# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2017 දෙසැම්බර් 11 වන සඳුදා**
2017 மார்கழி 11 திங்கட் கிழமை
Monday 11th December 2017

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09. 10 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.10 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.10 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*2017.12.12 වන දින, එනම් හෙට දින පැවැත්වෙන අයවැය විවාදය සඳහා සහභාගීවන ගරු මන්ත්‍රීවරුන් හා නිලධාරීන් සඳහා බටහිර වෛද්‍ය සායනයක් හා දේශීය වෛද්‍ය සායනයක් පැවැත්වීමට බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් කටයුතු සම්පාදනය කරනු ඇත. එම බටහිර වෛද්‍ය සායනයේදී රුධිරයේ සීනි ප්‍රමාණය, රුධිරයේ කොලොස්ටරෝල් ප්‍රමාණය, උසට සරිලන බර මැනීම, දන්ත සායනය, අක්ෂි සායනය, ECG, බෝ නොවන රෝග සායනය ආදී සේවාවන් ලබා දෙන අතර දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව මගින් සර්වාංග රෝග සායනයක් ද පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත්, ඒ සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් දැනුවත් කරන මෙන් එම අමාත්‍යාංශ ලේකම්තුමා විසින් සභා ලේකම්තුමා වෙත දැනුම් දීමක් කර තිබෙනවා. ඒ අනුව හෙට දින එනම්, 2017.12.12 දින එම වෛද්‍ය සායනයෙන්, අවශ්‍ය අයට එම සේවාව ලබා ගැනීමට හැකි බවත් එම ගරු මන්ත්‍රීවරුන් වෙත කාරුණිකව දැනුම් දෙනවා. වෛද්‍ය සායනය පැවැත්වෙන්නේ මෙම පරිශ්‍රයේම බවත් වැඩිදුරටත් දන්වා සිටිනවා.*

*ii*

*අද දිනට නියමිත න්‍යාය පත්‍රයානුකූලව මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්. වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් සහ සමූපකාර සේවක කොමිෂන් සභාව ආදී වැය ශීර්ෂයන් සම්බන්ධ විවාදයෙන් ද අනතුරුව සභාවේ එකඟතාවය විමසීම ඡන්ද විමසීම මධ්‍යාහ්න 12.00 ට සිදු කිරීමට නියමිතව තිබෙන බව ගරු මන්ත්‍රීවරුන්ටත්, ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකවරුන් දෙදෙනාටත් මම මේ අවස්ථාවේදී පූර්ව දැනුම් දීමක් කරනවා.*

# වාර්ෂික මුදල් ප්‍රකාශය - 2018
# පූර්ණ කාරක සභාව
## ANNUAL FINANCIAL STATMENT - 2018
## COMMITTEE OF THE WHOLE COUNCIL
**(ප්‍රගතිය - 2017.12.08)**

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට 2018 වාර්ෂික මුදල් ප්‍රකාශයේ සඳහන් ප්‍රදාන පිළිබඳව සලකා බැලීමට මෙම සභාව පූර්ණ කාරක සභාවක් පත් කිරීමේ අවස්ථාව. ඒ අනුව මෙම අවස්ථාවේදී පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් වෙනවා.

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***
*Accordingly, the Provincial Council resolved itself into a Committee of the whole Council.*

***ශීර්ෂ අංක 107, 121, 122, 123, 124, 125 හා 103 යන ශීර්ෂයන්ගෙන් රුපියල් 10/- ක සංකේත කපා හැරීමක් කළ යුතු යැයි යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනය පිළිබඳ ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී. (ප්‍රගතිය : 2017.12.08)***
*The question on the amendment that a token cut off of Rs. 10/- from each vote Nos. of 107, 121, 122, 123, 124, 125&103 moved by Hon. U. George Perera, Chief Opposition Whip, was proposed again. - (Continuation: 08.12.2017)*

[පූ.භා. 09.14]

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusamy

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම අද වාගේ දවසක පළමුව වන කථාව කිරීමට මට අවස්ථාවක් ලබා දුන් ගරු ඔබතුමාටත්, ඒ වාගේම ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ඇත්ත වශයෙන්ම මම අද ආඩම්බරයෙන් සමහර දේවල් ගැන කියන්න කැමති වෙනවා. මෙම පළාත් සභාවේ පසුගිය අවුරුදු දෙකකට වැඩි කාලයක් මන්ත්‍රීධුරය දරන මම, මාර්ග අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ ගරු මන්ත්‍රීවරයෙකු හැටියට, පසුගිය අවුරුදු දෙකක කාලය තුළ අපේ ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ පවත්වන සියලුම උපදේශක කාරක සභා රැස්වීම්වලට සහභාගී වෙලා තිබෙනවා. ඒ තුළින් මට දැන ගන්නට ලැබුණේ, ඇත්ත වශයෙන්ම මෙම අමාත්‍යාංශය මගින් වඩාත් උසස් සේවයක් අපේ බස්නාහිර පළාත් සභාවට ඉටු වෙලා තිබෙනවාය කියලා මට සාක්ෂි දරන්නට පුළුවන්. ඇත්ත වශයෙන්ම ඒකට හේතු වන්නේ -

මම ඉස්සෙල්ලාම කියන්න කැමැතියි. අපේ ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමා කවදාවත් ඇමතිවරයෙක් හැටියට හැසිරෙන්නේ නැහැ. එතුමා තුළ ආඩම්බරයක් නැහැ. කවදත් අපිත් එක්ක ඉතාමත් මිත්‍රශීලීව කටයුතු කරනවා. අපට දුරකථනයෙන් කථා කරලා මන්ත්‍රීතුමා, මොකක් හරි තිබෙනවා නම් මට කියන්න කියලා ඉතා හොඳ විධියට අපිත් එක්ක ආශ්‍රය කරන ඇමතිවරයෙක්. ඒ වාගේම කොයි වෙලාවේ කථා කළත්, එතුමා බෙදිලා කථා කරන්නේ නැහැ. අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ වැඩ ඉටු කරලා දුන්නාද කියලා තමයි සියලුම නිලධාරීන්ගෙන් එතුමා අහන්නේ. ඒ නිසා ඇත්ත වශයෙන්ම මම සතුටු වෙනවා, ඒ වාගේ ඇමතිවරයෙකු ළඟ අපට වැඩ කරන්නට ලැබුණු එක පිළිබඳව. මම ස්තුතිවන්ත වෙනවා, එතුමා ඇතුළු එතුමාගේ නිලධාරී මඩුල්ලට. බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු හැටියට මට ලබා දුන්, ඒ කියන්නේ මෙම පළාත් සභාවේ මට ලැබෙන විමධ්‍යගත මුදල්වලට අමතරව මෙම අමාත්‍යාංශය මගින් දුප්පත් ජනතාව වෙනුවෙන් නිවාස ආධාර ලබා දෙන්න අවස්ථාව මට අමාත්‍යතුමා ලබා දීලා තිබෙනවා. ඒ වාගේම පාරවල් කාපට් කිරීම, එහෙම නැත්නම් කොන්ක්‍රීට් කිරීම සඳහා විමධ්‍යගත මුදල් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම පාසල්වලට "බිඳුණු පුටුව" වැඩ සටහන යටතේ එම ව්‍යාපෘතිය සඳහා ද මගේ මාර්ගයෙන් අපේ ජනතාවට යම්කිසි සේවාවක් කිරීමට එතුමා ඒ මුදල් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම මාර්ග ආවරණ. ඒ කියන්නේ බස් හෝල්ට් හදලා දීලා තිබෙනවා. මම මේ සියලු දේට ඔබතුමාට සහ නිලධාරී මඩුල්ලට මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙනවා. තවත් මගේ තිබෙන අදහස් ටිකක් මම කියන්න කැමැති වෙනවා.

ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ බිඳුනු පුටුව වැඩ සටහන වාගේ හොඳ දේවල් වෙනවා. අපේ මන්ත්‍රීවරු වැඩ බහුල නිසා - මම හිතන්නේ, ඔබතුමා පසුගිය අවුරුදු දෙකක කාලය තුළ එක මන්ත්‍රීවරයෙකුට රුපියල් 50,000 බැගින් මේකට ලබා දුන්නා. නිලධාරීන් කියනවා, ඉස්කෝලවල නම දෙන්නය කියලා. අපි ඉස්කෝලවල නම් දෙනවා. ඇත්ත වශයෙන්ම ඊට පස්සේ follow-up එකක් නැහැ. ඒ වාගේ රු. 50,000 ක් වැය කරලා යම්කිසි පාසලක කැඩුණු පුටු හැදුවොත්, ඊට පස්සේ අපට වාර්තාවක් මේ වන තුරු ලැබුණේ නැහැ, කවුද හැදුවේ? එහෙම හදලා තිබෙනවා නම්, කැඩුණු මේස පුටු කොපමණ සංඛ්‍යාවක් හැදුවාද කියන එක පිළිබඳව ඔබතුමාට සොයා බලන්න බැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පාසලෙන් ගන්න ඕනෑ.

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusamy

පාසලෙනුත් ගන්න ඕනෑ. නමුත් මම හිතන්නේ, කවුරුහරි කොන්ත්‍රාත්කරුවෙකු හදනවා නම්, අමාත්‍යාංශ මාර්ගයෙන් මොකක්ද මේ කරලා තිබෙන්නේ? ඒ වාගේ දෙයකුත් කරන්න ඕනෑ. ඒ පළමුවැනි එක.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාවේ අපි දැන් කරන කථාවේදී තව දෙයක් මම කියන්න ඕනෑ. බස්නාහිර පළාත් සභාවේ කොළඹ දිස්ත්‍රික්කය ගැනත් ඔබතුමා වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. මම විශේෂයෙන්ම කියන්නේ ගරු ඇමතිතුමනි, ඔබතුමාට විතරක් නොවෙයි. මේ මුළු බස්නාහිර පළාත් සභාවටම. ඒ වාගේම අපි නිලධාරී මඩුල්ලටත් කියන්න ඕනෑ. අපේ කොළඹ ඒ කියන්නේ, උතුරු කොළඹ, මැද කොළඹ වාගේ

කොළඹ නගර සභාවට අයත් ප්‍රදේශවල දැන් ලස්සනට interlocking කරපුවා. ඒ වාගේම කාපට් කරපුවා. එලෙස කොන්ක්‍රීට් කරන පාරවල් කොළඹ මහ නගර සභාව විසින් නැවතත් පළුදු කරන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මම කොළඹ නගර සභාවේ - ඇත්තටම මම මේ දේ කියන්න ඕනෑ. මහජනතාවගේ කෝටි ගණන් මුදල්. මම ඇත්ත කියන්න ඕනෑ. අපේ හිටපු ආරක්ෂක ලේකම්, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඉන්නකොට යම්කිසි පිළිවෙළක් තිබුණා. ඒ කියන්නේ පාරක් කාපට් කරන කොට, එහෙමත් නැත්නම් interlocking කරනවා නම්, ඊට ඉස්සෙල්ලා කරන්න තිබෙන වැඩ, ඒ කියන්නේ SLT වැඩද, නැත්නම් electricity ද, එහෙම නැත්නම් water board ද ඒ සියලු දෙනාගේ වැඩ ඉවර කරලා තමයි interlocking අල්ලන්නේ. එහෙම නැත්නම් කාපට් කරන්නේ. එතකොට කොළඹ මහ නගර සභාවටත් යම්කිසි භයක් තිබුණා. අලුත් පාරක් කපන්න, පේමන්ට් එකක් කපන්න අනුමැතියක් දෙන කොට භයක් තිබුණා. අපි ඒකට අනුමැතිය දෙන්නේ නැහැයි කියලා. දැන් ඒ භය ගතිය නැති වෙලා තිබෙනවා. කෝටි ගණන් වැය කරලා පාරවල් කාපට් කරනවා. Interlocking කරනවා. ඊට පස්සේ කවුරු හරි කෙනෙකු ඇවිල්ලා පාරවල් කපනවා. ඉතින් මම කොළඹ නගර සභාවට කථා කරලා අහනවා, මේ මොකක්ද කියලා. නැහැ, මන්ත්‍රීතුමා ඒක අපි නොවෙයි කියනවා. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය කියලා කියනවා. (බාධා කිරීමක්) මම කියන්නේ, කොළඹ මහ නගර සභාව කියලා හැමදාම අපි කොළඹ මහ නගර සභාවෙන් කරනවාය කියලා අපි පළාත් සභාවක් හැටියට අයින් වෙලා ඉන්න බැහැ. ඒකයි මම කියන්නේ. නිකම් බොරුවට ඇවිල්ලා මම කථාවක් කරන්න ඕනෑ කියලා හිතලා, මම කථා කරන්නේ නැහැ. මමත් ශ්‍රී ලාංකිකයෙක්. කොළඹ ජීවත් වන මහජන නියෝජිතයෙක්. මේ නිකම් කථාවක් කියලා මේ හැන්සාඩ් එකේ ලියවිලා යන්න නොවෙයි මම මේ කියන්නේ.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, ඒ කාලේ තිබුණා කොඩි දාන කොට - සාමාන්‍යයෙන් මරණයක් සිදු වුණොත් කොළඹ මහ නගර සභාවෙන් සුදු කොඩි ගහනවා. ඒ සුදු කොඩි දාන්නේ වැදගත් පුද්ගලයෙක් ආන්ත්‍රා වුණොත්. එහෙමත් නැත්නම් කවුරු හරි මන්ත්‍රීවරයෙකුගේ ඥාතියෙකු ආන්ත්‍රා වුණොත් ඒ මන්ත්‍රීතුමා ලියුමක් දීලා තමයි කොළඹ මහ නගර සභාව සුදු කොඩි දාන්නේ. දැන් එහෙම නොවෙයි. දැන් අර සුදු කොඩිවල තිබෙන ගරුත්වය නැති වෙලා තිබෙනවා. කවුරු හරි පාතාලයේ කෙනෙකු මැරුණත් හරි සුදු කොඩි දානවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වැඩියෙන්ම දාන්නේ ඒ කට්ටියට.

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusamy

ඒ කට්ටියට වැඩියෙන්ම දානවා. එතකොට අර සමාජයේ උසස්ම ඉන්න කවුරු හරි හොඳ කෙනෙකුටත් දමන එකේ තේරුමක් නැහැ. ඒ නිසා මේ කොඩි දාන කොට කරුණාකරලා ඒකට යම්කිසි පිළිවෙළක් දාන්න. ඒ වාගේම ඡන්ද කාලයට. දැන් කොළඹ ඇවිල්ලා බැලුවොත් මේ මම කියන interlocking ඔක්කොම හිල් කරලා කොඩි කණු හිටවලා. ඇත්තටම බලන කොට හුඟාක් දුක හිතෙනවා. මේ පාරවල් මෙපමණ ලස්සනට හදලා තිබෙනවා. ඒ නිසා කොළඹ මහ නගර සභාව බස්නාහිර පළාත් සභාව යටතේ ඒගොල්ලෝ ක්‍රියාත්මක වෙනවා නම්, කරුණාකරලා ඔබතුමන්ලා - මේ අමාත්‍යාංශය විතරක් නොවෙයි. මෙම පළාත් සභාවේ ඉන්න උසස්ම නිලධාරීන් මේ ගැන සොයා බලන්න. කොඩි දානවා නම් ඒකට මොකක් හරි පිළිවෙළක් යොදන්න. ඒ නිසා ඒකත් මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. ඒ වාගේම ලබන අවුරුද්ද වෙන කොට කොළඹ දිස්ත්‍රික්කයේත් හුඟාක් පාරවල්, තවත් වතු පාරවල් අපට කොන්ක්‍රීට් කරන්න තිබෙනවා. Interlocking අල්ලන්න තිබෙනවා. ඒ නිසා ඒ ටිකත් අපට කරලා දෙන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අඩු ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති යටතේ ඔබතුමා හුඟාක් මන්ත්‍රීවරුන්ට එම නිවාස ආධාර යටතේ බඩු ලබා දීලා තිබෙනවා. ඒ පිළිබඳවත් ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම PRDA යටතේ මාර්ග සංවර්ධනය කිරීමට හුඟාක් මුදල් ලබා දීලා තිබෙනවා. ඒකටත් මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මීට කලින් හැම අවස්ථාවකදීම මම උපදේශක කාරක සභාවේදී කියපු දෙයක් තමයි, මේ කොළඹ නගර සීමාව තුළ හදන බස් හෝල්ට්වල අපට නීති ප්‍රශ්නයක් තිබෙනවා. ඒක ගරු ඇමතිතුමා දන්නවා. කරුණාකරලා ඒ නීති ප්‍රශ්න සොයා බලන්න. කොළඹ නගර සභාවෙන් පිටත මේ බස් හෝල්ට් දානවා නම් අනුමැතියක් ලබා ගන්න ඕනෑ නැහැ.

[ගරු කේ.ටී. කුරුසාමි]

නමුත් කොළඹ මහ නගර සභා සීමාව තුළ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත අරමුදල්, එහෙම නැත්නම් මෙම අමාත්‍යාංශයෙන් අපට දෙන විමධ්‍යගත අරමුදල්වලින් මහජනතාව වෙනුවෙන් බස් හෝල්ට් හදනවා නම්, ඒකට කොළඹ මහ නගර සභාවෙන් අනුමැතිය ගන්න ඕනෑ. කොළඹ මහ නගර සභාවෙන් අනුමැතිය ගන්න යන කොට, කොළඹ මහ නගර සභාව කියන්නේ, ඒක අපි ප්‍රයිවට් ආයතනයකට දීලා තිබෙන්නේ. ඒ ආයතනයේ අනුමැතිය ලබා ගන්න ඕනෑ කියලා ඉල්ලනවා. ඒ නිසා මේ බස්නාහිර පළාත් සභාව බලවත්, ශක්තිමත් පළාත් සභාවක් නිසා, අප යටතේ කොළඹ මහ නගර සභාව ක්‍රියාත්මක වන නිසා, කරුණාකර මේ ගැන සොයා බලලා, ලබන අවුරුද්දේ මේ සියලු දේ අපට ඉටු කර දෙන්න ඕනෑය කියලා ඉල්ලා සිටිමින්, ගරු අමාත්‍යතුමාට සහ එතුමාගේ නිලධාරී මණ්ඩලයට යළිත් වරක් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 09.24]

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
**Hon. Pradeep Undugoda**

ගරු සභාපතිතුමනි, මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධනය පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මගේ කෘතඥතාවය පළ කරනවා. ඇත්තෙන්ම මෙම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරයෙකු හැටියටත්, පසුගිය කාල සීමාව තුළදී අපේ ගරු අමාත්‍යතුමා උපදේශක කාරක සභාවන් පැවැත්වීමේදී මම හිතන්නේ, අනිකුත් අමාත්‍යාංශවල තිබෙන උපදේශක කාරක සභාවලට වැඩිය සෑම මසකම උපදේශක කාරක සභාව පවත්වන්නට කැප වුණු අමාත්‍යවරයෙක්. ආණ්ඩු පක්ෂය වාගේම විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ කථා තුළින් අපට පැහැදිලි වන්නේ, සෑම මන්ත්‍රීවරයෙකු වාගේම ඉතාමත් ප්‍රශංසාත්මක විධියට තමයි මේ අමාත්‍යාංශය පිළිබඳව කරුණු ඉදිරිපත් කළේ. මම දකිනවා, අමාත්‍යවරයෙකු හැටියට ඉතාමත් නිහතමානීව මන්ත්‍රීවරුන්ගේ අවශ්‍යතා අවබෝධ කර ගනිමින්, අමාත්‍යවරයෙකු වූ පළියට තමන්ගේ අවශ්‍යතා පමණක් ඉටු කර නොගන්නා අමාත්‍යවරයෙකු හැටියට තමයි මම ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමාව දකින්නේ. ඇත්තෙන්ම එතුමාගේ කාර්ය මණ්ඩලයත්, මන්ත්‍රීවරුන්ගේ අවශ්‍යතා වෙනුවෙන්, පොදු ජනතාවගේ අවශ්‍යතා ඉටු කරන්නට වෙහෙස මහන්සියක් දරන කාර්ය මණ්ඩලයක් සිටිනවා. නමුත් මම චෝදනා ඉදිරිපත් නොකළත් මම මෙය අවස්ථාවක් කර ගන්නවා, නිර්මාණශීලී අමාත්‍යාංශ කිහිපයක, නිර්මාණශීලී වැඩ කටයුතු කරන්න පුළුවන් අමාත්‍යාංශ කිහිපයක ඉදිරි වර්ෂය තුළදී අපට තවත් කාර්යක්ෂමව, වැඩදායී ලෙස ඵලදායී සේවාවක් බස්නාහිර පළාතේ ජනතාවට ඉදිරිපත් කරන්න පුළුවන් වැඩ සටහන් කිහිපයක් පිළිබඳව යෝජනා කිහිපයක් ගරු අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට. ඇත්තෙන්ම අපි දකිනවා. මෙම අමාත්‍යාංශ කිහිපය ගත්තාම, මේ අමාත්‍යාංශ කිහිපය අතරින් ප්‍රධානතම අමාත්‍යාංශය තමයි මාර්ග අමාත්‍යාංශය. ඒ වාගේම ප්‍රවාහන, සමුපකාර, නිවාස කියන අමාත්‍යාංශ කිහිපය ජනතාවට ඉතාමත් ඉක්මණින් ළං වෙන්නට පුළුවන් අමාත්‍යාංශ හැටියට තමයි මම දකින්නේ.

එතකොට පළාත් මාර්ග අමාත්‍යාංශය ගැන අපි කථා කරන කොට අපි දකිනවා, පසුගිය වර්ෂය තුළදී පළාත් මාර්ග සංවර්ධනය වෙනුවෙන් වෙන් කරන ලද මුළු මුදල රුපියල් මිලියන 150 ක්. අපේ බස්නාහිර පළාතේම C සහ D වර්ගයන්ට අයත් මාර්ග පද්ධතියේ කිලෝ මීටර් 1952 න් මේ වන කොට අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, කිලෝ මීටර් 1445 ක් සම්පූර්ණයෙන් නිම කරන්න. නමුත් මම දකින්නේ, පසුගිය කාල සීමාව තුළදී අපේ ගරු අමාත්‍යතුමා මේ අමාත්‍යාංශය භාර ගන්නට පෙර ඊට කලින් හිටපු ගරු අමාත්‍යතුමා වන නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා හිටපු කාල සීමාව තුළ විශාල වශයෙන් මේ C සහ D වර්ගයන්ට අයත් පාරවල් සංවර්ධනය කළා. දැන් වර්ෂ තුන හතරකට පෙර තමයි මේ මාර්ග සංවර්ධනය කරන්නට යෙදුණේ. නමුත් වර්තමානයේ මා දකින්නේ, පාරවල් සංවර්ධනය කිරීම කෙසේ වෙතත්, පාරවල් නඩත්තු කිරීමට විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කිරීමට අත්‍යවශ්‍ය බවයි. මොකද, අපි පාරවල් නිර්මාණය කිරීම පමණක් නොවෙයි, ඒ පාරවල් දීර්ඝ කාලයක් හරියාකාරව පවත්වාගෙන යන්නට අපට විශාල උත්සාහයක් දරන්නට සිද්ධ වෙලා තිබෙනවා. මෙයට මූලිකවම බාධාවක් වශයෙන් මා දකින්නේ, අපි පසුගිය කාල සීමාව තුළදී අත් වින්දා හදිසි ආපදා තත්ත්වයන්. ජල ගැලීම්. මේ ජල ගැලීම් තුළදී අපේ මේ මාර්ග පද්ධතියට විශාල වශයෙන් හානි සිදු වෙලා තිබුණා. මේ සඳහා නැවත ප්‍රතිසංස්කරණය කිරීමට අපට

විශාල මුදල් ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා. සමහර පාරවල්වල අපි අත් විඳලා තිබෙනවා. දැකලා තිබෙනවා. ඒ පාරවල්වල තිබෙන අයින් කැඩිලා, ඒ පාරවල් සම්පූර්ණයෙන් පාවිච්චියට නුදුසුසු තත්ත්වයට පත් වෙන්න මූලිකම හේතුවක් විධියට මා දකින්නේ මේ පාරවල්, edge කියන අග කොටස, අයින කොටස කැඩී බිඳී යාම. මේ තුළින් මා දකිනවා, අපේ මාර්ග පද්ධතිය විශාල හානියක් සිද්ධ වෙලා තිබෙනවා. තවත් කටයුත්තක් මා දකිනවා. අපි මන්ත්‍රීවරු හැටියට දේශපාලන නායකත්වයන් හැටියට අපි දකින්නේ, ගමට, මිනිස්සුන්ට වැඩක් කරලා පෙන්වන්න. එතකොට හැම මන්ත්‍රීවරයාම යෝජනා කරන්නේ පාරවල් හදන්න කියන එක පමණයි. නමුත් මේ පාරවල් හැදුවාට වැඩක් නැහැ. පාරවල් දෙපැත්තේ තිබෙන කාණු ටික සංවර්ධනය කළේ නැත්නම් මේ පාරවල් දීර්ඝ කාලයක් පවත්වාගෙන යන්නට පුළුවන්කමක් නැහැ. මම දකිනවා. මමත් මන්ත්‍රීවරයෙකු හැටියට, මමත් කවදාවත් මගේ විමධ්‍යගත මුදල් කාණු හදන්න දාන්නේ නැහැ. නමුත් අමාත්‍යාංශයක් හැටියට මේ පිළිබඳව මැදිහත් වෙලා, අමාත්‍යාංශ මුදල් වෙන් කරලා මේ මාර්ග පද්ධතිය දෙපස තිබෙන කාණු පද්ධතිය නඩත්තු කරන්නට පුළුවන් නම් මම හිතනවා, මේ මාර්ග පද්ධතිය අපට දීර්ඝ කාලයක් පාවිච්චි කරන්න පුළුවන් ආකාරයට පවත්වාගෙන යන්නට පුළුවන් කියලා.

ඒ වාගේම ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය ගැන කථා කරන කොට අප පසුගිය කාල සීමාව තුළ මේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය තුළින් ගමේ සිටින ජනතාව වෙනුවෙන් විශාල කාර්යභාරයක් කරන අමාත්‍යාංශයක්. ගරු සභාපතිතුමනි, මේ ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවීමේදී පසුගිය කාල සීමාව තුළ තිබුණු ක්‍රමවේදය, එක් ග්‍රාම සේවා වසමකට එක් ග්‍රාම සංවර්ධන සමිතියක් පිහිටුවන්නට තමයි අතීතයේ ඉඳන් පැවත එන ක්‍රියාදාමය. නමුත් මේ පරණ නීතිරීති ඉදිරියටත් ගෙන යාමට සුදුසු කාලය දැන් ඉක්ම ගිහිල්ලාය කියන එක තමයි මගේ හැඟීම. මොකද, ඉස්සර තිබුණේ, ගමක් ඒකරාශී වුණු වට පිටාවක්. නමුත් අද නිවාස සංකීර්ණයන් ඇති වෙලා තිබෙනවා. නාගරීකරණය වීම තුළින් මේ ගම් කියන සංස්කෘතිය අපෙන් ඉවත් වෙලා, දැන් මේ සඳහා වෙන් වෙන් වශයෙන් හැදුනු නිවාස සංකීර්ණ අපට දකින්නට ලැබෙනවා. මේ නිවාස සංකීර්ණවල ඉන්න පිරිස මේ ගමත් එක්ක සම්බන්ධයක් නැහැ. ඒ නිසා මේ එක් ග්‍රාම සේවා වසමකට එක් ග්‍රාම සංවර්ධන සමිතියයි කියන ඒ නීතියෙන් ඔබ්බට ගිහිල්ලා යම්කිසි ක්‍රියාදාමයක්, නීති පද්ධතියක් සකසලා ඉන් අපට තවත් කාර්යක්ෂමව වැඩ කරන්න පුළුවන් වන ආකාරයේ ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවීමට අවස්ථාව ලබා දීමට කටයුතු කරන මෙන් මම ගරු අමාත්‍යතුමාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තමයි කර්මාන්ත දෙපාර්තමේන්තුව. අද කර්මාන්ත දෙපාර්තමේන්තුව තුළින් මා දකිනවා, විවිධ ආකාරයේ පාඨමාලා කර ගෙන යනවා. දැන් මේ විවිධ ආකාරයේ පාඨමාලා කරන අතර තුර, පසුගිය කාල සීමාව තුළ තිබුණු පාඨමාලාවම දිගටම කර ගෙන යනවා. නමුත් නවීන තාක්ෂණයත් එක්ක මේ රට දියුණු වී ගෙන යන කොට අපි මේ පාඨමාලා කරන්න ඕනෑ රැකියා අරමුණු කර ගෙන. නැතිව ඒ පාඨමාලා කිරීම තුළින් කාටවත් ඒකෙන් යහපතක් සිද්ධ වෙන්නේ නැහැ. රැකියාවක් අරමුණු කර ගෙන කරන්නට පුළුවන් පාඨමාලා පැවැත්වීම තුළින් මා දකිනවා, මේ බස්නාහිර පළාත තුළ සිටින ජනතාවට ඒකෙන් යහපතක් සිද්ධ වෙයි කියලා. ඒ වාගේම තමයි, මේ කුමන පාඨමාලාවක් කළත් ඒකේ තිබෙන පිළිගැනීම, ඒ සහතිකයේ තිබෙන පිළිගැනීම, ඒකට වටිනාකමක් දෙන්න බැරි නම් මම හිතන්නේ නැහැ, ඒ කරන පාඨමාලාව තුළින් ලබා ගන්නා දැනුම අරගෙන යම්කිසි ආයතනයකට ඇතුළත් වෙන්න පුළුවන් වේවි කියලා. ඒ නිසා ඒ ලබා දෙන සහතිකයේ වටිනාකම අත්‍යවශ්‍ය වෙනවා. හැම පුද්ගලික ආයතනයක්ම බලනවා, කුමන ආයතනයකින්ද මේ සහතිකය ලබා දීලා තිබෙන්නේ කියලා. ඒ නිසා අපට අවශ්‍ය වෙලා තිබෙනවා, මේ සඳහා රාජ්‍ය ආයතන තිබෙනවා. ස්වයං රැකියා, අනෙකුත් පුහුණුවීම් කටයුතු කරන NAITA වාගේ ආයතන තිබෙනවා. මේ ආයතනත් එක්ක සම්බන්ධ වෙලා, මේ ආයතනවල තිබෙන Syllabus එක අරගෙන, මේ ආයතනත් එක්ක අනුබද්ධිතව යම්කිසි සහතිකයක් නිකුත් කරන්න පුළුවන් නම්, ඒ පාඨමාලා කර ගෙන යන තරුණයන්ට හොඳ තැනක රැකී රක්ෂාවක් කරන්නට හොඳ අවස්ථාවක් සැලසෙනවා.

ඒ වාගේම තමයි සමූපකාර දෙපාර්තමේන්තුව. මේ සමූපකාර දෙපාර්තමේන්තුව තුළින් පසුගිය කාල සීමාව තුළ - මේක නොකියත් බැහැ ගරු අමාත්‍යතුමනි. සමූපකාරය කියන එක අද වල් බිහි වුණු තත්ත්වයකට පත් වුණු දෙපාර්තමේන්තුවක්. මේ වාගේ බොහෝ සමූපකාර

තිබෙනවා. අපි දැකලා තිබෙනවා. බොහෝ සමුපකාර අද පාඩු පිට පවත්වාගෙන යන සමිති බවට පත් වෙලා තිබෙනවා. මේ සමුපකාරය කියන එක අතීතයේ ඉඳලා ගමක් ඒකරාශී කර ගෙන, ගමේ තිබුණු එකම කඩය. නමුත් අද මේ රට දියුණු වීමත් සමඟම, නාගරීකරණයත් සමඟම අද සමුපකාරයට විශාල තරගකාරීත්වයකට මුහුණ දෙන්නට සිද්ධ වෙලා තිබෙනවා. අද යම්කිසි පුද්ගලයෙක් ගිහිල්ලා බඩුවක් මිලදී ගන්න කොට, ඒ භාණ්ඩයේ උසස් තත්ත්වය, ප්‍රමිතිය පිළිබඳව අද හැමෝම උනන්දු වෙනවා. ඒ නිසා මම හිතන්නේ කාගිල්ස්, කීල්ස් වැනි ආයතනත් සමඟ තරගකාරීත්වයට මුහුණ දෙන්නට පුළුවන් වටා පිටාවක් අද සමුපකාරයට නැහැ. ඒ නිසා මා දකින්නේ. කොළඹ දිස්ත්‍රික්කය ගත්තොත්, මේක ගම්පහ දිස්ත්‍රික්කයේ සමහර ප්‍රදේශවලට බලපාන්නේ නැති වෙන්න පුළුවන්. කළුතර දිස්ත්‍රික්කයේ සමහර ප්‍රදේශවලට බලපාන්නේ නැති වෙන්න පුළුවන්. නමුත් කොළඹ දිස්ත්‍රික්කයේ අද සමුපකාරයට මේ ආයතනත් සමඟ තරගකාරීත්වයට මුහුණ දෙන්න පුළුවන්ද කියන සැකය අපට තිබෙනවා. ඒ නිසා මේ සඳහා සමුපකාරය මත්තේම, සමුපකාරයේ තිබෙන අල, සීනි, පිටි මේවා විකුණනවා ඇරෙන්නට අපි මෙයින් ඔබ්බට ගිහිල්ලා - උදාහරණයක් වශයෙන් අපට ලාභ ලැබීමට පුළුවන් ආයතන, මේ සමුපකාර හොඳ ස්ථානවල ඉතාමත් වටිනා ස්ථානවල තමයි මේ ගොඩනැඟිලි තිබෙන්නේ. අපට මේවා පාවිච්චි කරලා යම්කිසි ආදායමක් උත්පාදනය කරන්න පුළුවන් ක්‍රමවේදයක්, නැත්නම් ආයතන පිහිටුවන්නට පුළුවන්කමක් තිබෙනවා නම්, අපට පුළුවන් මේ පාඩු ලබන එක අවම කර ගන්නට.

තවත් කාරණා කිහිපයක් තිබුණත්, මම ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. පසුගිය කාල සීමාව තුළ අපි හැමෝම උපදේශක කාරක සභා වාගේම අනිකුත් සියලුම ගරු මන්ත්‍රීවරු සමඟ ඉතාමත් මිත්‍රශීලීව, ඉතාමත් සහයෝගයෙන් කටයුතු කරලා, අපේ අවශ්‍යතා ඉටු කරන්නට ලබා දුන්න සහයෝගය පිළිබඳව ගරු අමාත්‍යතුමාටත්, ලේකම්තුමියටත්, ඒ වාගේම කාර්ය මණ්ඩලයටත්, විශේෂයෙන්ම පෞද්ගලික කාර්ය මණ්ඩලයටත් මම ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොමත්ම ස්තුතියි.

[පූ.භා. 09.37]

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි, ඔබතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම පිළිබඳව. මාර්ග, ප්‍රවාහන, සමුපකාර, වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතේ කථා කරන කොට මේ සභාව නියෝජනය කරන අමාත්‍යවරුන්ගෙන් මම හිතන්නේ, ප්‍රබලම අමාත්‍යාංශ කිහිපයක කටයුතු කරන අමාත්‍යවරයෙක් තමයි ලලිත් වනිගරත්න ඇමතිතුමා. ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරපු ආකාරයට සැබවින්ම ඔබතුමා පිළිබඳව කියන්න තිබෙනවා. ගුණ වැයීමක් නොවෙයි. ඔබතුමා අමාත්‍යවරයෙක් නොවන අමාත්‍යවරයෙක්. ඒක මම කිව්වේ, ඔබතුමා අමාත්‍යවරයෙක් බව මේ ඉන්න එකම මන්ත්‍රීවරයෙකුටවත්, අපටවත් ඒත්තු ගන්වලා නැහැ. ඔබතුමා, ඔබතුමාගේ බලය අනිසි ලෙස පාවිච්චි කරලා, එහෙම කටයුතු කරලා නැහැ. ඇත්තටම ඔබතුමා හරිම නිහතමානීයි. ඕනෑම වෙලාවක ඔබතුමාට දුරකථනයෙන් කථා කළත් - ඔබතුමාව එක එක්කෙනා දකින රූප. ඇඟිලි පහ වෙනස් නේ? ඒ නිසා එක්කෙනෙක් දකින රූපය වෙනස්. මම දකින රූපය වෙනස්. විවේචනයට ඕනෑම අවස්ථාවක ලැහැස්ති වෙලා ඉන්න කෙනෙකුට ඒක එක එක විධියට දකින්න පුළුවන්. ඒක එයාගේ ප්‍රතිපත්තිය වෙන්න පුළුවන්. මම නම් දකින්නේ ඒක නොවෙයි. මොකද, වැඩක් කර ගන්න බැරි ඇමතිවරුත් ඉන්නවා. දුරකථන ඇමතුමක් දුන්නොත් එහෙම ජීවිතේට කෝල් එකකට එන්නේ නැහැ. මෙතුමාට දුරකථන ඇමතුමක් දුන්නොත් අනිවාර්යයෙන්ම එතුමා ඒ වෙලාවේ කථා කරනවා. එතුමාට ඉන්නවා නියම කාර්ය මණ්ඩලයක්. වසන්ත, කිත්සිරි, ඒ වාගේම තමයි නුවන් අපේ සභාපතිතුමා. ලේකම්තුමිය. ඕනෑම අවස්ථාවකදී ඒ අවශ්‍ය කාරණාවට එළඹිලා, මන්ත්‍රීවරයෙකුගේ තිබෙන ගරුත්වය. අපි එතැනට ගියාම - සමහර අමාත්‍යාංශවලට ගියොත්, ඒකේම උඩ තට්ටුවට ගියොත් අපි - මම නම් නියෝජනය කරන්නේ ඒ අමාත්‍යාංශය. සමහර විට අපි මන්ත්‍රීවරුන්ද කියලා අපට සිතා ගන්න බැහැ. අපි යම්කිසි වැඩ කටයුත්තක් කර ගන්න පැය ගණන් ඉන්න ඕනෑ. නමුත් මෙතුමාගේ අමාත්‍යාංශයේදී -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැබැයි, එදා එතුමාව වර්ණනා කළා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒක තමයි. සමහර අවස්ථාවලදී එහෙම කරන්න වෙනවා. ඒ ආකාරයෙන් ගත්තාම මෙතුමා පිළිබඳව ඉතාමත් සතුටුයි. එතුමා කරන්නා වූ කාර්යය පිළිබඳව.

ගරු සභාපතිතුමනි, ගරු අමාත්‍යතුමාගේ ප්‍රධාන විෂය තමයි මාර්ග. දැන් මීට පෙරත් කථා කළා. මාර්ග කිව්වාම - එකක් මෙතුමාගේ අමාත්‍යාංශය හරහා කෙරෙන්නා වූ කාර්යභාරය. ඒ හැරුණාම පළාත් පාලන ආයතන මගින් කරන්නා වූ කාර්යභාරය. නගර සභා මගින් කෙරෙන්නා වූ කාර්යභාරය නිසි ලෙස සිදු වෙනවාද කියලා ආපහු හැරී බැලීමක් කරන්න සිද්ධ වෙනවා. හේතුව තමයි ගරු සභාපතිතුමනි, සමහර නගර සභාවල සැලසුම් හදනවා. TO මහත්වරු ඒවාට සම්බන්ධ වෙනවා. නමුත් මාර්ගයක් හදලා ඉවර වෙනකල් ඒවායේ ප්‍රමිතිය පිළිබඳව නැවත සොයා බැලීමේ කිසිම කටයුත්තක් කරන්නේ නැහැ. මේ පාරවල් - දැන් මම නියෝජනය කරන්නේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා නියෝජනය කරන ආසනය. දැන් මීට පෙර තිබුණු පළාත් පාලන ආයතන තුළින් හදපු පාරවල්, පසුකාලීනව, දැනට අවුරුදු දෙකකට පමණ පෙර හදපු පාරවල් නැවත වතාවක් ගිහිල්ලා බැලුවොත් එහෙම, පසු විපරමක් කළොත් එහෙම අද ගල් කැට පමණයි තිබෙන්නේ. පාරවල් නොවෙයි හදන්නේ. අර ආස්මිවලට පැණි දානවා වාගේ පාරේ තිබෙන්නේ ගල් කැට පමණයි. ගල් කැට වැඩියි. මුළු තාර ප්‍රමාණය දාන්නේ නැහැ. ඒ නිසා ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා වෙන් කරන මුදල් වෙන්න පුළුවන්. ඒවා ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරපු ආකාරයට නැවත වතාවක් සොයා බැලීමක් කරන්න ඕනෑ. පසුවිපරමක් අනිවාර්යයෙන්ම කරන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, අඩුම තරමින් මාසයක්. අපි දන්නවා. පුංචි කාලයේ සමහර පාරවල්, තාර පාරවල් අවුරුදු 25 ක් 30 ක් තිබෙනවා. සමහර විට දීර්ඝ කාලයක් තිබෙන ප්‍රධාන පාරවල් තිබෙනවා. ඉතින් ඒවා අහඹු ලෙස තමයි පිළිසකර කරන්නේ. නමුත් අද මේ කොන්ත්‍රාත්කරුවන් හරහා කරන්නා වූ කාර්යභාරයේදී අවුරුද්දක්, අවුරුදු දෙකක් හරිම අපහසුවෙන් තමයි ඒ පාරවල් හොඳ තත්ත්වයේ තිබෙන්නේ. ඒ කියන්නේ තාර නොවෙයි දාන්නේ. මම ඊයේත් එක්තරා ස්ථානයක පාරක් බලන්න ගියා. මාස දෙකක් නැහැ. කොන්ක්‍රීට් එකේ උඩ තිබෙන අර පුංචි පුංචි ගල් ටික ගැලවිලා යනවා. ඒ නිසා මේවා ඔබතුමාට අයිති කාර්යභාරයක්. ඔබතුමා අනිවාර්යයෙන්ම මේ පිළිබඳව සොයා බැලීමක් කරන්න ඕනෑ. TO මහත්වරු මේවා බලන්නේ නැහැ. නගර සභා ආශ්‍රිතව ඉන්නා වූ TO මහත්වරු - ගරු සභාපතිතුමනි, මම මේ මෑතකදී දැක්කා, රාත්‍රියේ කොන්ක්‍රීට් දමනවා. මම හිතන්නේ, මේ හදිස්සිය නිසා වෙන්න ඇති. මහ රෑ ගිහිල්ලා කොන්ක්‍රීට් දානවා. මම එතැන නවත්වලා ඇහුවා, මොකක්ද මේ වැඩේ කියලා. වැඩ ඉවර කරන්න ඕනෑ නිසා. පොඩි ලයිට් එකක් ගහගෙන කොන්ක්‍රීට් අනනවා. අර පෙරමුසු, එහෙම නැත්නම් රෙඩිමේඩ් කියලා එකක් ගේන්න ඕනෑ. නමුත් ඒවා මොකුත් බලන්නේ නැහැ. රෑ දොළහට විතර ඇති. පාර හදනවා. ගරු ඇමතිතුමනි, සාමාන්‍යයෙන් කොන්ක්‍රීට් එකක් උඩට කොන්ක්‍රීට් එකක් දාන්නේ නැහැ නේ? මේ තිබුණු කොන්ක්‍රීට් එක උඩින් අඟල් දෙකක් විතර නැවත වරක් දාලා අරකත් එක්ක පෙන්වනවා මෙන්න හදපු පාර කියලා. ඉතින් ඒ නිසා මේ නගර සභා හරහා කෙරෙන්නා වූ ඒ මාර්ග පිළිබඳව විශාල වශයෙන් සොයා බැලීමක් කරන්න ඕනෑ. අඩු තරමින් නැවත වතාවක් ඒ මුදල් ගෙවන කොට ඒවා නිසියාකාරව තිබෙනවාද කියලා බලන්න ඕනෑ. මීට පෙර කථා කරපු ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුම කිව්වා, අඩුම තරමින් පාරක් හැදුවාට පස්සේ අඩුම තරමින් අවුරුදු දෙකක්වත්, තුනක්වත් මේකේ ඉන්නවා අපි හිටපු සභාවල ප්‍රධානීන් හැටියට. ඒගොල්ලන්ට අඩුම තරමින් අවුරුදු තුනක්වත් වගකීම් දරන්න දෙන්න ඕනෑ. පාරක් හැදුවාට පස්සේ. දැන් එහෙම නොවෙයි. පාර හදලා ආපහු මාස පහක් හයක් යන කොට ඒ පාරම හදනවා. ඒ නිසා මුදල් හම්බ කරන මහා ව්‍යාපාරයක් බවට පත් වෙනවා. ඒ පිළිබඳව සැලකිල්ල යොමු කිරීමක් කරන්න ඕනෑ.

ඒ වාගේම දැන් ප්‍රවාහන සේවය අයිති වෙන්නෙත් ඔබතුමාට. ප්‍රවාහනය හොඳයි. තරඟකාරීත්වයක් ඇතිව - සමහර පාරවල්වල ඔබතුමාගේ යටතේ තිබෙන්නා වූ ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ඒකාධිකාරී ස්වරූපයක් තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, මම මහරගම සිට අනුරාධපුරයට CTB බස් එකක් දැම්මා, මහරගම සිට උදේ හතයි ගණනකට යන්න. ඒ බස් එක අවිස්සාවේල්ලෙන්

[ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්]

ගිහිල්ලා බුලත්කොහුපිටිය හරහා යන්න. සතියක්වත් දුවන්න බැරි වුණා. ගරු සභාපතිතුමනි, ඒ පාරේ ඒ බස් රියදුරාට යන්න දෙන්නේ නැහැ. ගහනවා. ඒ කියන්නේ, පුද්ගලික අංශයේ ඉන්නා වූ රියදුරන් සහ තව චණ්ඩි එකම තැනකවත් බස් එකක නවත්වන්න දෙන්නේ නැහැ. මහරගමින් පටන් ගත්තාම අනුරාධපුරය, කුරුණෑගල ඉඳන් තමයි වැඩ පටන් ගන්න පුළුවන්. එතකල් මෙහෙන් නගින ටික විතරයි. සති දෙකක්වත් යන්න බැරි වුණා. බස් එක නතර කර ගත්තා. සමහර පාරවල් තිබෙනවා ගරු ඇමතිතුමනි, රුක්මලේ නිවාස යෝජනා ක්‍රමය කියන්නේ, ලොකු නිවාස යෝජනා ක්‍රමයක්. ප්‍රේමදාස මහත්තයා යටතේ ආරම්භ කරපු. දැන් අතුරුගිරියේ ඉඳන් කොළඹට දුවන්න බස් එකක් දෙකක් තිබෙනවා. රුක්මලේ CTB බස් එකක් දෙකක්. ඒ ඇරෙන්න රුක්මලේ ඉඳන් ආරම්භ කරන්නේ, පුද්ගලික බස් රථ පමණයි. ඒවා සවස පහ, හය වෙන කොට ඉවරයි. හයෙන් පස්සේ ඒ පාරේ බස් එකක් දුවන්නේ නැහැ. CTB බස් එකක් දාන්න ගියොත් එහෙම ඒගොල්ලෝ කියනවා, අපි දුවන්නේ නැහැ. ඒ නිසා මේ තනි ඒකාධිකාරයක් තිබෙන්නේ.

ඔබතුමාට මම තව මාර්ගයක් කියන්නම්. මහරගම සිට පිළියන්දලට යන CTB බස් එකක් තිබෙනවාද බලන්න. මහරගම සිට පිළියන්දලට CTB බස් එකක් දුවන්න දෙන්නේ නැහැ. ඉස්සර තිබුණා. අපි පාසල් යන කාලයේ පිළියන්දලට බස් එකක් තිබුණා. දැන් බස් එකක් දුවන්න දෙන්නේ නැහැ. පොළ දවසට එහෙම විශාල සෙනඟක් ඉන්නවා. බස් එකක් දුවන්න දෙන්නේ නැහැ. CTB එක වැරදිලා හරි - වෙන මුකුත් ඕනෑ නැහැ. විද්‍යාකරයේ පාසල් බස් රථයට යන්න දෙන්නේ නැහැ. ඒ බස් එක නවත්වාගෙන ඉන්න කොට පුද්ගලික බස් රථවල යන අයත් සමහර අවස්ථාවලදී නගිනවා. ඒකට යන්න දෙන්නේ නැහැ. ගහනවා. ඒ පාරේ දුවන්න දෙන්නේ නැහැ. චණ්ඩි ඉන්නේ. එවැනි පාරවල් තිබෙනවා. 174 පාර. මේ සභාවටත් ආසන්නයේ තිබෙන කොට්ටාව - බොරැල්ල බස් එක. 8.30 න් පසුව බොරැල්ලට යන්න බස් එකක් සොයා ගන්න බැහැ. පාර්ලිමේන්තුව කිට්ටුවෙන්ම යන ප්‍රධාන පාරක්. බස් දුවන්නේ නැහැ. CTB එක නම් ලාභය අපේක්ෂාවෙන් තොරව හරි දුවනවා. නමුත් මේ වාගේ ස්ථානවල විශේෂයෙන්ම ඔවුන් කටයුතු කරන්නේ ලාභයට. Turn එක හරියට පුරවා ගන්න පුළුවන් නම් පමණයි දුවන්නේ. ඒ නිසා ඔබතුමා පොඩ්ඩක් අර - ඉස්සර මට මතකයි අපේ ගරු අමාත්‍යවරයෙක් හිටියා. අනිල් මුණසිංහ මැතිතුමා. මම හිතන්නේ සභාපතිවරයෙක්. එතුමා මහ පාරට බැහැලා ඒ පිළිබඳව සොයා බැලීමක් කළා. ගරු ඇමතිතුමනි, ඔබතුමාටත් පුළුවන් හවස් වරුවේ මේ වාගේ තැන්වලට ගිහිල්ලා සොයා බැලීමක් කරන්න. එතකොට ඒ මාර්ගවල නිසියාකාරව ඒ කටයුත්ත කරන්න පුළුවන්.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලනවා. ඔබතුමාටම තමයි නිවාස භාරවත් තිබෙන්නේ. මේ නිවාස ඉදි වෙනවා. අපේ ප්‍රදේශයේ අපේ ආසනයේ ගරු සභාපතිතුමනි, වියත්පුර කියලා විශාල නිවාස යෝජනා ක්‍රම දෙකක් ඇති වෙනවා. මගේ නිවස ඉදිරිපිටත්. හැබැයි, ඒ ඔක්කොම ඇවිල්ලා තිබෙන්නේ, වියතුන්ට සහ විශාල මුදල් ප්‍රමාණයක් තිබෙන අයට. එදා ප්‍රේමදාස යුගයේ ඇති කළා වාගේ ඔබතුමාට පුළුවන් නම්, මේ අඩු ආදායම්ලාභී පිරිස් සඳහා නිවාස යෝජනා ක්‍රමයක්, මේ මන්ත්‍රීවරුනුත් සම්බන්ධ කර ගෙන කරන්න පුළුවන් නම් මම හිතන්නේ, ලොකු කටයුත්තක්. ගරු සභාපතිතුමනි, ගොඩක් ඉන්නවා පාරවල් අද්දර නිවාස නැතිව, පුංචි පුංචි පැල්පත් වාගේ දේවල් ගහගෙන. ඉතින් ගරු ඇමතිතුමාගේ අවධානය යටතේ ඒ දේ කරනවා නම්, මම හිතනවා වඩාත් සුදුසුයි කියලා. පළාත් සභාව හරහා නිවාස යෝජනා ක්‍රමයක් හදන්න. අපේ මහ ඇමතිතුමාත් ඉන්නවා. අපේ ප්‍රදේශවල ඉඩකඩම් තිබෙනවා. ඒවා අඩුතරමින් මිලදී ගෙන හරි ඒ දේ කරන්නය කියලා ඉල්ලීමක් කරනවා.

ගරු සභාපතිතුමනි, සමූපකාර ව්‍යාපාරයේ නම් ඉතාමත් ඇල් මැරුණු ස්වභාවයක් තිබෙන්නේ. සමූපකාර ව්‍යාපාරය ආරම්භ කළෙත් එංගලන්තයේ Lancashire ප්‍රාන්තයේ Rochdale නගරයේ සාධාරණ පුරෝගාමීන්ගේ සමූපකාර සමිතිය කියලා. 18 දෙනෙකු එකතු වෙලා. එහෙම ආරම්භ කරපු සමූපකාර ව්‍යාපාරය අද විශාල ලෙස වැටිලා තිබෙන්නේ. සමූපකාරයට ගිහිල්ලා බඩු තෝරන්න බැහැ. අර පරණ ගතානුගතික දේවල් තිබෙන්නේ. හැම වෙලාවේම මීයෝ, සත්තු ඉන්නවා. ඒ නිසා අද මේ අලුත් තරඟකාරී තත්ත්වයට එන්න විධියක් නැහැ. ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඒ වාගේම සණස ව්‍යාපාරය හරහා මහා හොරකමක් වෙලා තිබෙනවා. ඔබතුමා ඒ පිළිබඳව කිසිම ආකාරයකින් සැලකිල්ලක් යොමු

කරලා නැහැ. මහ ඇමතිතුමාත්, මමත් නියෝජනය කරන අපේ බල ප්‍රදේශයේ. ණය ගත්ත මිනිස්සුන්ට තමන්ගේ තැන්පත් සඳහා ඒ දුන්න ඒවා - මොනම ආකාරයේ කටයුත්තක්වත් කරලා නැහැ. ඒ නිසා ඒ මිනිස්සු අසරණ වෙලා තිබෙන්නේ. කිහිප දෙනෙකු එල්ලිලා මැරෙන්න පවා ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කිරීමක් කරන්න. මේක මහා කුඨ ව්‍යාපාරයක්.

අවසාන වශයෙන්, ග්‍රාම සංවර්ධන සමිති කියලා කියන්නේ ගරු අමාත්‍යතුමනි, හොරු. බහුතරයක්. හැමෝම නොවෙයි. හැමෝම ගම්වල ග්‍රාම සංවර්ධන සමිතියක් හදා ගන්නවා. ඒගොල්ලෝ තමයි කොන්ත්‍රාත් ටික ගන්නේ. කොන්ත්‍රාත් ටික අරගෙන, ඒගොල්ලෝ 5% ගන්නවා. ගරු සභාපතිතුමනි, ඒකේ ඉන්නේ සභාපතිවරයා, ලේකම්වරයා, භාණ්ඩාගාරික. ඒ නිසා නැවත පසු විපරමක් කරන්න, ඒ 5% අරගෙන මොනවාද කරලා තිබෙන්නේ කියලා. බොහොම ස්තුතියි මේ අවස්ථාව ලබා දීම පිළිබඳව.

[පූ.භා. 09.49]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඇත්ත වශයෙන්ම ගරු සභාපතිතුමනි, මේ අපේ අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ විෂය පථය දිහා බැලුවාම, මහා විශාල විෂය ක්ෂේත්‍රයක්. විශේෂයෙන්ම එතුමා යටතේ අධිකාරී කිහිපයක් තිබෙනවා. අපි මේ අමාත්‍යාංශය ගැන කථා කරන කොට විශේෂයෙන්ම, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ මේ සමහර අධිකාරී පිහිටෙව්වේම, ලාභ ලැබීමේ පරමාර්ථයෙන්. ඇත්ත වශයෙන්ම එතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ඒ ආයතනවලින් සැබෑ ප්‍රයෝජන ගන්නවාද? සැබෑ ලාභයක් අත් වෙනවාද? කියන එක යළිත් සලකා බලන්නය කියලා ඉල්ලන්න වෙනවා. විශේෂයෙන්ම මම ඔබතුමාට දිගින් දිගටම අවධානය යොමු කළ කාරණයක් තමයි, මේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ අත්තනෝමතික පාලනය. මම එතුමාට කිව්වා. ඉතාමත්ම සරල කාරණා කිහිපයක් මම කියන්නම්. අභ්‍යන්තර විගණකවරයෙක් ගත්තා. අවුරුදු තුනක පළපුරුද්ද තිබෙන්න ඕනෑ. නමුත් ලංකා තේ පර්යේෂණ මණ්ඩලයේ අවුරුදු දෙකයි මාස තුනක පළපුරුද්ද තිබෙන කෙනෙක් ගත්තා. දැන් ඒ මනුස්සයා ඇවිල්ලා මාස හතරෙන් වැටුප් වර්ධකයකුත් ඉල්ලනවා. කවුද මේ? සභාපතිතුමාගේ ගමේ. ගමේ කමට අරන් තිබෙන්නේ. එතුමාගේ සුදුසුකම් ගැන නොවෙයි. මා ළඟ තිබෙනවා, එතුමාගේ ජීව දත්ත තොරතුරු. එතුමාට සුදුසුකම් තිබෙනවා. හැබැයි, තනිකරම මේ බඳවා ගැනීම නීති විරෝධීයි. ඒ නිසා මේ වාගේ ඒවා වළක්වා ගන්නය කියලා මම ඔබතුමාට දිගින් දිගටම කිව්වා. ඊළඟට ප්‍රාදේශීය කළමනාකරුවන් දෙන්නෙක් ගන්න සම්මුඛ පරීක්ෂණ තිබුණා. හැබැයි, පළමුවැනියා බාහිර අයදුම්කරුවෙක්. ඒ නිසා එයා ආවේ නැහැ. ඊළඟට දෙවැනියා, තුන් වැනියාගෙන් එක්කෙනෙක් බාහිර අයදුම්කරුවෙක්. එයත් කලින් රජයේ සේවයෙන් අයින් වුණු කෙනෙක්. ඒ නිසා එයාට එන්න බැහැ. අනික් කෙනා ආයතනයේ හිටපු කෙනෙක්. හැබැයි, එයාගේ පත්වීම දුන්නේ නැහැ. වානක ලංකානන්ද කියලා. ඊළඟට තුන්වැනියා අභ්‍යන්තර අයදුම්කරුවෙක්. එතුමාට දුන්නෙත් නැහැ. එහෙම තිබෙද්දී හත් වැනියාට පත් වුණු කෙනා තවම වැඩ බලනවා. සම්මුඛ පරීක්ෂණයේ හත් වැනියා වුණු කෙනා වැඩ බලනවා.

මම දන්නේ නැහැ ඇයි මෙහෙම වෙන්නේ කියලා. ඔබතුමාට මීට කලින් මේක කිව්වා. ඒ නිසා මේක ඔබතුමාගේ පොතේ ලියා ගත්තාට වැඩක් නැහැ. ගරු ඇමතිතුමා, ඔබතුමාට අපි හරි ආදරෙයි. නමුත් ඇත්ත කතන්දරය මේකයි. දැන් බලන්න බොරැල්ලේ Area Manager විශ්‍රාම ගියා. එයාව දික් කළා. ඇයි මේ තවත් කෙනෙකුට අවස්ථාව දෙන්න බැරි? හැබැයි, ඔබතුමාට කිව්වාම, ඇත්තටම වැඩ කරන, අර බැස්ටියන් මාවතේ වැඩේ වෙනුවෙන් සැහෙන්න මහන්සියක් ගත්ත, ඒ.ඩී. අලස්ට දෙන්න කිව්වාම කිව්වා, ඒ.ඩී. අලස්ට දෙන්න බැහැ. සභාපති විරුද්ධයි කියලා කිව්වා. මම දන්නේ නැහැ සභාපති ඉන්නවාද කියලා. සභාපති හිටියත් මට කමක් නැහැ. ඔය චණ්ඩිකම්වලට නම් අපි භය වෙන්නේ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ වාගේ බරපතළ කාරණා තිබෙනවා මේකේ. මේ ආයතනය විනාශ කරලා තිබෙන්නේ. දැන් බලන්න මම මීට කලිනුත් මතු කළා. මොකක්ද? නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය). අවශ්‍ය සුදුසුකම් සපුරා නැත. මේ විගණන වාර්තාවක් තිබෙනවා. මෙතුමාට අ.පො.ස. (සා.පෙළ) අවශ්‍ය සුදුසුකම් නැහැ, කලින් තනතුර ගන්නත්. කලින් තනතුර ගන්නත්

අවශ්‍ය සුදුසුකම් නැහැ. ගණිතය සමත් නැහැ. වැඩ පහයි සමත්. එහෙම පුද්ගලයෙකුට කොහොම හරි අවසානයේ මොකක්ද දෙන්නේ? නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුරට පත් කරනවා. මේක ඔබතුමාට කලින් කිව්වා. මොකක්ද මේ සුදුසුකම? පරීක්ෂණ මණ්ඩලයකින් මෙයා වැරදි කාරයා කරපු කෙනෙක්. සුදුසුකම එකම දේ තමයි. ප්‍රසන්න සෝලංගආරච්චිගේ ඉඳුල් කෑම. මම කියන්නම් ඇත්ත. මම භය නැහැ මේවා කියන්න. ඒ නිසා කරුණාකරලා මේවා වහාම නිවැරදි කරන්න. දැන් මිනිහාගේ පරපුරම දා ගෙන.

ගරු සභාපතිතුමනි, අපට අපේ කෙනෙක් රස්සාවකට දා ගන්න බැහැ. අපි ලැජ්ජා වෙනවා, පාරේ බැහැලා යන්න. හැබැයි, මේ නීති විරෝධී විධියට පත් කරපු සාමාන්‍යාධිකාරී පරපුරම දාගෙන. මට අර කෙනෙක් කිව්වා. සේවකයෙක් කිව්වේ. වෙන කවුරුවත් නොවෙයි. මම භය නැහැ මේවා කියන්න. සේවකයෙක් කිව්වා, එයාගේ අම්මයි නංගියි විතරයි නැත්තේ. අනික් ඔක්කොම දැන් අධිකාරියේ වැඩ කරනවාය කිව්වා. ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, ඒ ගැන පොඩ්ඩක් සොයලා බලන්න. අපටවත් රස්සාවකට දාන්න දුන්නේ නැහැ තවම. මම පළාත් සභාවේ සභාපති.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඊළඟට බලන්න, දැන් අත යට Permit දෙනවා. ඔබතුමා දන්නේ නැහැ. සල්ලි අරගෙන Permit දෙනවා. මම වගකීමෙන් කියන්නේ. මම ඒකත් කියන්නම්. NF – 8836. මාර්ග අංක 189 නිට්ටඹුව - කොළඹ. පර්මිට් එකක් තිබෙනවා. සභාපති මේවා දෙන්නේ. දැන් මේකට කියයි ටෙන්ඩරය දුන්නා කියලා. පරණ ටෙන්ඩර්වලට අලුතෙන් දුවන්න දෙන්න බැහැ, ගරු සභාපතිතුමනි. ඒක නිකම් මහා විකෘතියක්. ඒ නිසා පරණ ටෙන්ඩර් එකට මේ අවුරුද්දේ බස් දාන්න දෙනවා නම්, මේක බරපතළ ප්‍රශ්නයක්.

ඊළඟට මම කියන්නම් ගරු සභාපතිතුමනි. පරිපාලන නිලධාරී (ධාවන). සම්මුඛ පරීක්ෂණය අවලංගු කරන්නය කියලා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් දුන්න නියෝගයක් තිබෙනවා. නියෝගයට මාස පහයි. නියෝගය දුන්නේ කවදාද? 2017.05.02 වැනිදා. දැන් මාස හතක්. තවම මේක ක්‍රියාත්මක කරන්න සභාපති අසමත් වුණා. ගරු ඇමතිතුමා දන්නවා මේවා. එතුමා නොදන්නවා වෙන්න බැහැ. හැබැයි, හරිම කනගාටුයි. මම දන්නවා. ඔබතුමා මේ දේශපාලන බල අධිකාරියට යටත් වෙන්න එපා. අනික් එක ඔබතුමන්ලා ඉන්නේ එකම පක්ෂයේ. ඔබතුමා ඇමතිවරයා. මතක තියා ගන්න. ඔබතුමාට මහා විශාල බලයක් තිබෙනවා. අඩුම ගණනේ ඔබතුමාට ඒකවත් ක්‍රියාත්මක කර ගන්න බැරි නම්, ඔය සභාපතිලා පත් කරපු ඒ බල අධිකාරියට ගිහින් කියන්න අනේ මගේ වැඩේ කර ගන්න දෙන්නය කියලා. නැත්නම් ඔබතුමා ඇත්තටම - සමාවෙන්න. මේක මම කියන්න ආස නැහැ. ඔබතුමා හොඳ ඇමතිවරයෙක්. ඉල්ලලා අස් වෙනවා කියන්න නැත්නම්. අස් වෙන්න. මෙහෙම කරන්න බැහැ නේ? ආයතන විනාශ වෙන්න දෙන්න බැහැ නේ? අවසානයේදී ඔබතුමාගේ නමයි මේකෙන් සවුත්තු වෙන්නේ.

කරුණාකරලා බැස්ටියන් මාවත - මේ සභාවට ආපු දවසේ ඉඳලා මම කියනවා. බැස්ටියන් මාවත ගන්න. අධිකාරියට මාසයකට ලක්ෂ 25 ක් අහිමි වෙනවා. මාසයකට ලක්ෂ 25 ක්. මොකද වෙන්නේ? යනවා. කියන දේ අහගෙන ආපහු හැරිලා එනවා. ආයතනය ගොඩ නගන්න මෙහෙම නම් හරි අමාරුයි. අපි කියනවා, මේ පළාත් සභාවේ ලාභය උපයන්න ඕනෑ. අපි දන්නවා. ඔබතුමා උද්වේගකර විධියට වැඩ කරන ඇමතිවරයෙක් නොවෙයි. හැබැයි, ගරු ඇමතිතුමනි, මේවාට කෙලින් තීරණ ගන්න ඕනෑ. නැත්නම් මේක හරි අමාරුයි. දැන් ඔබතුමාගේ අතිනුත් වැරැද්දක් වෙනවා. මොකක්ද සරත් කීර්තිරත්නගේ පුතා මහජන සම්බන්ධතා නිලධාරී, පරිපාලන නිලධාරී (ධාවන) දුන්නා. සම්මුඛ පරීක්ෂණ නැහැ. සුදුසුකම් පිළිබඳ නොවෙයි. අඩුම ගණනේ මානව හිමිකම් නියෝගත් තිබෙනවා, සම්මුඛ පරීක්ෂණ තියන්න කියලා. මේකට ඔබතුමාගේ මැදිහත් වීමක් තිබෙනවාද නැද්ද කියලා මම දන්නේ නැහැ. එහෙම තිබෙද්දීත් මේවා ක්‍රියාත්මක කරනවා. මම වෙනම කියන්නම්. කීර්තිරත්නලාගේ කතන්දර වෙනම තිබෙනවා. දැන් මේ බඳවා ගැනීම් පටිපාටි වෙනස් කරන්න හදනවා, මේවා සාධාරණීකරණය කරන්න. හැබැයි, ආණ්ඩුකාරතුමා නම් නොමග යවන්න දෙන්නේ

නැහැ සභාපතිතුමනි. මම ආණ්ඩුකාරතුමාට ලියනවා. සභාපතිවරුන්ට ඕනෑ විධියට, ඔබතුමා නොදැන ආණ්ඩුකාරතුමාත් නොමග යවලා, දැන් මේ බඳවා ගැනීම් පටිපාටි වෙනස් කරන්න හදනවා. කොන්දොස්තර ලයිෂන් දෙනවා. හොර ලයිෂන් එකක්. රුපියල් පන් දාහයි ලයිෂන් එක. එළියේ ගන්න පුළුවන්. කරපු මිනිස්සුත් මම දන්නවා. තාමත් කෙරෙනවා. කවුද අල්ලන්නේ? අල්ලන්න කෙනෙක් නැහැ. මේක බරපතළ තත්ත්වයක්. CTB එකෙන් ගෙනැල්ලා පුහුණු කරනවා. ඔබතුමාම කල්පනා කරලා බලන්න මේවායේ වටිනාකමක් තිබෙනවාද කියලා. ඒ නිසා මේවා හරි බරපතළ තත්ත්වයන්. මේවා වෙනස් කරන්න.

ඊළඟට අපේ ගරු මන්ත්‍රීතුමා මතු කළා. සණස කොටිකාවත්ත ප්‍රශ්නය. තවම පරීක්ෂණ ගැන දන්නේ නැහැ. මම පැමිණිල්ල දාපු මන්ත්‍රීවරයා. අද වනකල් දැනුම් දීලා නැහැ ගරු සභාපතිතුමනි, මොකද වුණේ කියලා. වත්තෙගෙදර සමිතියේ ප්‍රශ්නය. ඒ මිනිස්සු වෙනුවෙන් අපිත් මැදිහත් වුණා. මන්ත්‍රීවරු හැටියට අපි කිහිප දෙනෙක්ම එළියේ ගිහින් කථා කළා නේ? අද වනකල් මුකුත් වෙලා නැහැ. ඊළඟට කොළොන්නාවේ සමූපකාර ප්‍රශ්න තිබෙනවා. අද කොළොන්නාව සමූපකාරයේ සභාපතිවරයා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීගේ පස්සේ යනවා. ඔබතුමන්ලාගේ හිතවත්තු. ෂේප් වෙන්න. මොකද, ඊළඟ ඡන්දය වෙන කොට පුටුව අහිමි වෙයි කියලා. දැන් ගරු සභාපතිතුමනි, මේවා වෙන්න බැහැ.

ත්‍රිරෝද රථ ප්‍රඥප්තියක් හදන්න කිව්වා. මුකුත් වුණේ නැහැ. ඒවා එහෙම්මම අතරමග නතර වෙලා. ඊළඟට රැට බස් දාන එක. අපි මේවා මේ සභාවේ මතු කරපු ප්‍රශ්න. ගරු සභාපතිතුමනි, ඒ වැඩේ එහෙම්මම නතර වෙලා. දැන් බලන්න. බස් නැවතුම්පල ඉදි කරනවාය කිව්වා. අවුරුදු දෙකක්ම දැන් මම මේ බොරුව - මේකේ ළඟ එන කොටත් කිව්වා. මන්ත්‍රීතුමා, ඔබතුමාගේ බස් නැවතුම්පල හරි. පොලීසියෙන් එපා කිව්වා කියනවා. මම කිව්වා, පොලීසියෙන් එපා කිව්වා නම්, ලිඛිතව ඉල්ලන්න. මට ගේන්න ලියුම. පොලීසියෙන් එපා කිව්වා නම්. වැල්ලම්පිටිය බස් නැවතුම්පල හදන්න. එහෙම එපා කියන්නේ නැහැ. එතැන තිබුණු බස් නැවතුම්පල. මම කිව්වා ලොකු දෙයක් එපා. මිනිස්සු දිවා රෑ තෙමෙනවා. මෙතැනට බස් නැවතුම්පලක් හදලා දෙන්නය කියලා. මගේ ප්‍රතිපාදන වෙන් කළා ගරු සභාපතිතුමනි. ඒ පාර කිව්වා මේක හදන නිසා, ඒවා ඕනෑ නැහැ කියලා. අන්තිමට ඒකත් නැහැ. මේකත් නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමනි, මේවා ගැන අවධානය යොමු කරන්න.

මම ඔබතුමාගෙන් දිගින් දිගටම ඉල්ලුවා, සමූපකාර ඡන්දය. අනික් එක දේශපාලන හේතු මත කිසිදු ඇමතිවරයෙකු හෝ මහ ඇමතිවරයා හෝ වෙනත් දේශපාලන අධිකාරියක ඕනෑකම මත මෙතැන ඉන්න කිසිම කෙනෙක් සමූපකාරවලට ඇතුළත් කරන්න එපා කියලා. දැන් සාමාජිකයෝ. අධ්‍යක්ෂ මණ්ඩලවලට ඇතුළත් කරන්න එපා කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එහෙම දාපු නිසා තමයි මෙහෙම වෙලා තිබෙන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

දැන් තව වැඩක් වෙනවා. දැන් ඉන්න දේශපාලන අධිකාරිය balance කරන්න සභාපතිවරු මොකක්ද දන්නවාද කරන්නේ? ඒගොල්ලන්ගේ මිනිස්සුන්ට ණය දෙනවා. කථා කරලා කිව්වාම සභාපතිතුමා මම අහවලා. මගේ එක්කෙනෙක් එනවා. එයාට ණයක් දෙන්න. ණය දෙනවා. ඒ නිසා මේ ආයතන විනාශ වෙනවා. අපේ ගරු මන්ත්‍රීතුමා කියපු කථාව ඇත්ත. මේවා ඔක්කොම මීයෝ කාලා තිබෙන්නේ දැන්. ඒ නිසා මේවායේ කිසිම පරිපාලනයක් නැහැ. අධීක්ෂණයක් නැහැ. සොයා බැලීමක් නැහැ. පසු විපරමක් නැහැ. ඒ නිසා මේ ගැන වැඩි අවධානයක් යොමු කරන්නය කියලා ඉල්ලනවා.

ඊළඟට මට මතක් වෙනවා. අපේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා එක සැරයක් මේ වාගේම අයවැය විවාදයකදී කිව්වා. ගරු සභාපතිතුමනි, නයා වුණත් පෙනය පිප්පුවේ නැත්නම් වැඩක් නැහැ, දරමිටියට තියලා බඳිනවා කියලා. මේක තමයි අපේ ඇමතිතුමාට වෙලා තිබෙන්නේ. මේක තමයි ඇමතිතුමාට වෙලා තිබෙන්නේ. එතුමා දන්නවා ප්‍රශ්නය. හැබැයි, එතුමාට විසඳුමක් දී ගන්න බැරිව ඉන්නවා. ඊළඟට අපේ මන්ත්‍රීතුමාත් මතු කළා. ග්‍රාම සංවර්ධන ප්‍රශ්න තිබෙනවා. දැන් ග්‍රාම සංවර්ධන සමිති වැඩේ. මේක හම්බ කරන වැඩක්. දැන් මම දුන්නා

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

කොන්ත්‍රාත්තුවක්. අපේ පාරක කොන්ත්‍රාත්තුවක්. ඒ කොන්ත්‍රාත්තුව දීලා තිබෙන ග්‍රාම සංවර්ධන සමිතිය ගැන බරපතළ චෝදනා තිබෙනවා. මම දන්නේ නැහැ. මිනිස්සු අපට ඇවිල්ලා කියනවා. මේගොල්ලෝ තනිකර ග්‍රාම සංවර්ධන සමිතියෙන් බිස්නස් කරනවා. සොයලා බලන කොට ගොඩක් ග්‍රාම සංවර්ධන සමිතිවලින් මේක තමයි කරන්නේ. කිහිප දෙනෙකුගේ ව්‍යාපාරයක්. ඒ නිසා මේ ග්‍රාම සංවර්ධන සමිති ශක්තිමත් කරන්න. මම ඊළඟට මෙතුමාගෙන් ඉල්ලුවා. ග්‍රාම සංවර්ධන නිලධාරීන්. ඒ නිලධාරීන් ඉතාමත්ම අත්තනෝමතික විධියට වැඩ කරන්නේ. විශේෂයෙන්ම කොලොන්නාව භාරව වැඩ බලන්න දාලා තිබෙනවා නිලධාරියෙක්. ඔබතුමාට මම කිහිප වරක් දුරකථනයෙන් කිව්වා. අධ්‍යක්ෂතුමාට, ගුණපාල මහත්තයාට කිව්වා, කරුණාකරලා මේක විසඳන්න. ඔබතුමන්ලා කියනවා දාන්න නිලධාරීන් නැහැ. අඩුවක් තිබෙනවා. නිලධාරීන් නැහැයි කියනවා. මේවා පරිපාලනයට හසු කර ගන්න ඕනෑ ඇමතිතුමනි. නැත්නම් අමාරුයි මෙහෙම ඉස්සරහාට යන්න.

ගරු සභාපතිතුමනි, ඊළඟට මම එතුමාට ගිය අවුරුද්දේ පෙන්වලා දුන්නා, පාරවල්වල ප්‍රශ්නය ගැන. මේ සැරේ PSDG වලින් දිස්ත්‍රික්ක තුනේ බෙදී යාමේ යම් සාධාරණයක් තිබෙනවා. සමහර වෙලාවට කළුතරට ටිකක් වැඩි වෙන්න පුළුවන්. එහෙම වෙන්න හේතු තිබෙනවා. මොකද, සමහර පාරවල් කැඩිලා. ගං වතුර නිසා හෝ කවර හෝ හේතුවක් නිසා. ඒ නිසා බෙදී යාමේ විෂමතාවය - ලොකු විෂමතාවයක් නැති බව පේනවා. නමුත් PDGවල යම් යම් ගැටළු තිබෙනවාය කියලා - මේ සියලු වාර්තා මගේ ළඟ තිබෙනවා. මේ අවුරුද්දේ කරපු සියලු වාර්තා, තොරතුරු. මම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අපේ මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරීතුමා, බණ්ඩාරනායක මහත්තයා ගොඩක් උදව් කරනවා. එතුමාගෙන් විස්තරයක් ඇහුවොත් එතුමා හංගන්නේ නැහැ. මොකද, හංගන්න දෙයක් නැහැ. ඒ උගත් නිලධාරීන්. අපට උදව් කරනවා. ලේකම්තුමියගෙන් වාර්තා ලැබෙනවා. එතුමියත් ඉක්මනට වාර්තා ටික එවලා තිබුණා. ඒ ගැන සතුටු වෙනවා. ඔබතුමාගේ සභාපතිවරු වාගේ නොවෙයි. ඒ වාගේම හැමෝම මතක් කළා කිත්සිරි සහ වසන්ත. නිරන්තරයෙන් උදව් කරන නිලධාරීන්. ඒ අය මතක් කළේ නැත්නම්, අසාධාරණයක් කළා කියලා හිතනවා.

ඒ වාගේම මම ඔබතුමාට මීට කලින් ප්‍රශ්න අහලා යොමු කරලා තිබුණා. දැන් බලන්න වත්තල ඇවරියවත්ත ඉඩම. කීර්තිරත්නලාගේ වැඩ තමයි මේවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඔබතුමා මගින් ආදරයෙන් ඉල්ලා සිටිනවා. අනේ ඇමතිතුමනි, මේවා වෙන්න දෙන්න එපා. මේවා අත යට වැඩ. පනස් අට කෝටි විසි අට ලක්ෂයකට ඉඩමක් ගත්තා. ගන්න පුළුවන් ගණනට වඩා ලක්ෂ හතක් වැඩියෙන් පර්චස් එකක් ගත්තේ. මුළු ගණන කෝටි පනස් අටයි. පනස් අට කෝටි විසි අට ලක්ෂයයි. වැඩේ තිබෙන්නේ ඒක නොවෙයි. මේක ගන්න පුළුවන් ලක්ෂ විස්සට නම්, ගන්නේ ලක්ෂ විසි හතට. එහෙම නම් එක පර්චස් එකකින් ලක්ෂ හතක් අත යට ගිහින් තිබෙනවා. පර්චස් 220 යි. ගරු සභාපතිතුමනි, වත්තල ඇවරිවත්ත ඉඩම. බැංකු සංගමයෙන් ගන්නේ. අනේ ඇමතිතුමනි, මෙහෙම වෙන්න දෙන්න එපා. කැමති වුණත්, අකමැති වුණත් අපට ඔබතුමා ගැනත් එතකොට සැක කරන්න වෙනවා නේ? සාධාරණයි නේ? හරිද? ඒ නිසා මේවා වෙන්න දෙන්න එපා. අපි හැමදාම ඔබතුමාට ප්‍රශ්න කියනවා. ඔබතුමා අපේ වැඩ කරලා දෙනවා. ඒක ඇත්ත. ඔබතුමා හොඳ ඇමතිවරයෙක්. හැබැයි, නිලධාරීන්ට, සභාපතිවරුන්ට අත්තනෝමතික විධියට දඟලන්න දෙන්න එපා. කරුණාකරලා ඒවා වහාම වළක්වන්න. දැන් අපි ගිය අවුරුද්දෙත් මේ ප්‍රශ්න ගොඩක් මතු කළා. මේ අවුරුද්ද ඇතුළත මතු කරපු ප්‍රශ්න ඔබතුමාට විසඳන්න බැරි වෙලා තිබෙනවා. විසඳුමක් නැහැ. සමහර පුංචි පුංචි දේවල් ඔබතුමා කළා කිව්වා. විසඳුවා කිව්වා. හැබැයි, සමස්තයක් හැටියට ගත්තාම ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්න ටික විසඳන්න අඩුම ගණනේ තව ඉතාම ටික කාලයයි අපට තිබෙන්නේ. නැත්නම් මේ ආයතන විනාශ කරලා භාර දෙන්න ඉඩ තියන්න එපා. ගරු සභාපතිතුමනි, ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මගේ කථාව අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා.

[පූ.භා. 10.03]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයේ අපේ ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු විධියට අදහස් ඉදිරිපත් කරන්න ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. විශේෂයෙන්ම මේ අයවැයේදී මම බොහෝ වෙලාවට අදහස් ඉදිරිපත් කරන්න ගියේ නැහැ, යම් යම් ගැටළු සහගත තත්ත්වයන් තිබුණු නිසා. නමුත් අපි නියෝජනය කරන අමාත්‍යාංශය නිසා යම් ගැටළු තිබුණා වුණත්, අදහස් ඉදිරිපත් කළ යුතුයි කියලා මම හිතුවා. ඒ නිසා තමයි අද මේ අවස්ථාව ලබා ගත්තේ. විශේෂයෙන්ම මුලින්, කවුරුත් කියනවා වාගේ ඇමතිතුමාගේ හොඳත් කියන්න ඕනෑ නේ? නැත්නම් අර මන්ත්‍රීතුමා කිව්වා හැමෝටම කිව්වා කියලා. මගේ නම් හැමෝටම කියන බණේ නොවෙයි. කෙළින් කියන්න තිබෙන දේ කියනවා. ගරු ඇමතිතුමාගේ හොඳත් තිබෙනවා. පොඩි පොඩි අඩුපාඩුත් තිබෙනවා. ඒකත් කියන්න වෙනවා. හොඳ වාගේම. සාමාන්‍ය භාෂාවෙන් කියනවා නම් එහෙම ඇමතිතුමා මනුස්සයෙක් විධියට ඉතාම හොඳ කෙනෙක්. ඇහුම්කන් දෙනවා. කථාබහ කරන්න පුළුවන්. ප්‍රශ්නයකට යම් උත්තරයක් දෙන්න උත්සාහ කරනවා. ඒ හැම කාරණාවකදීම අමාත්‍යතුමා අමාත්‍යවරයෙකුගේ මට්ටමිනුත් බැහැලා යම් දේවල් කරනවා. ඒ නිසාම තමයි ඔබතුමාගේ අමාත්‍යාංශය තුළ ඉදිමින් අපි ඔබතුමාට සහයෝගය දෙන්නේ. යම් යම් ගැටළු තිබුණා වුණත්. විශේෂයෙන්ම ගරු ඇමතිතුමනි, ඒ ඔබතුමාගේ හොඳ තවදුරටත් තියා ගෙන ඇහුම්කන්දීම සහ මේ මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කරලා කටයුතු කිරීම තුළ තමයි ඔබතුමාට යම් මට්ටමකට නිලධාරීන්ගේ පැත්තෙන් ආපු ගැටළු වෙන්න පුළුවන්, දේශපාලනිකව ආපු ගැටළු වෙන්න පුළුවන්, අනික් මන්ත්‍රීවරු ඒ සම්බන්ධව විරෝධය අඩු කර ගන්නේ, ඔබතුමා තුළ තිබෙන ඒ හොඳ මනුස්සකම් නිසා.

ඒ වාගේම ඔබතුමාගේ තිබෙන පොඩ්ඩ අඩුපාඩු කිහිපයකුත් මට මතක් නොකර බැහැ. විශේෂයෙන්ම මේ සමහර කාරණා පිළිබඳව ඔබතුමා වැඩි අවධානයක් යොමු කරන්නේ නැහැ. ඒවා යන්නම් වාලේ - දැන් මේ සමහර මන්ත්‍රීවරු වැඩි අවධානයක් යොමු කරලා කිව්වෙත්, ඒවා යන්නම් වාලේ යන්න අත අරිනවා කියලා. කාලය සීමිත නිසා මම ගොඩක් කාරණා කියන්න යන්නේ නැහැ. දැන් සමූපකාර ක්ෂේත්‍රය ගත්තාම, පොදුවේ රටේ ගත්තත් සමූපකාර වැටිලා. ඒක සමස්තයක් විධියට ඔබතුමාට තනිවම නගා සිටුවන්න බැහැ. සමූපකාරය, එදා අපි කුඩා කාලයේ තිබුණු ව්‍යාපාර එක්ක ගත්තාම, අපේ තිබෙන මේ වෙළඳපොල ආර්ථිකයත් එක්ක සමූපකාරය රාජ්‍ය අංශයේ සහාය, ශක්තිය දීලා ගෙනියන්න අද හරි අමාරුයි. හැබැයි, ඒ සියල්ලත් එක්ක අද රටත් වඩා සමූපකාරවලට දූෂණය, අක්‍රමවත් භාවය, වංචාව ඇතුළු වෙලා තිබෙනවා. එතකොට පරිපාලන මට්ටමින් ඇති වන අවුල් සහගත තත්ත්වයන් නිසා සමස්ත සමූපකාර ව්‍යාපාරයම විනාශ වෙමින් තිබෙනවා. දැන් සමූපකාර ව්‍යාපාරයේ මූලික තේමාවක් විධියට තිබෙන්නේ, "*එකා සැමටත් - සැම එකාටත්*" කියන කාරණය. හැබැයි, එහෙම නැහැ. මේකේ තිබෙන්නේ, එකා සැමට නොවෙයි. එකෙක්, දෙන්නෙක් ඉඳගෙන මේක කමින් ඉන්න තැනට සමූපකාර ව්‍යාපාරය පත් වෙලා තිබෙනවා ගරු ඇමතිතුමනි.

බස්නාහිර පළාත ගත්තාම විශේෂයෙන් මා නියෝජනය කරන කඩුවෙල ආසනයේ සමූපකාර දෙක ඉතා හොඳට තිබුණා. විශේෂයෙන්ම බස්නාහිර පළාතේ පළමුවන ස්ථානය කඩුවෙල සමූපකාර සමිතියට තිබුණා. ආසියාවේ තිබෙන වී මෝල්වලින් හොඳම වී මෝලක් කඩුවෙල සමූපකාර සමිතියේ තිබුණා. සහල් නිෂ්පාදනය සහ අනෙකුත් කටයුතුවලදී ඒ සමූපකාර සමිතිය ශක්තිමත්ව තිබුණා. අද වන කොට මේ සමූපකාර සමිතිය විශාල වශයෙන් බිමට සමතලා වෙලා තිබෙනවා. මම මාස කිහිපයකට කලිනුත් මේ නිලධාරී මහත්වරුන්ට කිව්වා, මේ සම්බන්ධව සාකච්ඡාවක් දෙන්න. මොකද, මට පුද්ගලිකව දේශපාලන ප්‍රශ්න තිබෙන අය සිටියාය කියලා, ඒ දේශපාලනය කථා කරන්න මම මේ වෙලාව ගන්නේ නැහැ. එහෙම අවශ්‍යතාවයක් නැහැ. සමූපකාරය පුද්ගලිකව යම් කෙනෙකු එක්ක තිබෙන ප්‍රශ්නයක් නිසා අතහරින්න හෝ ඒ වෙනුවෙන් වැඩියෙන් චෝදනා කරන්න ඕනෑකමක් නැහැ. නමුත් මේ සමූපකාර ව්‍යාපාරය

[ගරු ජගත් කුමාර]

කියන්නේ, සාංඝික දේපළ වාගේ දෙයක්. මේකෙන් කාලා හැදෙනවා කියන්නේ, ඒක සහගහන අපරාධයක්. මේක අපේ මුතුන් මිත්තෝ ආරක්ෂා කරපු ව්‍යාපාරයක්. නමුත් මේ සමූපකාරය, විශේෂයෙන්ම කඩුවෙල සහ බත්තරමුල්ල සමූපකාර අද ඉතාමත් විනාශයට පත් වෙලා. දේශපාලන නියෝජිතයෝ තමයි අද අර කියපු විධියට ඉන්නේ. අද ඡන්දයෙන් ආපු අය ඉවත් වෙලා. මේක ඔබතුමා අහන්න ඕනෑ චෝදනාවක් නොවෙයි. හැබැයි, ඔබතුමාගේ අර පොඩි අඩුපාඩුවක් තිබෙනවා නේ? ඔබතුමාට ලොකු දේශපාලන බලපෑම්නුත් තිබෙන බව මම දන්නවා. හැබැයි, ඒ වුණත් ඔබතුමා, ඔබතුමාගේ අමාත්‍යාධුරයේ වගකීමත් ඉෂ්ට කරනවා නම් - ඔබතුමාට සතුටු වෙන්න පුළුවන්ද? මගේ කාලයේ කඩුවෙල හරි කොහේ හරි සමූපකාරයක් විනාශයට පත් වෙන්න ඉඩ දුන්නාය කියලා. ඒක අනාගතයේ ඔබතුමාගේ නමට එකතු වුණොත්, ලලිත් වනිගරත්න අමාත්‍යතුමාගේ කාලයේ සමූපකාර කාලාම දැම්මා කියන තැනට ආවොත් ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ දරුවෙකුටවත් දේශපාලනය කරන්න බැරි වෙයි. ඒ නිසා ඔබතුමා කොන්ද කෙළින් තියාගෙන යම් දේශපාලන උපදෙස් දෙනවා නම් ඒගොල්ලන්ටත් කියන්න කරුණාකරලා මේක විනාශ වෙලා. මේකට අත දාන්න එපා. මේක බේරා ගන්න ඕනෑ. ඒකේ ජගත් කුමාරගේ ද, හෙක්ටර් බෙත්මගේ ද, එහෙම නැත්නම් බුද්ධදාසගේ මිනිස්සු ද ඉන්නේ කියලා නොවේ. ඔබතුමා හරියට සමූපකාර ව්‍යාපාරය වෙනුවෙන් වැඩ කරන මිනිස්සු දාන්න. මම කවදාවත් අපේ අය දාන්න කියලා, කියලාත් නැහැ.

ඒ වගේම එහෙම ඕන කමකුත් නැහැ. අපට අවශ්‍ය වෙන්නේ මේ ව්‍යාපාරය විනාශ වෙන එක වළක්වා ගන්නයි. පසුගිය කාල පරිච්ඡේදය තුළම කඩුවෙල හිටපු නගරාධිපතිතුමාගේ ගෝලයෝ දාලා, ඡන්දෙන් පත් වෙලා සමූපකාරය කෑවා. ඡන්දෙ නැතුවත් දැන් අපි ආයේ දීලා තියෙනවා ඒ අයටම, කාගෙන යන්න මේක. අනික් එක, එක සභාපතිවරයෙකුගේ ප්‍රජා අයිතිය අහෝසි කළා මේ නිලධාරීන්. අපි විශාල බලපෑමක් කරලා, චෝදනා ඉදිරිපත් කරලා එක සභාපතිවරයෙකුගේ ප්‍රජා අයිතිය අහෝසි වුණා. වැරදි කරලා. හැබැයි, ඔවුන් දැනටත් යමින් එමින් ඉන්නවා. ඒ වගේම ඔවුන්ට මොකුත් වෙලා නැහැ. දැන් ප්‍රජා අයිතිය අහෝසි වීම විතරයි. ඒ කියන්නේ සමූපකාර ඡන්දයට ඉදිරිපත් වීමට බැහැ. ඊට එහා මොකුත් වෙලා නැහැ. වරදකරු වෙලා නම් ඒවට වෙන දඬුවම් දීලා, එහෙම නැත්නම් මුදල් අයකර ගැනීම් කරලා - මම මෙයට පෙර ඇසුවාම කිව්වා. නැහැ, ඒවා වෙනවා කියලා. අද කථා කළාමත් මම දන්නවා ගහට කපපු ඉනි වගේ මේක මෙතනින් එහාටත් එලෙසම ගලා ගෙන යයි. මේකේ ඡන්දෙන් ඉතින් පත් වෙයි. ඉතින් ඊට පස්සේ මෙතනින් එහාට ඉවරයි. මම හැබැයි ඉතින් ඉල්ලනවා කරුණාකරලා මෙයට වඩා වැඩි මැදිහත් වීමක් කරන්න. මේ ව්‍යාපාරය විනාශ වෙනවා. විශේෂයෙන් මේක අපේ අනාගතය වෙනුවෙන්, දරුවන්ගේ හෙට දවස වෙනුවෙන්, ජාතියේ උන්නතිය වෙනුවෙන් තියෙන්න ඕනෑ. විශේෂයෙන්ම ගංවතුරක් ආපුවාම, ස්වභාවික විපතක් ආවාම, ඔන්න ඒ වෙලාවට සමූපකාරය මතක් වෙනවා. එකෙන් තමයි බඩු ටික දෙන්නේ. අනික් කටයුතු කරන්නේ. හැබැයි ඒ වෙලාවට කර ගන්න. කිරි ටික දොවා ගත්තාට කමක් නැහැ. ඒ එළදෙන ශක්තිමත් කරලා. කන්න බොන්න දීලා හදලා. හැබැයි එළදෙන නාටු වෙලා විනාශ වෙලා යමින් අන්තිමට දොවා ගන්න කිරි ටිකක් එන්නේ නැහැ. ඒ නිසා අවශ්‍ය වෙලාවට ජාතියේ අවශ්‍යතාවයකදී ගන්න පුළුවන් විදිහට සමූපකාර ව්‍යාපාරය පොදුවේ ශක්තිමත් කරන්න. දැන් විශේෂයෙන් කඩුවෙල සමූපකාර දෙක විනාශ වෙමින් තියෙනවා. ඒ ගැන මම නිලධාරීන්ටත් කියනවා. කරුණාකරලා මෙයට වඩා මැදිහත් වෙන්න. ඔබතුමාගේ අවධානය යොමු කරලා කටයුතු කරන්න කියලා.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, ඒ චෝදනාව එක්ක අපට පොදුවේ ගත්තාම දැන් මේ අමාත්‍යාංශයේ තියෙන, මම හිතන්නේ මිනිස්සුන්ට අවශ්‍ය මූලිකම අවශ්‍යතාවයක් විධියට තියෙන්නේ නිවාස. අපේ මූලික අවශ්‍යතාවයක් තමා කෑම් බීම්, ඉඳුම් හිටුම් කියන කාරණා. ඉතින් ඉඳුම් හිටුම් ගත්තාම මේ කාලේ ඉන්න නිවාස අවශ්‍යයි. හැබැයි මිලියන 08 ක විතර මුදලක් තමයි නිවාස අමාත්‍යාංශයට වෙන් වෙලා තියෙන්නේ. ඒක දිගටම ඇවිල්ලා තියෙන මුදලක්. ඒකෙන් මොනවාද කරන්න පුළුවන්? මෙතැන ගරු ප්‍රධාන අමාත්‍යතුමා නැහැ. මම ගියවර නිමල් ලාන්සා ඇමතිතුමා ඉන්න කාලෙත් කිව්වා. මෙයට වඩා මේ නිවාස අමාත්‍යාංශයට මුදල් වෙන් විය යුතුයි. ඔබතුමාගේ ඉන්න නිලධාරීන්, පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් හොඳයි. ඒ වගේම අමාත්‍යාංශයේ අනික් නිලධාරීන්ගෙත් එහෙම ලොකු වැරැද්දක් මම දකින්නේ නැහැ. ඒ අය වැඩ කරනවා. නිවාස කොමසාරිස්තුමිය එහෙම ඉතාම හොඳින්

මේ කටයුතුවලදී අපට මැදිහත් වෙලා යම් යම් දේවල් කරන්න උදව් කරනවා. හැබැයි, ඒ අයට අත දිග ඇරලා වැඩ කරන්න පහසුකම් නැහැ. මුදල් නැහැ. යෝජනා, වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන්න විධියක් නැහැ. ඉතින් නිවාස අමාත්‍යාංශය සම්බන්ධයෙන් ඔබතුමාත් කියනවා නම්, මට වෙන් කරලා තියෙන්නේ, මිලියන 08 යි. එයට වඩා දෙයක් කරන්න බැහැ කියලා. එහෙම බැහැ. මෙයට වඩා අධ්‍යාපන ඇමතිතුමත්, එතුමාට මුදල් වෙන් කරලා නැත්නම්, එතුමත් දැන ගන්න ඕනෑ වෙන් කර ගැනීම පිළිබඳව වැඩ කරන්න. මොකද අධ්‍යාපනය රටේ මූලික අවශ්‍යතාවයක් විධියට තියෙන නිසා. ඒකට වැඩි මුදලක් යවන්න. ඒ වගේම තමා ඔබතුමාගේ පැත්තෙනුත්, මේ නිවාස ප්‍රශ්නය. මාර්ග අරවා මේවා ඔක්කෝම තියෙනවා තමා. හැබැයි නිවාස කියන එක එයට වඩා අපට අත්‍යාවශ්‍ය දෙයක්. මිනිස්සුන්ට තාමත් නිවාස ප්‍රශ්නය තියෙනවා. ඔබතුමා ඉදිරිපත් කරපු වාර්තාවේම තියෙනවා, විශාල ප්‍රමාණයක් අලුතින් හැදෙන ඒවා. කැඩිණු බිඳුනු වහලවල්, හදා ගත්තේ නැති නිවාස. මම ඉලක්කම් හරඹයක යෙදෙන්නේ නැහැ. නමුත් එහෙම තියෙනවා. එහෙම නම් ඒවාට විසඳුම් සොයන්න අපට මුදල් තියෙන්න ඕනෑ. එහෙම මුදල් නැතුව අපට යෝජනා දීලා වැඩක් නැහැ. අපට ඕනෑ තරම් යෝජනා දෙන්න පුළුවන්. අපි දැන් මිනිස්සුන්ට 10,000/-, 20,000/- දෙනවා. මිනිස්සු සමහර විට සීට් 05 ක් අරන් යනවා. නැත්නම් 10 ක් අරන් යනවා. ඉතින් ඉතිරි ටික කර ගන්න බැහැ. ඊට වඩා මුදලක් දීලා හොඳට හොයලා බලලා, මේ කටයුතු කරනවා නම් බස්නාහිර පළාතට - අනික බස්නාහිර පළාත් සභාව කිව්වාම ලංකාවේ අනිත් පළාත් සභා ගත්තාම පාර්ලිමේන්තුවට විතරයි දෙවෙනි වෙන්නේ. එවැනි පළාත් සභාවක තවමත් මෙහෙම අඩු ආදායම් සහ දරිද්‍රතාවයේ මිනිස්සු ඉන්න කොට, ඒවාට පිළියම් යොදන්න අපේ අමාත්‍යාංශයට බැරි නම්, මේ අමාත්‍යාංශය තිබිලා මොකටද කියලා ප්‍රශ්නයක් අපට තියෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, නිවාස අමාත්‍යාංශය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

ඒ වාගේම ඔබතුමා කර්මාන්ත අමාත්‍යාංශය හරහා කර ගෙන යන විශේෂ වැඩපිළිවෙල, ගම්මන්පිල හිටපු අමාත්‍යතුමා පටන් ගත්ත කැඩුණු, බිඳුනු පුටු හදන එක ඉතා හොඳ වැඩපිළිවෙලක්. ඒකට වැඩි අවධානයක් යොමු කරන්න. ඒක එදා ආරම්භ කිරීම තුළ එක් පැත්තකින් පරිසරය ආරක්ෂා වුණා. ගස් කොළන් කපන ප්‍රමාණය අඩු වුණා. තියෙන ඒවාම එකලස් කරලා ගත්තා. අනිත් පැත්තෙන් රජය දරන මුදල් ප්‍රමාණය අඩු වුණා. දෙමාපියන්ට දරන්න තියෙන මුදල් ප්‍රමාණය අඩු වෙනවා. ඒ නිසා ඒ කර්මාන්ත දෙපාර්තමේන්තුව හරහා කැඩුණු පුටුවට දැතේ සවිය කියන වැඩ සටහන යටතේ කරන වැඩ පිළිවෙළ වඩා වැඩියෙන් හැම ආසනයකම, එකක් දෙකක් නොවෙයි. ඊට වඩා වැඩි ප්‍රමාණයක් පාසැල්වල - මොකද පාසල්වල විශාල ප්‍රශ්නයක් තියෙනවා. ඒ ගොල්ලෝ අපට ඩෙක්ස් බංකු අරන් දෙන්න කියනවා. අපට ඩෙක්ස් බංකු අරන් දෙන්න විදිහකුත් නැහැ. ඉතින් තියෙන එක හදා ගන්න උදව් කරනවා නම්, ඒක හොඳයි. හැබැයි, ඒකට මේ තියෙන ප්‍රතිපාදනත් ප්‍රමාණවත් නැහැ. ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරලා කටයුතු කිරීම අත්‍යාවශ්‍ය කාරණාවක්.

ඒ වාගේම තමයි මාර්ග පිළිබඳව කථා කරන කොට, පසුගිය කාලේ පළාත් මාර්ග ගොඩාක් හැදුණා. විශේෂයෙන්ම බැසිල් රාජපක්ෂ හිටපු ඇමතිතුමාගේ කාලයේ විශාල මුදල් ප්‍රමාණයක් පළාත් මාර්ගවලට දුන්නා. දැන් ඒවා ගොඩාක් හැදිලා. හැබැයි, ඒකෙත් දැන් ප්‍රශ්නයක් තියෙනවා. හැදුණු පාරවල් ආයේ කැඩිලා බිඳිලා, යම් යම් ප්‍රශ්ණ ඇති වෙලා තියෙනවා. ඒවා ආයේ හදන්න ඕනෑකම තියෙනවා. 2015 වෙන කොට අපේ ආසනවල එහෙම පාරවල් හදන්න තිබුණේ නැහැ. නමුත් දැන් අවුරුදු 05 කට 06 කට කලින් හදපු ඒවා නැවත වළවල් හැදිලා තියෙනවා. ඉතින් ඒකට මූලික වශයෙන් ප්‍රිමික්ස් ටිකවත් දාලා ඒ වළ වහන්නේ නැති වුනොත්, ප්‍රශ්නයක් වෙනවා. මම පසු ගිය දිනවලත් උපදේශක කාරක සභාවේදී ඔබතුමාට යෝජනා කළා. අපේ මාර්ග. මාර්ගවල ගොඩාක් තදබදයක් ඇති වෙන්න එක හේතුවක් තමයි මාර්ග ගස් කොළන්වලින් වැහිලා. ඉලුක් මානාවලින් වැහිලා. පසු ගිය දිනවල මම කිව්වා, මේ හෝකන්දර ප්‍රධාන පාරට කිට්ටුව. ඒ වගේම අපේ දැඩිගමුව. ඒ වගේ ප්‍රදේශවල මාර්ග, මම මේ නිතර යන පාරවල් දකින කොට පෙනුනේ. ගස් කොළන් වලින් පාරවල් වැහිලා තියෙන්නේ. පාර පළල නැහැ. ඒ නිසා පාරේ තියෙන ඉඩත් එක්ක ප්‍රධාන පාරට ගන්නවා. වාහන වලට අයිනේ ඉඩ නොතබා. එතකොට Traffic එක වැඩිවෙනවා. ඒක නිසා Traffic එක අඩු කරන්න නම් අපේ මාර්ග වැඩි ප්‍රමාණයකට අවශ්‍ය ඉඩ ප්‍රමාණය නිවැරදි විධියට ලබා ගන්න. අවශ්‍ය පිරිසිදු කිරීම්. නිවැරදි කිරීම්.

[ගරු ජගත් කුමාර]

සමහර විට කිව්වාම, කාණුවල පස් අයින් කරනවා. හැබැයි අයින් කරලා, ඒක එහෙම තියෙනවා. ඊට පස්සේ ඊළඟ වැස්සට ආයේ පිරෙනවා. ආයේ අදිනවා. ආයේ පිරෙනවා. එක සෙල්ලමයි කරන්නේ. ඒවා එදා ඇදලා පහුවදාම ගෙනියන වැඩපිළිවෙළක් නැහැ. ඒ නිසා මීට වඩා මේ සම්බන්ධව අදාළ නිලධාරීන් මෙයිට වඩා උනන්දු වෙලා, නිවැරදිව මේ කටයුතු කරනවා නම් මම හිතන්නේ අපේ තියෙන මුදල් වලින් සමහර විට මේවා යම් ප්‍රමාණයකට කර ගෙන යන්න පුළුවන්. නමුත් මේ මාර්ග සම්බන්ධ කාරණා වලදී නිවැරදි කළමනාකරණයක් සිදු වෙන්නේ නැද්ද කියලා ප්‍රශ්ණයක් තියෙනවා. ඔබතුමා ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න.

ඒ වාගේම අතුරු මාර්ග. ප්‍රාදේශීය සභාවට අයිති මාර්ගවල තමයි අපට ගොඩාක් වැඩ කටයුතු කර ගන්න තියෙන්නේ. එහිදී ඔබතුමා අපට දුන්නා යම් ප්‍රමාණයකට උදව්. නමුත් ඒක ප්‍රමාණවත් නැහැ. ඒ නිසා වැඩි මුදල් ප්‍රමාණයක් අතුරු මාර්ගවලටත් යොමු කරලා ඒවා සංවර්ධනය කරන්නත් උදව් කළොත්, මොකද, ගමේ ප්‍රදේශ. මොකද නගර සභා ඡන්ද තිබුනේ නැහැ. දැන් තියන්න ලැස්ති උනාට. අවුරුදු 02 ½ ක් තිබුනේ නැහැ. ඒ නිසා එදා හැදුනු තරම්, නගර සභා පාරවල් හැදුනේ නැහැ. කැඩිලා බිඳිලා එතනම තියෙනවා. පළාත් සභාවට, අපට කියන්න බැහැ නේ අපට මොකවත් කරන්න බැහැ කියලා. විශේෂයෙන් අපි මහජන නියෝජිතයෝ විධියට. ඒ නිසා පළාත් සභාවෙන් හරි එයට උදව්වක් ලැබුනොත්, ඒ කටයුතු සාර්ථකව කර ගෙන යන්න අපට පුළුවන්කම තියෙනවා. ඒ වගේම ඔබතුමාගේ නිලධාරීන්. අද උදෙත් කථා කළා, බස් ස්ටෑන්ඩ් එකක් හදලා තියෙනවා. ඊළඟ බස් ස්ටෑන්ඩ් එක. ඒ ගැන මම ස්තුති වෙනවා. හැමෝම දොස් කියනවාට වඩා. ඔබතුමාගේ පැත්තේ ප්‍රශ්ණයක් ඇති. නමුත් මගේ පැත්තේ ඒක හරි කියලත් මම කියන්න එපායැ. ඒ කාරණාව සිදු වෙමින් තියෙනවා. ඒ ගැන මම මගේ ස්තුතිය පිරිනමනවා.

විශේෂයෙන්ම මේ අමාත්‍යාංශය මේ රටේ දැනෙන අමාත්‍යාංශයක්. මේ දැනෙන අමාත්‍යාංශයෙන් ඔබතුමාගේ ප්‍රමාණයට මීට වඩා දේවල් කරන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. හැබැයි ඔබතුමත් මෙයට වඩා ටිකක් ශක්තිමත් වෙන්න ඕනැ. මෙයට වඩා නායකත්වය අර ගෙන ඉස්සරහට දුවන්න ඕනැ. හොයලා බලලා කරන වැඩ කටයුතු කරන්න ඕනැ. සමහර පාරවල්වල, දැන් මම ඔබතුමාගේ අමාත්‍යාංශයටත් එව්වා, අතුරු පාරවල් වල බස් දුවන්න පටන් ගත්තා. හැබැයි ඒක මාසයයි, දෙකයි. ඇමතිතුමා, නතර වුණා. දැන් අවුරුදු ගණනක් තිබුණා වගේ මිනිස්සු ආයේ දොස් කියනවා. ඔන්න පටන් ගත්තා කෙරිලා නැහැයි කියලා. එක්කෝ පටන් නොගෙන ඉන්න ඕනැ. පටන් ගත්තා නම් අපි යන්න ඕනැ ඇමතිතුමා. එහෙම අතුරු මාර්ග කිහිපයකම බස් ධාවනයට දාලා කඩුවෙල ආසනයෙත් ගැටළු කිහිපයක් මතු වෙලා තියෙනවා. මේ පිළිබඳවත් ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා, කටයුතු කරන්න කියලා මතක් කරමින් අවසාන වශයෙන් ඔබතුමා කර ගෙන යන කටයුතු සාර්ථක වෙන්න වගේම, අපට මෙයට වඩා ලබන වර්ෂය තුළ මිනිස්සුන්ගේ ප්‍රශ්ණ විසඳන්න - පුද්ගලිකව අපි කවුරුවත් වරදාන ගන්න නොවෙයි. මිනිස්සුන්ගේ ප්‍රශ්ණ විසඳලා මේ ජාතියට, රටට ගොඩ නැගෙන්න අවශ්‍ය ශක්තිය බස්නාහිර පළාත් සභාවෙන් ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් මෙයට වඩා ලබා දෙන්න.

ඒ වාගේම විශේෂයෙන්ම සමුපකාර ව්‍යාපාරය ඇතුළේ හොරකම, දූෂණය, වංචාව නවත්වන්න ඔබතුමා නායකත්වය ගන්න. එහෙම ඉන්නවා නම්, අපි ඔබතුමා එක්ක ඉන්නවා. එහෙම නැති උනොත් අපට සමහර විට මීටත් වඩා වැඩි විවේචනයන් කරන්න සිදු වෙනවා. ඒ ගැනත් අවධානය යොමු කරලා කටයුතු කරන්න කියමින් ඔබතුමාගේ ඉදිරි කටයුතු සාර්ථක කර ගන්න අපි සුභාශිංසන පිරිනමනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා අවධානය යොමු කළ නිවාස ප්‍රශ්නය ගැන නම් මම ගරු ඇමතිතුමාට අවධාරණය කරනවා. විශේෂයෙන්ම ගරු ඇමතිතුමනි, පසුගිය වකවානුවලදී කිහිප වතාවක්ම බස්නාහිර පළාතට පැමිණි ස්වභාවික විපත් නිසා, නිවාස පැත්තට මුදල් වැඩිපුර වෙන් කර ගැනීම ඔබතුමාගේ විශාල කාර්ය භාරයක් කියලා මතක් කරනවා.

[පූ.භා. 10.18]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, වෙළඳ, නිවාස ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය. මම හිතන්නේ, මේ පළාත් සභාවේ මහජනතාවට දැනෙන, දැනෙන්න යමක් කරන්න පුළුවන් හොඳ අමාත්‍යාංශයක් තමයි, අපේ ලලිත් වනිගරත්න ඇමතිතුමා කරන්නේ. ඒ පිළිබඳව මේ සාකච්ඡාව කරන අවස්ථාවේදී විශේෂයෙන්ම එතුමා පිළිබඳවත් වචනයක් කථා කරන්න ඕනෑ. ගම්පහ දිස්ත්‍රික්කයේ අපට ඉන්න එකම පළාත් සභාවේ ඇමතිවරයා. ඒ ඇමතිවරයා සාමාන්‍යයෙන් බොහොම නිශ්ශබ්ද පුද්ගලයෙක්. ඒ නිසාම මේ සභාව තුළ ඉන්න පක්ෂ විපක්ෂ හැම මන්ත්‍රිවරයාගේම හොඳ හිත දිනා ගෙන කටයුතු කරන්න, එතුමාට පුළුවන්කම ලැබිලා තියෙනවා. විශේෂයෙන්ම මේ ගෙවෙන අවුරුද්දේදී එතුමාගේ අමාත්‍යාංශය හරහා අපට සාමාන්‍යයෙන් පළාත් සභා මන්ත්‍රිවරයෙකුට වාර්ෂිකව ලැබෙන මුදලට අමතරව අමාත්‍යාංශ මට්ටමින් සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන්න පුළුවන්කම ලැබිලා තියෙනවා. ඒ පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

විශේෂයෙන්ම ජගත් කුමාර ගරු මන්ත්‍රිතුමා නවත්තපු තැනින් පටන් ගන්නවා නම් මෙතන තියෙනවා එතුමාට මේ නිවාස කියන කොටසත්. මේ කොටස පිළිබඳව නම් එතරම් වැඩි අවධානයක් යොමු වෙන්නේ නැහැ. නිර්මාණාත්මක දෙයක්, සංවර්ධනාත්මක වැඩ සටහනක් මේ අමාත්‍යාංශය හරහා යොමු වෙන්නේ නැහැ. එයට හේතුව, වැඩි අවධානය යොමු කරන්නේ පළාත් මාර්ගවලට. පළාත් ප්‍රවාහනයට. ඒ වාගේම සමූපකාරයට. ඒක නිසා එතුමාත් දන්නවා, මම නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල මැතිවරණ කොට්ටාශයේ මට්ටක්කුළිය පාලමෙන් පැන්නාම පෝරුතොටට යනකම්, කොච්චිකඩේ එක දිගටම මුහුදු බඩ තීරය. ඉතාම දුප්පත් අසරණ, එදිනෙදා ජීවිතය සරි කර ගන්න මහ මුහුදත් එක්ක වෙර වීරිය දරණ අහිංසක ජනතාවක් තමයි ඉන්නේ. මේ අය ස්වභාවික විපත්වලට ලක් වුණාම අපි ගිහිල්ලා මොකද කරන්නේ? පොඩි සොච්චමක්, මොනවා හරි ආධාරයක් දීලා ඒ මිනිස්සුන්ව සනසනවා. ඒ මිනිස්සු ජීවත්වෙන සැබෑ තත්වය ගමට ගිහිල්ලා බලනවා නම්, විශේෂයෙන්ම උස්වැටකෙයියාව, දික්ඕවිට, පල්ලියවත්ත පැත්තට ගිහිල්ලා බලනවා නම්, මොන තරම් අසරණ දුක්ඛිත ජීවිතයක් ද ගත කරන්නේ කියන එක පිළිබඳව අපි මේ සභාවලට ඇවිල්ලා කථා කරලා, මේවා හැන්සාඩ් ගත වෙලා, ජනමාධ්‍යයෙන් ගියත් මේ වනතෙක් කිසිම අවධානයක් යොමු වෙලා නැහැ. ඒක නිසා මම ඔබතුමාට යෝජනා කරන්නේ, මේ පළාත් සභාවේ ධීවර අමාත්‍යාංශ වැය ශීර්ෂය කථා කරද්දිත් මම මේ කතන්දරය කිව්වා. ඒ නිසා මේ අමාත්‍යාංශ දෙකත් එක්ක සහ සම්බන්ධතාවයක් ඇති කර ගෙන, මේ නිවාස ප්‍රශ්නයට විසඳුමක් හොයන්න පුළුවන්. ඔය රු. 50,000 ක් දුන්නාට ඒ මිනිස්සු එදාට ඔය පොඩ්ඩක් එහාට මෙහාට කර ගෙන ඉඳියි. එහෙම වැඩ සටහනක් ගැන නොවෙයි මම මේ කථා කරන්නේ. ඉස්සර ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කාලේ ධීවර නිවාස තිබුණා. වෙනම ධීවර ගම්මාන හැදුවා. එහෙම ඒවා තියෙනවා. නමුත් ඒ වැඩසටහන් ඊට පස්සේ එතනින් එහාට නැතුව ගියා. මේක රේඛීය අමාත්‍යාංශයත් එක්කත් සම්බන්ධ වෙලා කරන්න පුළුවන් වැඩක්. ඔබතුමාගේම පක්ෂයේ, සන්ධානයේ මහ ලේකම්වරයා තමයි ධීවර ඇමතිවරයා හැටියට කටයුතු කරන්නේ. ඉතින් ඒක නිසා එතුමාවත් සම්බන්ධ කර ගෙන නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කරන්න. අඩුම තරමින් ගම්පහට. අපි මේ දිස්ත්‍රික්ක තුනට යෝජනා කරලා තියෙනවා නිමල් ලාන්සා ඇමතිතුමා මේ සභාවේ ඉන්න කාලේ, මමමයි යෝජනාව කළේ. මේ ධීවරයින්ට නිවාස හදලා දීමේ වැඩ පිළිවෙළක්. ඔය ගම්මාන තියෙන්නේ, ඒ වගේ හදන්න කියලා. ඒ යෝජනාවත් මේ සභාවේ සම්මත වෙලා හමස් පෙට්ටියට ගිහිල්ලා තියෙන්නේ. මේවා නැවත අර ගෙන මේ දිස්ත්‍රික්ක තුනට නියාමක ව්‍යාපෘතියක් ලෙසටවත්, ලබන අවුරුද්දේ අඩුම ගානේ නියාමක ව්‍යාපෘතියක් ලෙසටවත් මේ නිවාස වැඩසටහන ආරම්භ කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඊළඟට බොහොම කණගාටුවෙන් කථා කරන්න සිද්ධ වෙලා තියෙනවා, සමූපකාර මැතිවරණ පිළිබඳව. සමූපකාර ඡන්ද පිළිබඳව. දැන් මේ රටේ මේ ඡන්ද උණුසුමක් තියෙන කාලේ. දැන් ඉල්ලලා ඉල්ලලා ඉල්ලලා පළාත් පාලන මැතිවරණය ඇවිල්ලා තියෙනවා. හැබැයි අපිට බැරිවෙලා තියෙනවා තාමත් සමහර ස්ථාන වල, සමහර නෙමෙයි. බොහෝ ස්ථාන වල මේ තියෙන සමූපකාර ඡන්ද ටික ඉවර කරලා මහජන නියෝජිතයින්ගෙන් සැදුම්ලත් ආයතන විධියට සමූපකාරය ඒ විදිහට පවත්වා ගෙන යන්න. මේවාට

[ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා]

විවිධ අවස්ථාවලදී ඉදිරිපත් වුණාම, වාරණ නියෝග ඇවිල්ලා, ඒවා කල් දානවා. මේක එච්චර හොඳ දෙයක් නොවෙයි. මේක තමුන්නාන්සේගේ අතේ - බලය කාට ගියත් කමක් නැහැ. කරන්න දෙයක් නැහැ. මේක මහජනතාවගේ ස්වාධිපත්‍ය. මහජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය. දැන් ඡන්දෙන් පස්සේ හරි කමක් නැහැ. මේ පළාත් පාලන ඡන්දය අවසාන වෙලා හරි. මේවාවල ඇත්ත වශයෙන්ම සිද්ධ වෙන දේවල් පිළිබඳව කථා කරන්න කෙනෙක් නැහැ. මහජන නියෝජිතයෙක් නැතුව ගියාම, මහජනතාවගේ සම්බන්ධය නැතුව ගියාම - මේ සමූපකාරය ව්‍යාපාරය ඇත්ත වශයෙන්ම ශක්තිමත් ව්‍යාපාරයක්. අතිවිශාල මුදල් සම්භාරයක් මේ සමූපකාර දෙපාර්තමේන්තුව හරහා තමුන්නාන්සේගේ අමාත්‍යාංශයට තියෙනවා. සංචිත තියෙනවා. මේ පිළිබඳව මිනිස්සු කථා කරනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලනවා. ඔබතුමා පක්ෂ විපක්ෂ භේදයක් බලන්න එපා. කාට මෙහි බලය ගියත් කමක් නැහැ. මේ රටේ බලය මාරු කරන්න පුළුවන්කම තිබුණා නම් 2015 දී අපි හිතපු නැති විධියට. ඒ නිසා මේ සමූපකාරයක් වාගේ තැනක එහෙම බලය මාරු වුණා කියලා මම හිතන්නේ නැහැ එපමණ ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා කියලා. ඒ නිසා කරුණාකරලා මේ මැතිවරණ පවත්වන්න අවස්ථාව ලබා දෙන්නය කියලා කාරුණික ඉල්ලීම කරනවා.

ඊළඟට ඔබතුමාගේ බොහොම වැදගත්ම විෂය හැටියට ගැනෙන්නේ පළාත් මාර්ග. අපි දැක්කා, පසුගිය පළාත් සභාවේදී නිමල් ලාන්සා ඇමතිවරයා මේ සභාවේ මාර්ග ඇමතිවරයා හැටියට ඉන්න කාලයේ මේ පළාත් මාර්ග මහා ප්‍රමාණයක් හැදුනා. ඒ සම්බන්ධ හේතුවක් තිබුණා. ඒ මධ්‍යම රජයේ බැසිල් රාජපක්ෂ ඇමතිවරයාත් එක්ක සම්බන්ධ වෙලා ඒ තියෙන වරප්‍රසාදත් අර ගෙන මේ පළාතේ විශාල වශයෙන් පළාත් මාර්ග හැදුවා. ඒක හොඳ දෙයක්. දැන් මෙතුමා කිව්වා ඒ හදපු ඒවා යම් යම් තැන්වල කැඩිලා තියෙනවා කියලා. ඒවා ඉතින් හදපු එකේ වැරැද්ද වෙන්න ඇති. දේශගුණික විපර්යාසයන් වෙනවා. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. හැබැයි මේ පළාත් පාලන ආයතන සතු මාර්ග කිහිපයක් - මට මතකයි, මම සභාපති ධුරය දරන කාලයේ තමයි වත්තල මැතිවරණ කොට්ඨාශයේ ඔය දැනට පවරලා තියෙන පාරවල් ටික මේ පළාත් සභාවට පැවරුවේ. ඒ කියන්නේ, පළාත් පාලනය සතුව තිබුණු මාර්ග, පළාත් සභාවට පැවරුවා. ඉතින් ඒවා කිහිපයයි තියෙන්නේ. දැන් එතනින් එහාට පවරා ගැනීමක් වුණේ නැහැ. මම හිතන්නේ, දැන් අවුරුදු 15 කින් 20 කින් විතර පළාත් පාලන ආයතන සතු මාර්ග එකක්වත් පළාත් සභාවට අලුතින් පවරා ගෙන නැහැ. මම දන්න විධියට. හැබැයි, තමුන්නාන්සේ අපට ප්‍රතිපාදන ලබා දුන්නාම, මොනවා හරි කිව්වාම, අපි ගිහිල්ලා ඒ දෙන ප්‍රතිපාදන පළාත් පාලන මාර්ගවලට යොදලා ඒ මාර්ග සංවර්ධනය කරනවා. හැබැයි ඊට වැඩිය මේවා පුළුවන් තරම් ගුණාත්මක බවින් වැඩියි. මේ පළාතේ අත්‍යාවශ්‍ය මාර්ග, මම කියන්නේ උදාහරණයක් හැටියට කියපුවාම මේ ප්‍රධාන මාර්ග යා කරන මාර්ග තියෙනවා.

දැන් උදාහරණයක් හැටියට කොළඹ - මීගමුව පාරෙන් නාගොඩ හංදියෙන් රාගමට යන්න තියෙන හොඳම විකල්ප මාර්ග දෙක තුනක් තියෙනවා. එක පාරක් තමයි ඒ කාලේ ඔය අඩි 20 පාර කියලා දැන් ඔය වැලිසර නවලෝක ක්‍රීඩාංගනය අයිනෙන් තියෙන පාර. සෙල්රින් ජයසිංහ මාවත කියලා. ඒක රාගම පාරට සම්බන්ධ කළාම, අර තියෙන මාර්ග තදබදය බොහොම ප්‍රමාණයකින් අඩු වුණා. මොකද මහබාගේ හන්දියෙන් ගිහිල්ලා ප්‍රධාන පාරෙන් යන එක, short cut එකකින් යනවා. අපි හඳුනගත්ත එවැනි මාර්ග කිහිපයක් තියෙනවා. ජා - ඇළ, වත්තල මැතිවරණ කොට්ඨාශයේ තියෙනවා, නාගොඩ හන්දියේ ඉඳලා පේරලන්ද ප්‍රධාන මාර්ගයට වැටෙන පාර. ආනියකන්ද පාර. අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ පියා වන ජෝශප් මයිකල් මැතිතුමා පසුගිය කාලේ එක කොටසක් - ජා - ඇළ කොටස හොඳට කාපට් කරලා තියෙනවා. වත්තල කොටස කාපට් කරන්න සල්ලි හම්බ වුණේ නැහැ. මම පුළුවන් තරම් තමුන්නාන්සේ දුන්නු සල්ලි කිහිපයක් උපයෝගී කර ගෙන කොන්ක්‍රීට් කළා. නමුත් ඒක සෑහීමකට පත් වෙන්න බැහැ. එවැනි මාර්ග හරියට හදපුවාම වෙන්නේ, අර තියෙන මාර්ග තදබදය හුඟාක් දුරට අඩු වෙනවා. ඒවා හොඳට හඳුන ගන්න පුළුවන්. ප්‍රධාන මාර්ග යා කරන අතුරු මාර්ග. ඒ නිසා ඒ පිළිබඳව තමුන්නාන්සෙගෙන් මම අවස්ථාවක් ඉල්ලනවා. ලබන අවුරුද්දේ මට කීයක් හරි දෙනවා නම්, තමුන්නාන්සේ මේ පොඩි පොඩි ඒවා නම් දෙන්න එපා. දෙනවා නම් අර වැලිසර හන්දියේ සිට ඇලෙහිවත්ත පාර ඊළඟට වැටෙන්නෙත් පළාත් සභාව සතු පාරකට. ඒ පාර සංවර්ධනය කරලා දෙන්න ලක්ෂ 25 ක් 30 ක් 40 ක් යයි, වැඩිම වුණොත්. ඒක හොඳට කාපට් කරලා දුන්නාට

පස්සේ, ඒ තිබෙන මාර්ග තදබදය විශාල ප්‍රමාණයකින් අඩු වෙනවා. ඇත්ත වශයෙන්ම පහසුයි. ජනතාවටත් පහසුයි. ඒක නිසා එවැනි මාර්ග පිළිබඳව පළමුව තමුන්නාන්සේ ලැයිස්තුවක් අර ගන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගිය අයවැයේදී ස්තුති කළා නේද?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කොහොමත් මේ අයවැයේදීත් ස්තුති කරනවා. ඇත්ත වශයෙන්ම දුන්නා. අද අපේ නමින් බස් හෝල්ට් එකක් හරි පාරේ තියෙනවා. අපි වාගේ මන්ත්‍රීවරයෙක් ඉන්නවා කියලා හරි පේන්න තියෙන්නේ, ලලිත් වනිගරත්න ඇමතිතුමා ඉන්න නිසා තමයි. ඒ කාලේ තිබුනේ නැහැ ඒවා. ඒවා තිබුණා. අර කිවන් කැබිනට් එක වටේ හිටපු කට්ටියට විතරයි. වෙන කාටවත් දුන්නේ නැහැ ඒවා. ඒක නිසා මම ඕවා කථා කරන්න යන්නේ නැහැ. පසුගිය දේවල් කථා කරලා මේ කාලය නාස්ති කරන්න මම කැමති නැහැ. එතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම කොළඹ මීගමුව පාරේ යන කොට අද වත්තල මැතිවරණ කොට්ඨාශයට එන විට රන්දීර් මැතිතුමාගේ තියෙනවා. නිරෝෂා අතුකෝරළ මන්ත්‍රීතුමීගේ තියෙනවා. සිරිකමල් ෆිලීෂියන් ද සිල්වාගේ තියෙනවා. ජානක සූරියබණ්ඩාරගේ තියෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ශ්‍රීනාත් පෙරේරාගේ නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ශ්‍රීනාත් පෙරේරාගේ නැති වුණාට ඒකට කරන්න දෙයක් නැහැ. මෙරිල් පෙරේරාගේ තියෙනවා. ඉතින් මේ සියල්ල හොඳයි. එතකොට දන්නවා, අඩුගානේ බස් හෝල්ට් එකේ හිටන් ඉන්න මිනිහත් දන්නවා, මේ පැත්තේ ඉන්නවා පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් කියලා. හැබැයි, මම ඉතාම වගකීමෙන් කියන්න ඕනෑ. ඒ හදන බස් නැවතුම්වලවල් ප්‍රමිතියෙන් යුතු හොඳ ඒවා හදන්න. අවස්ථා කිහිපයකදීම හදන්න කලින් කඩාගෙන වැටුණා. ඒකත් කියන්න ඕනෑ. යාන්තම් කොහේ හරි කොනක් වැදුන ගමන් කඩා ගෙන වැටෙනවා. ඒක තමුන්නාන්සේගේ දුර්වලතාවය නොවෙයි. ඒක භාරව කටයුතු කරන අයගේ. ඒ කරන වැඩේ හරියට කරන්න. එතකොට තමයි ඒකේ ගෞරවය තමුන්නාන්සේට ලැබෙන්නේ. ඒ නිසා මම නැවත වතාවක් යෝජනා කරනවා. 2018 වර්ෂයේදී මේ පළාත් පාලන ආයතන සතු මාර්ග කිහිපයක් හෝ මේ පළාත් මාර්ග අමාත්‍යාංශයට පවරා ගෙන, ඒවා සංවර්ධනය කරන්න. එතකොට අපට විශාල වශයෙන් ලොකු අස්වැසිල්ලක් ලැබෙනවා. ඒක නිසා මීට වැඩිය කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

මම ප්‍රවාහනය ගැන කථා කරන්න යන්නේ නැහැ. මොකද මම සමහර ස්ථාන ගැන සෑහීමකට පත් වෙන්නේ නැහැ. දැන් උදාහරණයක් හැටියට ගත්තොත් එහෙම, රාගම - කොළඹ 262 මාර්ගය. දැන් අලුතින් බස් කිහිපයක් දාන්න ඕනෑ කාලය. මම මේ පිළිබඳව යෝජනා ගෙනාවා. ඒවා දාන්න. මොකද, දැන් මේ එකම කණ්ඩායමක් තමයි අවුරුදු ගානක් තිසේ මේක මාෆියාවක් වගේ අල්ලාගෙන කර ගෙන ඉන්නේ. ඒක හින්දා ටෙන්ඩර් කරලා ප්‍රජාතන්ත්‍රවාදීව ඕනෑ කෙනෙකුට කරන්න පුළුවන් විධියට, වැඩ පිළිවෙලක් කරන්න. නැත්නම් මේකේ මුල්ම කාලේ පටන් ගත්ත කණ්ඩායම තමයි ඉන්නේ. ඒ වගේම තමයි ඔය බස් ස්ථාන වල ඉන්න ටයිම් කීපර්ලා. වේලා සටහන්කරුවන්. ඒ පිළිබඳව නම් තමුන්නාන්සේ අවධානය යොමු කළ යුතුමයි. මේක ඉතාමත් දූෂිත තත්වයට පත් වෙලා තියෙනවා. දැන් ඒ මිනිස්සු පුරුදු වෙලා ඒකට. ගිහිල්ලා බලන්න කෝ, ඒ වේලා සටහන්. අපේ ආදායම් තත්වයත්, තමුන්නාන්සේගේ ආදායම් තත්වයත්, ඒ අයගේ ආදායම් තත්වයත් දෛනිකව අරන් බැලුවහොත් එහෙම පළාත් සභා මන්ත්‍රීවරයෙක් වෙනවාට වඩා හොඳයි වේලා සටහන්කරුවෙක් වෙන එක. ඇලකන්ද හන්දියේ, එහෙමත් නැත්නම් රාගම. ඇත්ත වශයෙන්ම තත්වය ඒකම තමයි. මේවා හංගලා කථා කරන්න දේවල් නොවෙයි. ඒවා ඉතාමත් දූෂිත ආකාරයට තමයි සිද්ධ වෙන්නේ. තමුන්නාන්සේ ඒවා පිළිබඳව සොයලා බලන්න. මේ ප්‍රවාහන ක්ෂේත්‍රය - (බාධා කිරීමක්) ඉතින් දෙනවා තමයි. දෙන ක්‍රමය හදලා තියෙන්නේ. ඒ ක්‍රමය හැදිලා තියෙන්නේ. මේවා කථා කරලා ඉවර වෙලා ගෙදර යන්න පුළුවන් වෙයිද දන්නෙත් නැහැ. නමුත් ඒක නොවෙයි කථාන්දරය. ඇත්ත වශයෙන්ම මේවා කවුරු හරි කියන්න

[ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා]

ඕනෑ. ඉතින් මේවා පිළිබඳව සොයලා බලන්න. ඔය ඕනෑවට වඩා කරුණාව පෙන්වන එකේ තේරුමක් නැහැ. තමුන්නාන්සේට කරුණාවකුත් නැහැ ඒකේ. ඒ තමුන්නාන්සේ දාපු මිනිස්සුත් නොවෙයි. ඒකේ මාෆියාවක් තියෙන්නේ. ඒ නිසා ඒ සියලු දෙනාම පිළිබඳව අවධානයෙන් කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. විශේෂයෙන් අපේ ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන එකම ඇමතිවරයා. ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේට අපේ සුභ පැතුම් එක් කරන්න කැමතියි. මේ ගෙවෙන වර්ෂයේදී ඇමතිවරයෙක් හැටියට අපේ තියෙන යම් යම් අඩුපාඩු හදන්න ඔබතුමා ඉතාම හොඳ දායකත්වයක් ලබා දුන්නා. අඩු ගානේ අපට පුටු ටිකක්, හට් එකක් හරි දුන්නා. ඒවාත් අපි අගය කරන්න ඕනෑ. තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් විශේෂයෙන්ම මේ අමාත්‍යාංශයට අපේ කණ්ඩායමේ සහයෝගය ලබා දෙනවා කියලා කියමින් තමුන්නාන්සේ මේ සභාවේ ඉන්න එකම කතෝලික ඇමතිවරයා. තමුන්නාන්සේට සුභ නත්තලක් වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

[පූ.භා. 10.29]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කරන්න ලැබීම සතුටක්. අපි මුලින්ම එතුමාට ස්තුති කරන්න ඕනෑ. මොකද, මමත් මේ සභාවේ යම් යම් කරුණු කාරණා සම්බන්ධයෙන් ඕනෑ තරම් කථා කරලා තියෙනවා. ඒවායේදී එතුමා ඇත්තටම අපට ඉන්න ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක් වශයෙන් සාවදානව ඇහුම්කන් දීලා, කටයුතු කරලා තියෙනවා. ලියුම් කෑල්ලක් ගිහිල්ලා දීලා ඇමතිතුමා මෙන්න මේක කරලා දෙන්න කිව්වත් ඒක අත්සන් කරලා දෙනවා. සල්ලි තිබෙනවා නම් ගිහිල්ලා කර ගන්න කියලා. ඉතින් අපි අගය කරන්න ඕනෑ. මට තිබුණා ප්‍රධාන ප්‍රශ්ණයක්. මගේ ගමේ පාලමක් කඩා වැටිලා. ඒක ලොකු ප්‍රශ්ණයක්ව තිබුණා. මේ වන විට ඒ පාලම ¾ කටත් වඩා ඉදි කරලා තිබෙනවා. ඒ වාගේම මට තවත් ප්‍රශ්ණයක් තිබුණා. අපේ පාලන බලය තිබෙන කාලයේ රන් අරුණ වැඩ සටහන යටතේ පාරක් ගලවලා ඒකේ උද්ඝෝෂණ. සතියකට වරක් උද්ඝෝෂණ. මේ අවුරුදු දෙක තුනේ කාලයක්ම තිබුණා. ගරු ඇමතිතුමාට මම උපදේශක කාරක සභාවට ඇවිල්ලා කිව්වාම, අද වෙන කොට ඒක හදන්න සියලුම දේවල් ඉවු කරලා දැන් අවසන් කරලා තිබෙනවා. ඒක නිසා ඇහුම්කන් දුන්න ඇමතිවරයෙක් වශයෙන් එතුමාට අපේ ගෞරවය පුද කරනවා. ඒ වාගේම අපි එතුමාට - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇමතිතුමා ඇහුම්කන් දුන්නොත් තමයි ඉතින් කථා කරන්න පුළුවන් වෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථා කරන්න. ගරු ඇමතිතුමා, ඔබතුමාගේ අවධානය යොමු කරන්න වෙනවා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ඒ නිසා ගරු ඇමතිතුමාට අපේ ගෞරවය පුද කරනවා. ඒ වාගේම මම මේ ඇමතිතුමාගේ වැය ශීර්ෂය තුළ සියලුම වැය ශීර්ෂ සම්බන්ධව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. එතුමාට මම දොස් කියන්න බලාපොරොත්තු වෙන්නෙත් නැහැ. හැබැයි මම මහා මාර්ග සම්බන්ධව, අපේ මාර්ග සංවර්ධන අධිකාරිය ඇතුළු ඒ අපේ ඇමතිතුමාට මම සුභ පතන්නේ. හොඳ කියන්නේ. ඒ අය වැඩක් කළා. මොනවා හරි වැඩක් කිව්වාම, ඒ අපේ බණ්ඩාරනායක මැතිතුමා ප්‍රධාන ඒ නිලධාරීන්. ඒ අය ඒවාට ඇහුම්කන් දුන්නා. ඒවාට ක්‍රමවේදය හදලා දුන්නා. ඒ වගේම ගරු ඇමතිතුමාත් ඒකට සහාය දැක්වූවා. අදාළ ලේකම්වරු ඒවාට සහාය දැක්වූ නිසා අපි අමාත්‍යාංශයට ඒ ගෞරවය පුද කරන්නට ඕනෑ.

ඒ වාගේම තමයි ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය. මම එනකොටත් කල්පනා කලේ, මම බෞද්ධයෙක්. එතකොට අපේ ඇමතිතුමා, ක්‍රිස්තියානි කෙනෙක් උනත් එතුමා මම දන්නවා බුදු දහමටත් ලොකු ගෞරවයක් තිබෙනවා. අපේ ආගමේ හැටියට තියෙනවා හොඳ දේවල් කළාම අට මහා කුසල් කියලා එකක්. අපට පින් සිද්ධ වෙන කාරණා තිබෙනවා. ගමේ ග්‍රාම සංවර්ධන සමිතියේ දුර්වලතාවයක් තිබෙන්න පුළුවන්. නමුත් ග්‍රාම සංවර්ධන විෂය තිබෙන්නේ ඉතාමත් පුණ්‍ය කටයුතු කරන්න. මිනිස්සුන්ට පාරක් හදලා දෙන එක. මිනිස්සුන්ට නාන ළිඳක් හදලා දෙන එක. බෝක්කුවක්, පාලමක් දාලා දෙන එක. මිනිස්සුන්ට නිවාසයක් හදලා දෙන එක. එහෙම නැත්නම් මිනිස්සුන්ගේ

එදිනෙදා ජන ජීවිතය ශක්තිමත් කරන්න කටයුතු කරනවා නම්, ග්‍රාම සංවර්ධන සමිතිය හරහා ලොකු සේවයක් කෙරෙනවා. ගමේ නැතිවෙලා යන අපේ කම, ගමේ නැතිවෙලා යන්නේ මිනිසුන්ගේ තියෙන එකමුතුකම. මේ සියල්ල ඒකරාශි කරලා තමන්ගේ ශ්‍රමය යොදලා ගමේ පාර හදන ග්‍රාම සංවර්ධන වැඩ සටහන අපි අගය කරන්න ඕනෑ. එහි අධ්‍යක්ෂකතුමාත් ඒකට ලොකු කැපකිරීමක් කරලා රු. 20,000 ක් දුන්නාම වැඩි කොටසක් කරන්නේ අලුත් වැඩසටහන්. නිර්මාණශීලී ග්‍රාම සංවර්ධන වැඩ සටහන්. හැබැයි, ගමේ සමිතියේ පත් වෙන නිලධාරියාගේ දූෂිතකමක් තිබුණාට, ඒකට ඇමතිතුමාටවත්, අධ්‍යක්ෂකතුමාටවත් දොස් කියලා වැඩක් වෙන්නේ නැහැ. ඒ නිසා අපි නිරන්තරයෙන් මේ ග්‍රාම සංවර්ධන පැත්ත දියුණු කරන්නට ඕනෑ. ඒකට මිල මුදල් යොදවන්න ඕනෑ. මම ග්‍රාම සංවර්ධන පැත්තෙන් ඇමතිතුමාට යෝජනාවක් ගේනවා. පුළුවන් නම් මේ ග්‍රාම සංවර්ධන සමිතිවලට විදුලියයි, වතුරයි දෙන්න විධියක් නැහැ. පළාත් පාලනයට ගිහිල්ලා ඉල්ලුවාම කියනවා, ඒක අපේ ගොඩනැගිල්ලක් නොවෙයි කියනවා. වෙන තැනකට ගියාම කියනවා, ඒක ග්‍රාම සංවර්ධන ඇමතිතුමාගේ වැය විෂයේ තියෙන්නට ඕනෑ. මේවාට ජලය විදුලිය දෙන්නත් ක්‍රමවේදයක් හදලා දෙන්න. ග්‍රාම සංවර්ධනය වෙනුවෙන් තව මුදල් වෙන් කරන්න. වැඩක් කරන්න පුළුවන්. හට් එකක් දෙන්න පුළුවන්. පුටු ටිකක් දෙන්න පුළුවන්. කරන්න පුළුවන් හැමදේම මේ ග්‍රාම සංවර්ධන විෂය හරහා කරන්න පුළුවන්. ළමයින්ට චිත්‍ර අන්දන්නත් පුළුවන්. ළමයින්ට මොන්ටිසෝරි දියුණු කරන්නත් පුළුවන්. හැමදේම කරන්න මේ ග්‍රාම සංවර්ධනයට පුළුවන්. මේක වැඩිදියුණු කරන්න කියන එක මම ඔබතුමාට කියන්නේ.

ඒ වාගේම තමයි නිවාස. මම අපේ කොමසාරිස්තුමියට දවසක් ලියුමක් ලියා ගෙන ආවා. ෆොටෝ ටිකකුත් අරගෙන. පර්චස් 60 ක තියෙනවා, ගෙවල් 95 ක්. එතුමිය ඔලුවේ අත තියා ගත්තා. කොහේද මේ තියෙන්නේ? අපේ වේයන්ගොඩ නගරයේ තියෙන්නේ. නමුත් හදා ගන්න විධියක් නැහැ. එතුමියට කරන්න දෙයක් නැහැ. එතුමිය මට උපදෙස් දුන්නා. මේක අරන් යන්න දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට ගිහිල්ලා කියන්න. එතුමියත් මැදිහත් වෙන්නම් කියලා. ඒ නිසා ඇමතිතුමා, ඔබතුමාට මේ වහින දෙනෝරා වැහි. මනුෂ්‍යයෙක් උනාම අපි හැමතිස්සේම - අපේ ආගමේ කියන්නේ, "සන්තුෂ්ටි පරමං ධනං" තමන්ට හිතට සතුට ගෙන දෙන කාරණාවල යෙදෙන්නට ඕනෑ. මහා වැහි වහින කොට ඔබතුමාට සතුටු වෙන්න පුළුවන්. අනේ මම මේ මිනිස්සුන්ට මොන තරම් තහඩු දීලා තියෙනවා ද? මම කොච්චර සීට් දීලා තියෙනවා ද? මේ පුංචි දරුවෝ නොතෙමී මේ ගෙදරට ගුලී වෙලා ඇති කියලා තමන්ට සතුටු වෙන්න පුළුවන්. තමන්ගේ අමාත්‍යාංශය ගැන ඔබතුමාට සතුටු වෙන්න පුළුවන්. ඒ නිසා අර මන්ත්‍රීතුමන්ලා කිව්වා වගේ, නිවාස හදන්න. මේ සංවර්ධන කාර්යය හරහා කොමසාරිස්තුමියටත් කථා කරලා වැඩ පිළිවෙළක් හදන්න. පුංචි අහිංසක මිනිස්සු කොපමණ ඉන්නවාද? අපි ගෙදර නොතෙමී නිදියන කොට තෙමෙන මිනිස්සු කොච්චර ඉන්නවාද? රාත්‍රියේ නිදිය ගන්න බැරි පාසල් යන දරුවෝ කොච්චර ඉන්නවාද? තමන්ගේ හිසට සෙවනක් නැති අහිංසක මිනිස්සු. ඒ නිසා මේ සමාජයේ මිනිස්සුන්ට සැමට සම අයිතිවාසිකම් තියෙනවා. ජීවත් වීමේ අරගලයක මිනිස්සු ජීවත් වෙලා ඉන්න නිසා ගෙයක් හදා ගන්න බැහැ. ගෙදරට ඇවිල්ලා මිනිස්සු අඬනවා තහඩු ඉල්ලලා. මිනිස්සු ගේ බැඳලා දෙන්න කියලා අඬනවා. පුංචි දරුවො වඩා ගෙන ඇවිල්ලා කියනවා, මේ දරුවා හින්දවත් ගේ හදලා දෙන්න කියලා. මේක පුණ්‍ය කර්මයක්. පින් සිද්ධ වෙනවා. ඔබතුමා මේ කාරණය වෙනුවෙන් මැදිහත් වෙන්න කියලා මම ගෞරවයෙන් සිහිපත් කරනවා.

ඒ වාගේම තමයි කර්මාන්ත අමාත්‍යාංශය. මම ඔබතුමාට යෝජනාවක් වශයෙන් ගේන්න බලාපොරොත්තු වෙනවා. මේ කර්මාන්ත අමාත්‍යාංශයත් ඔබත් මහ ඇමතිතුමාගේ සංචාරක අමාත්‍යාංශයත් එකට ඒකාබද්ධ වෙන්න. මේ කර්මාන්ත අමාත්‍යාංශය කියන්නේ, මේ රටේ දුප්පත්කම තුරන් කරන්න තියෙන තැනක්. මිනිහෙකුට මාළු දෙනවට වඩා බිලී පිත්තක් දෙන්න කියලා මේ සභාවේ හැම දෙනාම දැන් කරුණු ගණනාවක් කිව්වා. ඒ නිසා මේ මිනිස්සුන්ට ජීවත්වීමට තමන්ට හැකියාව, කුසලතාවය, දැනුම තිබෙනවා. පාරම්පරිකව රැගෙන එන. අපේ ප්‍රදේශය ගත්තත්, මම හැමදාම ඔබතුමාගේ උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට ඇවිල්ලා මම කියනවා, මැටි කර්මාන්තය. මැටි කර්මාන්තය මොන තරම් වටිනවාද? හෙළ බොජුන් හල් වලට, මැටි කර්මාන්තයේ නව නිෂ්පාදන අපෙන් ඉල්ලනකොට, අපේ කර්මාන්තකරුවා දන්නේ නැහැ නව තාක්ෂණයට මේවා නිෂ්පාදනය කරන්න. ඒවා අපි විධිමත් කරන්න ඕනෑ. රත්තරන් කර්මාන්තය, කම්මල් කර්මාන්තය එහෙම නැත්නම් රිදී කර්මාන්තය, එහෙම නැත්නම් බට

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

කර්මාන්තය, වේවැල් කර්මාන්තය, සංගීත භාණ්ඩ මේ සියල්ලම පරම්පරාවෙන් පැවත එන අපේ ගැමි සංස්කෘතියත් එක්ක ගොනු වුණු දේවල්. මිනිස්සු මුදල් හම්බ කරනවා වෙන්න පුළුවන්. ජන ජීවිතය ගොඩ නැගිලා නැහැ. මේ කර්මාන්ත අමාත්‍යාංශයේ අධිකාරියක් තිබුණා. එතුමන්ලා හොඳට වැඩ කරනවා. අපේ ප්‍රදේශයේ ස්වර්ණාභරණ අධිකාරියක් අපි පිහිටුවලා තියෙනවා. මේ අය ඉල්ලන්නේ 5% ට ණය. මේ අයට ඉල්ලනවා උපකරණ. මේවා වෙනුවෙන් අපි අතහිත දුන්නොත් - මේ රටේ ඔබේ පරමාර්ථය, රටේ නායකයාගේ පරමාර්ථය තමයි දුගීකම තුරන් කරන එක. අපේ රටේ ජනතාව වත්පොහොසත් කරන එක. එහෙනම් මේ කර්මාන්ත පැත්ත දියුණු කරන්නට ඕනෑ. ඔවුන් නව තාක්ෂණයත් සමඟ ඔවුන්ගේ පරම්පරාගත දැනුමත් මේ සියල්ලත් අපි ඒකරාශි කර ගන්නට ඕනෑ. අපි අගය කරනවා. අධ්‍යාපන අමාත්‍යාංශය - එදා ප්‍රධාන අයවැය විවාදය වෙලාවේදී මම කිව්වා, අපේ අධ්‍යාපන ඇමතිතුමාගෙන් ලැබුණු මුදල්වලට වඩා වැඩි මුදලක් අපට ඔබතුමාගෙන් ලැබුණා. බිඳුණු පුටුව වැඩ සටහන හරහා ඉස්කෝලවලට ගිහිල්ලා කටයුතු කරන්න. මේකටත් වැඩිපුර මුදල් ටිකක් දාන්න. පාර හදන එකෙන් කපලා හරි බිඳුනු පුටුවට පුටුව දාන්න. ඔබතුමා තාත්තා කෙනෙකු වශයෙන් සතුටු වෙන්න පුළුවන්. පුටුවක් නොමැති, ඩෙක්ස් එකක් නොමැති දරුවෝ පාසල්වල ඉන්නවා. මේවා පින් සිද්ධ වෙන වැඩ. මම බෞද්ධයෙක් වශයෙන් නිරන්තරයෙන් කියන එකක් තමයි, අප ලෝ පහළ වුණු බුදුහාමුදුරුවෝ කිව්වේ,

"*චරත භික්ඛවේ චාරිකං. බහුජන හිතාය, බහුජන සුඛාය අත්ථා හිතාය සුඛාය දේව මනුස්සාය*" කියලා.

මහජනතාව වෙනුවෙන් පාද චාරිකාවේ යෙදෙන්න කිව්වා. ඔබතුමාට මේ හැමදේම කරන්න පුළුවන්. ගෙවල් හදන්න පුළුවන්. පාරවල් හදන්න පුළුවන්, බෝක්කු හදන්න පුළුවන්. දරුවො වෙනුවෙන් කටයුතු කරන්න පුළුවන්. මේ හැමදේම කරන්න පුළුවන්. ලොව පහළ වුණු බුදුහාමුදුරුවෝ පළමුවෙනි තමන්ගේ කණ්ඩායමට කිව්ව දේ තමයි මිනිස්සු වෙනුවෙන් වැඩ කරන්න. මහ මගට බහින්න. චාරිකාවේ යෙදෙන්න. ඔබතුමාට පින් කරන්න පුළුවන් අමාත්‍යාංශයක්. මම කවදාහරි මේ පළාත් සභාවේ ඇමති කෙනෙක් වෙනවා නම්, මම පතන ඇමතිකම තමයි ඔබතුමාගේ ඇමතිකම. වැඩක් කරන්නත් පුළුවන්. නිවන් දකින්නත් පුළුවන් ඇමතිකම තමයි මේ අමාත්‍යාංශයේ ඇමතිකම කියලා කියන්නට ඕනෑ.

ගරු ඇමතිතුමනි ඒ වාගේම තමයි, සමූපකාර සම්බන්ධයෙන් අපට තිබෙන්නේ, හොඳ අදහසක් නොවෙයි. ඔබතුමාට ඒ හින්දා දොස් කියන්නේ නැහැ. නමුත් අත්තනගල්ල සමූපකාරය මේ වෙනකොට විශාල වශයෙන් පිරිහෙලා තිබෙනවා. මේ සමූපකාර ක්ෂේත්‍රයේදී ඔබට බැණුම් අහන්න ආපු වැය ශීර්ෂයක් මේ ඇවිල්ලා තියෙන්නේ. ඔබතුමාට මේකෙන් යමක් කරන්න බැහැ. මේක අධ්‍යක්ෂ මණ්ඩලය හරහා ක්‍රියාත්මක වන එකක්. නමුත් ඔබතුමාට බනින්න, බැනුම් අහන්න මේ සභාවේ ඔබතුමා විවේචනයට ලක් වෙන්න තියෙන අමාත්‍යාංශයේ කෑල්ලක්. ඔබතුමාට තියෙන්නේ විශේෂ කොමසාරිස්වරයෙක් පත් කරන්න. ඒ වගේ පරීක්ෂණයක් කරන්න විතරයි. ඒ හින්දා ඇමතිතුමා මේක එක්කො අපි අයින් කරලා දාමු ඔබතුමාගේ අමාත්‍යාංශයෙන්. නැත්නම් ඔබතුමා අපරාදේ බැනුම් අහන්නේ. අත්තනගල්ල සමූපකාර සමිතිය ගත්තාම සංවර්ධනය වුණු ඉතාමත් හොඳ ආයතනයක්. අද වෙනකොට ඒක විනාශ වෙලා ගිහිල්ලා. අද ඒක යමක් කරන්න බැරි තත්වයටම විනාශ වෙලා ගිහිල්ලා. ඒ නිසා ඔබතුමාට මේ සමූපකාර පැත්තෙන් ඇති වෙලා තියෙන ප්‍රශ්ණය ගැන ඇත්තටම මම දුක් වෙනවා. ඒ වාගේම තමයි ගරු ඇමතිතුමා, පරිපාලනය පැත්තෙන් මම හිතන්නේ ඔබතුමා ස්ථාවර වුණේ නැහැ. නව ලේකම්තුමියක් ඇවිල්ලා තියෙනවා. එතුමිය බොහොම හොඳ කෙනෙක්. හිටපු ලේකම්තුමා දිසාපතිවරයෙක් වෙලා ගියා. ඊළඟ ලේකම්තුමියත් ගියා. දැන් අලුත් ලේකම්තුමියක්. තමුන්ගේ පරිපාලනමය වසර කාලය තුළ විටින් විට වෙනස් වෙන්න ගියාම එතුමියන්ලාට වුණත් පුළුවන්කමක් නැහැ වැඩ සටහනක් හදන්න. සිව් අවුරුදු, නැත්නම් අවුරුදු දෙකට, අවුරුද්දට හරි සැලැස්මක් හදා ගෙන ඉදිරියට දුවන්න ඕනෑ. පරිපාලනය වෙනස් වුණාම දුවන්න බැහැ. මොකද රාජ්‍ය නිලධාරීන්ට උපදෙස් දෙන්නේ පරිපාලනයෙන්. ඉතින් ඒ පරිපාලනය කරන්න විධියක් නැහැ. නමුත් ඒ ලේකම්වරියත් අපේ සැලසුම් අංශය නිලධාරීන්ටත් ඇත්තටම කථා කරලා අහනවා, මන්ත්‍රීතුමා ඔබතුමාගේ වැඩේ වුණාද? අහවල් ව්‍යාපෘතියට මොකද වුණේ කියලා. ඒ වගේ කටයුතු ගණනාවක් සම්බන්ධයෙන් අපි ඔබේ අමාත්‍යාංශයේ නිලධාරීන්ට අපේ සතුට ප්‍රකාශ කරනවා.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, යෝජනා කිහිපයක් කියන්න තිබෙනවා. පාරවල්වල. අපේ පළාත් සභා පාරවල්වල බැනර් කටවුට් ගැහුවාම ඒවායින් මුදල් අය කරන්නේ නැහැ. අපි මේවා වෙනුවෙන් මුදල් අය කරන්න වැඩ සටහනක් හදන්නට ඕනෑ. ඒ වාගේම කර්මාන්ත අමාත්‍යාංශය හරහා මහා විශාල ප්‍රමාණයක් - 70 - 77 ආණ්ඩු කාලේ සිරිමා බණ්ඩාරනායක මැතිනිය දේශීය කර්මාන්ත නගා හිටුවන්න ගත්ත උත්සාහය ඔබතුමන්ලා දන්නවා. ඒ හරහා කර්මාන්ත අමාත්‍යාංශයේ ඉඩම් අයාලේ ගිහිල්ලා තියෙනවා. ගොඩනැගිලි අයාලේ ගිහිල්ලා තිබෙනවා. මේවා යම් යම් අවබෝධතා ගිවිසුම් ඇති කරලා, ප්‍රාදේශීය සභාවලට, ගමේ ග්‍රාම සංවර්ධන සමිතිවලට ලබා දීලා, මේවා ඒක රාශි කරලා, මේවා තමන්ගේ ඒ වත්කම්වලට ගන්න, ලැයිස්තුවක් ලේඛන ගත කරන්න කියලා මම ඔබතුමාව දැනුවත් කරනවා.

ඒ වාගේම තමයි පළාත් පාරවල් වල ඉදිකිරීම් නවත්වන්න. මේවා ගැසට් කරලා අත්පත් කර ගෙන, පාරවල් සීමාව ලකුණු කරන්නට ඕනෑ. අහවල් සීමාව තුළ ඉදිකිරීම් කරන්න කරන්න බැහැයි කියලා. ඒ වාගේම තමයි බස් නැවතුම්පලවල්වල ඉන්න මගීන්ට, දරුවෝ හම්බ වෙන්න ඉන්න අම්මාලාට, වැඩිහිටියන්ට. මේ ජන සමාජයේ ආබාධිතයන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ආබාධිතයන්ට ඒ අයට පහසුකම් සැලසෙන විධියට බස් රථයට නගින්න, ඒකට ප්‍රවේශ වෙන්න, වැසිකිළියට යන්න, එහෙම නැත්නම් ඒ අයට නිදහසේ පහසුවෙන් ඉන්න පුළුවන් පරිදි බස් නැවතුම්පලවල් වඩා හොඳින් සංවර්ධනය කරන්න. හැම මගියාටම සාධාරණයක් වෙන විදිහට කියන එකත් මම ඔබතුමාට අවධාරණය කරනවා. කියන්න බොහෝ දේ තිබුණත් ගරු ඇමතිතුමාට කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා ඇමතිතුමා නිකන්ම ඉන්නවා, පෙනේ පුප්පන්නෙත් නැහැයි කියලා. නයා නම් පෙනේ පිප්පුවාට වැඩක් වෙන්නේ නැහැ. පෙළක් නිලධාරීන් ඉන්නවා. මම කථා නොකළ වැය ශීර්ෂවල පෙළක් නිලධාරීන් ඉන්නවා. හොඳ නයි නටවන්නෝ ඉන්නවා. ඇමතිතුමා පෙනේ පිප්පුවත් වැඩක් නැහැ. විෂ දළ ගලවලා පෙනේ පිප්පුවට වැඩක් නැහැ. නයි නටවන මිනිස්සු ඇමතිතුමාවත් නටවනවා කියන එක මම ඉතාමත් කණගාටුවෙන් ප්‍රකාශ කරමින් ඔබතුමාට මේ වැය ශීර්ෂයේ කටයුතු තව තවත් දියුණු වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විපක්ෂයේ අපේ මූලාසනය නියෝජනය කරන සිරිකමල් මන්ත්‍රීතුමාගේ අවධානයට යොමු කරනවා. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාවත් ඇතුළු ඒ සියලු දෙනාව දැනුවත් කරන්නේ සියලුම දෙනාම සභාවේ ඉන්න කියලා කියන්න. මීළඟට අවස්ථාව තියෙන්නේ ඉෆ්තිකාර් මන්ත්‍රීතුමාට. එතුමත් නැහැ. ඒ නිසා මන්ත්‍රීවරුන් ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු ඔබතුමන්ලා කරන්න. ඒ අනුව මීළඟට සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 10.42]

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස ඉදිකිරීම්, වතුයටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් අදහස් දැක්වීමට ලබා දීම පිළිබඳව පළමුවෙන් ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ, මේ අමාත්‍යාංශය භාර අපේ ලලිත් වනිගරත්න ඇමතිතුමා තමයි මේ අමාත්‍ය මණ්ඩලයේ ඉන්න අහිංසකම ඇමතිතුමා. එතුමාට බැන්නත්, තර්ජනය කළත්, එතුමා සිනහා වෙලා, ඒ සියල්ලට මුහුණ දීලා එතුමාගේ පාඩුවේ වැඩ කටයුතු කරනවා. මම හිතන්නේ, මේ අමාත්‍යාංශයට මීට කලින් තරම් මුදල් ප්‍රමාණයක් වෙන් වෙන්නේ නැහැ. ඉතාමත් අල්ප මුදල් ප්‍රමාණයක් තමයි වෙන් වෙන්නේ. මේකේ ශ්‍රී විභූතිය තිබුණේ අපේ නිමල් ලාන්සා ඇමතිතුමා ඉන්න කාලේ. මේ අමාත්‍යාංශයට දැවැන්ත මුදල් සම්භාරයක් පැමිණුනා. මේ ආසනයේ පමණක් නොවෙයි, අපේ දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි. වෙනත් දිස්ත්‍රික්කවලත් විශාල වැඩ කොටසක් කරලා ඉතා විශාල ලාභයක් අපේ පළාත් සභාවට ලැබුණා සහ අපේ අමාත්‍යාංශයට ලැබුණා. ඒ නිසා අපි ඉල්ලන ප්‍රමාණය ඉල්ලන පරක්කුවෙන්, මාර්ග කාපට් කරන්න සහ අනෙකුත් මාර්ග සඳහා ලාන්සා ඇමතිතුමාගේ කාලේ ලැබුණා. නමුත් අවාසනාවකට මෙතුමාට ඒ වාසනාව ලැබුනේ නැහැ. විශාල මුදල් ප්‍රමාණයක් මේ අමාත්‍යාංශයට ලැබිලා නැහැ. ඒ නිසා කණගාටු වෙනවා. දැවැන්ත පාරවල් සංඛ්‍යාවක් තිබෙන - මේ රටේ 1/3 ක ජනතාවක් ජීවත් වෙනවා. මේ අමාත්‍යාංශයට, මීට වඩා ප්‍රතිපාදන වෙන් කළ යුතුව

තිබුණා. නමුත් මහරගම තත්ත්වය ඊට වඩා වෙනස්. ඒ මහ ඇමතිතුමාට පින් සිදු වෙන්න. මම හිතන්නේ එතුමා වැඩි හරියක්ම ජනප්‍රියම ඇමතිවරයා. තමුන්නාන්සේගේ දිස්ත්‍රික්කයට පස්සේ මහරගම ආසනයේ. හැම පාරකම තමුන්නාන්සේගේ මූණ අලවලා තිබෙනවා. අපේ මහ ඇමතිතුමා ඒ බෝඩ් ගහලා තිබෙනවා. රට ගියාම මළ ගෙදර, උදේ පාර හදනවා. තමුන්නාන්සේත් ඒ බෝඩ් වල ඉන්නවා. අපෙන් අහනවා, කවුද මේ ඇමතිතුමා කියලා. අපි කියනවා මේ වනිගරත්න ඇමතිතුමා කියලා. නම ගහලා නැහැ බෝඩ් එක ගහනවා. එලෙස මහරගම විශාල වැඩ කොටසක් වෙලා තිබෙනවා. මම හිතන්නේ, මේ අපේ පළාත් සභාවේ වැය ශීර්ෂය ගැන කථා කරලා වැඩක් නැහැ, මේ රටේ වැය ශීර්ෂය ගැන කථා නොකර. ඒ නිසා අපට මේ පළාත් සභාවට, අපේ පළාත් සභාවට මිලියන 71645 යි මුළු ලැබීම් තිබෙන්නේ. ඉතින් මේකෙන් අපේ පළාත් සභාව අපි ජාතිය ගොඩ නැගීමේ බද්ද සහ මුද්දර ගාස්තු වශයෙන් රුපියල් මිලියන පනස් එක් දහස් එකසිය හාරසිය දහසයක් එකතු කර ගන්නවා. ඊට අමතරව රජයෙන් ලැබෙන්නේ පුනරාවර්තන ප්‍රදාන වශයෙන් මිලියන 14,261 යි. පළාත් නිශ්චිත මිලියන 1306 යි. උපමාන පාදක 254 යි. විශේෂ ව්‍යාපෘති මිලියන 407 යි. ළහම පාසල හොඳම පාසල සඳහා මිලියන 4000 යි. ඉතින් මේක නිසා මිලියන 4000 ක් ළහම පාසල හොඳම පාසලට දාලා තිබෙනවා. ගිය අවුරුද්දෙත් මේක දැම්මා. මේ අවුරුද්දෙත් දාලා තිබෙනවා. මේක පුස් වෙඩිල්ලක් බවට පත් වෙලා තියෙනවා. අලියා කෑ දිවුල් ගෙඩිය වගේ හදපු ළහම පාසල හොඳම පාසල හදපු එකක් නැහැ. මේ සමස්ථ ආර්ථික අයවැය තුළ පටන් ගත්ත (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපි හදලා තිබෙන්නේ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

හදපු එකක නම කිව්වොත් ඔබතුමාට - අපි හදලා තිබෙනවා, අපේ ආණ්ඩුව කාලේ. ඒ වාගේ බිල්ඩින් 1000 ක් හැදුවා. තට්ටු දෙකේ, තුනේ බිල්ඩින් 1000 ක්. ඉස්කෝලෙකට එක ගණනේ හැදුවා නම් 6000 ක් හදන්න තිබුණා. (බාධා කිරීම්) එකක් කිව්වාට මේ රට වෙනස් වෙන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ ගමේ එකක් හදන්න ඇති. අපි නම් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ලැප්ටොප් දුන්නා වාගේ තමයි.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ලැප්ටොප් - තමුන්නාන්සේලා එක බිල්ඩින් එකක් ගැන කථා කරනවා. අපේ කාලේ අධ්‍යාපනයට මුදල් වෙන් කරලා එක ඉස්කෝලයක බිල්ඩිමක් හැදුවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මූලාසනය අමතන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

තමුන්නාන්සේ එක ඉස්කෝලයක් ගැන කථා කරන්නේ. මේ කථාව වෙනස් කරනවා. කථා කරන්න අවස්ථාව දෙන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ඒවාට උත්තර දෙන්න යන්න එපා. ඔබතුමා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බාධා කරන කොට කියන්න යන එක නොවෙයි කියන්න වෙන්නේ. මේකට කොල්ලෝ කියනවා, ආප්ප සුප්පු ආණ්ඩුව කියලා. මේක ආප්ප සුප්පු ආණ්ඩුව තමයි. මේවගේ ආප්පයෝ තමයි මේ ආණ්ඩුවේ ඉන්නේ. මේක මේ කුණුහරපයක් නෙමෙයි. ආප්ප සුප්පු ආණ්ඩුව කියන්නේ. ආප්පෙන් යන්නේ. (බාධා කිරීම්) පන්තියේ ඉන්න කොට ළමයින්ට කියනවා, ආප්පයා කියලා. ආප්පයා කියන්නේ - (බාධා කිරීම්) පණ නැතුව වැනිලා, බෙල්ල කඩා ගෙන ඉන්න කට්ටියට ඉස්කෝලේ

කොල්ලෝ කියනවා ආප්පයා කියලා. එහෙමයි විහිළුවට කියන්නේ. ආප්පයා වාගේ කියලා කියනවා අර පණක් නැතුව, වැඩක් කර ගන්න බැරිව, බොරුවට කෑගහන එවුන්ට කියනවා ආප්පයා කියලා. මේ ඒ වාගේ එක ආප්පයෙක්. ඒ වාගේම සූප්පුවා කියන්නෙත්, ඇඟිල්ල කටේ ගහගන්න කොල්ලෝ ඉන්නවා. කිසි වැඩක් කරන්නේ නැතුව. ඇඟිල්ල කටේ ගහ ගෙන පැත්තකට වෙලා ඉන්න කොට ඒකට කොල්ලෝ කියනවා, සූප්පුවා කියලා. එතකොට ආප්ප සූප්පු ආණ්ඩුව මේක. මේවායේ වැඩ නැහැ. මේ කට අවුස්ස ගන්න එපා. කියන්න ගියේ මේක නෙමෙයි. වැඩ බැරි ආණ්ඩුව නිසා තමයි ආප්ප සූප්පු ආණ්ඩුව කියන්නේ. කුණුහරුපයක් නොවෙයි. මේ ආප්ප සූප්පු ආණ්ඩුවේ මේ වාගේ ආප්පයෝ ඉන්නවා. ඉතින් ඒ නිසා කට වහගෙන අපේ කථාව කරන්න -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කේන්ති ගිහිල්ලා ඉන්නේ. ලැයිස්තුව හදා ගන්න බැරිව. පොහොට්ටුවේ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඔබතුමාට මම ගරු කරනවා. ඔබතුමා අර කකුළුවා යන පාරේ යන්න එපා. ඔබතුමා ඊට වඩා වැදගත්. බුද්ධිමත් අපේ සහෝදරයෙක්. ඒ නිසා ඔබතුමාට මම කියන්නේ නැහැ.

ඒ වාගේම විශේෂයෙන්ම නිවාස අමාත්‍යාංශය ඔබතුමා යටතේ තියෙන්නේ. මේ නිවාස අමාත්‍යාංශය - (බාධා කිරීම්) නිවාස විෂය ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තියෙන්නේ. මේ නිවාස අමාතයාංශයේ මම හිතන්නේ ඉතාමත් අල්ප විධියට තමයි මේ ආධාර බෙදෙන්නේ. උපරිම මුදල වශයෙන් රුපියල් ලක්ෂයයි දෙන්න පුළුවන්. දැන් ඔබතුමා යෝජනා කළා ලබන අවුරුද්දේ ලක්ෂ 1 ½ බැගින් දෙන්න. ලක්ෂ 1 ½ කින් මම හිතන්නේ, අද සම්පූර්ණ ගෙයක් හදන්න අමාරුයි. නමුත් ඒ ගාන හරි දීලා නිවාස 100 ක් හදන්න යෝජනා කරලා තිබෙනවා. මම හිතන්නේ මේක බස්නාහිර පළාතේම නිවාස සංඛ්‍යාව දිහා බලන කොට ඉතාමත් අල්ප ප්‍රමාණයක්. ඒ නිසා තවමත් ස්ථිර වහල්වල් නැති නිවාස ප්‍රමාණය 5% ක වගේ ප්‍රමාණයක් තිබෙනවා. නමුත් පසුගිය වකවානුව තුළ නාගරික සංවර්ධන අධිකාරියෙන් බද්දක් පනවලා තිබුණා. අඩු ආදායම් නිවාස අධිකාරිය පිහිටුවලා. ඒ බද්දෙන් 1% ක බද්දක් අය කළා. මේ නිවාස හදන්න වර්ග අඩි 3000 ට වඩා ඉදිකිරීමක් කළොත් ඒකෙන් බද්දක් අය කරලා විශාල නිවාස ප්‍රමාණයක් හැදුවා. අපිත් ඒකේ හිටපු නිසා දන්නවා. කුසුම් නිවාස ව්‍යාපෘතිය. අවුරුද්දක් ඇතුළත ගෙවල් දහ දාහක් හැදුවා. එහෙම ආදායමක් ආවා. එහෙම ආදායමක් මේවායේ එන්නේ නැහැ. ගෙවල් 1000 කට රු. 10,000/- ඒවා, 20,000/- ඒවා ආධාර දුන්නාට ගෙවල් 1000 කට ආධාර දුන්නාම, අවුරුද්දේ ඇති ප්‍රගතියක් නැහැ. මේ නිවාස දෙපාර්තමේන්තුවක් තියෙනවා. මම හිතන්නේ නිලධාරීන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. මෙයට වඩා වැඩ කරන්න පුළුවන්. දක්ෂ නිලධාරීන් ඉන්නවා. ඒ අය නිකන් ඉන්නවා වැඩ කරන්න ප්‍රතිපාදන නැහැ. ඒ නිසා මම හිතන්නේ, නැවත වතාවක් ඉදිකිරීම් කරන වෙලාවට, අපේ ගොඩනැගිලි අනුමත කරන කොට අපේ නගර සභාවට එන කොට ඒ නගර සභාවේ මම හිතන්නේ වර්ග අඩි 3000 ට 5000 ට වැඩි ඒවාට වෙන වැඩි බද්දක් අය කරලා හරි, මේ නිවාස අරමුදල ශක්තිමත් කරලා, මේ නිවාස ප්‍රශ්නයට මෙයට වඩා මැදිහත්වන ලෙස අපි ඉල්ලා සිටිනවා.

ඒ වාගේම විශේෂයෙන්ම හෝමාගම ප්‍රදේශයේ යෝජනා කරලා තිබුණා, නිවාස යෝජනා ක්‍රමයක්. ඒකත් අද අපෙන් අහිමි වෙලා තිබනවා. අහිමි වෙලා. අපේ පළාත් සභාවෙන් නෙමෙයි කරන්නේ. ඒක මම හිතන්නේ වෙනත් ආයතනයකට පවරලා තිබෙනවා. දැන ගන්න තිබෙන පරිදි ඒකත් අපට අහිමි වුණා. මන්ත්‍රීවරුන්ට නිවාස දෙන්න සමහරු පෝරම ලබා දුන්නා. ඒවා අහිමි වෙලා තිබෙනවා. මන්ත්‍රීවරුන්ට නෙමෙයි. අඩුගානේ ඒ අපෙන් අහිමි වෙච්ච එකට නිවාස ව්‍යාපෘතියක් අපේ කොළඹ දිස්ත්‍රික්කයට ලබා දෙන්න මේ අවුරුද්දේවත් තමුන්නාන්සේ කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. මම හිතන්නේ, මේකේ අපට බරපතල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් විතරයි කථාවක් කරන්න අවස්ථාව ලැබුණේ. ඒ අවස්ථාවක් ලැබුණු වෙලාවේ අපි මතක් කරන්න ඕනෑ, මේ රටේ ලොකුම හොරකම් කරපු කට්ටිය එක්ක තමයි මේ ආණ්ඩුව තිබෙන්නේ. අද පළවෙනි වතාවට බැඳුම්කර කොමිසමට, ජනාධිපති කොමිසමට අගමැතිතුමාට යන්න සිද්ධ වුණා. අගමැතිතුමාට යන්න සිද්ධ වුණේ අතිගරු ජනාධිපතිතුමා කොමිසමක් දාපු නිසා. එතුමාට යන්න සිද්ධ වුණා.

[ගරු සලෝචන ගමගේ]

ගිහිල්ලා මේ බැඳුම්කර වංචාවට සාක්ෂි දෙන්න වුණා. එතුමන්ලාට පළමුවෙනි වතාවට මන්ත්‍රීවරු ඇවිල්ලා නම කියවෙනවා. සමහර කට්ටිය ගෙවල් ගත්ත කට්ටිය මේ ආදි ලෙස. මේ බැඳුම්කර වංචාව අද ඔප්පු වෙලා තිබෙනවා. (බාධා කිරීම්) ඒ කට්ටියත් යවන්න ඕනෑ. වැරදි තිබෙනවා නම් සියලු දෙනා යවන්න ඕනෑ. ලැජ්ජයි කියන්න. පළමුවෙනි වතාවට අගමැතිතුමාට බැඳුම්කර කොමිසමට යන්න සිද්ධ වුණා. කෝප් වාර්තාව එළියට එන්න දුන්නේ නැහැ. කෝප් වාර්තාවේ පැහැදිලිව සඳහන් වෙලා තිබුණා, අගමැතිතුමා තමයි මට උපදෙස් දුන්නේ කියලා. ඒක නිසා ඊට කලින් පාර්ලිමේන්තුව විසුරුවලා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එවෙලේ බේරුවා. අගමැතිතුමාව සහ ඒ ආණ්ඩුව බේරලා තමයි ඡන්දයට ගියේ. බැරි වෙලාවත් කෝප් වාර්තාව එළියට ආවා නම් අගමැතිතුමා එදාම වැරදිකාරයෙක් වෙනවා. අද එතුමා ගිහිල්ලා සාක්ෂි දීල තිබෙනවා. අපි කියන්නේ මේ ජනාධිපති විමර්ශන කොමිසම විතරක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒ කොමිසමට කරන්න පුළුවන් දෙයක් නැහැ. කොමිසමේ වාර්තාව එන්න තව කල් යයි. කලින් බටලන්ද කොමිසම ආවා. එකෙනුත් වැරදිකාරයා වුණා. කිසිම දඬුවමක් නැහැ. එතුමා අද රටේ අගමැති. නමුත් මේ කරපු වංචාව බරපතළයි.

මේ නිසා තමයි මේ රුපියල බාල්දු වෙලා, ඩොලර් එක ඉහළ ගිහිල්ලා, නැති ප්‍රශ්නයක් රටේ නිර්මාණය වුණේ. ඒ නිසා අපි වගකීමෙන් කියන්නේ, තමුන්නාන්සේලා අපේ මෛත්‍රීපාල ජනාධිපතිතුමාට පුළුවන් නම් ගිහිල්ලා කියන්න. මේ අයට නඩු පවරලා දඬුවම් දෙන්න කියලා. එතුමාටත් එය කරන්න බැරිවෙලා තිබෙනවා. එතුමා එනකොට කිව්වේ, මම දිවුරුම් දෙන උත්සවයට රු. 6000/- යි වියදම් කලේ කියලා ආවා. මේ 2017 මොකද වෙලා තියෙන්නේ. කෝටි නමසිය අසූ ගානක අයවැයක් ඉදිරිපත් කරලා. ගිය පාර තිබුනේ කෝටි දෙසිය ගානයි. මේ පාර කෝටි නමසිය ගානක්. තමුන්නාන්සේලා දන්නවා. මේ අවස්ථාවේදී මේවා මතක් කරන්න ඕනෑ. ඉතින් නැවක් ගන්න යනවා. කෝටි 630 කට පරණ කසිකබල් නැවක්. යුද්ධ නැවක්. යුද්ධෙ නැති කාලේ මොකටද යුද්ධ නැව්.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ප්‍රවාහන අමාත්‍යාංශයට නැව් නැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මේකත් ප්‍රවාහනය තමයි. ඒක නිසා මේ ආණ්ඩුවේ අගමැතිතුමාත් හොරකම් කරනවා. ජනාධිපතිතුමාත් හොරකම් කරනවා. දෙගොල්ලම හවුලේ තමයි මේ ආප්ප සුප්පු ආණ්ඩුව ගෙනියන්නේ. තව එක වගකීමක් තිබෙනවා මට මතක් කරන්න. මේ සමුපකාර අමාත්‍යාංශයත් ඔබතුමා යටතේ තියෙන්නේ. අපේ මහරගම සමුපකාර ණය දෙන සමිතියේ අය ඇවිල්ලා මෙතැන උද්ඝෝෂණය කළා. මේ උද්ඝෝෂණයට බය වෙලා මොකද කළේ? කඩිනමින් ගිහිල්ලා කමිටුවක් පත් කරලා විමර්ශනය කරලා, ඒ අය සියල්ලටම නඩු දැම්මා. නමුත් ඒ නඩු දාපු අය අතර අහිංසක මිනිස්සු ඉන්නවා. ලක්ෂ 30 කට අනුමත කරනවා. ණය වාරිකය ලක්ෂ 30 ක් අනුමත කරලා, ඒ මිනිස්සුන්ට ලබා දීලා තියෙන්නේ ලක්ෂ දෙකයි. ලක්ෂයයි. ලක්ෂ ½ යි. ඒ අයට ලක්ෂ 30 ටත් නඩු දාලා තියෙනවා. මිනිස්සු ඇත්තටම අරන් තියෙන්නේ ලක්ෂ දෙකයි. නැත්නම් තුනයි. ලක්ෂ 30 කට ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. ඒ අර ගත්ත හොරා තවමත් නිදැල්ලේ ඉන්නවා. නමුත් අර අහිංසක මිනිස්සුන්ට නඩු දාලා. ඒ මිනිස්සුන්ට අද උසාවියට වාරික වශයෙන් ඒවා ගෙවන්න වෙලා තිබෙනවා. නැත්නම් හිරේ දාන නිසා මිනිස්සු පිළිඅරගන්නවා. අත්සන් කරපු නිසා පිළිඅරගන්න වෙලා තිබෙනවා. අපේ සමුපකාර කොමසාරිස්තුමාට කිව්වා. මේකට නැවත පරීක්ෂණයක් කරන්න කියලා. අසාධාරණ විදිහට, ණය ඇත්තටම ගත්තෙ නැති මිනිසුන්ට අත්සන් කරපු පලියට ණය අතට ගත්තේ නැති මිනිස්සුන්ට නඩු දාලා. මේ කරන අකටයුත්ත නවත්තන්න කියලා. නමුත් එතුමාටත්, මෙයට දැන් කරන්න දෙයක් නැති තත්වයට පත් වෙලා තිබෙනවා. ඒක නිසා නැවත වතාවක් විශේෂ විමර්ශනයක් කරලා, මේ නඩු දාලා තියෙන එකට කරුණාකරලා මැදිහත් වෙලා මේ අහිංසක මිනිස්සුන්ට මේ ලක්ෂ 30 ක් 40 අත්සන් කරලා ලබා ගෙන එහෙම යථාර්තවාදිව මුදල් නොදීපු අයට ඒ සහනය ලබා දෙන්න මැදිහත් වෙන්න කියන ඉල්ලීම අපි කරනවා.

විශේෂයෙන්ම ලබන අවුරුද්ද වෙන කොට තමුන්නාන්සේලාට අපට දූරකථනයෙන්වත් කථා කරන්න බැරි වෙනවා. අදත් කුළුණු බද්දක් දාලා තියෙනවා, ලක්ෂ දෙක ගානේ. කුළුණු එකලොස් දහස් ගානක් ලංකාවේ තිබෙනවා. දැන් 50% ක් බදු. තවත් ගණන වැඩි වෙනවා.

ටෙලිෆෝන් කෝල් එකක්වත් ගන්න බැරිව යනවා. අපේ පාරිභෝගික අධිකාරිය තමුන්නාන්සේ යටතේ තිබෙනවා. විශේෂයෙන්ම අපේ ප්‍රදේශයේ ජනතාවට ජීවත්වෙන්න බැරි වෙලා තියෙනවා. විශේෂයෙන්ම පොල් ගෙඩිය රු. 150 ට ගිහිල්ලා තිබෙනවා. මේ ආණ්ඩුවෙන් පරිප්පු මිල රු. 12 කිනුත්, හාල්මැස්සන්ගෙන් රු. 10 කුනුත්, ලොකු ළූණු රු 39 කුනුත්, කරවල රු. 50 කින්, අර්තාපල් රු. 36 කිනුත් අඩු කරලා තියෙනවා. තමුන්නාන්සේට වගකීමක් තියෙනවා, මේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් තමුන්නාන්සේලා විශේෂ වැඩපිළිවෙළක් කරලා මේ බස්නාහිර පළාත් සභාවේ මේ මිල පාලනය කරන්න තමුන්නාන්සේ මැදිහත් වෙන්න කියලා ඉල්ලීම කරමින් තමුන්නාන්සේ ඉතාමත් බොහොම හොඳ ඇමති කෙනෙක්. විශේෂයෙන් ඔබතුමාගේ ලේකම්තුමා අපේ නුවන් වනිගරත්න මැතිතුමාත් විශාල කැපකිරීමක් කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අන්න කඩේ යනවා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

කඩේ ගියාට කමක් නැහැ. යන්න ඕනෑ අයට. මේ වාගේ ආප්පයන්ට කඩේ යන්නේ නැතිව කඩේ යන්න ඕනෑ මිනිහාට කඩේ ගියාට කමක් නැහැ. මේ ආප්පයාගේ කට වහන්න. කථා කරන්න ඕනෑ දේ කථා කරන්න දෙන්නේ නැහැ. ඔලුව අවුල් කරනවා මේ ආප්පයා. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අනුරුද්ධ ලේකම්ගේ ගරු මන්ත්‍රීතුමා පැමිණ නැහැ. ඒ අනුව මීළඟට සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 10.55]

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ ශීර්ෂ අංක 107, 121, 122, 123, 124, 125 සහ 103 කියන වැය ශීර්ෂයන් සම්බන්ධයෙන් විවාදයට එකතු වෙන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම සතුටු වෙනවා. විශේෂයෙන්ම මම හිතන්නේ, ගරු ඇමතිතුමා බොහොම නිහතමානී සහ හැම මන්ත්‍රීවරයෙකුගේම ප්‍රශ්නවලට ඇහුම්කන් දෙන අමාත්‍යවරයෙක් හැටියට හැම කෙනෙකුගේම ලොකු ප්‍රසාදයක් තියෙනවා. පක්ෂ විපක්ෂ මන්ත්‍රීතුමාලාගේ. ඒ එතුමාගේ වැය ශීර්ෂ සම්බන්ධව මම දේශපාලන කථාවක් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් මේ අයවැය මුදල් ප්‍රකාශයේ තිබෙන එතුමාගේ වැය ශීර්ෂයේ තියෙන සංඛ්‍යා ලේඛන පිළිබඳව පුංචි අදහසක් හා ඒ දෙපාර්තමේන්තු සහ ඒ අධිකාරිය සම්බන්ධ පුංචි අදහසක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

මුදල් ප්‍රකාශයෙන් මූලධන වියදම් හැටියට මිලියන 671 ක් ඇමතිතුමාට වෙන් කරලා තියෙනවා. ඒ වාගේම මුළු අයවැයෙන් 2.7% ක් ප්‍රතිශතයක් හැටියට ඇමතිතුමාට වෙන් කරලා තියෙනවා. ඒකෙන් PSDG වලට රුපියල් මිලියන 367 කුත්, PDG වලට රුපියල් මිලියන 302 කුත් වෙන් කරලා තියෙනවා. PSDG කියන රුපියල් මිලියන 367 වැය ශීර්ෂ 2001, 2104, 2506, 2509 කියන වැය ශීර්ෂවල මුදල් වෙන් කරලා තියෙනවා. PDG වල රුපියල් මිලියන 302 ක් 2001, 2102, 2103, 2104, 2502 සහ 2509 කියන වැය ශීර්ෂවලට මුදල් වෙන් කරලා තියෙනවා. ඇමතිතුමාගේ විෂයයන් 07 ක් තියෙනවා. මේ විෂයයන් 07 ට PSDG සහ PDG වෙන් කරලා තිබෙන විධිය, මුදල් බෙදී යන ආකාරය පිළිබඳව තමුන්නාන්සේලාට පුංචි විශ්ලේෂණයක් කරන්න ඕනෑ. මේක මම බන්දුල මහත්තයාගේ අවධානයට විශේෂයෙන්ම යොමු කරනවා. මොකද මේ අයවැය ලේඛන සකස් කිරීමේදී, කෙටුම්පත් සකස් කිරීමේදී යම් අඩුපාඩුවක් සිදුවී ඇතැයි කියන එක මම දකිනවා. ඒ නිසයි මම මේක මෙහෙම කියන්න හිතුවේ. මොකද, මාර්ග සඳහා PSDG වලට මිලියන 300 ක් වෙන් කර තියෙන කොට PDG වලට ශත පහක්වත් වෙන් කරලා නැහැ. ප්‍රවාහන කියන විෂයට PSDG මිලියන 20 ක් වෙන් වෙන කොට PDG වල සත පහක්වත් වෙන් වෙලා නැහැ. සමූපකාර සංවර්ධන හා වෙළඳ කියන විෂයට, PSDG වලින් සත ශත පහක්වත් වෙන් වෙලා නැහැ. PDG වලින් මිලියන දෙකක් වෙන් වෙලා තියෙනවා. නිවාස හා ඉදිකිරීම් කියන විෂයට, PSDG වලින් මිලියන 08 ක් වෙන්වෙන කොට PDG වලින් ශත පහක්වත් වෙන් වෙලා නැහැ. වතු යටිතල පහසුකම් කියන විෂයට PSDG වලින් මිලියන 09 ක් වෙන් වෙන

[ගරු සහන් ප්‍රදීප් විතාන]

කොට PDG වලින් ශත පහක්වත් වෙන් වෙලා නැහැ. ඒ වාගේම කර්මාන්ත කියන විෂයට PSDG වලින් මිලියන 15 ක් වෙන් වෙන කොට PDG වලින් ශත පහක්වත් වෙන් වෙලා නැහැ. ග්‍රාම සංවර්ධනය කියන විෂයට PSDG වලින් මිලියන 15 ක් වෙන් වෙන කොට PDG වලින් ශත පහක් වෙන් වෙලා නැහැ. එහෙම බලනකොට එකතුව ගත්තාම PDG මිලියන 302 න් මිලියන 02 යි විෂයන්ට අදාළව මුදල් ප්‍රකාශයේ වැය ශීර්ෂයේ වෙන් වෙලා තියෙන්නේ. ඒ වාගේම ඒකත් කුඩා කර්මාන්තවලට වෙන් වෙලා තියෙන්නේ. ඒ වාගේම PSDG වල මිලියන 367 න් මිලියන 67 ක් විතරයි ඒ විෂයන්වලට වෙන් වෙලා තියෙන්නේ. මිලියන 300 ක්ම මාර්ග සංවර්ධනයට යොදවලා තියෙන්නේ. ඒ නිසා මම මේ මුදල් ප්‍රකාශය සකස් කිරීමේදී අමාත්‍යාංශවලට වැය ශීර්ෂවලට මුදල් වෙන් කරද්දී මම දකිනවා, මේකේ වෙනසක් සිදු විය යුතුයි කියලා. ඒ සඳහා බන්දුල මහතාගේ අවධානයට මම මේ කාරණාව යොමු කරනවා.

විශේෂයෙන්ම දැන් අපි දන්නවා. රියදුරු පුහුණුව සඳහා දැන් අපේ මන්ත්‍රීවරු, ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු මන්ත්‍රීවරු මුදල් වෙන් කරලා තියෙනවා. නමුත් ඒක අද ක්‍රියාත්මක කර ගන්න බැරි තත්වයකට පත් වෙලා තියෙනවා. මොකක්ද ඒකට හේතුව? දැන් මේ වෙනකොටත් එය ක්‍රියාත්මක කරන ආකාරය සහ ඒ තියෙන අඩුපාඩුකම් එක්ක ඒක කර ගන්න බැරි තත්වයට පත් වෙලා තියෙනවා. මොකද නාම ලේඛන ලබා දීලා නැහැ. ඒවා කරන්නේ කවුද කියලා ලේඛන ලබා දීලා නැහැ. ඒ නිසා නිලධාරීන්ට ඒ වරද පටවන්නේ නැතුව මම ඉල්ලීමක් කරනවා. සමහර වේලාවට ඒක ක්‍රියාත්මක කරන්න බැරි වුණොත්, ඒක අපේම වරදක් හැටියට, අපේ මන්ත්‍රීවරුන්ගේ වරදක් හැටියට දකින්න කියලා.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, උපදේශක කාරක සභා, නියමිත වෙලාවට තියලා ඒ වැය ශීර්ෂයන් සම්බන්ධව ලේකම්තුමිය හා ඒ නිලධාරී මණ්ඩලයත් එක්ක සාකච්ඡා කරලා, හරියට ඒ පිළිබඳව පසුවිපරම් කරලා, ඒ සෑම මුදලක්ම වෙන් වුණු මුදලක්ම වියදම් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙල සකස් කරලා තියෙනවාය කියන එක මතක් කරන්න ඕනෑ.

ඒ වගේම ප්‍රවාහනය පැත්තෙන් ගත්තාම, ප්‍රවාහන අධිකාරිය අද විශාල මුදලක් බලපත්‍ර තුළ හොයනවා. එදා අතයට පර්මිට් දුන්නේ, එහෙන් මෙහෙන් සල්ලි අර ගෙන හොරට. නමුත් ඇමතිතුමා ඒක වෙනස් කළා. ටෙන්ඩර් පටිපාටියට ගිහිල්ලා, අද කෝටි ප්‍රකෝටි ගණන් මුදල් ප්‍රවාහන අධිකාරියට ලබා දෙන්න, අද කටයුතු කරලා තියෙනවා. ඒක අපි හොඳ ලක්ෂණයක් හැටියට දකිනවා. එතුමාගේ අවංකකම එතැනින් පිළිඹිබු වෙනවාය කියන එකත් මතක් කරන්න ඕනෑ. ඒ වගේම තමයි පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය. ඒ එතුමන්ලා ලැබෙන පුංචි මුදල හරියට වියදම් කරලා හොඳ ඵලදායි විධියට ඒ කටයුතු සිදු කරලා තියෙනවා කියන එක මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම තමයි සමූපකාරය. සමූපකාර කොමසාරිස්තුමාට දැවැන්ත බලපෑම් තියෙනවා. නමුත් මේ වගේ වෙලාවක එතුමා සහ ඇමතිතුමා බොහොම අවබෝධයෙන් කටයුතු කරමින් අද සමූපකාරය එදා තිබුණු ප්‍රශ්ණ ගැටලු විසඳන්න කමිටුවක් පත් කරලා, අද හොඳින් ඒක කර ගෙන ගිහිල්ලා මම හිතනවා ඉදිරි වර්ෂය වෙන කොට මේ ගැටලු සියල්ල අවසාන කරන්න පුළුවන්කම තියෙනවා. ඒ වාගේම මේ සමූපකාරවල තියෙන අයවැය ලේඛණ අද අපට ලබා දීලා තියෙනවා. මන්ත්‍රීවරු හැටියට බලලා ඒවායේ අඩුපාඩු තියෙනවා නම්, කියන්න කියලා. ඒ වාගේම පැහැදිලිව කියන්නට ඕනෑ. නිවාස අධිකාරිය. නිවාස කොමසාරිස්තුමිය අද නිවාස ආධාරයක් අපට දුන්නාම, ඒ ගෙවල්වලට ගිහිල්ලා බලලා, හොයලා බලලා අඩුපාඩුකම් බලලා ඵලදායි විධියට ඒ මුදල් බෙදා හැරීම් කටයුතු කරනවා. ඒ නිසා කොමසාරිස්තුමියට මගේ ගෞරවය පුද කරනවා. ගරු ඇමතිතුමාගේ උපදෙස් මත ඉතාම හොඳින් ඒ නිවාස අරමුදල, එතුමා ලබා දෙන මුදල්වලින් ඒ කටයුත්ත ඉතාම හොඳින් අවසාන කරන්න අද කටයුතු කරලා තියෙනවා. ඒ වගේම වතු යටිතල පහසුකම් කියන විෂයට ඇත්තටම ගරු ඇමතිතුමනි මුදල් වෙන් වෙලා තියෙනවා මදී. ඒක පුළුල් විෂයක්. ඒකෙන් ලොකු වැඩක් කරන්න පුළුවන්. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. ඒ PDG වල ගොඩනැගිලි කියන විෂයට මිලියන 265 ක් වෙන් කරලා තියෙන කොට, ඒකෙන් යම් ප්‍රමාණයක් වැඩි ප්‍රමාණයක් ඒ වතුයටිතල පහසුකම් කියන ඒ වැය ශීර්ෂයට ලබා දෙන්නය කියලා.

ඒ වාගේම තමයි කර්මාන්ත අධිකාරිය. කර්මාන්ත දෙපාර්තමේන්තුව. ඒ අය විශාල වැඩ කොටසක් කරනවා. පුංචි මුදලකින්. බොහොම ඵලදායි විදිහට වැඩ කරන දෙපාර්තමේන්තුවක් සහ අධිකාරියක් හැටියට අපි දකිනවා. ඇමතිතුමාගේ උපදෙස් අනුව ඒ නිලධාරී මණ්ඩලය බොහොම හොඳින් ඒ කටයුතු කර ගෙන යනවා. අද සියලු කර්මාන්ත ක්ෂේත්‍රය තුළ ඒ ලැබෙන මුදල බොහොම හොඳට වියදම් කරලා, ඒ කර්මාන්ත කරන අහිංසක අයට උදව් කරන තෝතැන්නක් බවට පත් වෙලා තියෙනවා. ඒ පිළිබඳව අද අපේ ස්තුතිය ගෞරවය පුද කරන්න ඕනෑ. ඒ වාගේම තමයි, ග්‍රාම සංවර්ධනය. ග්‍රාම සංවර්ධනය ගරු ඇමතිතුමනි පොදු වැඩ පිළිවෙළක් හදන්නේ. මොකද ග්‍රාම සංවර්ධනය කියන්නේ ලොකු වැඩක් කරන්න පුළුවන් විෂයක්. මිලියන 15 ක් දාලා ඒකෙන් වැඩ කරන්න මදී. ඒ නිසා ග්‍රාම සංවර්ධනයට ඔබතුමා ඒ සඳහා විශේෂ වැඩපිළිවෙළක් කරලා සෑම මන්ත්‍රිවරයෙකුටම සම්බන්ධ වෙන්න පුළුවන් ක්‍රමවේදයක් හදන්න කියන ඒ ඉල්ලීම කරනවා.

ඒ වාගේම පැහැදිලිවම කියන්නට ඕනෑ. ඒ අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු ඒ සියලු ආයතනවල ප්‍රධානීන් හැම කෙනෙක්ම බොහොම අවබෝධයෙන් ඇමතිතුමත් එක්ක සුහදව, උපදේශක කාරක සභාවත් එක්ක බොහොම ළෙංගතුව අදහස් හුවමාරු කර ගනිමින්, ඒ අමාත්‍යාංශයේ සියලු ජයග්‍රහණ කරා යන්න අවශ්‍ය ශක්තිය ලබා දෙනවා කියන එක මතක් කරන්න ඕනෑ. ඒ වාගේම තමයි ඇමතිතුමාගේ කාර්ය මණ්ඩලය. අපි වැඩක් කිව්වොත් - මට මන්ත්‍රිවරු ගොඩාක් කියලා තියෙනවා. ඇමතිතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය ගොඩාක් හොඳින් වැඩ කරනවා. මන්ත්‍රිවරුන් කියපු වැඩ ගොඩාක් වෙලාවට පසුවිපරම් කරලා, හොයලා බලලා උදව් කරනවා. නුවන් මහත්මා, කිත්සිරි මහත්මා, වසන්ත මහත්මා ගැන අපි කියන්න ඕනෑ. ඒ අය ගොඩාක් උනන්දුවෙන් ඇමතිතුමාට ලොකු ශක්තියක් ලබා දෙනවා. අමතක වෙන දේවල් පවා මතක් කරලා දීලා. ඒ පිළිබඳව අපි මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. ඒ නිසා මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපේ සම්පූර්ණ සහයෝගය අපි උපදේශක කාරක සභාවේ ඉඳන් ඇමතිතුමාට දෙන ඒ සහයෝගය වාගේම අද අයවැය විවාදේදී ඔබතුමාගේ වැය ශීර්ෂය සම්මත කරන වෙලාවට අපි සියලු දෙනාගේ සම්පූර්ණ සහයෝගය ඔබතුමාට ලබා දීලා ඔබතුමාගේ ඉදිරි වර්ෂය සහ ඔබතුමා මේ අමාත්‍ය ධූරය දරන තුරු ඔබතුමාගේ තියෙන මනුස්සකමට, නිහතමානීකමට, ලෙන්ගතුකමට ඔබතුමාගේ තියෙන හැකියාවට අපි සහයෝගය ලබා දෙන බව මතක් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.04]

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මුලින්ම කියන්න කැමතියි. අපේ ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමාගේ කාර්ය මණ්ඩලය පිළිබඳව මම හිතන්නේ ගොඩාක් මන්ත්‍රිවරු - මගේ ඉතිහාසයේ, පළාත් සභාවේ මගේ අවුරුදු 18 ක ඉතිහාසයේ කාර්ය මණ්ඩලයක් පිළිබඳව ගිය වර්ෂයේ අයවැයේදීත්, ඒ වාගේම මේ වර්ෂයේ අයවැයේදීත් ඇගයීමට ලක් කිරීම පිළිබඳව මට ඇත්තටම සතුටක් තියෙනවා. මොකද අනිත් අමාත්‍යාංශවලටත් මේ ආදර්ශය ගත්තොත් - අනික් අමාත්‍යාංශ වලත් බොහෝ නිලධාරීන් හොඳ අය ඉන්නවා. නමුත් කාර්ය මණ්ඩලයක් හැටියට සමස්තව ඔක්කොම එකට එකතුව වැඩ කරන අමාත්‍යාංශයක් හැටියට හැම මන්ත්‍රිවරයෙකුටම පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒකට දැන් අද ඉන්නේ මේ අමාත්‍යාංශයේ ඉන්න නිලධාරීන් විතරයි. අනිත් අමාත්‍යාංශවල අයත් හිටියා නම් තමයි වටින්නේ. නේද?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඔව්. ඒක ඇත්ත ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ විතරක් නොවෙයි. මන්ත්‍රිවරුත් හිටියා නම් මේ සභාවේ මීට වඩා වැදගත් වෙනවා. මොකද අද ගණන් කරලා බලන්න. මන්ත්‍රිවරු කී දෙනාද ඉන්නේ කියලා වැදගත් අමාත්‍යාංශයක්. මේ අමාත්‍යාංශයට ගියාට පස්සේ නම් අපට පේනවා මන්ත්‍රිවරු නිවාස ආධාර ෆෝම් ටික ගන්න, ඊළඟට කර්මාන්ත අධිකාරියෙන් මොනවා හරි ලබා ගන්න අමාත්‍යාංශය පිරෙන්න ඉන්නවා. පාරවල් ටික කර ගන්න. මේ අමාත්‍යාංශය පිරෙනවා. හැබැයි අමාත්‍යාංශයේ වැය ශීර්ෂ විවාදයෙදි සහභාගි වෙන මන්ත්‍රිවරු, මන්ත්‍රිවරියන් ගණන බලන්න කී දෙනාද කියලා. (බාධා කිරීමක්)

[ගරු සරත් පතිරණ]

මම මුලින්ම ස්තුතිවන්ත වුණේ කාර්ය මණ්ඩලයට. ඒ කරන කැපවීමට. ඔබතුමාගේ අමාත්‍යාංශය ඉස්සරහට ගෙනියන්න කරන ඒ දරන උත්සාහය පිළිබඳව. ඊළඟට ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ ප්‍රධාන වගකීමක් තියෙනවා. මාර්ග සංවර්ධන ව්‍යාපෘති විශාල ගණනක් ඔබතුමාගේ අමාත්‍යාංශයට එනවා. PRDA එකට. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම උදාහරණයක් කියන්නම්. මාළඹේ රොබට් ගුණවර්ධන මාවත සංවර්ධනය කරන්න බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යතුමා මුදල් වෙන් කරලා තිබුණා, ලක්ෂ 75 ක්. ඒක PRDA එකෙන් ඇස්තමේන්තු කළේ. මම ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය වෙලාවෙත් මේ පිළිබඳව මගේ විවේචන ඉදිරිපත් කළා. ලක්ෂ 75 ක මුදල PRDA එකෙන් ඇස්තමේන්තු කරලා දුන්නාට පස්සේ, PRDA එකට වැඩ වැඩියි කියලා කඩුවෙල මහ නගර සභාවට තමයි මේ ව්‍යාපෘතිය, ඒ සංවර්ධන කටයුතු ටික යොමු කළේ. නමුත් මේක මාස ගාණක් ඇදුණා. ප්‍රතිපාදන එවලා මාස තුනක්. කඩුවෙල මහ නගර සභාවට කාපට් කරන පාරට ඇස්තමේන්තු හදා ගන්න බැරි වුණා. (බාධා කිරීමක්) මම දැක්කා අද මෙතුමාගේ, අපේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකුගේ ගෙදරට යන පාරට මෙතුමා මුදල් වෙන් කරලා තිබුණා. කඩුවෙල මහ නගර සභාව ප්‍රතික්ෂේප කරලා. මේ අවුරුද්දේ අන්තිම වෙලාවේ. මුදල් වෙන් කළාට පස්සේ. කඩුවෙල මහ නගර සභාව මේක භාර ගත්ත මොහොතේ බෑ කිව්වා නම්, ඊට පස්සේ ඒ මුදල් වෙන් කළ මන්ත්‍රීවරයාට හෝ ඇමතිවරයාට ඒක වෙනස් කර ගන්න තිබුණා. (බාධා කිරීමක්) PRDA එක දැන් මගේ ව්‍යාපෘතිය, ඒ මාළඹේ ව්‍යාපෘතියත් PRDA එක භාර ගත්තා කියලා මම නම් දන්නේ නැහැ, ඒක කෙරෙයිද නැද්ද කියලා. ඔබතුමා පුළුවන්නම් පෞද්ගලිකව හොයලා බලන්න. මාළඹේ රොබට් ගුණවර්ධන මාවතට ලක්ෂ 75 ක මුදල් වෙන් කරලා දැන් මාස තුනකට අධික කාලයක් වෙනවා. PRDA එකේ ප්‍රශ්නයක් නොවෙයි තියෙන්නේ. කඩුවෙල මහ නගර සභාවේ ප්‍රශ්නයක්. කාපට් කරන්න අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ටික කඩුවෙල මහ නගර සභාවට දීලා තියෙනවා. දැන් මම උපදේශක කාරක සභාවේදීත් ඉදිරිපත් කළා ගරු ඇමතිතුමනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආයතනවලට පුහුණුව, තාක්ෂණික පුහුණුව අවශ්‍යයි. කාපට් කරන පාරකට ඇස්තමේන්තුවක් හදා ගන්න බැහැ. ඇස්තමේන්තු 02 ක් හැදුවා කඩුවෙල මහ නගර සභාව. ඒ දෙකම ප්‍රතික්ෂේප වුණා. පස්සේ මම PRDA එකෙන් හදපු අපේ සූරියආරච්චි මහත්මයා හදපු, මට මතක සූරියආරච්චි ඉංජිනේරු මහත්තයා. සූරියආරච්චි මහත්තයා හදපු ඇස්තමේන්තුව තමයි කඩුවෙල මහ නගර සභාවට මම ගෙනැත් දුන්නේ. ගෙනැත් දීලා ඒ ඇස්තමේන්තුව තමයි කඩුවෙල මහ නගර සභාව විසින් නැවත ඉදිරිපත් කළේ, අනුමැතියට. මේ ඔක්කොම කරලා අවසානයේ කඩුවෙල මහ නගර සභාව ව්‍යාපෘතියක් අත හැරියාට පස්සේ, මේ නගර සභා පාරක් මේක. PRDA පාරක් නෙමෙයි. නගර සභා පාරක්. මේක කර ගන්න බැරි අදක්ෂ පාලනයක් නම් කඩුවෙල මහ නගර සභාවේ තියෙන්නේ. මේක මේ එන මැතිවරණයේදී වෙනස් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැඩක් කරන්න පුළුවන් කාර්යක්ෂම මන්ත්‍රීවරු, මොන දේශපාලන පක්ෂයේ වුණත්. මේ කොන්ත්‍රාත්කරුවන්ට නාම යෝජනා දීලා.

අද මම දන්නවා. හෝමාගම ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත්කරුවෝ බහුතරයක් තමයි මේ පක්ෂවලින් නාම යෝජනා අර ගෙන තියෙන්නේ. පක්ෂවල නම් කියන එක හරි නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් නාම යෝජනා ලැයිස්තු බැලුවාම ඔබතුමන්ලට තේරෙයි. ඔබතුමාලා මේ කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරු. දැන් තේරෙයි හෝමාගම ප්‍රාදේශීය සභාවේ කවුද ඡන්දයට ඉල්ලන්නේ කියලා. කොන්ත්‍රාත්කරුවෙක් මන්ත්‍රීවරයෙක් වුණාට පස්සේ ඔහුගෙන් සිද්ධ වෙන සංවර්ධනය පෞද්ගලික සංවර්ධනයක් මිසක්, ගමේ පළාතේ සංවර්ධනයක් සිදු කරන්න ඔහුට උවමනාවක් නැහැ. මේ මැතිවරණයට පෙර මෙන්න මේවා වළක්වන්න ඕනෑ. කොන්ත්‍රාත්කරුවන් මේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවලින් ගසා කන විදිය. අපට බලන් ඉන්න බැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමහර ඒවා බලන් ඉන්න බැහැ. කොන්ක්‍රීට් කරනවා සමහර පාරවල්. ප්‍රාදේශීය සභා, නගර සභා, කොන්ක්‍රීට් කරන එක ගැන මිනිස්සුන්ට අවබෝධයක් නැහැ. කොන්ක්‍රීට් එකේ උස, අඟල් 3 ද 4 ද, ඒ ප්‍රමිතිය සම්බන්ධයෙන් මිනිස්සුන්ට අවබෝධයක් නැහැ. කොන්ක්‍රීට් කරද්දි මිනිස්සු පාරෙ අයිනෙන් යනවා. මේකේ අඟල් හතර වැටෙනවාද? දුර ප්‍රමාණය අනුව එකේ අවශ්‍ය ඒ ඒ තීරු වෙන් කිරීම් කරනවාද? ඒ වාගේම කොන්ක්‍රීට් කළාට පස්සේ මේක ඒ අදාළ ප්‍රමිතීන් තියෙනවාද කියලා, තාක්ෂණික නිලධාරීන් - අවුරුද්ද අවසානයේ කරන කිසිදු

ව්‍යාපෘතියක් අධීක්ෂණය කරන්නේ නැහැ. පාරේ දිගයි, පළලයි මැන ගන්නවා විතරයි. ඒ මැනලා ගෙනත් ආයතනයට දුන්නාට පස්සේ TO යන්නේ නැහැ පාර බලන්න. මොන විධියටද මේ පාර සංවර්ධනය කරන්න ඕනෑ කියලා ඔහුට අවබෝධයක් නැහැ. මේ ආයතනයට ගෙනත් දුන්නාට පස්සේ ඔහු පාරේ දිග පළල දකිනවා. නගර සභාවට, ප්‍රාදේශීය සභාවට. ගෙනත් දුන්නාට පස්සේ දිග පළලට ඇස්තමේන්තු හදනවා. ඇස්තමේන්තු හදලා කොන්ත්‍රාත්කරුවෝ අර ගෙන යනවා, ඒ ඇස්තමේන්තුව ක්‍රියාත්මක කරන්න. ගමේ මිනිස්සු දන්නේ නැහැ. ගමේ මිනිස්සු විරුද්ධ වෙන්නෙත් නැහැ. මොකද ගොඩක් කොන්ත්‍රාත්කරුවෝ පාතාලයත් එක්ක සම්බන්ධයි. ඔය කොන්ත්‍රාත් කරන අය. ගමේ මිනිස්සුන්ගේ කිසිදු විරෝධතාවයක් නැහැ. කොන්ක්‍රීට් කරලා මාස 06 න් කැඩුණු පාරවල් මම ඕනෑ තරම් පෙන්වන්නම්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගේ ප්‍රදේශයෙත් ඇති. මෙන්න මේ නිසා කොන්ත්‍රාත්කරුවන්ට නාම යෝජනා භාර දීම සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන්න ඕනෑ. සියලුම දේශපාලන පක්ෂ. ඔහු කොන්ත්‍රාත් කරනවා නම් ඔහුට වෙනම කර ගන්න දෙන්න.

ඒ වාගේම ග්‍රාම සංවර්ධනය සම්බන්ධයෙන් කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ග්‍රාම සංවර්ධන සමිති තියෙනවා. ග්‍රාම සංවර්ධන සමිති ගොඩාක් තියෙන්නේ කොන්ත්‍රාත්කරුවන්ට. කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් අත්සන් කරන්නේ ග්‍රාම සංවර්ධන සමිති. සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළාට පස්සේ මේවාට 5% ක කොමිස් මුදලක් හම්බ වෙනවා, හැබැයි ග්‍රාම සංවර්ධන සමිති සාමාජිකයෝ දන්නේ නැහැ කොයිතරම් මුදලක් මේකට ලැබුණාද කියලා. ගොඩාක් ග්‍රාම සංවර්ධන සමිතිවල ඒවා පාලනය කරන්නේ, ප්‍රදේශයේ ඉන්න ප්‍රාදේශීය මන්ත්‍රිවරයා. ඒ ප්‍රාදේශීය මන්ත්‍රිවරයා විසින් තමයි 5% කොමිෂන් එක ඒ ආයතනයට අරන් දෙන්නේ. කොන්ත්‍රාත් එක කරන්නේ ඔහු. ඔහු තමයි ඒක තමන්ගේ ග්‍රාම සංවර්ධන සමිතියට ගන්නේ. ගසා කෑමේ කෙළවරක් නැහැ. ගසා කන්න පුළුවන් හැම විධියකින්ම, හැම පැත්තකින්ම ගසා ගෙන කනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒනිසා මෙන්න මේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් දැන් ගොඩාක් වෙලාවට -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

TO ලා තමයි වග කියන්න ඕනෑ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඒක තමයි මම කිව්වේ. TO ලා පාරවල් බලන්න යන්නේ නැහැ. ගොඩාක් ඒවා. මේ අවුරුද්ද අවසානයේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එතුමන්ලාගේ කාර්ය භාරය.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඇත්ත ඇත්ත. ඔබතුමාට අවබෝධයක් තියෙනවා. මේ කවුරුත් දන්නවා. මේ වැඩේ කවුරුත් දන්නවා. කියන්නේ නැහැ. කවුරුත් දන්නවා මේ ගැහිල්ල කොහොමද ගහ ගන්නේ කියලා. ඔබතුමා පාරවල් හදන්න සල්ලි වෙන් කරනවා. ඔබතුමා පාරක් පාරක් ගානේ ගිහිල්ලා හොයන්න යන්නේ නැහැ නේ? මේ නිලධාරි ටික නේ මේ වැඩේ සොයා බැලීම කරන්න ඕනෑ. අදාළ පළාත් පාලන ආයතනයෙන්. PRD එකේ වැඩ ඉතාමත් ඉහළින්ම සිද්ධ වෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. පාරක් කොන්ක්‍රීට් කළොත් දෙපැත්තේ කාණු පද්ධතිය සකස් කරලා ඒවායේ නියම ප්‍රමිතියට සිද්ධ වෙනවා. අපට ඒ පිළිබඳව, PRD එක සම්බන්ධයෙන් තියෙන්නේ ගෞරවයක්. මේ නගර සභා, ප්‍රාදේශීය සභාවලින් කරපු පාරවල් ටික. පළාත් සභාවේ මුදල් ටික වෙන් කරන්නේ. ඔබතුමාගේ මුදල් ටික තමයි අරගෙන වෙන් කර ගෙන යන්නේ ප්‍රාදේශීය සභා පාර හදන්න. හැබැයි, මේ පාර හදලා මාස 06 න් කැඩිලා යනවා නම්, මහජනතාවගේ බදු මුදල් ටික නේද මේ කොන්ත්‍රාත්කරුවෝ නිලධාරීන් සමඟ එකතු වෙලා ගසාගෙන කන්නේ. මෙන්න මේකට ක්‍රියා මාර්ගයක් ගන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාත් මැදිහත් වෙන්න. ඔබතුමාටත් හැකියාවක් තියෙනවා නිලධාරින් සම්බන්ධයෙන් ඒ සොයා බැලීම කරන්න.

ඒ වාගේම තමයි ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධයෙන්. ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මම මීට අවුරුදු 05 කට

[ගරු සරත් පතිරණ]

06 කට ඉස්සෙල්ලා ඒ හිටපු ඇමතිතුමාට කිව්වා. කප්පන් ගන්න තැන් ටික සම්බන්ධව මම මේ සභාවට ලැයිස්තුවක් ඉදිරිපත් කළා. බස් වලින් කප්පන් ගන්න තැන්. මෙන්න මේ මේ තැන්, මෙන්න මේ පුද්ගලයන් කියලා මම ඉදිරිපත් කළා. පුද්ගලයන්ගේ නම් කිව්වේ නැහැ. ස්ථාන ටික පෙන්නලා දුන්නා. කළුතර ඉන්නවා ඒ කප්පන් කල්ලියේ ප්‍රධානම මෙහෙයුම්කරුවෝ. හැම තැනකින්ම කප්පන් ගන්නවා මේ පුද්ගලික බස් රථ සේවය. ඒ කර්මාන්ත කරුවන්ට කර ගෙන යන්න බැරි තරමට කප්පන්කරුවෝ වැඩි වෙලා. මේක ගිය ආණ්ඩුවෙත් එහෙමයි. මේ යහපාලන ආණ්ඩුව ඇතුළේත් කප්පන්කාරයෝ ටික ඒ කප්පම් ගැනිල්ල කොළඹ සිට ඒ ඒ ඈත ගම් වලට යනකන් හැම තැනටම කප්පන් ගෙවන්න ඕනෑ. ගෙවන මුදල් පිළිබඳව මම ඉදිරිපත් කළා. කිසිදු ක්‍රියා මාර්ගයක් ගත්තේ නැහැ. පසුගිය රජයටත් මේ රජයටත් ක්‍රියාමාර්ග ගන්න බැරි තරම් මේ මාෆියාව, ඉතාමත්ම ශක්තිමත් වෙලා තියෙනවා පාතාල කල්ලි සමඟ එකතු වෙලා. මේ නිසා නියෝජ්‍ය සභාපතිතුමනි, මෙන්න මේ ටික නතර කර ගත්තොත් මේ කර්මාන්ත - මේ කර්මාන්ත ටික රැකෙන්න ඕනෑ.

අද දුම්රිය වර්ජනයක් තියෙන වෙලාවක්. මේ ගමනාගමනය අද මිනිස්සුන්ට අත්‍යාවශ්‍ය සේවාවක් බවට පත්වෙලා. බස්වල එල්ලිලා යන්නේ පොර කකා, පොකුරු පිටින් ෆුඩ්බෝඩ් එකේ. දුම්රිය සේවය ලබා ගත් අය, ඒ ප්‍රවාහන සේවය ලබා ගත්තු මිනිස්සු ටික අද බස් රථවල එල්ලිලා යන විධිය දකිනවා නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට අපට මේක දැනෙන්නේ නැහැ. අපි A/C කරපු වාහනයේ ඇමතිවරු මන්ත්‍රිවරු එන නිසා. ඒ කෝටි 4 – 5 වාහන වල එන අයට මේක දැනෙන්නේ නැහැ. හැබැයි බස් එකේ ෆුඩ් බෝඩ් එකේ එල්ලිලා එන මිනිහාට තමයි මේක දැනෙන්නේ. මොන ආණ්ඩුව මාරු උනත් අපි හැමදාම ෆුඩ්බෝඩ් එකේ යන්නේ කියලා ඒ මනුස්සයාට දැනෙනවා. මේක මිනිස්සුන්ට දරා ගන්න බැහැ. දරා ගැනීමේ සීමාවන් ඉක්මවලා ගිහිල්ලා තියෙන්නේ. හෙට දවසේ මිනිස්සු මේවට විරුද්ධව පාරට බැස්සාට පස්සේ නතර කර ගන්නා බැහැ. සුනාමිය වාගේ මේ රට දෙගොඩ තලා යන තැනට මේ විරෝධය, ගමනාගමනය සම්බන්ධයෙන් තියෙනවා. ඔබතුමාට පුද්ගලිකව නෙමෙයි ගරු ඇමතිතුමනි. මේ රටේ ගමනාගමන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මිනිස්සුන්ට තියෙන්නේ කෑම පාර්සලය අර ගෙන උදේට බස් එකට නගින මනුෂ්‍යා බස් එකෙන් බැහැලා ආයතනයට යද්දී, ඒ කාර්යක්ෂම සේවාවත්, සුහද සේවාවක් ලබා ගන්න, ලබා දෙන්න ඒ ඒ රාජකාරි කරන රාජ්‍ය නිලධාරියා බස් එකෙන් බහින්නේ මාරාවේෂයෙන්. සුහද සිතින් තම සේවාව ඉෂ්ට කරන්න ඕනෑ කියලා ඒ අධිෂ්ඨානයෙන් ගෙදරින් බැහැපු මනුෂ්‍යා බස් එකෙන් බහින්නේ යක්ෂයෙක් වෙලා. බස් එකට නැග්ගාට පස්සේ එහාට මෙහාට තල්ලු කරනවා. ඉතුරු සල්ලි ටික දෙන්නේ නැහැ. මාරු කාසි නුදුන්නොත් යවනවා බස් එකේ ඉස්සරහාට. ඒ යැව්වාට පස්සේ නැවත ඉතුරු සල්ලි ගන්න විධියක් නැහැ. බස් එකෙන් බහින්නේ කොන්දොස්තරගේ ඇනුම් බැණුම්වලට ලක් වෙලා. කෑම පාර්සලය ප්‍රයිඩ් රයිස් එකක් වෙලා, බස් එකෙන් බිමට බහින කොට. බස් එකෙන් බැහැලා ආයතනයට ගියාට පස්සේ ඔහුට සුහද මිත්‍රශීලී මහජන සේවාවක් ඉෂ්ට කරන්න බැහැ. ඔහු මාරයෙක් වෙලා, යක්ෂයෙක් වෙලා යන්නේ. එහෙම නැත්නම් යක්ෂණියක් වෙලා. ඊට පස්සේ සේවාවන් ලබා ගන්න එන ඒ මහජනතාවට ඒ සේවය ලබා ගන්නා බැරි වුණාම, ඒ ගැටුම ඇති වෙන්නේ නිලධාරියා සහ ඒ මහජනතාව අතරේ. මෙන්න මේවා නතර කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ සම්බන්ධයෙන් ඔබතුමාටත් කිසියම් කාර්ය භාරයක් තියෙනවා. මේවා නිසා පරිදි සොයා බලලා මීට වඩා වැඩි වගකීමකින් යුක්තව ඔබතුමාගේ මැදිහත්වීමක් - මොකද, ඔබතුමාගේ කාර්ය මණ්ඩලය පිළිබඳව තිබෙන විශ්වාසය නිසා මීට වඩා වැඩි මැදිහත්වීමක් කරලා මේ සේවාවන් ටික තවදුරටත් විශේෂයෙන් අපේ රෙහෙනසිරි වරාගොඩ මැතිතුමා හිටපු පළාත් සභා මන්ත්‍රීතුමෙක්. එතුමාට ඒ ආයතනය සම්බන්ධව මීට වඩා වැඩි සොයා බැලීමක් කරලා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීලා ඒ කර්මාන්ත සංවර්ධන අධිකාරිය මීට වඩා ඉස්සරහට ගෙන එන්න ඔබතුමාගේ ඉදිරි කාලය තුළ ඔබතුමාට ශක්තිය ධෛර්ය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. අපි අපේ සහයෝගයත් ඔබතුමාට ලබා දෙමින් මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් නියෝජ්‍ය සභාපතිතුමාට නැවතත් ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා. සුභ දවසක්.

[පූ.භා. 11.17]

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශීර්ෂ අංක 107, 121, 122, 123, 124, 125 සහ 103 යටතේ ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ උපදේශක කාරක සභාවේ සිටින මන්ත්‍රීවරයෙක් හැටියට අදහස් ප්‍රකාශ කරනවා. මේ වන විට මොරටුව ප්‍රදේශය මා නියෝජනය කරන්නේ. රටේ තියෙන ආර්ථික තත්වයත් එක්ක මොරටුවේ වඩු කර්මාන්තය දැඩි අපහසුතාවයකට, බංකොලොත් භාවයකට පත් වෙලා තිබෙන්නේ. මේ කාල සීමාව වන විට අපේ මොරටුවට වසන්ත සමය තමයි උදා වෙන්නේ. ලී බඩු වලට හොඳ කලක්. නොවැම්බර් - දෙසැම්බර් පටන් ගත්තාම අප්‍රේල්, මැයි, ජූනි දක්වා අපේ වඩුවෝ බොහොම සතුටින් සිටින කාලයක්. අද වෙන කොට මේ ගැන සොයා බලන්න කෙනෙක් නැහැ. කථා කරන්න කෙනෙක් නැහැ. ලී මිල අහස උසට. හදපු නිෂ්පාදන ටික අලෙවි කරගන්න බැහැ. මාස 3 – 4 වෙක් එකටවත් අරගන්න විධියක් නැහැ,

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මම 2009 සිට මෙම සභාව නියෝජනය කරනවා. රාජ්‍ය දැව සංස්ථාවෙත් අධ්‍යක්ෂකවරයෙක් වෙලා සිටියා, 2014 ටික කාලයක්. මේ යහපාලන ආණ්ඩුව එන්න කලින්. මම එතනදිත් උත්සාහ කළා, මොරටුවේ වඩු කර්මාන්තය නියෝජනය කරන අයට යම් උදව්වක් කරන්න. 100 ක් නිෂ්පාදනය වෙනවා නම් 20% ක් අපේ පළාත් සභාවේ රජයේ ආයතන හරහා, මේ 20% සමූපකාර හරහා අපේ වඩු කර්මාන්තකරුවන්ට බෙදා දෙන්න පුළුවන්නම්, මම දකිනවා ඒකේ යම්කිසි සාර්ථක භාවයක් තියා ගන්න පුළුවන් හැකියාව තියෙනවා කියලා. ඉතින් මේ බලපු හැම උත්සාහයකින්ම අපට ඉහළින් සහයෝගය ලැබෙන්නේ නැහැ. මොකද අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පොලීසිය, සෞඛ්‍ය අමාත්‍යාංශය, මේ හැම එකටම ලී බඩු දෙනවා. නවීන ලී බඩු වගේම බොහොම පළපුරුදු වඩු කාර්මිකයන් ඉන්නවා. ඒ වගේම වඩු කර්මාන්ත සමූපකාර සමිති අපේ ප්‍රදේශය නියෝජනය කරනවා. අපට කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා යම්කිසි වැඩ කොටසක් අර ගෙන කරන්න තිබුණා නම් මම හිතනවා, අද මොරටුවට පත් වෙලා තියෙන ඉරණමට පළාත් සභා මට්ටමින් අපට සාර්ථක විසඳුමක් ලබා දීමට පුළුවන් කියන එක මම මේ අවස්ථාවේදී කියනවා. මොකද මා මෙතැන සිටින්නේ, මොරටු ජනතාවගේ නියෝජිතයෙක් හැටියට පළාත් සභාව නියෝජනය කරන්නේ. ඒක නිසා මොරටුවේ අයට යම්කිසි ප්‍රශ්නයක් දැනුනාම මේක අපේ අමාත්‍යාංශයට දැනෙනවා. ඒ දැනුනාම අදාළ තැන්වල ප්‍රකාශ කරන එක අපේ වගකීමක්, යුතුකමක්. ඒ වගේ තමයි අපේ මාර්ග සංවර්ධන සම්බන්ධව අපි කථා කළා. මාර්ග සංවර්ධනය යටතේ මගේ අමාත්‍යාංශ ප්‍රතිපාදන ගොඩාක් ලක්ෂ 5, 10 වැඩ පවා මා වෙන් කළේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියට. මොකද එතැනින් කළායින් පස්සේ යම්කිසි නිමාවක් ඇතිව වැඩක් ඉෂ්ට සිද්ධ කර ගැනීමේ හැකියාව කාර්යක්ෂමව අපට තියෙනවා. අපේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා කිව්ව ආකාරයට මේ හැම එකකම වරද තියෙන්නේ දේශපාලඥයාගේ නෙමෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපි යෝජනාව දුන්නාට පස්සේ ඇස්තමේන්තු සකස් කරන්නේ තාක්ෂණ නිලධාරීන්, එහෙම නැත්නම් ඉංජිනේරු මහත්වරු. මේවා එක එක්කෙනා අධීක්ෂණය කරනවා. කොමසාරිස්වරු, එහෙම නැත්නම් තව සභාපතිවරු. නගරාධිපතිවරු. මේ මේ අධීක්ෂණයක් වෙලා තියෙනවා. හැබැයි හැම එකකින්ම දෝෂාරෝපණය දේශපාලඥයන්ට යනවා. මේවා නිසියාකාරව, නිසි ප්‍රමිතීන්ට අපට කරලා තියෙනවා ද කියන එක හොයා ගන්න තියෙන්නේ, ඒක අනුමත කරන්නේ තාක්ෂණ නිලධාරීන් සහ ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්. ඉතින් මේ අය හරියට වැඩේ කරන්නේ නැත්නම් මේ අයට දඬුවමක් දීමේ ක්‍රමවේදයක් නැහැ. අපි හැම කෙනාම චෝදනා කරන්නේ පක්ෂ, විපක්ෂ දේශපාලඥයාට. මේක නෙමෙයි වෙන්න ඕනෑ. මීට වැඩි ප්‍රමාණයක්, මේ දේශපාලඥයාට දෙන ප්‍රමාණයට වැඩි ප්‍රමාණයක් තාක්ෂණ නිලධාරීන්ට, ඉංජිනේරුවරුන්ට තල්ලු කරන්න පුළුවන් නම්, නිලධාරීන්ට තල්ලු කරන්න පුළුවන් නම් මම හිතනවා, අපට සාර්ථකව මේ වැඩ ටික ඉෂ්ට සිද්ධ කිරීමේ හැකියාවක් තියෙනවා කියන එක.

අනික් එක තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමූපකාර විෂයය. සමූපකාර ඡන්ද තියෙනවා. ඡන්ද තිබුණත් ඒ අවශ්‍ය කරන ප්‍රමාණයට ලාභ පෙන්වන්නේ නැත්නම්, පාඩු පිට අරන් යනවා නම්, එන්න එන්නම කාබාසිනියා කරනවා නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා මම අපේ ඇමතිතුමාට යෝජනා කරනවා. ඒ නියමිත කාලය ඉවර නම් කොමසාරිස්වරයාගේ පාලනයට යටත් කරලා, නිලධාරීන්ට යොමු කරලා, මේ සමූපකාර කාබාසිනියා

[ගරු මොරිස් විජේරත්න]

කරන, සමූපකාර කාලා දමන අය ඉවත් කරලා සුදුසු අය පත් කරන්න කියන එක මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව කිව්වාම, අපට විවිධ වැඩ සටහන් රාශියක් මේ අමාත්‍යාංශය හරහා කරන්න පුළුවන්. අපේ බස්නාහිර පළාත තුළම අපට නිර්මාණාත්මක දෙයක් කරන්නට පුළුවන් එක දෙපාර්තමේන්තුවක් තමයි කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව. ඒ හරහා තමයි ගිය පාර අපේ උදය ගම්මන්පිල ඇමතිතුමා *"බිඳුනු පුටුවට දැතේ සවිය"* කියලා වැඩ සටහනක් අරන් කර ගෙන ගියේ. ඒ වාගේම තමයි ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය. ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයටත් වැඩ සටහන් රාශියක් කරන්න පුළුවන් හැකියාව තිබෙනවා. අපි දන්නවා. ප්‍රදේශයේ මේ වෙන කොට ජල ප්‍රශ්න ගොඩාක් වැඩි වෙලා තියෙනවා. හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම වල් වැදිච්ච, එහෙම නැත්නම් පුරන් වෙලා තියෙන අබලන් වෙලා තියෙන, ළිං අමුණු තිබෙනවා. මේ එකක්, අපට යෝජනාවක් හැටියට දීලා යම්කිසි මුදලක් වෙන් කරලා, ග්‍රාම සංවර්ධන සමිතියත් අර ගෙන, මේ ව්‍යාපෘතිය මුළු බස්නාහිර පළාත තුළම කරන්න පුළුවන් නම්, ග්‍රාම සංවර්ධන සමිතියේ දෙයක් කියලා පොදු කටයුතු සඳහා ළිඳක් ප්‍රතිසංස්කරණය කරන්න, අන්න එහෙම හරි කරන්න පුළුවන් නම් මම හිතනවා, මේක ඉතාමත්ම සාර්ථක විධියට ක්‍රියාත්මක කරන්න පුළුවන් කියන එක. ඒ වාගේම තමයි පසු ගිය කාලසීමාව තුළ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා අපි ත්‍රීවිල්වලට මීටර් ලබා දුන්නා. ඒ මීටර් ලබා දීම තුළින් අපේ මගියාටත්, ස්වයං රැකියාව කරන අපේ තරුණයන්ටත් විශාල සේවාවක් සිදු වුණා. මොකද පාරට බැහැලා ත්‍රීවිල් එකකට අත දැම්මොත් තමයි නතර කරන්නේ. ඒ ත්‍රීවිල් එකට හයර් එක තියෙනවා. අපි මේ මෑත කාලසීමාව තුළ අපේ විමධ්‍යගත මුදල් වලින්වත්, අපේ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව තුළින්වත් අපට ඒ අවශ්‍ය කරන ශක්තිය ලැබුණේ නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

මේ වෙන කොට අපි දන්නවා රටක් දියුණු වෙන්නට රටක මාර්ග පද්ධතියන් දියුණු වෙන්නට ඕනෑ. රටේ මාර්ග පද්ධතියන් දියුණු වෙන්න රටට මුදල් ආයෝජනය කරන්න ඕනෑ. බස්නාහිර පළාත් සභාව කිව්වාම මේ රටේ ප්‍රධානතම පළාත් සභාවක් බවට පත් වෙලා තිබෙද්දී, අපට මේ අවුරුදු තුනක හතරක කාල සීමාව තුළ තවම මීටර් 500 ක් අපට කාපට් කර ගැනීමේ හැකියාව ලැබුණේ නැහැ. ඒක අපේ ඇමතිතුමාගේ වරදක් නෙමෙයි. අපට කලින් අපේ ඇමතිතුමා ලබන අවම සම්පත්වලින් උපරිම සේවාවක් ලබා දෙන්න එතුමා කටයුතු කරනවා. ඒ වාගේම එතුමාගේ කාර්ය මණ්ඩලයත් ඇමතිතුමාට ඒ අවශ්‍ය කරන ශක්තිය ලබා දෙනවා කියන එක අපි මේ අවස්ථාවේදි ප්‍රකාශ කරන්න ඕනෑ. මොකද, මේ මාර්ග සංවර්ධනය - ඒ වාගේම මෑත කාලයේ මාර්ග සංවර්ධනය කිරීම කඩා වැටීම අපි දකිනවා. තැන් තැන්වල නම් තියෙනවා. සමස්තයක් හැටියට පළාත තුළ මාර්ග සම්බන්ධව සංවර්ධනයක් සිදු වෙලා නැහැයි කියන එක කනගාටුවෙන් හරි කියන්න ඕනෑ. මොකද ගිය පාරෙදි මම බස්නාහිර පළාත් සභාවේදී - පළාත් සභාවේ ලංකාවේම මන්ත්‍රීවරයෙක් ඉන්නවා කියන අදහස අපට ගියේ, බැසිල් රාජපක්ෂ මැතිතුමා පළාත් සභා මන්ත්‍රීවරුන්ට කිලෝ මීටර් ගණනාවක් කාපට් කරන්න අවශ්‍ය සම්පත් ආර්ථික සංවර්ධන කටයුතු හරහා අපට ලබා දුන්නා. මේ යහපාලන රජය යටතේ පළාත් සභාවට එහෙම ව්‍යාපෘතියක් නැහැ. දැන් අපි යහපාලනයට කටයුතු කරන්න යද්දී, අඩු ගාණේ කිලෝ මීටර් එකක් ගණනේ හරි මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට ලැබෙන්නේ නැහැ. ඒක අමාත්‍යාංශයට ලැබෙන්නෙත් නැහැ. ඉතින් මේ රටේ යන දිශාව, ගමන් කරන දිශාව කොහෙද කියන එකයි අපට අද බලාගන්න වෙලා තියෙන්නේ කියන එක කියන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අනිවාර්යයෙන්ම මේ විශාල වැදගත්කමක් තියෙන මේ අමාත්‍යාංශයට මුදල් දෙන්නේ නැතුව අපේ ඇමතිතුමා කොහොමද කටයුතු කරන්නේ? මෑතක පැමිණි ලේකම්තුමිය මේ සියලු දෙනාම යම් යම් සේවාවන්වල උපරිම සේවාවක් කරන්නට කටයුතු කරනවා.

ඒ වාගේම තමයි ගරු ඇමතිතුමනි, මෙතැන තිබෙනවා කෙටි කාලීන පාඨමාලා. අපේ අද වෙන කොට මේවා ගම්වලට ගිහිල්ලා නැහැ. අපේ පාවහන් නිෂ්පාදනය, රූපලාවන්‍ය පාඨමාලා, ජංගම දුරකථන අලුත්වැඩියාව, තිරරෙදි මැසීමේ පාඨමාලා මේ වාගේ වැඩ සටහන් 11 ක් තියෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේවාට තරුණ තරුණියන් ඉතාමත්ම වේගයෙන් එනවා. මේ වේගෙන්

එනවාට මේවා ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය කරන සම්පත් ටික ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා - මේ එක පාඨමාලාවක් මන්ත්‍රීවරුන්ට ලබා දෙනවා නම් මම හිතනවා, අපේ මේ වැඩසටහන කර්මාන්ත සංවර්ධනයට ඉතාමත්ම යහපත් තත්වයක් නිර්මාණය වෙනවා කියන එක කියන්න ඕනෑ. මොකද මෙතැනදි පාවහන් නිෂ්පාදනය, ජංගම දුරකථන කියන එක හැම අතකම තියෙනවා. ජනගහනයෙන් මිලියන 5 කට 6 කට වැඩි ප්‍රමාණයකට ජංගම දුරකථන අතේ තියෙනවා. ඒ වුණාට ඒවා හදන්න ගියාම විශාල මිළ මුදල් යනවා. ඉතින් මේ තරුණයන් මේක සම්බන්ධව ගොඩාක් උනන්දු වෙනවා. මේ උනන්දු වෙන පාඨමාලා ක්‍රියාත්මක කරන්න ග්‍රාමීය මට්ටමින් මේවා ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ ග්‍රාමීය මට්ටමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා මේවා ක්‍රියාත්මක කරන්න, ඒ මන්ත්‍රීවරුන්ව දැනුවත් කිරීමේ ක්‍රියාදාමයන් බොහොම අඩුවෙන් තමයි සිද්ධ වෙන්නේ කියන එක අපේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා අපට කියන්න ඕනෑ. ඉතින් මේ දේවල් කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් අපට කරන්න පුළුවන් නම්, මම කිව්වේ අර පොඩි දේකින් නිර්මාණාත්මක දෙයකට වැඩි පිරිසක් සම්බන්ධ වෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකවත් 50 – 75 ක් සම්බන්ධ වුණොත් එහෙම ද්ස්ත්‍රික්කයකින් 1000 කට වැඩි ප්‍රමාණයක් සම්බන්ධ කර ගන්න පුළුවන්. පළාතකට 3000 ක පමණ පිරිසක් මේ තියෙන විශේෂ පාඨමාලාවලට තෝර ගන්න පුළුවන්. ඒ පාඨමාලා කරලා ඉවර වුණාම දැන ගෙන තියෙනවා, ඒ අවශ්‍ය කරන යන්ත්‍රෝපකරණ හා මුදල් දෙනවා කියන එක.

ඒ වාගේම මට මතකයි මොරටුව ප්‍රදේශයට අපේ පසුගිය කාල සීමාවේ අපේ සභාපතිතුමා රෙහෙන්සිරි වරාගොඩ අපේ හිටපු මන්ත්‍රීතුමා බොහොම උනන්දුවක් ගත්තා මොරටුවේ ස්වයං රැකියා ලෙස වඩු කර්මාන්තයේ නියැලෙන අයට යමක් කරන්න. අපේ ඇමතිතුමාත් පැමිණිලා ණය මුදලක් ලබා දීලා, මේ කර්මාන්තය ශක්තිමත් කරන්න පුළුවන් හැකියාවක් තියෙනවාද කියලා බැලුවා. ඒකට අවශ්‍ය කරන සහයෝගය ඒ තැන්වලින් අපිට ලැබුණේ නැහැ . ඒක නිසා අපට සාර්ථකව ඉදිරියට ක්‍රියාත්මක කරන්න බැරි වුණා. ඒ එක්කම අවසාන වශයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මොරටුවේ ඇති වෙලා තියෙන ප්‍රශ්නයට - මේක ජාතික මට්ටමින් - දැව සංස්ථාව තියෙනවා, යන්ත්‍ර සූත්‍ර තියෙනවා. කර්මාන්ත අධිකාරියේ ලියාපදිංචි සමූපකාර සමිති, වඩු කර්මාන්ත සමූපකාර සමිති තියෙනවා. රජයේ තියෙන ඕඩර් ටික අර ගෙන, ඇණවුම් ටික අර ගෙන කර්මාන්ත හරහා අරන් ගිහිල්ලා අපේ මොරටුවේ වඩු කර්මාන්තයේ නියැලෙන වඩු කාර්මිකයන්ට සහනයක් ලබා දීමට කටයුතු කරන හැටියට ඉල්ලා සිටිමින් විශේෂයෙන්ම මෙම කටයුත්ත කර ගෙන යාමේදී අපට සහයෝගය ලබා දෙන ගරු අමාත්‍යතුමා, අමාත්‍යාංශයේ ලේකම්තුමා, පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටම, ඔවුන් ඉතාමත්ම හොඳ කාර්ය භාරයක් මෙහෙයක් ඉටු කරනවා. ඒක අපි අනිත් අයටත්, අනිත් තැන්වල අයටත් ආදර්ශයක් කියමින් ඔබ සියලු දෙනාටම ලබන්නා වූ නව වසර සුභ වේවා. නත්තල, සුභ නත්තලක් වේවා. අපේ ඇමතිතුමා හොඳ කතෝලිකයෙක්, බොහොම නිහතමානීව තමන්ගේ වැඩ කටයුතු ඉෂ්ට සිද්ධ කරනවා. අපි මොන ප්‍රශ්නයක් කථා කළත් ඒකට උත්තරයක් දීලා අපේ සිත සතුටු කරන්න පුළුවන් ඇමතිවරයෙක්. ඉතින් එතුමාට නිදුක් නිරෝගි කමත්, සුභ නත්තලත් සමඟ නව වසරක් උදාවේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පූ.භා. 11.30]

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තුතියි. ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ වචනයක් කථා කරන්න අවස්ථාව ඉල්ල ගත්තේ, දිස්ත්‍රික්කය නියෝජනය කරන බොහොම නිහතමානී ඇමතිවරයෙක් නිසා. ගමේ අය ආදරයට කියන්නේ කයිතන් මහත්තයා කියලා. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ මේ ඇමතිතුමාට ලැබුණු අමාත්‍යාංශය. මාර්ග විෂයයත් ඇතුළත් වෙලා තියෙනවා. පසුගිය කාලේ බැසිල් රාජපක්ෂ මහත්තයාගෙන් විශාල මුදලක් මේ අමාත්‍යාංශයට ලැබුණා. විශාල වැඩ කොටසක් කරපු අමාත්‍යාංශයක්. අද මුදල් නැතිකම නිසා මම හිතන්නේ, ඒ වගේ විශාල වැඩ කොටසක් කරන්න ඒ අවස්ථාව මෙතුමාට නැති වෙලා තියෙනවා. හැබැයි මම දකිනවා මේ අමාත්‍යාංශය සතුව ඒ සම්පත් ඔක්කෝම තියෙනවා. පසුගිය කාලේ බස්නාහිර පළාතට විතරක් නොවෙයි, පිට පළාත් වලටත් ගිහිල්ලා මේ PRDA එක හරහා වැඩ කළා. පාරවල් හැදුවා. අද

[ගරු ශිරන්ත අමරසේකර]

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවලට ලැබෙන මුදල් විවිධ කොන්ත්‍රාත්කාරයෝ හරහා පාරවල් කාපට් කිරීම, කොන්ක්‍රීට් කිරීම, ගල් ඇල්ලීම, ඉන්ටර්ලොක් ඇල්ලීම සිද්ධ වෙනවා. හැබැයි, මම යෝජනාවක් කරනවා 2018 වර්ෂයේ පළාත් පාලන ආයතනවල ඒ කොන්ත්‍රාත් ලබා දෙන කොට, පුළුවන් නම් PRDA එක මැදිහත් වෙලා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මැදිහත් වෙලා ඒ අවස්ථාවල් උදා කර ගත්තොතින් මම හිතන්නේ, ඒකෙන් අපට ලාභයක් කෙසේ වෙතත් මාර්ග සංවර්ධන අධිකාරියට, පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට හොඳ සේවයක් අපට ලබා දෙන්න පුළුවන්කම ලැබෙයි කියලා.

ඒ වාගේම ගරු ඇමතිතුමනි මම හිතන්නේ, මේ අමාත්‍යාංශයට තමයි එන්නේ බස්නාහිර පළාතේ රියදුරන් පුරුදු කරන එක. ඇත්තටම අපේ ගම්වල ඉන්නවා රියදුරන් විශාල පිරිසක්. විශේෂයෙන්ම ත්‍රිවීල් රියදුරන්. මේ අය රස්සාව කරනවා. හැබැයි ලයිෂන් නැහැ. උදාහරණයක් හැටියට මගේ ගම කඳාන. අපේ ඩිල්ෂාන් ගරු මන්ත්‍රීතුමා ඉන්නවා, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. ශ්‍රීනාත් මන්ත්‍රීතුමා දන්නවා. සිරිකමල් මන්ත්‍රීතුමාත් දන්නවා. බලපත්‍ර නැති රියදුරන් විශාල පිරිසක් ඉන්නවා. මේ සඳහා විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද මේ අයට තියෙන ප්‍රධාන ප්‍රශ්න විභාගය ලියන්න බැහැ. විභාගය ලියන්න බැරිකම නිසා මේ අයට රියදුරු බලපත්‍රයක් ගන්න විධියක් නැහැ. ඉතින් මේ අයව ඒ තැනට ගේන්න. මම ඇමතිතුමා එක්ක පුද්ගලිකවත් කථා කළා, කොමසාරිස්තුමා එක්ක කථා කරලා වැඩ පිළිවෙළක් හදන්න කියලා. ඒ කියන්නේ විභාගේ ලියන්නේ නැතුව, රියදුරු බලපත්‍රය - මේ අයට යම් පුහුණුවක් දීලා වාචිකව අර ගෙන යම් පුහුණුවක් දීලා, ඒ ප්‍රශ්න පත්‍රයේ තියෙන ප්‍රශ්නවලට පිළිතුරු වාචිකව අර ගෙන ඒ අයට රියදුරු බලපත්‍රයක් දෙන වැඩපිළිවෙළක් 2018 වර්ෂයේ මෙහෙන් හදලා දෙන්න කියන එක මම මතක් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හොඳ යෝජනාවක්.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඒ වාගේම කියන්න කනගාටුයි. මේ රියදුරු බලපත්‍රවලට පුහුණුව දෙන්න අමාත්‍යාංශයට වාහනයක් නැහැ. මම හිතන්නේ අමාත්‍යාංශයට වාහනය ගන්න ක්‍රමවේදයකුත් නැහැ. ඇත්තටම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම හිතන්නේ ශිරන්ත මන්ත්‍රීතුමා මේ කථා කරන එක ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවාත් එක්කම, අනික් මන්ත්‍රීවරුත් මේකට පොඩි අවධානයක් යොමු කරන්න. මේ ලොකු අඩුපාඩුවක් පෙන්වන්නේ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඇත්ත වශයෙන්ම අයවැයේදී මේක කථා කරන්න වුණු එක ගැනත් මම කනගාටු වෙනවා. අපේ මේ නිහතමානී ඇමතිතුමාට නිලධාරී මණ්ඩලයෙන් - මාත් එක්ක තරහා වෙන්න එපා. ඒ ලැබෙන සහයෝගය මදී කියලා මම හිතන්නේ. කොහේ හරි තැනක වරදක් තියෙනවා. රියදුරු පාසලට වාහනයක් නැහැ. වාහනයක් හයර් එකට හරි, වාහනයක් මිළදී ගෙන හරි රියදුරු පුහුණුව දෙනවා නම් පළමුවෙන්ම කරන්න ඕනෑ මෙතැනින්. ඇත්තටම මමත් මගේ ප්‍රතිපාදනවලින් රුපියල් ලක්ෂ 10 ක් වෙන් කළා. ඒකට මොකද වුණේ කොහොමද ලයිසන් ගත්තේ කියලා මම මෙතැන කියන්න යන්නේ නැහැ. ඇත්තටම ලොකු අඩුපාඩුවක් එතැන තියෙනවා. පළමුවෙන්ම වාහනයක් අරන් දෙන්න. ඊට අමතරව අපි මේ අයව යවනවා - පසුගිය කාලේ යැව්වේ, CTB එකට. දැන් CTB එකට යවන්නේ නැතුව මෙතැනින් කරනවා. මම ඒ ගැන -

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

වාහන ගන්න ලැහැස්තියි.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

වාහනය ගන්න ලෑස්තියි. බොහොම සන්තෝෂයි. ඒ වාගේම තමයි රියදුරු බලපත්‍රයක් ලබා දෙන්න අය කරන මිල. යම්කිසි මන්ත්‍රීවරයෙකු එයාගේ ප්‍රතිපාදන දානවා නම්, මම හිතන්නේ මීට වැඩිය අඩු ගාස්තුවකට මේක අරන් දෙන්න ඕනෑ. මම උදාහරණයක් හැටියට පෙන්නුවා පුද්ගලික අංශයෙන් මට කථා කළා. රු. 8000/- ට ලයිසන් එක අරන් දෙන්නම් කියලා. හැබැයි මෙහෙන් කියනවා අපට ඒ ගණනට දෙන්න බැහැයි කියලා. මම යෝජනා කරන්නේ යම්කිසි මන්ත්‍රීවරයෙක් මන්ත්‍රී ප්‍රතිපාදන දානවා නම් මේකට යන වියදම රු. 10,000/- නම් 5000/- ක් පළාත් සභාව යටතේ දාලා ඉතිරි 5000/- මන්ත්‍රීවරයාගේ ප්‍රතිපාදන වලින් දාලා අරන් දෙන්න. මොකද රියදුරු බලපත්‍රයක් තියෙන එක ස්වයං රැකියාවක්. රියදුරු බලපත්‍රයක් ගන්න බැරි විශාල පිරිසක් ඉන්නවා. විවිධ හේතු නිසා. මුදල් නැතිකම නිසාත් ඉන්නවා. ඒ වගේම අර ප්‍රශ්න නිසාත් ඉන්නවා. ඉතින් ඒ නිසා මම යෝජනා කරනවා, 2018 වර්ෂයේ ඔබතුමාගේ ප්‍රතිපාදන වලින් යම් කොටසක් රියදුරු බලපත්‍ර වලට වෙන් කරන්න. යම් මන්ත්‍රීවරයෙක් දානවා නම්, ඒකෙන් දෙකෙන් පංගුවක් මෙහෙනුත් දාලා. පහුගිය කාලේ එහෙම ක්‍රමයක් මේ පළාත් සභාවේ තිබුණා. මම 2009 පළාත් සභාවට ආවේ. 2009 ආපු වෙලාවේ ඒ පළාත් සභාවේ එහෙම ක්‍රමයක් තිබුණා. මේ පාර ඒක නැති වෙලා තියෙනවා. දැන් අපට ප්‍රතිපාදන ලැබෙනවා. එතකොට එන අවුරුද්දෙත් ඒකට මන්ත්‍රීතුමන්ලා මුදල් වෙන් කරයි. එම නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා කියනවා.

ඒ වාගේම තමයි අපේ මොරිස් විජේරත්න ගරු මන්ත්‍රීතුමා කථා කළා ත්‍රීවිල් මීටර් දුන්නා කියලා. ඇත්තටම දැන් යහපාලනය ගැන අපේ සමහර අය කථා කරනවා. පහුගිය කාලේ අපට මතකයි අපේ කොඩිකාර ඇමතිතුමා මන්ත්‍රීවරුන්ට ස්පයිස් දුන්නා. බෝල දුන්නා. බැට් දුන්නා. ලොරි වලින් අර ගෙන ගියේ. හැබැයි අපට නම් එතුමාගෙන් එක ටෙනිස් බෝලයක්වත් හම්බ වුණේ නැහැ. අද නිකන් කථා කරන්නේ හරියට සාධාරණව බෙදුවා වගේ. අපේ මොරිස් මන්ත්‍රීතුමාලා කථා කරන්නේ. හැබැයි අපටත් ඔය ත්‍රීවිල් මීටරයක්වත් හම්බ වෙලා නැහැ. ගිහිල්ලා අපේ ගමේ ඉන්න ත්‍රීවිල් එකකට හයි කරන්න කියලා. මෙරිල් මන්ත්‍රීතුමා බෙදුවාද ඩිල්ෂාන් මන්ත්‍රීතුමා බෙදුවාද කියන්න මම දන්නේ නැහැ. මට නම් හම්බ වෙලා නැහැ. ත්‍රීවීල් මීටර්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මොනවාද?

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ත්‍රීවීල් මීටර්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බෙදුවා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

අපට හම්බ වෙලා නැහැ. පළාත් සභා මන්ත්‍රීවරු හැටියට අපට හම්බ වෙලා නැහැ. දැන් යහපාලනයට සහයෝගය දෙන අය හැටියට අපි කියන්නේ නැහැ, අපට තනියම දෙන්න කියලා. සම්පූර්ණ එකතු වෙලා දෙන කොට ඔක්කෝටම දෙන්න. හැබැයි ත්‍රීවීල් මීටරය දෙන එකත් ලොකු දෙයක්. අර ජෝර්ජ් මන්ත්‍රීතුමාට කියලා දෙන්න මෙහෙම කථා කරන කොට

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔව්. ඔව්. විපක්ෂයේ සංවිධායකතුමා -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

මට මීට වැඩිය දීර්ඝ වශයෙන් කථා කරන්න ඕන නැහැ. අපි ඇමතිතුමාට සුභ පතනවා. විශාල කාර්ය භාරයක් කරපු ඇමැතිතුමෙකුගේ අමාත්‍යාංශය තමයි ඔබතුමාට හම්බ වෙලා තියෙන්නේ. ඒ වාගේම ඇත්තටම සමූපකාරය ගැන මතක් කරන කොට සමූපකාරයත් ඔබතුමාට එන්නේ. ජා-ඇළ ආසනයේ සමූපකාරයේ සභාපතිතුමාට පොඩි ස්තුතියක් කරන්න ඕනෑ. අර සමූපකාරයේ සල්ලි ටික බෙදද්දී ජා-ඇළ ආසනයේ සල්ලි ටික අර ඔහේ - 2015 මැතිවරණයට ඉස්සර මම දැක්කා ගොඩාක් තැන්වල සමූපකාරවල සල්ලි ටික අර ගෙන එක එක විධියට බෙදුවා. හැබැයි ජා-ඇළ ආසනයේ සමූපකාරයේ සල්ලි ටික එහෙම බෙදුවේ නැහැ. මම හිතන්නේ සභාපතිතුමා මැදිහත් වෙලා. ඒක නිසා මේකට මම විශේෂ ස්තුතියක් කරනවා. අපේ

පක්ෂය නියෝජනය කරන කෙනෙක් නෙමෙයි. එතුමාට ස්තුති කරනවා, ඒ සල්ලි ටික බේර ගත්තාට. ජා-ඇළ විවිධ සේවා සමූපකාර සමිතියේ සල්ලි ටික.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමාට උදව් කරනවා ඇති,

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

කිසිම උදව්වක් කරන්නේ නැහැ. ඊට වැඩිය විශේෂ දේවල් කියන්න ඕනෑ නැහැ. අපේ ඇමතිතුමාට සුභ පතනවා. 2018 අවුරුද්දේ මෙයට වඩා වැඩ කොටසක් කරන්න අවස්ථාව උදා වේවා කියලා. ඒ කරන ගමන් මන්ත්‍රීවරුන්ටත් ඒකේ ප්‍රතිලාභ ලැබිලා ජනතාවට ප්‍රතිලාභ ලැබෙන්න අවස්ථාවක් උදාවේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේ ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා ඇති.

**ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා *[යසපාල කෝරලගේ මහතා]* මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සභාපතිතුමා *[සුනිල් විජේරත්න මහතා]* මූලාසනාරූඪ විය.**

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.40]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, අපේ ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමාගේ මේ වැය ශීර්ෂය යටතේ අදහස් ස්වල්පයක් පළ කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව සතුටු වෙනවා. පළමුවෙන්ම මම කියන්න කැමතියි අපේ ලලිත් වනිගරත්න ඇමතිතුමා ඉතාම නිශ්ශබ්ද ඇමතිවරයෙක්. වැඩි කතා බහක් නැති වුණාට ඒ වගේම වැඩි සද්ද බද්ධයක් නැති වුණාට දැන් සභාවේ කරපු අදහස් වලින් පෙනී ගියා එතුමාගේ කාර්ය මණ්ඩලයත්, එතුමාත් තමන්ගේ කාර්ය සාධනය පැත්තෙන් යම් සාර්ථකත්වයක් පෙන්නලා තියනවාය කියන එක. ඒ නිසා මම හිතන්නේ ඒ පිළිබඳව අපි පසුවිපරමක්, සමාලෝචනයක් කළොත් යම්කිසි ප්‍රගතියක් අත්පත් කර ගෙන තියෙනවාය කියන එක පිළිබඳව අපි සතුටු වෙන්න ඕනෑ. එතුමා වැඩිය කැකොස්සන් ගහන්නේ නැහැ. ඒ වාගේම තමන්ගේ කාර්යය භාරය සහ තමන්ගේ වගකීම ඉෂ්ට කරන ඇමැතිවරයෙක් විධියට අපිට සතුටු වෙන්න පුළුවන්.

මම කැමතියි මේ අවස්ථාවේදී අවධානය යොමු කරන්න, මේ මොහොත වන කොට රටේ දුම්රිය වැඩ වර්ජනයක් පවතිනවා. දැන් දින ගණනාවක් තිස්සේ මේ දුම්රිය වැඩ වර්ජනය හේතු කොට ගෙන බස්නාහිර පළාතේ විතරක් නොවෙයි, මුළු රටේම මගී ජනතාව විශාල පීඩනයකට ලක් වෙලා තියෙනවා. අපහසුතාවයකට ලක් වෙලා තියෙනවා. ඒ වාගේම තමයි බස්නාහිර පළාත තුළ විශේෂයෙන්ම කොටුව දුම්රිය පොළේ ඉඳලා අනිකුත් සියළුම දුම්රිය පොළෙවල්වල විශේෂයෙන්ම අපේ සංචාරකයින් විදේශීය සංචාරකයින් මොන තරම් පීඩාවට අපහසුතාවයට පත් වෙලා තියෙනවාද කියන එක අපි දැක්කා, ඔවුන් මාධ්‍යවලට කරන ප්‍රකාශ දිහා බැලුවාම. මේක පැහැදිලිව අපේ සංචාරක කර්මාන්තයට යම්කිසි බලපෑමක් ඇති කරනවා. ඒ වාගේම මගී ජනතාව විශාල පීඩාවකට පත් වෙලා තියෙනවා. එහෙම නම් මෙවැනි අවස්ථාවකදී විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට විශාල වගකීමක් තියෙනවා. මේ පීඩාවට පත් වෙලා ඉන්න ජනතාව මේ පීඩාවෙන් මුදවා ගැනීම සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් කඩිනමින් දියත් කරන්න. මොකද, මේ තත්ත්වය තුළ විශේෂයෙන්ම අවධානයට ලක් වෙලා තියෙන්නේ ඉදිරි දින දෙක ඇතුළත පැවැත්වීමට තිබෙන අ.පො.ස. (සා.පෙළ) විභාගයට මුහුණ දීමට නියමිතව සිටින සිසු දරුවන් හා ඔවුන්ගේ දෙමාපියන් විශාල වශයෙන් මේ තත්වය තුළ බියට පත් වෙලා තියෙනවා. මේ අයට අවශ්‍ය කරන මේ ප්‍රවාහන පහසුකම් කොහොමද සැලසෙන්නේ කියන කාරණය සම්බන්ධයෙන්. ඒ නිසා මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගේ විශේෂ අවධානයට යොමු විය යුතුයි. ඉදිරි දින කීපය තුළ මේ වැඩ වර්ජනය නිමාවට පත් වෙන්න අවශ්‍ය කරන සාකච්ඡා සාර්ථක වුණේ

නැත්නම්, මේ මගී ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඇති වෙලා තියෙන මේ තත්ත්වය පාලනය කරන්න කිසියම් ආකාරයක විසඳුමක් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුව තිබෙනවායි කියන එක මේ අවස්ථාවේදී මම අවධාරණය කරන්න කැමතියි.

ඒ වාගේම විශේෂයෙන්ම කියන්න ඕනෑ. පුද්ගලික අංශයෙත් බස් රථ 21,000 ක් තියෙනවා. නමුත් ඒකට මුහුණ දෙන්න රජය සතුව තිබෙන, ලංගමය සතුව තියෙන බස් රථ ප්‍රමාණය 5000 කට අඩු සංඛ්‍යාවක් තියෙන්නේ. නමුත් ඒවාත් නියමිත ප්‍රමිතියෙන් තියෙනවාද කියන එක පිළිබඳව ගැටලුවක් තියෙනවා. කෙසේ නමුත් මේ අවස්ථාවේදී මගී ජනතාව පත් වෙලා තියෙන මේ පීඩාකාරී තත්වයෙන් මුදා ගැනීම සඳහා ක්ෂණිකව ක්‍රියාත්මක විය යුතුයි. මම හිතන්නේ, අපේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා මේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ තියෙන ගැටලු ගණනාවක් පිළිබඳව අවධානය යොමු කළා. ඒ පිළිබඳව අපෙත් අවධානය, විශේෂයෙන්ම මේ අමාත්‍යාංශයේ අවධානය යොමු විය යුතුයි කියලා කල්පනා කරනවා. මොකද විශේෂයෙන්ම විනීත රියැදුරන්, විනීත කොන්දොස්තරවරු පිළිබඳව ගැටලුවක් තියෙනවා. බස් වල අපේ ජනතාව මොනතරම් පීඩාවට පත් වෙනවාද? හිරිහැරවලට ලක් වෙනවාද? අඩන්තේට්ටම්වලට ලක් වෙනවාද කියන එක අපි දැකලා තියෙනවා. ඒ නිසා මේ පිළිබඳව අවධානය යොමු කරලා, විනීත රියදුරන් කොහොමද අපි පුහුණු කරන්නේ? ඒ වාගේම විනීත කොන්දොස්තරවරු කොහොමද පුහුණු කරන්නේ? ඒ වාගේම මාර්ග නීතිරීති පිළිබඳව මීට වඩා විධිමත් ආකාරයට ඇති කර ගනිමින් මේ ප්‍රවාහන සේවය සකස් කර ගැනීම සඳහා අවධානය යොමු කළ යුතුයි. ඒ සඳහා අවසාන වශයෙන් මම කියන්න කැමතියි අපි මේ නවීන තාක්ෂණයත් එක්ක අලුත් මෙහෙයුම් මැදිරියක් විශේෂයෙන්ම බස්නාහිර පළාතේ මේ ප්‍රවාහන කටයුතු සිදු වෙන ආකාරය පිළිබඳව, බස් රථ ධාවනය පිළිබඳ, රියදුරන්ගේ කටයුතු පිළිබඳව, ඒ වාගේම මේ කොන්දොස්තරවරුන්ගේ කටයුතු පිළිබඳව අධීක්ෂණය කරන්න පුළුවන් මෙහෙයුම් මැදිරියක් ඉදි කළ යුතුව තිබෙනවා. ඒ සඳහා මේ නවීන තාක්ෂණය ඇතුළේ චන්ද්‍රිකා තාක්ෂණය පාවිච්චි කරන්න පුළුවන්. ද්‍රෝණ තාක්ෂණය පාවිච්චි කරන්න පුළුවන්. ඒ වාගේම මීට අදාළව තිබෙන සන්නිවේදන තාක්ෂණය පාවිච්චි කරලා මෙහෙයුම් මැදිරියක් මගින් මුළු බස්නාහිර පළාත තුළම කොහොමද මේ ප්‍රවාහන කටයුතු සිදු වෙන්නේ කියන එක පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. මම හිතන්නේ එවැනි කටයුත්තක් සඳහා විශාල ප්‍රාග්ධනයක් අවශ්‍ය වෙනවා. ඉතින් මම හිතන්නේ නැහැ, මේ බස්නාහිර පළාත් සභාව ඇතුළේ මෙවැනි කටයුත්තක් සඳහා මේ අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ වෙන් වෙලා තියෙන මුදල් යොදා ගත හැකියි කියලා. නමුත් මේ අදහස, මේ සංකල්පය අද ලෝකයේ ප්‍රධාන නගරවල මේ මෙගා පොලිස් සෑම නගරයකම අපට දැක ගන්න පුළුවන් එකක්. ඒක නිසා මේ සංකල්පය මේ බස්නාහිර පළාත් සභාව තුළිනුත් ක්‍රියාත්මක කරන්න ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින් අපේ ලලිත් වනිගරත්න ඇමතිතුමාගේ මේ අමාත්‍යාංශයේ කටයුතු සර්ව ප්‍රකාරයෙන්ම සාර්ථක වෙලා ඉදිරි වර්ෂයේදීත් මේ බස්නාහිර පළාතට වැඩදායි අමාත්‍යාංශයක් විධියට ඒ කටයුතු කර ගෙන යන්න එතුමාටත්, එතුමාගේ කාර්ය මණ්ඩලයටත් අපේ ආශිර්වාදය පිරිනමමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇත්ත වශයෙන්ම මේ ඇමතිතුමා දැන් කාලය ගන්න. නැත්නම් ඔබතුමාට විනාඩි 8 ක් කථා කරන්න මදි නේ. ඔබතුමා කතා කරන්න. නැත්නම් මේක තේරුමක් නැහැ නේ? ඔබතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට ඔබතුමා කරුණු ඉදිරිපත් කරන්න ඕනෑ.

[පූ.භා. 11.46]

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, 2018 වර්ෂය සඳහා අප අමාත්‍යාංශයේ අයවැය විවාදය වෙනුවෙන් පක්ෂව හා විපක්ෂව කරුණු ඉදිරිපත් කළ මැති ඇමතිවරුන්ට ප්‍රථමයෙන්ම මගේ ස්තුතිය පුද කර සිටින අතර, ඔබතුමන්ලා විසින් ඉදිරිපත් කරන ලද කරුණු ඉතා සැලකිල්ලෙන් යුත්තව සිහි තබා ගනිමින් ඉදිරි වර්ෂය තුළද අමාත්‍යාංශයේ කටයුතු සාර්ථකව ගෙන යාමට මා බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම ගෙවී ගිය වසර පිළිබඳව සළකා බැලීමේදී සෑහීමකට පත් විය හැකි සේවාවක් අප අමාත්‍යාංශයට ඉටු කිරීමට හැකියාව ලැබුණු බව මාගේ අදහසයි. විශේෂයෙන්ම 2017 වර්ෂය පුරාවට උපදේශක කාරක සභා 07 ක් ද පැවැත්වීමට අපට හැකි වුණා. එහිදී සහභාගි වූ මැති ඇමතිවරුන්ගේ යෝජනා හා

[ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා]

අදහස් අමාත්‍යාංශයේ වැඩ කටයුතු නිවැරදි කර ගෙන යාමට බොහෝ රුකුලක් වූ බව මා ඉතා නිහතමානීව සඳහන් කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, මීට වසර දෙකකට පෙර සමූපකාර සේවකයින්ගේ වැටුප් වැඩි කිරීම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. මොනවත් ඇහෙන්නේ නැහැ. ඇමැතිතුමා ගැන වර්ණනා කරනවා. නමුත් බාධා කරනවා.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

හේතු කොට ගෙන බස්නාහිර පළාත තුළ 12,000 කට අධික සමූපකාර සේවකයින් යම්තාක් දුරට හෝ ශක්තිමත් කිරීමට හැකියාව අපට ලැබුණා. ගියවර අයවැයේදී පොරොන්දු වූ පරිදි පාසල් සමූපකාර ව්‍යාපාරය වසර ගණනාවකට පසු නැවතත් සක්‍රීය ලෙස ක්‍රියාත්මක කිරීමට මේ වසරේ අපට හැකි වුණා. එය නිල වශයෙන් පසුගිය දින ආරම්භ කළා. ගරු සභාපතිතුමනි, විවිධ සේවා සමූපකාර සමිතිවල දිනෙන් දින කඩා වැටෙන පාරිභෝගික අංශය නගා සිටුවීම සඳහා නියෝජිත ආයතන හා එක්ව විවිධ වැඩසටහන් කීපයක් පවත්වා අවශ්‍ය මහ පෙන්වීම ලබා දීමට පියවර ගත් අතර, ඒවායේ යම් ප්‍රගතියක් මේ වන විට අත්කර ගෙන ඇති බව පෙනී යනවා. ගරු සභාපතිතුමනි, සමූපකාර සේවකයින් වෙනුවෙන් රක්ෂණ ආවරණයක් ලබා දීමට අවශ්‍ය කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර, එය සීමාසහිත සමූපකාර රක්ෂණ සමාගම හා එක්ව ක්‍රියාත්මක කරන අතර වසරකට රුපියල් 600/- ක වාරිකයක් පමණක් සේවකයින්ගෙන් අයකර ගෙන රුපියල් ලක්ෂ 05 ක වන්දි මුදලක් හා අනෙකුත් ප්‍රතිලාභ රාශියක් ලබා දෙන රක්ෂණ ආවරණ ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක කරවීමට නියමිතයි. ගරු සභාපතිතුමනි, එමගින් සමූපකාර සේවකයින්ගේ කාර්යක්ෂමතාවය මෙන්ම රැකියා තෘප්තිමත් භාවයද අපේක්ෂා කෙරෙනවා.

දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන යටතේ සෑම සමූපකාර සමිතියක් හරහාම අවම වශයෙන් එක් නිවසක් බැගින් ඉදි කර දීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කර අවසන් කර ඇති අතර, ඒ එක් නිවසක් පසුගියදා ගම්පහ ප්‍රදේශයේ නිවාසලාභියෙකු වෙත ලබා දීමට අපට හැකි වුණා. ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමයට සමගාමීව බස්නාහිර පළාතේ සමූපකාර සමිති සාමාජිකයින් සේවකයින් සම්බන්ධ කර ගනිමින් ගෙවතු වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඒ දස දහසක් සමූපකාර ගෙවතු නමින් තරගයක්ද පැවැත්වීමට 2018 වර්ෂයේදී බලාපොරොත්තු වන අතර, ඒ මූලික පියවර දැනටමත් ආරම්භ කර තිබෙනවා. එමෙන්ම ගරු සභාපතිතුමනි වසර ගණනාවක් පුරා ගොඩනැගී තිබුණ සමූපකාර සේවකයින්ගේ සේවක ගැටළු අප අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන බස්නාහිර පළාතේ සමූපකාර කොමිෂන් සභාව මගින් කඩිනමින් විසදීමට අවශ්‍ය පියවර ගත් අතර, අද වන විට එහි පවතින සමූපකාර සේවක අභියාචනා 05 ක් දක්වා අඩු කර ගැනීමට අපට හැකියාව ලැබුණා.

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ ජනතාවගේ ජීවනාලිය බඳු ප්‍රවාහන සේවා නිසි පරිදි ක්‍රියාත්මක කරවීමට විශාල වගකීමක් අප අමාත්‍යාංශය වෙත පැවරී ඇති බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය හරහා බස්නාහිර පළාත තුළ ප්‍රවාහන ක්ෂේත්‍රයේත් දියුණුව සඳහා මෙන්ම, මගී පහසුව සඳහා පසුගිය වසර තුළ ගරු මන්ත්‍රීතුමන්ලා ගේ මගපෙන්වීම හා ඉල්ලීම පරිදි බස් මගී ආවරණ 75 කට ආසන්න ප්‍රමාණයක් නවීන පන්නයේ ආකාරයට ඉදි කර දීමට හැකි වී තිබෙනවා. වඩාත් විනිවිද භාවයෙන් යුතුව ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කරමින් මාර්ග බලපත්‍ර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට පසුගිය කාලසීමාව තුළ හැකි වුණා. ගරු සභාපතිතුමනි, බස් රථ රියදුරන් හා කොන්දොස්තරවරුන් සඳහා සීමාසහිත සමූපකාර රක්ෂණ සමාගම සමඟ එක්ව රුපියල් ලක්ෂ 05 ක රක්ෂණ ආවරණයක් ලබා දීමේ වැඩ පිළිවෙලක් දැනට සාකච්ඡා මට්ටමේ පවතින අතර, ඒ මගින් තෘප්තිමත් සේවක පිරිසක් බිහි කිරීම අරමුණයි. මගී ජනතාවට වඩාත් හොඳ සේවාවක් ලබා දීමට බස් රථ සේවකයින් වෙනුවෙන් පුහුණු වැඩ සටහන් රාශියක් පසුගිය වසරේ පැවැත්වීමට හැකි වුණා. එමගින් ගැටලු අවම කර ගනිමින් විධිමත් ප්‍රවාහන ක්‍රමයක් බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් බස්නාහිර පළාත තුළ කාපට් අසුරා සකස් කරන ලද මාර්ග පද්ධතිය 74% දක්වා ඉහළ නංවා ගැනීමට 2017 වසර

තුළ හැකි විය. ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව තුළ බස්නාහිර පළාතේ කර්මාන්ත නගා සිටුවීමට විවිධ වැඩසටහන් රාශියක් පවත්වන ලද අතර, විශේෂයෙන්ම එම දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක වුණු බිඳුනු පුටුවට දැතේ සවිය වැඩසටහන බොහෝ දෙනාගේ පැසසුමට හේතු වූ වැඩ සටහනක් බවට පත්ව ඇත. මෙකී වැඩසටහන හරහා 2017 වසර තුළ පමණක් පාසල් 100 කට ආසන්න ප්‍රමාණයක කැඩුණු ඩෙක්ස් පුටුවල අලුත්වැඩියාවන් සිදු කිරීමට හැකියාව ලැබුණු බව දැන්වීමට මා කැමැතියි.

ගරු සභාපතිතුමනි, නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව හරහා බස්නාහිර පළාත තුළ අඩු ආදායම්ලාභීන් පිරිසකට නිවාස ආධාර සැලකිය යුතු ප්‍රමාණයක් පසුගිය වසර තුළ ලබා දෙමින් අඩු ආදායම්ලාභීන්ගේ නිවාස සඳහා විසඳුමක් ලබා දීමට අපට හැකි වුණා. මේ යටතේ පළාත් නිශ්චිත අරමුදලෙන් මිලියන 4 ක් හා නිවාස අරමුදලෙන් මිලියන 5.8 ක් මෙන්ම පළාත් සංවර්ධනය මිලියන 50 කට ආසන්න මුදලක් බස්නාහිර පළාතේ අඩු ආදායම්ලාභී පවුල් 2500 ක් වෙත ප්‍රදානය කරමින් ඔවුන්ගේ නිවාස ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා යම් දායකත්වයක් ලබා දීමට අපට හැකියාවක් ඇති වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා ගරු ඇමතිතුමන්ලා උදව් කරන්න. එතුමාගේ ප්‍රකාශය කවුරුත් අහගෙන ඉන්නෙත් නැහැ. හැබැයි කට්ටියම පැය ගාණක් එතුමාව වර්ණනා කළා. ඇමැතිතුමා හොඳයි, ඇමැතිතුමා නිහතමානියි, තාත්තා කෙනෙක් වාගේ කියලා නොයෙක් දේවල් කිව්වා. දැන් එතුමාගේ කථාව අහන්නේ නැහැ. කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් නිවාස දෙපාර්තමේන්තුව විශේෂයෙන් බස්නාහිර පළාතේ නිවාස ව්‍යාපෘතිය සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම නියෝජනය වන පරිදි තෝරා ගත් පවුල් 40 ක් සඳහා දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන යටතේ නිවසක් බැගින් ඉදි කිරීමේ වැඩසටහනක් මේ වන විට ක්‍රියාත්මකව පවතින අතර, එයින් නිවාස කිහිපයක වැඩ කටයුතු දැනටමත් අවසන්ව ඇත. එමෙන්ම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා ඕක සභාගත කරන්න. මේ ශබ්දයට ඇහෙන්නෙත් නැහැ නේ? Photo Copy ගහලා ඒක බෙදන්න.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, එසේම 2017 වසරට වඩා 2018 වසරේ අප අමාත්‍යාංශයට වැඩියෙන් මුදල් ප්‍රමාණයක් වෙන් වෙලා තිබෙනවා. PDG මිලියන 300 ක්, PSDG මිලියන 369 ක් එකතුව මිලියන 669 ක්. ඒ බව ඔබතුමන්ලාට මතක් කරන්නේ ඉතාම සතුටින්. මෙය 2017 වසරට වඩා මිලියන 158 ක වැඩිවීමක්. ඒ නිසා ගරු මන්ත්‍රීතුමන්ලා වෙත මේ වසරට වඩා වැඩි මුදලක් ලබන වසරේ ලබා දීමට හැකිවේයැයි කියා මා බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, අප අමාත්‍යාංශය හරහා සිදු කරනු ලැබූ සියලුම කාර්යයන් වලදී වඩා ඵලදායි සේවාවක් ලබා දීම සඳහා උපදෙස් හා මඟපෙන්වීම ලබා දෙන අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, ඒ වාගේම බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමාත්, බස්නාහිර පළාත් මහ ඇමතිතුමාත් ඇතුළු මුළු පළාත් සභාවේ සියළුම සහෝදර ඇමතිවරුන් මෙන්ම බස්නාහිර පළාතේ පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන්ටත් මගේ ස්තුතිය පිරිනමන අතර, අප අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ටත් ලබාදෙන සහයෝගය පිළිබඳව මාගේ කෘතඥතාවය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙනුවෙන් කථා කරපු සියලුම මන්ත්‍රිවරුන්ගේ අදහස් මම ඉතාමත්ම සතුටින් භාර ගෙන ඒ පිළිබඳව ලබන වසරේ මගේ අමාත්‍යාංශයට මන්ත්‍රීවරුන් කැඳවලා ඒ අවශ්‍ය උපදෙස් අර ගෙන, එතුමන්ලාගෙත් උපදෙස් අර ගෙන මා ඉදිරියට කටයුතු කරනවා කියන එක මේ අවස්ථාවේදී මතක් කර දෙමින් 2018 වසර - ගරු සභාපතිතුමනි, ඒ වාගේම අපේ ගරු සභාපතිතුමාටත්

[ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා]

කාර්ය මණ්ඩලයටත් අපේ ලේකම්තුමා ඇතුළු සියලු දෙනාටත් මගේ ගෞරවණීය ස්තුතිය මේ අවස්ථාවේ පුද කරමින් 2018 වර්ෂය ඉතාමත්ම සාර්ථක වර්ෂයක් බවට පත්වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

***අ.භා. 11.58 ට, අංක 107, 121, 122, 123, 124, 125 හා 103 යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.***

*Discussion on the Expenditure Head Nos 107, 121, 122, 123, 124, 125 and 103 Was concluded at 11.58 a.m..*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ගරු මන්ත්‍රීතුමන්ලා තම තමන්ගේ ආසනවලට යන්න. මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ හා නිවාස, ඉදිකිරීම්, වතුයටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධනය පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන්, ශීර්ෂ අංක 103, 107, 121, 122, 123,124 හා 125 යන වැය ශීර්ෂයන් පිළිබඳව විවාදය මෙයින් අවසන් වෙනවා. ඒ පිළිබඳව සභාවේ එකඟතාවය විමසීමේ අවස්ථාවයි. කරුණාකර මන්ත්‍රීතුමන්ලා තමන්ට හිමි ආසන වලට යන්න. ඒ පිළිබඳව සභාවේ එකඟතාවය මේ අවස්ථාවේදී විමසනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව එකඟයි. ඒ අනුව, වැය ශීර්ෂ අංක 103, 107, 121, 122, 123,124 හා 125 යන වැය ශීර්ෂයන් ඒකච්ඡන්දයෙන් සභා සම්මත වූ බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

*ඊට අනුකූලව,*

***ශීර්ෂ අංක 107 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*The question of the amount stated in Head No. 107 was proposed and adopted.*

***ශීර්ෂ අංක 121 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*The question of the amount stated in Head No. 121 was proposed and adopted.*

***ශීර්ෂ අංක 122 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*The question of the amount stated in Head No. 122 was proposed and adopted.*

***ශීර්ෂ අංක 123 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*The question of the amount stated in Head No. 123 was proposed and adopted.*

***ශීර්ෂ අංක 124 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*The question of the amount stated in Head No. 124 was proposed and adopted.*

***ශීර්ෂ අංක 125 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*The question of the amount stated in Head No. 125 was proposed and adopted.*

***ශීර්ෂ අංක 103 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*The question of the amount stated in Head No. 103 was proposed and adopted.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට න්‍යාය පත්‍රානුකූලව තිබෙන්නේ සෞඛ්‍ය දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂය සම්බන්ධ වැඩ කටයුතු ආරම්භ කිරීමට. විපක්ෂයට මම ආරාධනා කරනවා සංකේතය කපා හරින්න.

| | | |
|---|---|---|
| **ශීර්ෂ අංක 105** | **-** | **සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය** |
| **ශීර්ෂ අංක 113** | **-** | **සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 114** | **-** | **ආයුර්වේද දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 115** | **-** | **සමාජ සේවා දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 116** | **-** | **පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව** |

| | | |
|---|---|---|
| Head No 105 | - | Ministry of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs |
| Head No 113 | - | Department of Health Services |
| Head No 114 | - | Department of Ayurveda |
| Head No 115 | - | Department of Social Services |
| Head No 116 | - | Department of Probation and Child Care Services |

*[සංකේත කපා හැරීම ]*
*[Symbolic write-off]*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, 105, 113, 114, 115, 116 වැය ශීර්ෂයන්ගෙන් රුපියල් 10/- ක මුදලක් කපා හැරිය යුතු යැයි යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශීර්ෂ අංක 105, 113, 114, 115, 116 යන වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය ආරම්භ කිරීමට මම මුලින්ම විපක්ෂයෙන් සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා. ඔබතුමා විනාඩි 10 ක කාලයක් වෙන් වී තිබෙනවා.

[අ.භා. 12.01]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, යන අය යනකල් පොඩි නිහඬතාවයකට ඉඩ දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව් ඒක තමයි. ඔය කට්ටිය එන්නේ ඡන්දය දෙන්න නේ? වෙන මොනවාටවත් එන්නේ නැහැ නේ? කෑමත් ලැහැස්තියි. කට්ටියටම කෑම කාලා යන්න පුළුවන්. වෙන මොනවත් කරන්නේ නැහැ නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, අද විශේෂයෙන් කථා කරන්න තියෙන්නේ බස්නාහිර පළාතේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඡන්දයක් දීලා කෑගහලා, සභාව අවුල් කරලා, කෑම ටික කාලා ගෙදර යනවා. ඒකනේ කරන්නේ? වෙන කරන සේවයක් නැහැ නේ? ඔබතුමා කථා කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු අමාත්‍යාංශය සම්බන්ධයෙන් කථා කරනකොට විශේෂයෙන් අපේ අවධානය යොමු වෙන්නේ ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයට. අපි කථා කරන්නේම අනිත් අමාත්‍යාංශ ගැන කියලා නොවෙයි. සෞඛ්‍ය අමාත්‍යාංශය ගැන කියලා. මොකද සෞඛ්‍ය අමාත්‍යාංශය ඒ තරම් අපත් එක්ක සමීපයි. ඒකට ප්‍රධාන වශයෙන්ම හේතුව වෙලා තියෙන්නේ අපේ රට නිදහස් සෞඛ්‍ය ක්‍රියාත්මක වන රටක්. නිදහස් සෞඛ්‍ය ක්‍රියාත්මක වන රටක් හැටියට අපි දන්නවා විශේෂයෙන් බස්නාහිර පළාතේ සෑහෙන පිරිසක් මේ දිස්ත්‍රික්ක තුනේ අඩු ආදායම්ලාභීන් ඉන්නවා. කිසියම් සෞඛ්‍ය කටයුත්තක්, කිසියම් ප්‍රශ්නයක් වුණාම ඒ අය අනිවාර්යයෙන්ම රජයේ රෝහල් වලට යනවා. රෝගයක් වැළඳුනාම රෝහල් වලට යනවා දකිනවා. ඒ ප්‍රවණතාවය ඉහළයි. අනෙක් අතින් පෞද්ගලික රෝහල් වලට යන පිරිසත් අති විශාලයි. ඒ නිසා මේ සෞඛ්‍ය අමාත්‍යාංශය ගැන සළකන කොට අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයට වගකිවයුතු රාජකාරි දෙකක් තියෙනවා. එක පැත්තකින් මධ්‍යම ආණ්ඩුව මේ විෂය මෙහෙයවන අතර, සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට පළාතේ කොළඹ දිස්ත්‍රික්කයත්, කළුතර දිස්ත්‍රික්කයත්, ගම්පහ දිස්ත්‍රික්කයත් සම්බන්ධයෙන් මේ පළාත් සභාව සතු රෝහල්වල මනා පරිපාලනය බලන්න වෙනවා. ඒ වාගේම විශේෂ දෙයක් තියෙනවා. මම හිතන්නේ රටේ වැඩියෙන්ම පෞද්ගලික රෝහල් ඒ වාගේම අනෙකුත් වෛද්‍ය මධ්‍යස්ථාන පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන වැඩිපුර තියෙන්නේ මේ දිස්ත්‍රික්ක තුනේ කියලා

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

මම විශ්වාස කරනවා. ඒ නිසා මේ සෞඛ්‍ය අමාත්‍යාංශයට රජයේ රෝහල් පරිපාලනය කරන ගමන්ම ඒවායේ කටයුතු හොයා බලන ගමන්ම ඒ වගේම මහ විශාල රාජකාරියක් පැවරෙනවා පෞද්ගලික රෝහල්වල කටයුතු සොයා බලන්න.

ගරු ඇමතිතුමනි, මා විශ්වාස කරනවා මේ පෞද්ගලික රෝහල් නියාමනය හා අධීක්ෂණය නිසි පරදි මේ පළාතේ සිද්ධ වෙන්නේ නැහැ කියලා. මම ඒක වගකීමෙන් කරන ප්‍රකාශයක්. මොකද අපි දන්නවා සමහර රෝහල් ලියාපදිංචි කළ යුතුව තියෙනවා. සමහර පෞද්ගලික බෙහෙත් ශාලා සහ රෝහල් ලියාපදිංචි කරලා නැහැ. සමහර ඒවායේ ප්‍රමිතිය නැහැ. සමහර ඒවායේ සපයන්න ඕනෑ නියමිත සේවා සපයන්නේ නැහැ. ඊටත් වැඩිය භයානක කාරණය සමහර පෞද්ගලික රෝහල් වල හා බෙහෙත් ශාලාවල ඒ අවශ්‍ය සුදුසුකම් තියෙන වෛද්‍යවරු නැහැ. මේක හරි බරපතල ප්‍රශ්නයක්. එක්තරා කාලයකදි මහා විශාල වශයෙන් වැටලීම් කළා මේ පෞද්ගලික රෝහල්වල, පෞද්ගලික බෙහෙත් ශාලාවල ඉන්න වෛද්‍යවරු ගැන හොයන්න. හැබැයි දැන් ඒ කටයුත්ත නතර වෙලා තියෙන්නේ. ඒ කටයුත්ත ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ විතරක් නෙමෙයි. මේ පෞද්ගලික රෝහල්, මම උදාහරණයක් කියන්නම්, වත්තල තිබුණා අක්ෂි රෝහල. අපි දෙකටම ප්‍රශ්නයක් මතු වුණා මේ අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධ වෙලත් ප්‍රශ්නයක් තියෙනවා. අර පාසලේ ඉඩමක් අල්ලන් ඉන්නවා. මේ අක්ෂි රෝහලට ගිය සෑම අවස්ථාවකදීම එතන හිටපු නිලධාරීන් කියපු දෙයක් තමයි මේ රෝහල නිසි ප්‍රමිතියට නැහැයි කියන එක. එතකොට පාසල සතු ඉඩම දීලා අක්ෂි රෝහලක් පටන් අරන්. ඒ අක්ෂි රෝහල නියමිත ප්‍රමිතියට පවත්වා ගෙන නොයාමට විරුද්ධව අපි අවස්ථා ගණනාවකදී කථා කළා. මම මේ සභාවේදී කථා කළා. පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී කථා කළා. මීට කළින් හිටපු සෞඛ්‍ය අධ්‍යක්ෂවරියව දැනුවත් කළා. හැබැයි පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂවරිය හිටියත් එයට පිළියමක් යෙදුවේ නැහැ. ඔවුන්ට විරුද්ධව නීතිමය පියවර ගත්තේ නැහැ. හැමදාම ගිහිල්ලා බලනවා. ඒ ගොල්ලන්ගේ හිත සනසලා එනවා. මේ එක සිද්ධියක් විතරයි. මේ පෞද්ගලික බෙහෙත් ශාලා පෞද්ගලික රෝහල් නියාමනයේදී අත යට ගණුදෙනු වෙනවා නියම ලෙස නියාමනය වෙන්නේ නැහැ. මා වගකීමෙන් කියන කථාවක් ඇමතිතුමනි. ඒ නිසා කරුණාකරලා මේකට වහාම කාර්ය සාධක බලකායක් වත් පටන් ගන්න. පටන් අර ගෙන මේ අත යට ගණුදෙනු කරන නිලධාරීන් නොවෙයි. අපි හිතනවා, සමහර වෙලාවට මේ මුල් පුටුවල ඉන්නේ වෛද්‍යවරු. හැබැයි සමහර වෛද්‍යවරු ඒකාධිපති වගේ වැඩ කරන්නේ. මට නම් ගම් කියන්න අවශ්‍ය නැහැ. ඔබතුමා නම් ගම් දන්නවා. ඒ නිසා ඒ ගොල්ලෝ මේ හඳෙන් ඇවිල්ලා නොවෙයි. වෛද්‍ය උපාධිය කියන්නෙත් උපාධියක් විතරයි. ඒ ගොල්ලෝ මහා විශාල සමාජ සත්කාරයක්, කාර්ය භාරයක් කරන එක ඇත්ත. හැබැයි ඒ ගොල්ලන්ට ඕනෑ විධියට අමාත්‍යාංශයේ කටයුතු හා රෝහල්වල කටයුතු ක්‍රියාත්මක කරන්න දෙන්න එපා. ඒගොල්ලන්ට රෝහල් පරිපාලනය භාර දීලා තියෙන එක ඇත්ත. හැබැයි මේක නිලධාරීවාදයට යට වෙලා. මේක තමයි ඇත්ත කතාන්දරය. ඒ නිසා කරුණාකරලා ඒ කටයුතුත් හොයා බලන්න කියලා ඉල්ලනවා. ඒ වාගේම බෝ නොවන රෝග සහ බෝවන රෝග ගැන සළකලා බැලුවහොත් මේ පළාතේ පහුගිය කාලේ විශේෂයෙන්ම ඩෙංගු මර්ධනය ගැන කියන්න ඕනෑ. හැබැයි අපි ප්‍රමාණවත් ප්‍රතිඵල අත් කර ගෙන නැහැ. උදාහරණයක් කියනවා නම් දැන් 2016 මාර්තු මහ බැංකු වාර්තාව කියනවා,

*"ශ්‍රී ලංකාව ඇතැම් බෝවන රෝග අවම කිරීමේදී සාර්ථකත්වයක් අත්කර ගෙන ඇති නමුත්, ඩෙංගු වැනි වෙනත් බෝවන රෝග කිහිපයක් පාලනය කිරීමේදී තවමත් අභියෝග රැසකට මුහුණපාමින් සිටී."*

දැන් මේ පළාතේ තියෙන තත්ත්වය දිහා බැලුවාම ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා. ඔබතුමා ඩෙංගු උත්සන්න වුණු වෙලාවේ ගනු ලැබූ යම් යම් පියවර. විශේෂයෙන්ම මන්ත්‍රීවරු නම් කරලා ඒ කමිටු පිහිටුවලා. ඒවායේ යම් සාර්ථකත්වයක් දකිනවා. මන්ත්‍රීවරු ගොඩාක් ඒ සම්බන්ධයෙන් වැඩ කළා. ඒක හොඳ නැහැ කියන්නේ නැහැ. අපි බැලුවොත් කොළඹ දිස්ත්‍රික්කයේ 2013 ට සාපේක්ෂව පහුගිය අවුරුදු 05 දී හතර ගුණයකින් වැඩි වෙලා තියෙනවා. පස් ගුණයකටත් සමානයි ඩෙංගු රෝගීන් සංඛ්‍යාව. ගම්පහත් ඒ වගේමයි. ඒ වගේම කළුතර අට ගුණයකින් විතර වැඩිවෙලා තියෙනවා. ඔබතුමාගේ පළාතේ. පහුගිය අවුරුදු 05 ඇතුළේ ඩෙංගු රෝගය අට ගුණයකින් වැඩි වෙලා තියෙනවා. බස්නාහිර පළාතෙන්

බැලුවාම පස් ගුණයකින් වැඩි වෙලා තියෙනවා. ජාතික මට්ටමත් ඒ හා සමානයි. මේකෙන් පේන්නේ මොකක්ද? අපි මේ තවම අවධානමේ ඉන්නේ. මේ අවධානම අඩු කරන්න. අපට ඩෙංගු වැඩිවන කාලයට විතරක් මේක වෙනකම් බලා ඉන්න එපා. දැන් අපි ඩෙංගු වැඩි වෙන කාලයට මහා විශාල වැඩ කොටසක් කරන්න සැලසුම් දැම්මා. හැබැයි ඒවා මේ වෙනකොට අකර්මන්‍ය වෙලා තියෙන්නේ. ඒක නිසා ඒක වෙන්න දෙන්න එපා. මේක අනවර්ථයෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් සහ මර්ධන ක්‍රියාවලියක් බවට පරිවර්තනය කළ යුතුයි කියන එක මම විශ්වාස කරනවා. ඊළඟට ඔබතුමා දන්නවා. මේ පහුගිය කාලයේ ලොකු ප්‍රශ්නයක් මතු වුණා. මේ හඩක් නැගුණා මොකක්ද මේ සෞඛ්‍ය සේවයේ ඉන්න සේවකයින්ගේ උසස්වීම් හා දීමනා ගෙවීම් පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා කියලා. ඒ නිසා ඒවා නිවැරදි කිරීමේ වගකීමත් ඔබතුමාට තියෙනවා. ඒ ගැනත් අවධානය යොමු කළ යුතුයි කියලා මම මේ වෙලාවේ මතක් කරනවා. විශේෂයෙන්ම ඔබතුමා දැන් මේ පත්වීම් කිහිපයක් පහුගිය කාලේ බෙදලා දුන්නා. මම මේවා කියන්න බය නැහැ ගරු සභාපතිතුමනි. මටත් කථා කරලා කිව්වා මේ කම්කරුවෙකුගේ පත්වීමක් දෙන්න කැමැතියි කියලා. තාවකාලික කම්කරුවෙක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපට කිව්වේ නැහැ නේ?

**ගරු සුසිල් කිදෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එහෙම නම් ප්‍රශ්නයක්. සමසේ බෙදී ගියේ නැත්නම්. ගරු සභාපතිතුමනි, ඒකට අපි විරෝධය ප්‍රකාශ කරනවා. ඉතින් මමත් මේ පත්වීමට කෙනෙක් දැම්මා. කොහේද රෝහල දුන්නේ? මාලිගාවත්ත රෝහල. කාන්තාවක් ගියේ. ගිය දවසේ ඉඳලා කථා කරලා කියනවා අනේ මන්ත්‍රීතුමා මේකේ නම් වැඩ කරන්න බැහැ. ඒ තරම් අමාරුයි කෙනෙහිලිකම් කියලා. දැන් වෙලාවට වැඩට යන්න ඕනෑ. දෙනවයි කියන වැඩය නොවෙයි දෙන්නේ. වෙන වැඩක් දෙන්නේ. අවසානයේදී ගියේ වෙන වැඩකට. ඔහුට දුන්නු Duty List එක නොවෙයි අවසානයේදී දුන්නේ. එළියේ තියෙන කාණු ටික සුද්ධ කරන්න. ඒක කමක් නැහැ. අවසානයේ රක්ෂාව කම්කරු නේ? හැබැයි රෝහලට ගියාම කිව්වා ඔයගොල්ලෝ සාමාන්‍ය පැය 8 ක් නොවෙයි, වැඩිපුර පැය 04 ක් විතර වැඩ කරන්න. OT ගෙවනවා කියලා. අනේ මාස තුනක් විතර බලන් හිටියා OT නැහැ. මේවා ඔබතුමාගේ ප්‍රශ්න නොවෙන්න පුළුවන්. හැබැයි මේවා පරිපාලන ප්‍රශ්න. මම මේක ඔබතුමාට මීට කලින් කිව්වා. මේවා පරිපාලනය කර ගැනීමේ වගකීමක් අපට තියෙනවා. ඒ නිසා තමයි මම කිව්වේ සමහර නිලධාරීන්, සමහර වෛද්‍ය අධිකාරිවරුන් ඒ ගොල්ලෝ බොහොම බරපතළ විධියට මේ ඒකාධිපති ස්වරූපයෙන් වැඩ කරනවා. ඒක යම් පාලනයකට අසු කර ගත යුතුයි කියලා මා විශ්වාස කරනවා.

ඒ වාගේම තව වැදගත් කාරණයක් ගරු සභාපතිතුමනි. ආයුර්වේද බෙහෙත් ශාලාවල ඖෂධ හිඟය. දැන් මේ එක්තරා ආයුර්වේද දොස්තරවරයෙක් මට කියනවා මගේ බෙහෙත් ශාලාවට දවසකට 80 - 100 ක් එනවා කියලා. හැබැයි බෙහෙත් තියෙන්නේ 25 කට 30 කට. එතකොට ආයුර්වේද අධ්‍යක්ෂවරියට කිව්වාම, ඉහළ නිලධාරීන්ට කිව්වාම මට බෙහෙත් මදී කියලා. කරන්න දෙයක් නැහැ දවසකට 25 – 30 ක් බැලුවාම ඇති කියනවාලු. එතකොට අපේ ආයුර්වේද දොස්තර මහත්තයා මට ඉඳන් කියනවා, මට කරන්න දෙයක් නැහැ. මම ගමේ අයට කියලා, දේශපාලන අධිකාරියට කියලා - මට නම් කියන්න වෙනවා. අපේ මන්ත්‍රීවරයෙකුත් මැදිහත් වෙලා පස්සේ යන්තම් සල්ලි එකතු කරලා ගමේ මිනිස්සුන්ගෙන් සල්ලි එකතු කරලා, මේ ඖෂධ ටික ගෙනත් දුන්නා. අනේ ගරු ඇමතිතුමනි මෙහෙම වෙන්න දෙන්න එපා. විශේෂයෙන් කළුතර දිස්ත්‍රික්කයේ අය ආයුර්වේද බෙහෙත් ගැනීමට වැඩි නැඹුරුවක් දක්වනවා. ඔබතුමා දන්නවා. මොකද ඒ ප්‍රදේශයේ මගෙත් ඥාති සම්බන්ධකම් තියෙනවා. ඒ නිසා මම දන්නවා ඒවා. ඒ නිසා කරුණාකරලා ගරු සභාපතිතුමනි, මම කියන්නේ, ප්‍රමාණවත් තරම් මේවට ඖෂධ ලබා දෙන්න. ඖෂධ හිඟයක් ඇති වෙන්න දෙන්නම එපා. මේක ගැන ලොකු වගකීමක් තියෙනවා. මේ ඖෂධ හිඟය ගැන කථා කරන කොට මම ඔබතුමාට ඉන්දියානු පාර්ශවයක් හඳුන්වලා දුන්නා. ඇටියුන් කියලා සමාගමක අය. මම ඒ අයව ඔබතුමාට හඳුන්වලා දුන්නා. ඒ වාගේම අපේ ගරු මහ ඇමතිතුමාට හඳුන්වලා දුන්නා. මේ කොන්ත්‍රාත් එකක් ගන්න, කීයක් හරි තියා ගෙන නොවෙයි ගරු සභාපතිතුමනි. ඒගොල්ලන්ගේ ව්‍යාපෘතියක් හැටියට ලංකාවේ කිහිප තැනක හඳුන්නලා දීලා තියෙනවා. කොහොමද දවසින් දවස, පැයෙන් පැය, විනාඩියෙන්

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

විනාඩියට සියලුම රෝහල් පද්ධතියේ තියෙන අඩුපාඩු බලා ගන්න පුළුවන්. ඒ කියන්නේ දැන් මේ පැයේදී දොලොස්වැනි පැයේදී අපට බලාගන්නා පුළුවන් අහවල් රෝහලේ, ගම්පහ රෝහලේ කී දෙනෙක් OPD එකට ආවාද? මොකක්ද තියෙන ලෙඩ. ඩෙංගු රෝගීන් සංඛ්‍යාව ගම්පහ දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, මුළු බස්නාහිර පළාතේම අද දවසේ ඩෙංගු රෝගීන් කී දෙනෙක් හොයා ගත්තාද? ඒගොල්ලන්ට අවශ්‍ය බෙහෙත් තියෙනවාද? බෙහෙත් ටික අඩු වෙන්නේ මොනවාද? මොන බෙහෙත් බඩුද කියලා හැමදාම බලා ගන්නා පුළුවන් ක්‍රමවේදයක්, පරිගණක ගත ක්‍රමවේදයක්. මහ විශාල අපට දරා ගන්න බැරි මහ මුදලක් නෙමෙයි. මම ඒ යෝජනාව ඔබතුමාට හතර සැරයක් කිව්වා. සමාවෙන්න මම මෙතන මේක කියනවාට. ඔබගේ ලේකම්වරයාට දෙසැරයක් දුන්නා. මහ ඇමතිතුමාට දුන්නා. පස්සේ මහ ඇමතිතුමා ඔබතුමාට කිව්වා, මේක කැබිනට් එකේදි කථා කරන්න කියලා. ගරු ඇමතිතුමනි, මම දන්නවා ඔබතුමාට මේකේ උවමනාව තිබුණා. හැබැයි මේකේ උවමනාව ඔබතුමාගේ නිලධාරීන්ට තිබුණේ නැහැ. මට ඒකයි කනගාටු. මේ මහ උගත් යැයි කියන නිලධාරීන්ට මේ ඕනෑකම තිබුණේ නැහැ, මේක ඉදිරියට ගෙනියන්න. ගරු ඇමතිතුමනි, මම යෝජනාවක් හැටියට කරනවා. අපත් ආසයි ඒ පරිගණක මෘදුකාංගය පාවිච්චි කරලා -අපිත් මන්ත්‍රීවරුන් හැටියට බලාගන්න ආසයි, බස්නාහිර පළාතේ වෛද්‍ය ක්ෂේත්‍රයේ එදිනෙදා තියෙන ප්‍රශ්ණ මොනවාද කියලා. අපි නිදහස් සෞඛ්‍ය සේවය තියෙන රටක් නේ ගරු ඇමතිතුමනි. එහෙනම් අපි මේක දිනපතා බලලා ජනතාවගේ පැත්තෙන් කරන්න ඕනෑ වගකීමක් මේක. මේක මෙහෙම පුටුවක නිකන් ඉඳගෙන හිටියාට අහසින් පාත් වෙන්නේ නැහැ තොරතුරු ටික. ඒ නිසා මේක සෞඛ්‍ය සේවය මනාව පරිපාලනය කර ගන්න නම් ඒක අවශ්‍යයි. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේ වැඩ පිළිවෙලකට යන්න. අපි ලෝකයත් එක්ක ඉදිරි පියවරකට ගියේ නැත්නම්, අපි මේ නිදහස් සෞඛ්‍ය සේවයේ සැබෑ ප්‍රතිඵල නෙලා ගන්න බැරි වෙනවා.

පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ගැන ඔබතුමාගේ පොත් පිංචේ ඔබතුමා යම් සඳහන් කිරීමක් කරලා තියෙනවා. අත්හල දරුවන්, ඒ වාගේම කායික හා මානසික විවිධ නොහැකියාවන්ගෙන් - මම ආබාධිත කියන වචනය පාවිච්චි කරන්නෑ. නොහැකියාවන්ගෙන් පෙළෙන දරුවන් ගැන විශේෂයෙන් මම මගේ පළාතේ ගරු සභාපතිතුමනි, වැඩසටහන් දෙකක් කරනවා. එකක් ඒ ළමයින්ගේ රසවින්දන වැඩ සටහනක්. අනෙක් එක තමයි ඒ දරුවෝ ටික එකතු කරලා, මගේ ප්‍රතිපාදන සල්ලි නැත්නම්, මම මගේ අතේ සල්ලිවලින් හරි ඒගොල්ලන්ව චාරිකාවක් යවනවා. ඔබතුමා යම් වැඩසටහන් වගයක් කරනවා. මම කියනවා මේ සියලුම මන්ත්‍රීවරුන්ටත් හැම පළාතකම මෙහෙම කරන්න. සාමාන්‍යයෙන් මගේ ආසනයේ ඉන්නවා 100 – 200 ත් අතර ගණනක් ගරු සභාපතිතුමනි. මේ විවිධ නොහැකියාවන්ගෙන් පෙළෙන ළමයින්. ඒ දෙමාපියනුත්, පවුලුත් අසරණයි. ඒ අය වෙනුවෙනුත් යම් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. කාන්තා කටයුතු සම්බන්ධයෙනුත් එහෙමයි ගරු ඇමතිතුමනි. මම වැඩ සටහනක් කරනවා අපේ ප්‍රදේශයේ ස්වයං රැකියාවල නිරත කාන්තාවන් වෙනුවෙන්. මම ලොකු වෙළඳසැලක් කරනවා. ඒ වෙළඳ සැලේ විකුණන්නේ කොලොන්නාවේ ස්වයං රැකියා කරන සියලුම කාන්තාවන්ගේ නිෂ්පාදන. ගරු සභාපතිතුමනි, ඒකේ වැඩ කරන්නෙත් මේ කොලොන්නාවේ ඒ කර්මාන්තවල නියැලෙන කාන්තාවන්මයි. මෙහෙම වැඩසටහනක් අපි ක්‍රියාත්මක කළොත් කාන්තාවන්ගේ ස්වයං රැකියා සඳහා විශාල සහායක් අපිට දෙන්න පුළුවන්. ඒ වාගේ නිර්මාණාත්මක වැඩ ටිකක් ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා ඉදිරි වසරේදී ක්‍රියාත්මක කිරීමට උත්සාහ කරමුයි කියන යෝජනාව ඉදිරිපත් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.14]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, කාන්තා කටයුතු, පරිවාස හා ළමාරක්ෂක සහ සභා කටයුතු අමාත්‍යාංශය පිළිබඳව කථා කරන්න ලැබීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම බොහොම පළපුරුදුකම් තියෙන මන්ත්‍රීවරයෙක් තමයි දැන් මේ අමාත්‍ය ධූරය දරන්නේ. ඒ වාගේම තමයි මීට කලිනුත් මේ පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය දැරුවේ අපේ හිටපු ප්‍රධාන ඇමතිතුමා, ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමා. අපි ඒ කාලේ ඉඳන්ම යම් කිසි අරගලයක නිරත වුණා. අධ්‍යාපන විෂයට

පස්සේ වැඩිම මුදලක් මේ සෞඛ්‍ය අමාත්‍යාංශයට මේ පළාත් සභාවේදී වෙන් කරන්න ඕනෑය කියන කාරණාව. අද වෙන කොට විශේෂයෙන්ම අපේ පළාත තුළ පසුගිය කාලේ අපි දැක්කා, ඩෙංගු රෝගය නිසා ඉතාමත්ම පීඩාකාරී තත්වයකට මුහුණ දෙන්න සිදු වුණා. පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට මන්ත්‍රිවරුන්වත් සම්බන්ධ කර ගෙන යම්කිසි මැදිහත් වීමක් කළා. ඒ නිසා යම්කිසි පාලනයක් ඇති කරන්න පුළුවන්කම ලැබුණා. ඒ ගැන අපි ස්තුතිවන්ත වෙනවා. පළාත් පාලන ආයතනත් ඒකරාශි කර ගෙන බොහොම අඩුපාඩුකම් මැද්දේ යම්කිසි ප්‍රමාණයකට ඒ කටයුතු පාලනය කර ගන්න ලැබීම පිළිබඳව අපි සතුටු වෙනවා.

ඒ වාගේම තමයි මේ කටයුතු කරද්දී අපි දැක්කා. අපට සම්බන්ධ වෙන්න සිද්ධ වුණා. අපේ පළාත්වල ඉන්න මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු, ඒ වාගේම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මහත්වරු. ඒ අයගේ සහයෝගය අපට ලැබුණා. හුඟාක් අඩුපාඩුකම් මැද්දේ තමයි විශේෂයෙන්ම මම නියෝජනය කරන මේ වත්තල කොට්ඨාශයේ මේ අය කටයුතු කරන්නේ. ගරු ඇමතිතුමාම එක අවස්ථාවකදී ගිහිල්ලා පෙන්නලාත් කිව්වා මේ තියෙන අවශ්‍යතාවයන් ටික ඉෂ්ට කරලා දෙන්න කියලා. මීට අවුරුදු 2 කට 2 ½ කට විතර ඉස්සෙල්ලා. ගොඩනැගිලි අවශ්‍යතාවය පිළිබඳව විශාල ප්‍රශ්නයක් තියෙනවා. වත්තල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයේ. අපට බැරි වුණා මේ ගෙවෙන වර්ෂයේවත් ඒ සඳහා ශතපහක මුදලක් වෙන් කර ගන්න. ඒක නිසා මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලනවා. අපට තව අවුරුද්දක් තියෙනවා. අපි හිතන විධියට ලබන අවුරුද්දේ මේ මුදල් ප්‍රකාශනයේදී ඔබතුමාට වෙන් වන මුදලින් ඒවාට ප්‍රමුඛතාවය ලබා දෙන්න. වත්තල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයේ තියෙන ඒ පරණ ගොඩනැගිලි ටික - ඒවායේ තමයි මේ අමාරුවෙන් රාජකාරි කරන්නේ. දැන් නව තාක්ෂණයෙන් යුතු ගොඩනැගිල්ලක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තමයි විශේෂයෙන්ම අද අපි අපේ පළාත්වල සෞඛ්‍ය සේවිකාවන්ගේ විශාල හිඟයක් තියෙනවා. මේක දැන් අවුරුදු දෙක තුනක් තිස්සේම කියා ගෙන කියා ගෙන යනවා. මම ඔබතුමාගෙන් අද විමසීමක් කරපුවාම අපට 462 ක පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ අඩුවක් තියෙනවා. ඉතින් හිතන්න මේ මුළු පළාතෙන්ම 462 ක අඩුවක් තියෙන කොට මේ අයට හම්බ වෙන වපසරිය තුළ කොහොමද කටයුතු කරන්නේ කියලා. සමහර කොට්ඨාශ තියෙනවා. එක පවුල් සෞඛ්‍ය නිලධාරිනිය කොට්ඨාශ දෙකක තුනක රාජකාරී කරනවා. ඉතාම අසීරුවෙන් කරන්නේ. මොකද, මේවාට විශාල රාජකාරී කොටසක් තියෙනවා. අපි දන්නවා උත්පත්තියේ ඉඳලා මරණය දක්වාම කටයුතු කරන්න ඕනෑ කරන කටයුතු මේ අයට පැවරෙනවා. ඒක නිසා කරුණාකරලා මේ පිළිබඳව පියවර ගන්න. දැන් නම් මේක ඇති හොඳටම. මධ්‍යම රජයත් එක්ක සාකච්ඡා කරලා මේ පවුල් සෞඛ්‍ය සේවිකාවන් පුහුණු කිරීම. මේ බස්නාහිර පළාත් සභාවට තියෙන බලතල පාවිච්චි කරලා මේක අර ගන්න. අඩු ගානේ අපට එහෙම පුහුණු කිරීමේ ආයතනයක් හදා ගන්න බැරුව ගියා. මේ පළාත් සභා ක්‍රමය ආරම්භ කරලා අවුරුදු 29 ක්. බස්නාහිර පළාත් සභාවට බැරි වෙලා තියෙනවා තවම එවැනි නිලධාරිනියන් - ඒගොල්ලෝ විතරක් නොවෙයි. තව තව ඒ අංශවල, ක්ෂේත්‍රවල නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනයක්වත් පටන් ගන්න.

ඒ විතරක් නොවෙයි. අපි දන්නවා අපේ පළාත්වල විශාල වශයෙන් ඔය එක එක - ඔබතුමා අපට හෙට උදේට නිරාහාරව එන්න කියලා දැනුම් දෙන්න කිව්වා. මොකද අපේ ලේ බලන්න. අපේ ප්‍රෙෂර් බලන්න. ඒවා මේවා කරන්න. ඒ වාගේම තමයි මේ පළාත් සභාවේ තියෙන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හරහා මේ කටයුතු කරන්න අවස්ථාවක් ලබා දෙන්න. මොකද අතිවිශාල මුදලක් වියදම් වෙනවා මෙවැනි කටයුතුවලට. රජයෙන් කරනවා තමයි. රජයෙන් කරන ඒවත් දැන් බොහොම අවස්ථාවලදී සෞඛ්‍ය ඇමතිතුමා ඒවායේ යම්කිසි මිල පාලනයක් කරලා තිබුනත්, ඉතාම අසීරුවෙන් ජීවත් වන ජනතාවක් ඉන්නේ. විශේෂයෙන් අපේ මුහුදුකරය පැත්තේ. ඒ නිසා පළාත් සභාව හරහා පළාත් සභාවේ තියෙන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හරහා මෙවැනි පරීක්ෂණ කටයුතු කරන්න ඒ අයට අවස්ථාවක් ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම තමයි විශේෂයෙන්ම දේශීය වෛද්‍ය කොටස වැටෙන්නේ ඔබතුමාට. කොළඹ මීගමුව පාරේ, මීගමුවට යනකල් බලන්න. එහෙමත් නැත්නම් බියගම පැත්තට කිරිබත්ගොඩ පැත්තට යන කොට මේ නමට මුවා වෙලා මොනතරම් දූෂිත ක්‍රියාවන් සිද්ධ වෙනවාද කියලා. දැන්

[ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා]

කියනවා, මේ සම්බාහන ආයතන කියලා. මම මේක මේ කියන්නේ, සමහර වෙලාවට ප්‍රසිද්ධ මාධ්‍යවල කියන්නේ නැහැ. සම්බාහන ආයතන කියලා බොහොම හොඳට බෝඩ් එක ගහලා තියෙනවා. විශාල ප්‍රමාණයක් තියෙනවා. විශේෂයෙන්ම ඔය වෙළඳ කලාප ආශ්‍රිතව. මේවායේ මොන සම්බාහනයක්වත් සිද්ධ වෙන්නේ නැහැ. මේවා තනිකර ගණිකා නිවාස. මේක මම බොහොම වගකීමෙන් කියන්නේ. (බාධා කිරීම්) මේකට යන්න ඕන නැහැ. මේවා ගැන දන්නවා. මේවා හරියටම - ඒ නිසා මම මේ ඔබතුමාට කියන්නේ. හරි නියාමනයක් කරන්න. මොකද මේක සංචාරකයින් බහුලව ගැවසෙන රටක්. ඒ නිසා අපේක්ෂිත සංචාරකයින්ට උවමනා කරන පහසුකම් සපයන්න ඕනෑ. සම්බාහනය කියන්නේ ඔය කියන කථාන්දරය නෙමෙයි. අද මීගමුවට ගිහිල්ලා බලන්න, මොනවාද සම්බාහනය කියලා කරන්නේ කියලා. මීගමුව කියන්නේ සංචාරක කලාපයක්. තමුන්නාන්සේ නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කය කියන්නේ සංචාරක කලාපයක්. ඒ උවමනා කරන ප්‍රමිතියට තියෙන සම්බාහන ආයතන. වගකීමෙන් යුතුව මේ කියන්නේ. එහෙම ඒවා නොවෙයි මේ. ඒ නිසා මේ පිළිබඳව හොයලා බලලා ඉවර වෙලා, මේ තැන් තැන්වල බෝඩ් ලෑලි ගහගෙන කරන - ඇයි මේවා පාලනයක් කරන්න බැරි. ඇයි අපට අනිත් පැත්තෙන් මේක දියුණු කරන්න බැරි. ආයුර්වේද රෝහල් විතරක් නොවෙයි.

අපි දන්නවා. අපේ තියෙනවා කිරිබත්ගොඩ ඉතාම හොඳ එකක්. ඉතා හොඳ තත්වයේ එකක් තියෙනවා. මේ පළාත් සභාවට ආඩම්බරයක් වන විධියට ඒ කටයුතු කර ගෙන යනවා. මේවා ටිකක් වැඩි දියුණු කරන්න බැරි ඇයි? මම හැමදාම කියන එකක්. මේ ආමාත්‍යාංශ හුදකලා කරන්න එපා. එක එක අමාත්‍යාංශයෙන් අමාතයාංශයට සහසම්බන්ධතාවය තියෙනවා. දැන් සංචාරක කටයුත්ත තියෙන්නේ ප්‍රධාන අමාත්‍යවරයාගේ අමාතයාංශයට නම්, ඒකත් එක්ක එකතු වෙලා කොහොමද මේ වැඩපිළිවෙල කරන්නේ කියන එක පිළිබඳව අපි තාමත් එහෙම සාකච්ඡාවක් වෙලා නැහැ. දැන් ඔය අධ්‍යාපන ගැන කථා කෙරුවත්, මීට කලින් කතා කරපු ප්‍රවාහන, මාර්ග අමාත්‍යාංශය ගැන ගත්තත් මේ හැම එකකටම යම් සම්බන්ධයක් තියෙනවා. ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමා අර *"බිඳුනු පුටුවට දැතේ සවිය"* කියලා ඉස්කෝලවලට ගිහිල්ලා පුටු ටික හදන්න වැඩ සටහනක් කළා. මමත් හරි සංතෝෂයි ඇත්තටම. ඉතා හොඳ සේවයක් කෙරුවා. එතුමාගේ කාර්ය භාරයක් නොවෙයි ඒක. අධ්‍යාපනයේ. නමුත් අධ්‍යාපනයට ඒක රුකුලක් වුණා. ඒ අමාත්‍යාංශය හරහා තියෙන එක ස්ථානයක් තෝරා ගෙන සම්බන්ධ වෙලා කටයුතු කළ නිසා. ඒ නිසා මම ඔබතුමාගෙනුත් ඉල්ලීමක් කරන්නේ. මෙවැනි කටයුතු වලදී - මේවා මේ කවුරුහරි හිනාවට භාජනය කරන්න පුළුවන් මේ සම්බාහන ආයතනයක් කිව්වාම. ඇත්ත හිනාවට භාජනය වෙන්නේ ඒකේ තියෙන වැරදි වැඩේ හින්දා. මේවා ගැන පාලනයක් නැහැ. නියාමනයක් නැහැ. කවුරුත් හොයලා බලන්නේ නැහැ. කවුරුහරි කථා කෙරුවොත් ඒකනේ අර ඉස්සෙල්ලා කථා කළා වාගේ හිනාවකට භාජනය කරනවා. ඒ නිසා ඒ පිළිබඳව මම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි.

ඒ වාගේම තමයි දැන් සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කථා කරද්දී කිව්වා, අර සිංහ සමාජයට දීලා තියෙන හැඳල පාසලේ ඉඩම ගැන. මේක ගැන දැන් මම හිතන්නේ අවුරුදු ගානක් තිස්සේ අපි කථා කළා. අධිකරණයට ගිහිල්ලා තියෙන කාරණාවක්. මේක ඇත්තටම දුන්නේ - මමත් වත්තල ඉන්න පුද්ගලයෙක් හින්දා කියන්නේ. ඒ කාලේ මේක අතඇරලා දාපු ගොඩනැගිල්ලක් හින්දා තමයි සිංහ සමාජයට මේක දුන්නේ. රෝහලක් පවත්වා ගෙන යන්න. නමුත් අද ඒ මූලික කාරණාව නෙමෙයි සිද්ධ වෙන්නේ එතන. බොහොම වගකීමකින් මම කියන්නම්. අද එතැන ඇත්ත වශයෙන්ම වෙන්නේ බිස්නස් එකක්. ඒ ගැන කථා කරපුවාම කියන්නේ එක්කෙනෙකුට දෙන්නෙකුට යම්කිසි සහන දෙනවා. නමුත් වැඩි පිරිසක් ලාභ ලබනවා. දැන් ගිහිල්ලා බලන්න. පර්චස් 30 විතර ප්‍රමාණයක පන්ති කීයක් තියා ගෙන මීදූලේ උගන්වනවාද කියලා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලනවා. ලබන අවුරුද්දේ මේකට මැදිහත් වෙන්න. ජෝන් අමරතුංග මැතිතුමා දැන් ඊයේ මට ඉඳන් කිව්වා, අපි මේ මැතිවරණ කටයුතු ටික අවසාන වෙන්න ඉස්සෙල්ලා ගිහිල්ලා රාජිත සේනාරත්න මැතිතුමා හම්බ වෙමු. මොකද එතැනම තියෙනවා ලාදුරු රෝහල. දැන් ලාදුරු රෝගය ලංකාවේ නැහැ. ඒ නිසා එතැන අති විශාල ඉඩ ප්‍රමාණයක් තියෙනවා. ඒ ඉඩමේ ප්‍රමාණයෙන් අඩුම ගානේ අක්කරයක්වත් අර ගෙන මෙම විද්‍යාලයට දෙන්න ඕනෑ කියලා. ඒ නිසා ඔබතුමාගේ මැදිහත්වීම තියෙන්න ඕනෑ මේකට. මේක අපේ ආසනයේ තියෙන දැවෙන

ප්‍රශ්නයක්. මේක දැන් හුභාක් දේවල්වලට කථා වෙනවා. මේක විවිධ විදිහට උපයෝගී කර ගන්න බලනවා. දේශපාලන ප්‍රශ්නයක් විධියට. පෙළපාලි යන්න. උද්ඝෝෂණ කරන්න. අපි ඒවාට එතැනට යන්නේ නැතුව අපට කරන්න පුළුවන් ප්‍රමාණය මෙතැන තියෙනවා. මේක ඇත්තටම උඩු දිව්වා වැඩියි. කාලය ගියා වැඩියි. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමා තමයි ජනාධිපති පුටුවට එන්න ඉස්සරවෙලා මේ රටේ සෞඛ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කළේ. එතුමාට මේ ගැන දැනීමක් තියෙනවා. අද රාජිත සේනාරත්න ඇමතිතුමා ඉතාම හොඳට මේ සෞඛ්‍ය අමාත්‍යාංශය ගෙනියනවා. රේඛීය අමාත්‍යාංශය. අපි දන්නවා තමුන්නාන්සේගේ දිස්ත්‍රික්කයම නියෝජනය කරන ඇමතිවරයා. ඒ නිසා මේ සහ සම්බන්ධතාවය තියා ගෙන මේ ගන්න පුළුවන් දේවල් - තව බොහොම සුළු කාලයයි පළාත් සභා මැතිවරණයට තියෙන්නේ. ඉතින් ඒ නිසා මේ කාල සීමාව තුළදී, තමුන්නාන්සේට ලබන අවුරුද්දේදී මේ කටයුතු ටික කරන්න වාසනාව ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම තමයි විශේෂයෙන්ම පහුගිය දවස් ටිකේ - මේක මම වගකීමෙන් කියන්නේ. අපේ මාතෘ සායනවල ළදරුවන්ට නොමිලේ ත්‍රිපෝෂ දෙනවා. දැන් සති දෙකක් තිස්සේ අපේ වත්තල එකේ බෙදුවේ නැහැ. නොබෙදන්න හේතුව වුණේ, ඒක මම හිතන්නේ මොකක් හරි මදි පාඩුවක් තියෙනවා. මේවා ගැන හොයලා බලන්නේ නැහැ. අම්මලා බොහොම කැමැත්තෙන් එන්නේ මේක ගෙනියන්න. දැන් මගෙත් ඉන්නවා පුංචි මුණුබුරෙක්. අපේ ලේලි හැමදාම කියනවා, තාත්තේ කොහොම හරි ත්‍රිපෝෂ පැකට් දෙක තුනක් අරන් එන්න. මම ඒක හොඳටම දන්නේ ඒකයි. ඒක ගන්න ගියාම ඒක තිබුණේ නැහැ. ඉතින් මේවා ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේට මැදිහත් වෙලා කරන්න පුළුවන් ඒවා නොවෙයි. මේවා ඇත්තටම නිලධාරී මහතුන්ගේ නියෝගයෙන් කෙරෙන්න ඕනෑ දේවල්. නමුත් ඒ නිලධාරීන්ගේ තියෙන ඌණතාවය අඩු වීම විශේෂයෙන්ම පවුල් සෞඛ්‍ය නිලධාරීන්ගේ තියෙන ඌණතාවය නිසා මේ ක්‍රමවේදය හරියට දුවන්නේ නැහැ. ඒ නිසා මේ පිළිබඳව මීට වඩා කඩිනමින් වේගයෙන් ජවයෙන් දුවන්න පුළුවන් අවස්ථාවක් කර ගන්න කියලා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. මීට වඩා දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ගරු ඇමතිතුමා අපත් එක්ක බොහොම සම්බන්ධ ඇමතිවරයෙක්. මම මේ කියපු කාරණා කිහිපය බොහොම සැකෙවින් කිව්වේ. විශේෂයෙන්ම මේ සම්බාහණ ආයතන විශේෂයෙන්ම නියාමනය කිරීම සහ ඒවාට උවමනා කරන පහසුකම් දීලා සංචාරක ආකර්ශනය ඇති කරන ආකාරයට ඇති කර ගන්න පුළුවන් වන විධියට සකස් කරන්න. මේවා ආදායම් ලබන්න පුළුවන් දේවල්. ඒ නිසා ඒ පිළිබඳව කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. ඒ වාගේම මේ අමාත්‍යාංශයේ තියෙන සේවක ඌණතාවය ඉතාම ඉක්මණින් අවසන් කර ගන්න උවමනා කරන පුහුණුවීම් කටයුතු නිමා කරලා ඉවර වෙලා ඒ කටයුතු කරන්නත්, ඒ වාගේම තමයි යම් යම් පරීක්ෂණ කරද්දී, ඒ සඳහා ආයතනයක් ස්ථාපිත කරලා ඉවර වෙලා, මේ බස්නාහිර පළාත් සභාව තුළ හැම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයකම ජනතාවට පහසුවක් වන විධියට ජනතාවට සේවාවක් වන විධියට කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ඔබතුමාට ගෞරවයෙන් ආරාධනා කරනවා මූලාසනයේ අසුන් ගන්නා ලෙසට.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Sirikamal Filician de Silva M.P.C took the Chair*

[අ.භා. 12.25]

**கௌரவ ஷாபி ரஹீம்**
**ගරු එම්. ෂාෆි රහීම්**

பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம். தலைமை தாங்கும் உறுப்பினர் அவர்களே ! இன்று மேல் மாகாணத்தின் சுகாதார, உள்நாட்டு வைத்திய, சமூக நலன்புரி, நன்நடத்தை மற்றும் சிறுவர் பராமரிப்புச் சேவை, மகளிர் விவகாரம் அத்துடன் சபை நடவடிக்கை தொடர்பான அமைச்சின் வரவு செலவுத் திட்டத்தின் கீழ் இன்று எனக்கு உரையாற்ற கிடைத்தமைக்கு முதற்கண் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

என்னுடைய நண்பனான அமைச்சர் இன்று பல வருடங்கலாக இவ் அமைச்சின் கீழ் நல்லதோர் சேவையை செய்துகொண்டு வருகிறார். 2004 ஆம் ஆண்டிலிருந்து அவரை நான் அறிமுகமானதில் இருந்து அவருடைய நல்ல எண்ணங்களும், சமூகத்திற்கு சேவை செய்ய வேண்டும் என்று, உள்ளத்தில்

[கௌரவ ஷாபி ரஹீம்]

எண்ணம் கொண்டிருப்பதனையும் நினைத்து நான் மிகவும் மகிழ்ச்சி அடைகின்றேன்.

அதேபோல் நான் வாழுகின்ற கம்பஹா மாவட்டத்தில், நீர்கொழும்பு பிரதேசத்தில் பல மாதங்களுக்கு முன்பு டெங்கு காய்ச்சலினால் பாதிக்கப்பட்ட நோயாளிகளை நிறுத்தி சிகிச்சையளிக்க வைத்தியசாலையில் இடப் பற்றாக்குறை நிலவியது, அப்போது எங்களுடைய வைத்தியசாலையை பார்வையிடுவதற்கு அமைச்சரை அழைத்த போது உடனடியாக அவர் அதனைப் பார்வையிட்டு, வைத்தியசாலையில் உள்ள பிரச்சினைகளை அறிந்து உடனடியாக அதற்குத் தேவையான வேலைகளை இரண்டு மாதத்திற்குள் அவசரமாக செய்து நோயாளிகள் வசதியாக இருப்பதற்கு தேவையான எல்லா வசதிகளையும் நல்ல முறையில் செய்து கொடுத்தார்.

அதேபோல், இந் நாட்டிற்கும், எம் இளம் சமுதாயத்தை உருவாக்கிய நம் வயது முதிர்ந்த மூத்த சமுதாயத்தினரை கவனத்திற்கு எடுக்காத இக் கால கட்டத்தில், நல்லெண்ணம் படைத்த மற்றும் திறமை வாய்ந்த எம்முடைய அமைச்சர் அவரது அமைச்சினூடாக, 60 வயதுக்கு மேட்பட்ட வயது முதிர்ந்த நம் மூத்த சமுதாயம் Senior Citizen களுக்கு மூக்குக் கண்ணாடி வழங்குவதற்காக எல்லா உறுப்பினர்களுக்கும் அதற்கானதொரு நிதி ஒதுக்கீடை செய்து, அவர் அந்த மூக்குக் கண்ணாடி வழங்கும் திட்டத்தை அமுல் படுத்தினார்.

அதுமட்டுமல்ல, சில குறை நிறைகளையும் நான் காண்கின்றேன். அது அமைச்சரின் தவறில்லை, ஏனென்றால் எமது அமைச்சர் இவ் அமைச்சினூடாக அதற்குத் தேவையான வேலைத் திட்டங்களை செய்து கொடுத்தாலும், சில வைத்தியசாலைகளில் Senior Citizen எனப்படுகின்ற நமது வயோதிபர்களுக்கு அட்டை முறை ஒன்று வழங்கப்பட்டுள்ளன, அவ் அட்டையை காட்டுவதன் மூலம் அவர்களுக்கு எதிலும் முன்னுரிமை வழங்க வேண்டும். அது வைத்தியசாலையாக இருந்தாலும் சரி, வங்கியாக இருந்தாலும் சரி, பேருந்துகளிலானாலும் சரி அவ் அட்டையைக் காட்டுவதன் மூலம் முன்னுரிமை வழங்க வேண்டும் என்ற கௌரவத்தை அரசாங்கம் கொடுத்திருந்தாலும் கூட எங்களுடைய சில ஊழியர்கள் அவர்களை கணக்கெடுப்பதில்லை. ஏனென்றால் 60 வயதுக்கு மேற்பட்ட வயோதிபர்கள் நோய்வாய்ப்பட்டு நேராக நிற்க முடியாத சூழ்நிலையிலும் மிகவும் கஷ்டப்பட்டு வைத்தியசாலைக்குச் சென்றால், அவர்களுக்கு சாதாரண இளம் வயதினர்களைப் போன்றே வரிசையில் வருமாறு அவ் ஊழியர்கள் கூறுவதாக நம்மிடம் வந்து இவ்வாறான நிலைமைகளைக் கூறி கவலைப்படுகிறார்கள். எனவே எமது அமைச்சர் அவர்கள் இதனை உடனடியாக கவனத்தில் கொண்டு இவ்வாறான பிரச்சினைகள் வராமல் இருப்பதற்கு தேவையான நடவடிக்கைகளை நடைமுறைப்படுத்த வேண்டும். எனவே நீங்கள் அதனைச் செய்வீர்கள் என்ற நம்பிக்கை எனக்கு இருக்கின்றது

அது மட்டுமல்ல, அங்கவீனர்கள் கையால் இயக்கிச் செல்லும் மூன்று சில்லுகளைக் கொண்ட முச்சக்கர வண்டியில் அவர்கள் ஒரு கிலோமீட்டர் செல்லுவதாக இருந்தால் பல மணி நேரங்களாகும், எனவே அவர்கள் மிகவும் கஷ்டமான நிலைக்கு தள்ளப்படுகின்றனர். ஆனால் தற்போது அறிமுகமாகியுள்ள Electric முச்சக்கர வண்டிகளை பெற்றுக் கொடுப்பதன் மூலம் அவர்கள் அதனை Charge செய்து அதன் மூலம் தூர இடங்களுக்குச் சென்று தொழில் வாய்ப்புக்களை செய்து பொருளீட்டிக் கொள்ள முடியும் எனவே எதிர்காலத்தில் அவர்களது தேவைகளை பூர்த்தி செய்து, இன்னும் இவ் அமைச்சினூடாக பல நல்ல விடயங்கள் நடைபெற்று வருகின்றன, அதாவது கணவனை இழந்த குடும்பங்களுக்கும் மற்றும் கணவன் நோய்வாய்ப்பட்ட, சிறைச்சாலையில் அடைக்கப்பட்ட, விவாகரத்து செய்யப்பட்ட குடும்பங்களுக்கும், தந்தையை இழந்த பாடசாலை செல்லும் பிள்ளைகள் உள்ள குடும்பங்களுக்கும், வரிய குடும்பங்களுக்கும் மாதாந்தம் ஒரு தொகை நிதி உதவிகளை வழங்கி வருகின்றீர்கள், எனவே அந் நிதி உதவியானது தற்போதைய காலகட்டத்தில் போதாத சூழ்நிலை காணப்படுகின்றன, எனவே எதிர்காலத்தில் அவர்களுக்கு வழங்கும் பணத்தை அதிகப் படுத்துவதன் மூலம் வரிய குடும்பத்தில் வாழுகின்ற பாடசாலை செல்லும் பிள்ளைகளின் கல்வித் தேவைகளை நிறைவேற்றிக் கொள்ள முடியும். இவ்வாறான உதவிகளை கட்டாயம் செய்ய வேண்டும் ஏனென்றால் மேல் மாகாணத்தில் இப்படியான பிரச்சினைகள் உள்ள மக்கள் இன்னும் வாழ்ந்து கொண்டு தான் இருக்கின்றனர்.

அது மட்டுமல்ல நமது அரச வைத்தியசாலைகளுக்கு கூடுதலாக வருமானம் பெறக் கூடிய ஒரு வாய்ப்பு கிடைத்துள்ளது. அது என்னவென்றால், நமது பாடசாலை பிள்ளைகளுக்கு மத்திய அரசாங்கத்தினால் காப்புறுதி முறை ஒன்று ஆரம்பிக்கப்பட்டுள்ளன, நேராக வைத்தியசாலை வங்கிக் கணக்கிற்கு வரும் இக் காப்புறுதிப் பணத்தை தனியார் வைத்தியசாலைகளில் செலவிடாமல், அரச வைத்தியசாலைகளுக்கு கொண்டுவரக் கூடிய வேலைத் திட்டங்களை இன்றைய தினத்தில் இருந்து உங்களது அமைச்சினூடாக வைத்தியசாலைகளில் உள்ள அதிகாரிகளின் கவனத்திற்கு கொண்டு சென்று, இப் பணத்தினை அரச வைத்தியசாலைகளுக்கு கொண்டு செல்லும் வேலைத் திட்டங்களை செய்ய வேண்டும். இக் காப்புறுதிப் பணத்தினை தனியார் வைத்தியசாலைகளில் செலவிடுவோமானால் அது பாறியதொரு அனியாயமாகும். எனவே, நாம் கல்வி அமைச்சரோடு இணைந்து, வைத்தியசாலைக்கு செல்லக்

கூடியவர்களுக்கு துண்டுப் பிரசுரங்களின் மூலம் அறிவூட்டுவதன் மூலம், இவ் வருமானத்தை கூடுதலாக பெறக் கூடிய வாய்ப்பு எமக்கு இருக்கின்றன.

அது மட்டுமல்ல உங்களது அமைச்சினூடாக வழங்கப்படும் மகளிர் கைத்தொழில் ஊக்குவிப்புக்காக ஒதுக்கப்பட்டுள்ள நிதி ஒதுக்கீடு குறைவாக காணப்படுகின்றன, எனவே அதனை அதிகரித்து அவர்களை ஊக்குவிக்க வேண்டும். இன்று 55% பெண்கள் வாழுகின்ற ஒரு நாடாக இலங்கை காணப்படுகின்றன. எமது உப தலைவர் அவர்கள் சொன்னது போல், சில இடங்களில் விபச்சாரம் நடைபெறுகின்றன அதனை நாம் தடுத்து நிறுத்த வேண்டும் என்று சொன்னால், பெண்களுக்காக கூடுதலான முதலீடுகளை ஒதுக்கீடு செய்து, நல்லதோர் வாழ்க்கைக்கு செல்லக் கூடிய அமைப்புக்களை நாம் அவர்களுக்கு செய்து கொடுக்க வேண்டும் என இவ் அமைச்சிடம் நான் வேண்டிக் கொள்கின்றேன். ஏனென்றால், நாம் எமது அமைச்சினூடாக நல்ல பல வேலைத் திட்டங்களை செய்து கொடுப்பதற்கும், பலதரப்பட்ட பயிற்சி நெறிகளை வழங்குவதற்கும் பணம் போதாமை காணப்படுகின்றன. எமக்கும் அமைச்சர் அவர்கள் பணம் தந்திருந்தார். அதனை நினைத்து நான் மிகவும் மகிழ்ச்சி அடைகின்றேன். எதிர்காலத்தில் ஒவ்வொரு பிரதேசங்களிலும் பெண்களுக்கான உடற்பயிற்சி நிலையங்களை உருவாக்க வேண்டும். ஏனென்றால் பெண்களுக்கு எல்லா உடற்பயிற்சி நிலையங்களுக்கும் செல்லக் கூடிய அமைப்பு காணப்படுவதில்லை. எனவே பெண்களுக்கான உடற்பயிற்சி நிலையங்களை உருவாக்கி, அவர்கள் ஆரோக்கியமாக வாழ வழி வகுக்கக் கூடிய அமைப்புக்களை செய்ய வேண்டும்.

உங்களது நிதி ஒதுக்கீடுகளில் ஆலோசனைகளைப் பெறுவதற்கு பண ஒதுக்கீடுகளை செய்கிறீர்கள், என்னுடைய பிரதேசத்தில் 19 ஆந் திகதி நடைபெறவுள்ள நிகழ்ச்சித் திட்டத்தினை உங்களினூடாக செய்வதற்கு தீர்மானித்திருக்கின்றேன்.

எதிர்காலத்தில் இன்னும் உங்களுடைய ஆலோசனைக் கூட்டத்தை கூடுதலாக மாதாந்தம் கூட்டி, எங்களையும் அழைத்து, இன்னும் நல்ல விடயங்களை நீங்கள் கண்டறிந்து, அதற்குத் தேவையான விடயங்களை எதிர்காலத்தில் உங்களது முயற்சியினால் செய்ய வேண்டும். ஏனென்றால் வேலை வாய்ப்புக்களை எல்லோருக்கும் பகிர்ந்தளித்து, உங்களது பிரதேசங்களில் உங்களுக்கு தேவையான கல்வித் திறமையுள்ளவர்களுக்கு தொழில் வாய்ப்புக்களைப் பெற்றுக் கொடுத்தீர்கள் அதற்கும் நன்றியைத் தெரிவிக்க வேண்டும். இவ்வாறான அமைச்சர்களை நாம் காண்பது குறைவு, ஏனென்றால் அமைச்சர்கள் யாருக்கும் பகிர்ந்தளிக்காமல் தனியாகவே அனைத்தையும் அனுபவிப்பவர்கள். ஆனால் உங்களது நல்ல மனதைக் கொண்டு, மாகாண சபையில் உள்ள எல்லா உறுப்பினர்களுக்கும் தொழில் வாய்ப்புக்களை பகிர்ந்தளித்து தகுந்தவர்களை உள்ளடக்கினீர்கள் இதனை நாம் வரவேற்கின்றோம். ஏனென்றால் எதிர்காலத்தில் இவ்வாறான நிகழ்வுகளை நீங்கள் செய்வீர்கள் என்று நம்பிக்கை 2004 ஆம் ஆண்டு முதல் இன்று வரை உங்களுடன் நல்ல நண்பனாக இருந்து உங்களுடைய நல்ல எண்ணங்களை பார்த்துள்ளேன். எதிர்காலத்தில் இவ்வாறான நல்ல விடயங்களை செய்வதற்கும், இவ் அமைச்சினை நல்ல முறையில் நடாத்திச் செல்வதற்கும் எமது ஒத்துழைப்பு உங்களுக்கு எப்போதும் கிடைக்கும் எனக் கூறி என்னுடைய பேச்சை இத்துடன் முடித்துக் கொள்கின்றேன். நன்றி.

[අ.භා. 12.37]

**ගරු සන්ධ්‍යා සිරිවර්ධන**
**Hon. Sandya Siriwardana**

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරියක් හැටියට සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කථා කිරීමට අවස්ථාවක් සලසා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඇත්තෙන්ම කියන්න ඕනෑ. ඉතාමත්ම වැදගත් වූ අමාත්‍යාංශයක්. ඒ කියන්නේ, මොන තරම් මිල මුදල් බලය තිබුණත් නීරෝගිකම නැත්නම් ඒ ජීවිතයෙන් වැඩක් නැහැ. ඉතින් ඒ වාගේ ජීවිතයක් රකින ඒ වාගේ අමාත්‍යාංශයක් කර ගෙන යන ඔබතුමා ඇත්තෙන්ම ඉතාමත්ම නිහතමානී අමාත්‍යවරයෙක් කියලා මම හඳුන්වනවා. විශේෂයෙන්ම අපි ඕනෑම දෙයක් කිව්වාම ඇහුම්කන් දෙන අමාත්‍යවරයෙක්. ඒ වාගේම මම හිතනවා, ඔබතුමාට මෙම අත්දැකීම් සම්භාරය ආවේ වසර 20 කට වැඩි කාලයක් ඔබතුමා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක් වෙලා ඉඳලා ගරු අමාත්‍යධුරය දරන නිසා. ඔබතුමාත් මන්ත්‍රීවරයෙක් වෙලා ඉන්න කාලේ ඒ අත්දැකීම් තුළින්, අපට ලැබෙන අත්දැකීම් තුළින් ඔබතුමා මේ ප්‍රශ්න විසඳනවා කියන එක මට හිතෙනවා. ඒ වාගේම ඕනෑම අවස්ථාවක ඔබතුමාට දුරකථනයට ඇමතුමක් දුන්නාම, අපට ඒ සඳහා පිළිතුරක් ලබා දෙනවා. ඒ වාගේම ඉල්ලන ඕනෑම දෙයක් අපට නැහැයි බැහැයි කියන්නේ නැතුව ඒ අවස්ථානුකූලව අපට ඒ අවශ්‍ය කටයුතු රෝහල්වලට ආදිය සම්පාදනය කරලා දෙනවා. විශේෂයෙන්ම කියන්න ඕනෑ. මේ තාක් කාලයකට මේ පළාත් සභාව තුළ අපට රැකියාවක් කියලා ලැබුණේ ඔබතුමාගෙන් ලැබුණු ඒ ඩෙංගු රෝගීන් සඳහා, ඩෙංගු මර්ධනය සඳහා ඒ අවස්ථාවේ ලැබුණු රැකියා ටික ඇත්තෙන්ම ඉතාමත්ම වටිනවා. ඒකට විශේෂ ස්තුතියක් කරනවා. ඔබතුමාට මේ සම්බන්ධව කටයුතු කර ගෙන

[ගරු සන්ධ්‍යා සිරිවර්ධන]

යන්න විශේෂයෙන්ම කාර්ය මණ්ඩලය විශාල දායකත්වයක් ලබා දෙනවා. අපේ නව වර්තමාන ලේකම්තුමා ඉතාමත්ම නම්‍යශීලී අයෙක්. අපි කියන දේකට ඇහුම්කන් දීලා ඒ කටයුතු අපට සම්පාදනය කරලා දෙනවා. ඒ වාගේම සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා, අපට රෝහල්වලට බෙහෙත් අඩුපාඩු සම්බන්ධව. විශේෂයන්ම මම හිතනවා, අපේ නව පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂතුමෙක්, වෛද්‍යතුමෙක්, අපේ අනිල් මහත්තයා පත් වෙලා ඉන්නවා. එතුමා ඉතාමත්ම දක්ෂ වෛද්‍යවරයෙක්. ඒ වාගේම පරිපාලන ක්ෂේත්‍රයේ ඉතාමත්ම නියැලුනු අයෙක්. ඉතින් එතුමා හරහා ලබන වසරේදී අපි බලාපොරොත්තු වෙනවා, නව දැක්මක් ඇතිව මේ කටයුතු කර ගෙන යාවි කියලා අපි විශාල බලාපොරොත්තුවක් තියා ගන්නවා.

ඒ වාගේම අපේ ප්‍රාදේශීය සෞඛ්‍ය අපේ ගම්පහ ඉන්න අපේ නලීන් වෛද්‍යතුමා මේ තාක්කල් වැඩ බලන වෛද්‍යතුමා හැටියට හිටියේ. එතුමාත් තරුණ වෛද්‍යවරයෙක්. මම නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ. අපි එතුමාගෙනුත්, මේ දෙපොළගෙන්ම අපි විශාල සේවයක් 2018 වසරේදී බලාපොරොත්තු වෙනවා. නව දැක්මකින් අලුත් ගමනක් යාවි. මේ රෝහල්වල බෙහෙත් හිඟය මර්ධනය කරලා, අපට ඒ අවශ්‍ය නව දැක්මකින් කටයුතු කිරීම සම්බන්ධව. අපි විශේෂ බලාපොරොත්තුවක් තියා ගෙන ඉන්නවා. ඒ වාගේම සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා, ආයුර්වේද කොමසාරිස්තුමිය ගැන. එතුමිය මාව නම් කවදාවත් රස්තියාදු කරලා නැහැ. නුගේගොඩට කවදාවත් ගෙන්නලා නැහැ. එතුමියට දුරකථනයෙන් ඇමතුමක් දුන්නාම ඊළඟට ෆැක්ස් මගින් ඒ අවශ්‍ය කටයුතු කරලා එදාම, ඒ වෙලාවේදීම පහුවදාට බෙහෙත් ටික මට නම් ලැබිලා තියෙනවා. මම එතුමියට විශේෂ ස්තුතියක් කරන්නට ඕනෑ. මම දන්නේ නැහැ කුමන හෝ යම්කිසි - (බාධා කිරීමක්) නව කොමසාරිස්තුමිය ඉතාම ක්‍රියාශීලියි. එතුමිය ඉතාමත්ම හොඳ වැඩ සටහනක් කරනවා. මොකද, මම ඇස්තමේන්තු වගයක් හදන්න දුන්නා. අද කිව්වා නම් හෙට ඒ දේ කරලා එවනවා. අපව රස්තියාදු කරන්නේ නැතුව ෆැක්ස් මගින් එවනවා. (බාධා කිරීමක්) ඒකත් වෙන්න ඇති. මොකද අනිත් කොමසාරිස්තුමියන්ලා දෙන්නත් එහෙමයි. එතුමියන්ලා දෙන්නත් කාන්තාවෝ. ඉතින් මේ කාර්ය මණ්ඩලයත් සමඟ - අපේ ගයාන් මහත්තයාත් අමතක කරන්න බැහැ. එතුමා අපට විශාල සේවයක් කරලා දෙනවා. ඒ වාගේම සැලසුම් අංශයේ නිලධාරීන්තුමියන්ලා දෙන්නා සහ මාධව මහත්තයා. නිල්මිණී, අනෝමා ඔය කාණ්ඩේ එකතු කර ගෙන ඔබතුමා ගෙනියන ගමන 2018 වර්ෂයේදී ඉතාමත්ම සාර්ථකව හොඳ ගමනක් යන්න අපට පුළුවන් කියන විශ්වාසය උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරියක් ලෙස මම විශ්වාස කරනවා.

ඒ වාගේම බෝ නොවන රෝග සම්බන්ධව මම කථා කළොත් ගිය වසරේ අපි ඇවිදින සමාජ පිළිබඳව කථා කළා. අද ඒකේ ප්‍රගතිය පිළිබඳව ඔබතුමාට වචනයක් කියන්න ඕනෑ. වෛද්‍ය සමන් ජයකොඩි මහත්මා යටතේ අපි පුරුදු පුහුණු කළ මේ ඇවිදින සමාජ අද ගමට ගෙනිහිල්ලා තියෙනවා. අපේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීතුමියන්ලා හරහා අපි ඒ කොට්ඨාශ 50 ක - අපේ කොට්ඨාශ 50 ක් තියෙනවා. මේ වන කොට කොට්ඨාශ 32 ක පවුල් සෞඛ්‍ය සේවිකාවන් හරහා අපේ නලින් වෛද්‍යතුමත් සම්බන්ධ කර ගෙන අපේ MOH එකේ වෛද්‍යතුමත් සම්බන්ධ කර ගෙන මේ වෙන කොට ඉතාමත්ම සාර්ථකව කර ගෙන යනවා. ඔබතුමාට යෝජනාවක් කරනවා, මේක අපේ පළාතේ අනිත් තැන්වලත් 80 පමණ දක්වා කණ්ඩායමක් ඉන්නවා. ඉතින් මේක ඉතාමත්ම ප්‍රයෝජනවත් වැඩක්. මම හිතනවා, ඔබතුමා මෙය ආදර්ශයට අර ගෙන ඉතිරි පළාත් තුනෙත් මේ විධියට කටයුතු කරන්න යොදා ගත්තොත් හොඳයි කියලා. ඒ වාගේම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හරහා - අපේ වේයන්ගොඩ MOH කාර්යාලයේ ඊයේ පෙරෙයිදා ප්‍රදර්ශනයක් තිබ්බා. මේ ප්‍රදර්ශනයෙන් ජනතාව හුඟාක් දැනුවත් වුණා. ඒක සෞඛ්‍ය ප්‍රදර්ශනයක්. මම හිතනවා, මේක ජනතාවගේ උපතේ සිට මරණය දක්වා සියලුම ජනතාවට අවශ්‍ය කරන වෛද්‍ය පහසුකම් ඇතුළු සියලුම කොටස් මේ ප්‍රදර්ශනයේ තිබුණා. ඉතින් මම හිතනවා, ඒකේ වීඩියෝ පටයක් අර ගෙන ඔබතුමන්ලා බලලා, ඔබතුමන්ලාගේ කාර්ය මණ්ඩලයත් සමඟ සාකච්ඡා කරලා මේ වාගේ ඒවා පවත්වනවා නම්, ඉතාමත්ම වැදගත් කියලා හිතනවා. ඒ වාගේම නැවත වාරයක් ඔබතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපට හරිම ප්‍රශ්නයක් වෙලා තිබුණා, වතුපිටිවල වෛද්‍ය අධිකාරිතුමාගේ ප්‍රශ්නය. දැන් අලුතෙන් පත් වෙලා ඉන්න වෛද්‍ය අධිකාරිතුමා ඇත්තෙන්ම වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඉතාමත්ම හොඳ වෛද්‍යවරයෙක්. ඉතින් එතුමාගේ ඒ මාස තුනක් ඇතුළත මේ වන කොට විශාල සංවර්ධනයක් කරමින්

සිටිනවා. ගරු ඇමතිතුමා කලින් ලබා දුන්නු විදුලි සෝපානයේ වැඩ කටයුතුත් දැන් මේ වසර වෙන කොට නිමා කරලා වැඩ අවසන් කරන්න පුළුවන්. ඒ වාගේම ඒ වෛද්‍ය අධිකාරිතුමා අපෙන් කරන්නා වූ ඉල්ලීම් - එතුමා කරන්නා වූ කැපවීමට අපෙනුත් ඉල්ලීම් කරලා තියෙනවා. ඒ නිසා ලබන වසරේ 2018 වසරේ ඔබතුමාගේ අවධානයට යොමු කිරීම පිණිස මම කියන්නේ. ඇම්බියුලන්ස් රථ දෙකක් ඉල්ලලා තියෙනවා. ECG, Exercise Machine එකක් සහ Eco යන්ත්‍රයක්. ඒ වාගේම විකිරණ ශිල්පීන්ගේ හිඟයක් තියෙනවා. විකිරන ශිල්පීන් දෙදෙනෙකුත් ලබා දෙන්න කියලා එතුමා ඉල්ලා තියෙනවා. මොකද ඒ වගේ කැප කිරීමෙන් ඒ වෛද්‍යවරුන් කටයුතු කරද්දී අපි අපේ පැත්තෙන් ඒ සැපයීම් කරනවා නම් මම හිතනවා, මහජනතාවට තව හොඳ සේවයක් ලබා දෙන්න පුළුවන් කියලා.

ඒ වාගේම ආයුර්වේදය ගැන කථා කරන කොට අද ජනතාව ආයුර්වේදය පැත්තට නැඹුරු වෙලා තියෙනවා වැඩියි. විශේෂයෙන්ම අපේ නිට්ටඹුව ආයුර්වේද රෝහල. පොඩි රෝහලක් තියෙන්නේ. ආයුර්වේද බෙහෙත් නිෂ්පාදනය කරනවා. විශේෂයෙන්ම ඒ සඳහා ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මොකද අපට පංචකර්ම හා මූලික ප්‍රතිකාර ඒකකයක් ලබන වසරේ ලබා දෙන්න ඔබතුමා මුදල් වෙන් කළාය කියලා කියපු නිසා. විශේෂයෙන්ම මේ වෙන කොට ටෙන්ඩර් කැඳවලා තියෙනවා. ලබන වසරේ මේ කටයුතු පටන් ගන්නවා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, අපේ ධූර කාලය අවසන්වීමට පෙර -මොකද ලබන වසරේ සමහර විට ධූරකාලය අවසන් වෙන්න ඉඩ තියෙනවා. ඊට පෙර ඒ ප්‍රතිකාර ඒකකය ඔබතුමන්ගේ අතින්ම විවෘත කරන්න මම කැමතියි. ඉතින් ඒ නිසා ලබන වසර ඉවර වෙන්න ඉස්සර ඒ කටයුතු ටික සම්පාදනය කරලා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම අකරගම දිස්ත්‍රික් ප්‍රජා සෞඛ්‍ය නිලධාරී කාර්යාලය. ඒ ආයුර්වේදය. ළඟකදී අපේ කොමසාරිස්තුමිය හදිසියේ නිරීක්ෂණ කටයුත්තකට සහභාගි වෙනවා කිව්වා. එතුමිය නොදන්වා යන්නේ. කාර්යාලයට නොදන්වා හදිසියේ යන දවසේ මගේ ගම් ප්‍රදේශය නිසා මගේ උපන් ගම් ප්‍රදේශයට යද්දී මම එතුමියත් සමඟ ඒ නිරීක්ෂණ චාරිකාවට සහභාගි වුණා. එතුමිය යෝජනා කළා. ඒ ස්ථානයේ රෝහල් වාට්ටු ඉදිකරන්න පුළුවන් හොඳ පරිසරයක් තියෙනවා. ඒ වාගේම නිල නිවාසයක් හදලා ඒ කටයුතු කරන්න පුළුවන් කියලා. ඉතින් මම ප්‍රසන්න රණතුංග ඇමතිතුමා, සෞඛ්‍ය අමාත්‍යවරයා වෙලා ඉන්න කාලේ කළ යෝජනාවකට අනුව තමයි අකරගම දිස්ත්‍රික් රෝහල ගොඩ නැගුනේ. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියනවා. ඒවාත් කර ගන්න ලැබුනොත් අපට ලොකු භාග්‍යයක්. මොකද, කොමසාරිස්තුමියගේ දැඩි අවශ්‍යතාවය ඒ සඳහා තියෙනවා.

ඒ වාගේම ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් දේශන හා පන්ති මේ දවස්වල පවත්වමින් තියෙනවා. දේශීය ආහාර පිළිබඳව. ඒ වාගේම ජනතාව ඉතාමත්ම කැමැත්තෙන් ඒවා වැළඳ ගන්නවා. මොකද, මම ඒ පන්තිවලට සහභාගි වෙලා තියෙනවා. විශාල සංඛ්‍යාවක් අද ඒ සඳහා සහභාගි වන නිසා ඉදිරි වසර තුළ ඒ සඳහා වැඩි අවධානයක් යොමු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම පළාතේ වැසිකිලි හිඟය සම්බන්ධව. මම අහගෙන හිටියා, ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයේදී ජා- ඇළ ප්‍රදේශයේ වැසිකිලි නැති ජනතාව විශාල ප්‍රමාණයක් ඉන්නවා කියලා ප්‍රකාශ කළා. නගර බද එසේම නම් අත්තනගල්ල වැනි අපේ ප්‍රදේශවල විශාල ජනතාවක් ඉන්නවා, ගෙදරකට වැසිකලියක් නැති. ඉතින් අපේ මිල මුදල් තියෙන ජනතාවට නම් එක ගෙදරක එක කාමරයකට එක attached barthroom එක ගණනේ තියෙනවා. නමුත් මම හිතනවා. ශරීර කෘත්‍ය කියන එක ඉවස ගෙන ඉන්න බැරි දෙයක්. ඉතින් ඒක අල්ලපු ගෙදරට යනවා කියන කොට ඒක ඉතාමත්ම ශෝචනීය දෙයක්. ඉතින් මේ පළාතේ තියෙන්නා වූ වැසිකිළි හිඟය මඟ හරවා ගන්නට එක නිවසකට එක වැසිකිලියක් ලබා දීමේ අරමුණින් ඔබතුමාත්, මම හිතන්නේ ප්‍රධාන අමාත්‍යතුමාත් සමඟ සාකච්ඡා කරලා ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය හරහා මෙම වැඩිපිළිවෙළ දියත් කරලා ලබන වසරේ, 2018 වසරේවත් අපේ පළාත තුළ වැසිකිළි හිඟයක් ඇති නොවී සැම දෙනාටම වැසිකිළිය බැගින් නිවසකට ලබා දෙන්න ඒ අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද මේ සඳහා විදේශ ආධාර ලබා ගන්න හැකි හුභාක් ක්‍රම තියෙන නිසා. මම හිතනවා, ඉදිරිපත් වෙලා මේ පිළිබඳව කටයුතු කරයි කියලා.

[ගරු සන්ධ්‍යා සිරිවර්ධන]

ඒ වාගේම මම තව යෝජනාවක් ඉදිරිපත් කරනවා. මේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනා වෙනුවෙන් අපට රෝද පුටු දෙකක්, මන්ත්‍රීවරයෙකුට රෝද පුටු දෙකක්, කිහිලිකරු, අත්වාරු වගේ දෙයක් අපේ නිවසේ තබා ගෙන - මොකද නිදන්ගත රෝගවලට නොවෙයි. හදිසියේ ආපදාවක් වන අවස්ථාවකදී - මම හිතනවා, මන්ත්‍රීවරුන් සියලු දෙනාම මෙය දන්නවා ඇති. ඕනෑ කෙනෙක් හදිසි Accidents එකක් වුණු වෙලාවකදි මන්ත්‍රීවරයාව තමයි මතක් වෙන්නේ. ඇවිල්ලා දුවගෙන ඇවිල්ලා අහනවා රෝද පුටුවක් නැද්ද මන්ත්‍රීතුමිය ගෙදර කියලා. ඉතින් අපි ඒ අවස්ථාවේදී හරි අසරණ තත්වයකට පත් වෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් යෝජනාවක් විධියට ඉල්ලනවා, ලබන වසරේ රෝද පුටු, (බාධා කිරීමක්) එහෙම තියා ගන්න නෙමෙයි. ඔක්කෝටම දීලා තියාගෙන, සනීප වුණාම - මාස දෙකකින් වාගේ සනීප වුණාට පස්සේ අපි අත්සන් කරලා ආපසු ගෙනත් දෙන්න ඕනෑ. ඒ වගේ දෙයක් මම යෝජනා කරනවා. එහෙම නැත්නම් අපේ ප්‍රතිපාදනවලින් අපට ඒක ලබා දෙන්න පුළුවන් නම් ඒක ලොකු දෙයක්.

ඒ වාගේම කාන්තාවන් ගැන කථා කරන කොට ඔබතුමා කළුතර දිස්ත්‍රික්කයේ එදා කාන්තා වැඩ සටහන්, කාන්තා දිනය වෙනුවෙන් කළුතර ප්‍රදේශයේ කාන්තාවන් 1000 ක් පමණ සහභාගි කරවලා අපි උත්සවයට සහභාගි වුණා. ඇත්තෙන්ම ඒ උත්සවයේදී එදා මම එදත් යෝජනාවක් කළා. මම හිතන්නේ, කාන්තාවෝ ඉතාමත්ම හොඳින් අත්පොලසන් දීලා - නොනවත්වා අත්පොලසන් දුන්නේ, රැකියා වෙළඳ පොලක් හදලා දෙන්නය කියලා. ඔබතුමාට මම නැවතත් මතක් කරන්නේ. අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා එතුමන්ලාගේ ප්‍රදේශයේ තියෙනවා කියලා. ඒක හරි ආදර්ශයට අර ගෙන අපි හැමදාම මේ පන්ති පවත්වනවා. වසර ගණනාවක තිස්සේ අපට ලැබෙන්නා වූ සුළු මුදලින් අපි මේ පන්ති පැවැත්වුවාට, ඔවුන්ට එය ආර්ථික වශයෙන් සවිබල ගන්වන්නට ක්‍රමයක් වෙන්නේ නැහැ. මේ වෙළඳ පොළක් නැති නිසා. වෙළඳ පොල හදා ගන්නට නම් මම හිතනවා, එක දවසකට අපේ ඔය දැන් මීගමුවේ තියෙනවා නයිට් බසාර් එක කියලා. ඉතින් ඒකට ජනතාව හුරුවුණාම, ඒ ස්ථානයට එනවා. අපේ කාන්තාවන්ගේ ඒ අලෙවි නිෂ්පාදන ගන්න එතැනට එනවා වාගේම, තවත් ඒකට සම්බන්ධ කර ගන්න පුළුවන් ගරු අමාත්‍යතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශය. මොකද ගෙවතු වගා කරන කාන්තාවන්. අපේ ප්‍රදේශවල ගොඩාක් ඉන්නවා. ඒ කාබනික පොහොර යොදලා සකස් කරන ලද බෝග අපට ඒ වෙළඳ පොළේම තියලා තව කොටසකට විකුණන්න පුළුවන්. ඒ වාගේ කටයුතු මම යෝජනා කරමින්, විශේෂයෙන්ම මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. අපට 2018 වසර බලාපොරොත්තු තබා ගත හැකි වසරක් වෙනවා. අපට නීරෝගිමත්ම ජනතාවක් බිහි කරන්නට ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා සියලු කටයුතු සම්පාදනය කරන්න උදව් දෙන අපේ කාර්ය මණ්ඩලය ඇතුළු සියලු දෙනාටම සුභ ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. හොඳට කරුණු හොයලා බලලා, නිලධාරීන් ගැනත් කථා කරලා, කථාව පැවැත්වුවා. මීළඟට ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 12.50]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ක්‍රියාත්මක වන මේ මොහොතේ, අපි හදවතින්ම ස්තුතිවන්ත වෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ මම හිතන්නේ, දීර්ඝ කාලයක් දේශපාලනයට දර දිය ඇදලා ඒ ශක්තිය තුළින් මම හිතන්නේ අද බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශය ලැබීම පිළිබඳව අපි ඔබතුමා පිළිබඳව හදවතින්ම සතුටු වෙනවා. අද ඒක අර ගෙන, මම හිතන්නේ ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ මේ සියලු නිලධාරීන් එක්ක එකතු වෙලා, සියලුම මන්ත්‍රීවරුන්ට අවශ්‍ය කරන ශක්තිය, ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාවට හරියාකාරව සේවයක් මේ තුළින් ලබා දෙන්න ඔබතුමා මැදිහත් වෙලා ඉන්නවා. ඊට අමතරව මධ්‍යම රජයෙන් ලැබෙන මුදල් ටික, ගරු සෞඛ්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න මැතිතුමාත් එක්ක එක්කහු වෙලා මම හිතන්නේ ඒ මුදල් අනෙක් ප්‍රදේශවලට යන කොට විශේෂයෙන් කළුතර දිස්ත්‍රික්කයට, ගරු රාජිත ඇමතිතුමත් එක්ක එකතුවෙලා අපේ රෝහල් වලට, අපේ පළාත් සභා රෝහල් සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා විශේෂ වූ වැඩසටහනක් දියත් කරනවා.

විශේෂයෙන්ම ග්‍රාමීය රෝහල් ටිකට. මේ වෙන කොට සමහර රෝහල්වලට යන්න බැරි තත්වයක් උදා වෙලා තිබුණත්, අද වනකොට මම හිතන්නේ මතක් කරන්න ඕනෑ. අපේ කළුතර දිස්ත්‍රික්කයේ තියෙන රෝහල්වලට ගිහිල්ලා අද බෙහෙත් ටිකක් අර ගෙන ඉතාමත් හොඳින්, ලෙඩෙක් බෙහෙත් ටික ගන්න ගියාම එතැන නවාතැන් අර ගෙන, වෛද්‍යවරුන් විශේෂයෙන් වැඩසටහන් කරලා හොඳින් සේවාවක් ලබා දෙනවා කියන එක අපි මතක් කරනවා. ඒ වාගේම දේශීය වෛද්‍ය පිළිබඳව කථා කරන කොට ගරු ඇමතිතුමනි, ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා අපිට වැඩි හරියක් කථා කරන්න වෙන්නේ විපක්ෂයේ පුටුවලට තමයි. අපේ පැත්තෙත් ඉන්නේ තුන් හතර දෙනයි.

මම හිතන්නේ, දේශීය වෛද්‍ය පිළිබඳව කථා කරන කොට මේ වනවිට සංචාරකයෝ තමයි මේ දේශීය වෛද්‍ය සේවය ලබා ගන්න විශේෂයෙන් මෙහෙට පැමිණෙන්නේ. අද අපට සංචාරක කලාපයක් තියනවා, කළුවාමෝදර මොරගල්ල කියන අපේ බේරුවල ආසනයේ. අද මේ දේශීය වෛද්‍ය ක්‍රමය හෝටල්වලට මම හිතන්නේ, සංචාරක හෝටල්වලින් ක්‍රියාත්මක වෙලා සෑහෙන ප්‍රමාණයක සංචාරකයෝ ඒ ප්‍රදේශයට ඇවිල්ලා බෙහෙත් ටික අර ගෙන යනවා. අද ඒවා සංචාරකයන්ට පමණක් නොවෙයි, සමහර තැන්වල තියෙනවා, දේශීය වෛද්‍ය රෝහල් විධියට. අපේ පෞද්ගලික රෝහල්. ඒවා තමන්ගේ ආයතනවල හදා ගෙන ඒ තුළින් සිංහල ජනතාවටත් අවශ්‍ය කරන ශක්තිය ලබා දෙනවා. අපි ඔබතුමාගෙන් ඉල්ලන්නේ අපි දැක්කා, පහුගිය කාලයේ කැන්දකඩුව රෝහල, අපේ දිස්ත්‍රික්කයේ ඉතාමත්ම හොඳ රෝහලක්. අද මම හිතන්නේ ඒක ක්‍රියාත්මක නොවන තත්වයට පත්වෙලා තියෙනවා. මොකද යන්න බැරි තත්වය නිසා දුෂ්කරයි. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ රෝහල වෙනුවට රෝහලක් ස්ථාපිත කරලා ඔබතුමාගේ වැඩපිළිවෙලක් තියෙනවා. මම හිතන්නේ අදහසක් තියෙනවා. ඒ ටික අර ගෙන, ඒක කළුතර ප්‍රදේශයේ නාගරික ප්‍රදේශයකට අර එය ස්ථාපිත කරලා ජනතාවට අවශ්‍ය කරන ශක්තිය ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලනවා. සමහර අවස්ථාවලදී අපේ මේ නිලධාරී මණ්ඩලය වැඩ කටයුතු කරන කොට ඉක්මන් සේවාවක් ඔබතුමාට ලැබෙන අතර, සමහර විට එක් කෙනෙක් දෙන්නෙකුගෙන් මගේ කනට මේ ඊයේ පෙරේදා ඇහිලා තියෙනවා. සමහර නිලධාරීන් මෙන්න මෙහෙම කියනවා. අපි ඇවිල්ලා ඉන්නේ ඇමතිවරු පස්සේ ගිහිල්ලා නොවෙයි. අපි ඇවිල්ලා තියෙන්නේ ජනාධිපති නැත්නම් දේශපාලඥයින් පස්සේ ගිහිල්ලා නොවෙයි. අපි ඇවිල්ලා තියෙන්නේ අධ්‍යාපනය හදාරලා, හොඳට විභාග පාස් කරලා තමයි අපි මේ තනතුරට ඇවිල්ලා තියෙන්නේ. අපට මේ ඇමතිතුමාලා අරගොල්ලො මේ ගොල්ලෝ කියන විධියට වැඩ කරන්න බැහැ. සමහර නිලධාරීන් එහෙම කියනවා නම්, අපි හිතනවා. ඒවා ඉවත් කර ගන්න. ගරු ඇමතිතුමාත් එක්ක එකතු වෙලා හරියාකාරව වැඩ පිළිවෙළක් ගෙනියන්න. එතුමා යන ගමනට ලොකු ශක්තියක් සමහර නිලධාරින්ගෙන් ලැබෙන්නේ නැත්නම්, ඒක අද ඉඳන් මම හිතන්නේ මේක කනට ඇහුනා නම් කවුරු හරි ඒ දේ කියනවා නම් ඒ දේ කර ගෙන ඉදිරියට ගෙනියන්න කටයුතු කරන්නය කියලා මම ඔබතුමාලගෙන් ඉල්ලා සිටිනවා.

මොකද, මෙතන සමහර නිලධාරීන් ඉන්නවා, වැදගත් විධියට මම හිතන්නේ, මේ අමාත්‍යාංශය ගෙනියන්න කටයුතු කරනවා. එහෙම කටයුතු කරන කොට කවුරුත් කකුල්වලින් අදින්න එපා. මොකද, අපි දන්නවා. අපිත් ප්‍රාදේශීය සභාවල සභපතිවරු වෙලා ඉඳලා අපි වැඩ කරන කාලේ ඒ වාගේ නිලධාරීන් කකුලෙන් අදින්න ගියාම, අපි දන්නවා මොනවාද අපි කළේ කියලා. මොකද, අපි බොහොම සාමූහිකව එකතු වෙලා, අපේ නගර හදලා, කාටවත් වචනයක් කියන්න බැරි වෙන්න අපි බේරුවල ආසනයේ වැඩ කරලා ආවත් අද අපි යන කොට - ඒවායින් නැගිටලා ආවාට පස්සේ අද ඒවා ගරා ගෙන වැටිලා තියෙනවා. මොකද හේතුව, කළ හොඳ නරක ඊළඟ එක්කෙනා අර ගෙන යන්න ඕනෑ. නරක අයින් කරලා හොඳ ගෙනියන්න ඕනෑ. ඒ නිසා මේ අමාත්‍යාංශය තුළින් කටයුතු කරන මේ ගරු ඇමතිතුමා බොහොම නිහතමානීව, නිලධාරීන් එක්ක එකතු වෙලා වැඩ කටයුතු කරන කොට, හැමෝම අත්වැල් බැඳ ගෙන එකට එකතු වෙන්න ඕනෑ. ඒ වැඩ කරන්න ඕනෑ. සමහර විට වේගයෙන් යන කොට වේගයෙන් යන්න වෙනවා. එහෙම නැතුව ගියොත් මම හිතන්නේ මේ අමාත්‍යාංශය කඩා ගෙන වැටෙනවා. ගේන මුදල් ටික වියදම් කරන්න බැරි වෙනවා. ඒවාට අවශ්‍ය කරන ශක්තිය දෙන්නේ නැහැ. නව නිලධාරීන් ඉන්නවා නම්, ඒ නිලධාරීන්ගේ අලුත් අදහස් ගරු ඇමතිතුමත් එක්ක කථා කරලා, උපදේශක කාරක සභාවට එන්න ඕනෑ. ඒවා ඉදිරිපත් කරන්න ඕනෑ. ඒවා ඉදිරිපත් කරලා කථා කරන කොට ගරු ඇමතිතුමා කිව්වේ මේ විදිහට, මේ දේ කරන්න

[ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව]

ඕනෑ. මේක කරපුවාම මෙපමණ ඵලදායි තත්වයක් ඇති වෙනවා කියන වැඩ සටහන් ඔබ තුළින් නිර්මාණය වෙන්න ඕනෑ. එහෙම උනොත් තමා හොඳ. එතකොට අපිටත් දන්වලා එව්වාම උපදේශක කාරක සභාවට අපිත් එනවා. අපි මේ උපදේශක කාරක සභාවේ හිටියේ නැති වුණත්. ගරු මන්ත්‍රීවරුන්ට දෙන ප්‍රතිපාදන ටිකෙන් හරියට අපි වැඩ ටික කරලා අපේ ප්‍රදේශයේ ජනතාවට අපි ලබා දෙනවා. මෙතැන කථා කරන කොට කථා කළා, ඇත්තටම වැසිකිළි ප්‍රශ්නය පිළිබඳව. මුළු බස්නාහිර පළාතේම සමහර ස්ථානවල වැසිකිළි ප්‍රශ්න තියෙනවා. අහිංසක මිනිස්සුන්ගේ. හැබැයි, මේ වැසිකිළියක් ගන්නට ෆෝම් කොලයක් අර ගෙන ගියාට පස්සේ සමහර ග්‍රාම නිලධාරීන් - මම හිතන්නේ, මේ අහිංසක මිනිහා ග්‍රාම නිලධාරීගේ පිටිපස්සෙන් දහ දොළොස් පාරක් යන්න ඕනෑ. එක්කෝ අත්සන් කරලා දෙන්නේ නැහැ. අල්ලපු ගෙදර වැසිකිළියට යන්නේ. එහෙම නැත්නම් අම්මාගේ ගෙදර වැසිකිළියට යන්නේ. අම්මාගේ ගෙදර වැසිකිළිය තියෙනවා කියලා, මේකට වැසිකිළිය දෙන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, එහෙම නොවෙයි. අපි අපේ ආසනය තුළ, දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වෙන කොට කවුරු හරි කණ්ඩායමක් මේක හොයලා PHI මහත්තයා සෞඛ්‍ය පරීක්ෂකතුමාගෙන් වාර්තාව අර ගෙන මේ නැති හැමකෙනාටම වැසිකිළියක් හදලා දෙන්න කටයුතු කළොත් මම හිතන්නේ සෞඛ්‍ය තත්වය යහපත් වෙනවා. හැම ජනතාවටම ලොකු හයියක්, ශක්තියක් ලබා දෙන්න පුළුවන්කම තියෙනවා.

ඊට අමතරව ඔබතුමා, ඔබතුමාගේ අමාත්‍යාංශය තුළ, කාන්තා කටයුතු අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක වන කාන්තාවන් සඳහා ස්වයංරැකියාවලට අතහිත දීලා ඒ කාන්තාවන් දිරි ගන්වලා ඔවුන්ගේ ස්වයං රැකියා කටයුතු ශක්තිමත් කරන වැඩ සටහන් නිර්මාණය කරලා මම හිතන්නේ ලොකු හයියක් ශක්තියක් ඔවුන්ට ලබා දෙනවා. ඒ වාගේම තමයි කාන්තාවන්ට අවශ්‍ය කරන ගෙවත්තේ සිටුවන්න පළතුරු පැලයක් හෝ අවශ්‍ය කරන පැල වර්ග දීලා නොයෙකුත් ආකාරයේ වැඩිහිටි සංවිධාන ක්‍රියාත්මක කරන්න විශේෂයෙන් වැඩිහිටියන්ව ගෙනත්ලා ඔවුන්ගේ සුභසාධනය වෙනුවෙන් අවශ්‍ය කරන ශක්තිය ලබා දීම පිළිබඳව අපි හදවතින්ම ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම තමයි ගරු ඇමතිතුමනි, ළමා ආරක්ෂක හා සේවා ඒ කටයුතු පිළිබඳව කථා කරන කොට ළමයින් වෙනුවෙන්, අහිංසක දරුවෝ වෙනුවෙන් - අද මහා විශාල ප්‍රශ්ණයක් තියෙනවා. දරුවෝ නොයෙකුත් ආකාරයේ අකරතැබ්බවලට පත් වෙලා පරිවාස ගත වෙලා, ඒ පරිවාස කාලය ඇතුළතදී මම හිතන්නේ ඒ දරුවන්ගේ දෙමාපියෝ. ඒ දරුවන්ට ඉදිරි අනාගතයේ අවශ්‍ය කරන ශක්තිය නිර්මාණය කරලා දෙන්න කටයුතු කරනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලනවා. සමහර අපේ ප්‍රදේශවල වැඩිහිටි නිවාස සහ ළමා නිවාස පිළිබඳව ස්ථාන ගත කරලා තියෙන තැනුත් ඔබතුමාගේ අමාත්‍යාංශය වෙතින් එහෙම පරීක්ෂා කරන්න කියලා මම ඉල්ලනවා. මොකද, ඒවා ඇතුලේ ඉන්න, ඒ ඉන්න පාලිකාව හෝ පාලිකාවෝ එහෙම නැත්නම් ඒ ඇතුලේ ඉන්න කවුරු හරි බලන්න ඉන්න නියෝජිතයා හරියට මේ කටයුත්ත සිදු වෙන්නේ නැහැ. ගේන බඩු ටික හොරකම් කරනවා. ඒවා ළමයින්ට දෙන්නේ නැහැ. ළමයි ආරක්ෂා කරන්නේ නැහැ. පිරිසිදුව තියා ගන්නේ නැහැ. ඊයේ පෙරේදා වෙන කොට අපි බඩු දීලා, අපට ලිපියකින් එවලා තියෙනවා. මේවා ලැබුණාද කියලා හොයලා බලලා අවශ්‍ය කරන ශක්තිය ඒ ගොල්ලන්ට නිර්මාණය කරලා දෙන්න. වැඩි වැඩියෙන් ඒවාට අවශ්‍ය කරන ශක්තිය දෙන්න. මොකද ඒ දරුවෝ අහිංසක දරුවෝ. එහෙම නැත්නම් සමහර තැන්වල ඉන්න වැඩිහිටියෝ. මේවාට අවශ්‍ය කරන ශක්තිය නිර්මාණය කරලා දෙන්න කියලා ඔබතුමාගේ මාර්ගයෙන් අපි ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තමයි ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ මේ අමාත්‍යාංශය තුළින් 2018 ට වෙන් කරලා තියෙන මුදල් වඩ වඩා ඔබ්බට ගිහිල්ලා. මධ්‍යම රජයෙන් ඔබතුමාට ගොඩාක් වැඩ කටයුතු කරන්න ශක්තිය ධෛර්ය ලබා දෙන ඒ අතිගරු ජනාධිපතිතුමා එහෙමත් නැත්නම් සෞඛ්‍ය ඇමතිතුමා ඒ දෙන මුදල් අරගන්න. අපට තවත් හදන්න බැරි වුණු රෝහල් වැඩි සංඛ්‍යාවක් තියෙනවා. ඒ ටික ඔබතුමාගේ ලබන අවුරුද්දේ කාල වකවානුව තුළදී මම හිතන්නේ ඉක්මනින් කරලා දෙන්න කටයුතු කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. ඒ වාගේම තමයි මේ වසර කාලය තුළම අපිට ලැබෙන ප්‍රතිපාදන හරියාකාරව ක්‍රියාත්මක කරලා ඒ අමාත්‍යාංශයේ ලේකම්තුමියද, ලේකම්තුමාද එහෙම නැත්නම් අනිකුත් අධ්‍යක්ෂවරුද සියලු දෙනාම එකතු වෙලා කටයුතු කිරීම පිළිබඳව අපි හදවතින්ම

සියලු නිලධාරී මණ්ඩලයට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ඔබතුමාගේ අමාත්‍යාංශයේ අපේ ගයාන් මහත්මාට. ඒ වාගේම එහා පැත්තේ ඉන්න අනිත් නිලධාරි ටිකට. ඒ වාගේම ඔබතුමාගේ අනිකුත් පෞද්ගලික කාර්ය මණ්ඩලයට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. අපි දෙයකට කතා කළොත් එවලේම දුරකථනයට ඇවිල්ලා ඒකේ පනිවිඩය හරියාකාරව අපිට ලබා දීලා කටයුතු කිරීම පිළිබඳව. විශේෂයෙන් ඔබතුමාට ස්තුතියක් කරනවා. දුරකථනය ගත්ත ගමන් අනිත් පැත්තට ඒ විනාඩියටම Ring වෙන කොටම දුරකථනය අර ගෙන අපට කථා කරලා, අපේ ජනතාවගේ ප්‍රශ්න විසඳන්න ඔබතුමා මේ කරන ක්‍රියාවලිය පිළිබඳවත් ස්තුතිවන්ත වෙනවා. 2018 වසරේදී ඔබගේ අමාත්‍යාංශයේ මම හිතන්නේ, අනිත් අමාත්‍යාංශත් එක්ක, ඒ සියලු දෙනා එක්ක එකතු වෙලා ප්‍රධාන ඇමතිතුමා, අපේ කෘෂිකර්ම ඇමතිතුමා, අධ්‍යාපන ඇමතිතුමා, ප්‍රවාහන ඇමතිතුමා ඔබතුමා සියලු දෙනාම එක්ක එකතු වෙලා - මම හිතන්නේ සමහර නිලධාරීන්ගේ අර වචන කියවුණා. ඒවාට මේවා නොවී ලබන අවුරුද්දේ සියලු අමාත්‍යාංශ තුළින් හරියාකාරව දැවැන්ත සේවයක් කරන්න, ඔබතුමා ඇතුළු සියලුම නිලධාරීන්ට ශක්තිය, ධෛර්ය වාසනාව ලැබේවා! එළඹෙන නත්තල සියලු කිතුණු බැතිමතුන්ට සුහම සුභ නත්තලක් වේවා! ඒ වාගේම ලබන්නා වූ 2018 වසර ඔබතුමා ඇතුළු සමස්ථ රටේ සියලු දෙනාටම ඉතාමත්ම වාසනාවන්ත වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

දැන් මෙම සභාව දිවා ආහාරය සඳහා ප.ව. 2.00 දක්වා කල් තබනවා.

***ඊට අනුකූලව පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. 02.10 ට යළිත් රැස් විය.***

*Accordingly the Whole Council Suspended and. it resumed at 2.10 p.m.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 02.10]

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඉතාමත්ම සතුටට පත් වෙනවා. ඒ වාගේම කණගාටුවට පත් වෙනවා. තමන්ගේ වැය ශීර්ෂය කතා කරන අවස්ථාවේදී ඒ අදාළ අමාත්‍යවරයා අඩුම තරමින්, -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එතුමා හිටියා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

අපි ඔක්කොම වැඩ බලන්න තමයි ඉන්නේ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

වැඩ බලන සෞඛ්‍ය ඇමතිවරු මම දැනුවත්ව නම් පත් කරලා නැහැ. ඉතින් කොහොමටත් ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ඇමතිවරු ඉන්දැද්දී තමයි කථා කරලා පුරුදු?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

නැත්නම් වැඩක් නැහැ නේ? මොනවා හරි දෙනවා නම්, ගන්න තියෙන්නෙත් ඒ හරහා නේ? නැත්නම් කථා කරලා වැඩකුත් නැහැ නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය සේවයත් අධ්‍යාපන සේවය වාගේම තමයි. සෞඛ්‍ය අංශයත්, අධ්‍යාපන අංශයත්, අර මම එදා අධ්‍යාපන අංශය පිළිබඳව කථා කළා වාගේ සියල්ල සතුටු කරන්න පුළුවන් අමාත්‍යාංශ නොවේ. ඒ කියන්නේ, විශාල ජනතාවකගේ දෛනික ජීවිතය එදිනෙදා ජීවිතයේ විශාල වශයෙන් සම්බන්ධතා පවත්වන අමාත්‍යාංශයක් හැටියට ඇතැම් විට ඔබතුමාට සියලු දේවල් කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. හේතුව, මේ සෞඛ්‍ය ක්ෂේත්‍රය සමාජයට දෛනික ජීවිතයට ඉතාම බැඳිලා තියෙන්නේ. ඒ නිසා කෙසේ වෙතත් ඔබතුමාගේ කාර්ය භාරය නිසි ලෙස පවත්වා ගෙන

යනවා. මේ අතරින් ගරු අමාත්‍යතුමනි, පළාත් සභාව මගින් පවත්වා ගෙන යන, විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාව මගින් පවත්වා ගෙන යන රෝහල් ගත්තොත් එහෙම, ඒ රෝහල් විශාල වශයෙන් අඩුපාඩුවලින් සමන්විතයි. දැන් මධ්‍යම රජය හරහා පාලනය වන්නා වූ රෝහල් ගත්තොත් ඒ රෝහල්වල තිබෙන්නාවූ කෙරෙන්නා වූ කාර්ය භාරයේ ස්වරූපයත්, පළාත් සභාවකින් කෙරෙන්නා වූ රෝහලක කාර්ය භාරයත් ගත්තාම හරියට අර යම් ආයතනයකට ගියාම නිකන් අඩුපාඩු විශාල ප්‍රමාණයක් තිබෙන ගතියක් තියෙනවා. මම මේ පළමුදා ගියා හෝමාගම රෝහලට. ඒ ගිය වෙලාවේදී එහි සේවකයොත් එක්ක මම කථා කළා. ලෙඩෙක් බලන්න ගිය වෙලාවේ. ඒ රෝහලේ විශාල අඩුපාඩු කම් රාශියක් තියෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකට ලෙඩෙක් ආපුවාම අරන් යන්න පුටු අඩුයි. රෝද පුටු වගේ ඒවා. ඒ වාගේම අර strech වාගේ ඒවා නැහැ. අඩුයි. අනිත් එක අවශ්‍ය ප්‍රමාණයට ඒවායේ කාඩර් එකක් නැහැ. ඒ නිසා ඒවා කඩා වැටීමට ලක් වෙලා තියෙන්නේ. මෝචරිය ගත්තාම - මෝචරියේ දැනට නම් මම හිතන්නේ හයි කරලා තියෙනවා. ඉස්සර මෝචරියේ මිනියක් එහෙම තිබ්බාට පස්සේ, යම් විදිහකින් ඒ මිනිය දවස් තුනක් හතරක් ගියොත් එහෙම, කුණු වෙන්න පටන් ගන්නවා. මොකෝ ඒකේ ශීතකරණ, එහෙම නැත්නම් ඒ අවශ්‍ය කරන අයිස් එහෙම නැත්නම් AC කරලා ද මන්දා ඒවා තියෙන්නේ. ඒවා හරි විධියට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. දැන් හෝමාගම රෝහල ගත්තාම මේ ප්‍රදේශයේ තියෙන ප්‍රධාන පෙළේ රෝහලක්. ඒ කියන්නේ, ජනතාවට ලේසියෙන් තමන්ගේ අවශ්‍ය කරන සෞඛ්‍ය පහසුකම් ඉටු කර ගන්න තිබෙන්නා වූ රෝහලක්. මේ රෝහලේ ගත්තාම ගරු අමාත්‍යතුමනි, ඔබතුමාටත් කිහිපවතාවක් මේවා දැනුම් දීලත් තියෙනවාලු. සමහර අවස්ථාවලදී අපද්‍රව්‍ය වගේ දේවල් ගමේ නිකන් කාණුවලට අතහරින්නේ. ගරු ඇමතිතුමනි, මේ හේතුව නිසා - ගරු අමාත්‍යතුමා, ඔබතුමාට පොඩ්ඩක් - අපේ සභා නායකතුමා ඔබතුමා ආදර්ශමත් වෙලා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු සභානායකතුමා, ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න අවස්ථාව දෙන්න කෝ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

සභානායකතුමා කථා කරන්න පටන් ගත්තාම හරි කරදරයක් වෙනවා නේ? ගරු අමාත්‍යතුමනි, ඒ නිසා ඔබතුමාට මම මේ අවධානය යොමු කිරීමක් කරන්නේ. මේ රෝහලෙන් අපද්‍රව්‍ය පිටකරනවා. සමහර වෙලාවට ඔය සායනවලින් බැහැර කරන සියලුම දේවල්, අපද්‍රව්‍ය බෝක්කුවක් හරහා මහ පාර හරහා ගමන් කරන්නේ. පුවත්පත්වලත් මේවා ගියා. ඔබතුමාත් අධීක්ෂණය කරන්න ගියා. එක දවසක් ගියා දෙකක් ගියා. එච්චරයි. ඒවා නැවත වතාවක් ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා එවැනි අඩුපාඩුකම් මග හරවා ගන්නවා නම් වඩාත් හොඳයි. අර පුංචි ඉඩ ප්‍රමාණයන් මදියි ඒවාට. ඒවාට අවශ්‍ය කරන පහසුකම් ඔබතුමාගේ ප්‍රදේශයට කළුතරට කරනවා වාගේම, මේ ප්‍රදේශයටත් ඒ අවධානය යොමු කරලා, ඒ කාර්යය කරනවා නම් වඩාත් හොඳයි.

දැන් ආයුර්වේදය කිව්වාම ආයුර්වේද වෙදකම මේ ශ්‍රී ලංකාව තුළ ඉතාමත්ම ඉහළට ප්‍රචලිත කරන්න පුළුවන් අංශයක්. අද විදේශිකයන් ශ්‍රී ලංකාවට ගෙන්න ගන්න පුළුවන් ප්‍රධානම මාර්ගයක් තමයි, ආදායම් මාර්ගයක් තමයි මේ ආයුර්වේද වෙදකම කියලා කියන්නේ. සමහර විට අපට ඒක එච්චර ගැලපෙන්නේ නැහැ. තරුණ පරපුර අතර එපමණ ප්‍රචලිත නැති වුණත්, අද අපේ ප්‍රදේශවලින් ක්‍රියාත්මක වෙලා මහරගම නගර සභාව හරහා සෞඛ්‍ය මධ්‍යස්ථාන, ආයුර්වේද මධ්‍යස්ථාන 04 ක් පමණ ක්‍රියාත්මක වෙනවා. දැන් ඒවාට ගියොත් එහෙම ගරු අමාත්‍යතුමනි, දකින්න ලැබෙන්නේ වැඩිහිටියෝ. මේ තරුණ පරපුර ඒකට ගෙන්වා ගන්න හරිම අමාරුයි. දැන් ඒවාට ගියාම තරුණයොත් එක්ක සාකච්ඡා කළාම, තරුණයෝ ඉඳන් කියන්නේ තෙල් ගාගෙන, එක එක දේවල් කරන්න බැහැයි කියන එක. ඒ නිසා සායන තියලා ඉවර වෙලා පාසල් හරහා දරුවන්ට මේ සෞඛ්‍ය වැඩමුළු පිහිටවලා, එහෙම කරන්න පුළුවන්කමක් තිබෙනවා නම් මම හිතන්නේ වඩාත් හොඳයි. අර චීන කටු චිකිත්සාව. හෝමියෝපති ක්‍රමය. යුනානි ක්‍රමය. ඒවා වර්ධනය කරන්න පුළුවන්. ගුවන් තොටුපලින් පිටතට එනකොට පොත් පිංචක් වගේ දෙයක් දීලා, විදේශිකයින්ට ඉංග්‍රීසි බසින් එහෙම පොත් පිංචක් දෙනවා, අපි විසින් පවත්වා ගෙන යන මේ මේ මධ්‍යස්ථාන තියෙනවා. ඒ වාගේම සම්බාහන මධ්‍යස්ථාන. ගරු අමාත්‍යතුමනි, දැන් සම්බාහන මධ්‍යස්ථාන තියෙනවා.

ඔබතුමාගේ දැඩි අවධානයට යොමු කරන්න ඕනෑ. මේ SPA කියලා ජාතියක්. නගරයක් ගත්තාම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අලුතින්ම බිහිවෙලා තිබෙන්නා වූ දෙයක් තමයි මේ සම්බාහන මධ්‍යස්ථාන. ආයුර්වේද අමාත්‍යාංශය හරහා අනුමැතිය ලත් කියලා. විශාල වශයෙන් තියෙනවා. මේවා ඇත්තටම ගණිකා මඩම්. මේවා ගණිකා මඩම්. ඒ නිසා ඔබතුමා ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා මේවාට අවධානය යොමු කරන්න ඕනෑ. අපි ගත්තොත් එහෙම මේ මහරගම තලපත්පිටිය මෙන්න මේ ආසන්නයේ දිගටම තියෙනවා චූටි චූටි ඒවා. දැන් හැමෝම දන්නවා. පොඩියට Open කියලා එවර වෙලා 24 hours Spa කියලා එහෙම දානවා. ලයිට් එකක් දාලා තියෙනවා. ඉතින් ඒවා ගණිකා මඩම්. ඒ නිසා ඒවා හරියට අධීක්ෂණය කළොත් ඔබතුමාට මේ කටයුත්ත පිළිබඳ සොයා බලන්න පුළුවන්. ඒ නිසා මේවා මේ පවත්වා ගෙන යන්නේ, හරියට ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන හැටියට. මම කියන්නේ නැහැ, හැම තැනම හොඳ තත්ත්වයෙන් තියෙනවා කියලා. ඒ නිසා ඔබතුමාගේ ඒ අවධානය යොමු කරනවා නම් මම හිතන්නේ, වඩාත් සුදුසුයි කියලා. ඔබතුමාට ඉල්ලීමක් කරනවා. ඔබතුමා ඒ පිළිබඳව අධීක්ෂණය කරන්නයි කියලා.

ගරු අමාත්‍යතුමනි, ඊළඟ කාරණය තමයි ඔබතුමා යටතේම ක්‍රියාත්මක වන්නා වූ මාතෘ සායන තියෙනවා. බොහෝ දුරට මේවා පළාත් පාලන ආයතන හරහා ක්‍රියාත්මක වෙන්නේ. සමහර මාතෘ සායන තියෙනවා චූටි ඉඩ කඩ තියෙන ප්‍රදේශයක තමයි මේ දේ කරන්නේ. මෑතකදි කොට්ටාව හන්දියේ තිබුණා. දැන්නම් ඒක වෙනස් කරලා. ඇතුලට ගන්නේ 10 දෙනයි. 40 ක් 50 ක් විතර එළිවේ අව්වේ ගැබිනි මව්වරුන් ඉන්නවා. ඉතින් ඒ ගොල්ලන්ට නිවැරදි පහසුකම් නැහැ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

කොළඹ?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

කොළඹ. මේ කොට්ටාවේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ලැජ්ජයි නේ?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඉතින් ලැජ්ජයි තමයි. ඒක නිසා ඔබතුමාගේ අවධානය යොමු කරනවා. දැන්නම් ඒක අලුතින් හදලා තියෙනවා. දැන් ඒවා අලුතින් හදලා තියෙනවා. ඒ මාතෘ සායන. හයිලෙවල් පාර අද්දර තිබුණේ. දැන් නම් ඒක වෙන තැනකට අරන් ගිහිල්ලා, දැන් අලුතෙන් හදලා තියෙනවා. ඒක ගැබිනි මව්වරුන්ට, මාතෘත්වයට සලකන ඉතාමත්ම නරක ආකාරයේ දෙයක්. වතුර ටිකක් බොන්න බැහැ. ගරු අමාත්‍යතුමනි ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා මම මීට පෙර ප්‍රතිපාදන වෙන් කරලා වතුර ෆිල්ටර්ස් දුන්නා දුන්නා. මේ ෆිල්ටර්ස් සමහර අය භාර ගන්න අකමැතියි. මාතෘ සායනවලට මේවා භාර ගන්න අකමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකට අකමැති වෙන්න හේතුව තමයි, ඒවායේ ඉන්න හෙදියෝ ඉදන් කියනවා. මේක ගත්තාට පස්සේ මල කරදරයක්. කෝප්ප හොයන්න ඕනෑ. වතුර පුරවන්න ඕනෑ හැමදාම. දියසෙවෙල් බැදුනාම ඒවා අහක් කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඉතින් ඒ නිසා එහෙම නොවෙයි. මවකට වතුර වීදුරුවක් ලබා දෙන එක ඇත්තටම ඉතාම වැදගත් වෙනවා.

ඒ වාගේම අඩුම තරමේ ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා ඔය Spa, මේ වගේ දේවල් අධීක්ෂණය කරන්න කඩා පනින හමුදාවක් වගේ දෙයක් දා ගත්තා නම්, හැමවෙලේම සොයා බැලීම් කරනවා නම් මම හිතන්නේ ඒක වඩාත් සුදුසුයි. ඔබතුමාගේ අමාත්‍යාංශය ජනතාවට ඉතාමත්ම දැඩි ලෙස සම්බන්ධ වෙලා තියෙන්නේ. මේවා සොයන්න දාලා තියෙනවා ගරු අමාත්‍යතුමනි, PHI ලා. මම එදා මහ ඇමතිතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව කථා කරන අවස්ථාවේදීත් කිව්වා. අපි පළාත් පාලන ආයතනවල අවුරුදු 15 කට වඩා වැඩි කාලයක් මන්ත්‍රීවරුන් හැටියට, විපක්ෂ නායකවරුන් හැටියට හිටපු කට්ටිය. මම නම් දැකලා නැහැ PHI ලා. මගෙත් එක්ක තරහ වෙන්න එපා. මම සමහර අවස්ථාවලදී PHI කියලා හොයා ගන්න බැහැ. කම්කරුවත් එකයි, කාර්යාලයේ වැඩ කරන නිකන් සේවකයත් එකයි, PHI ලත් එකයි. අර ඉස්සර PHI ලාට කියන්නේ, සැනටරි ඉන්ස්පැක්ටර්ස්ලානේ? ඉංග්‍රීසියෙන් කියන්නේ Sanitary Inspector. මේක ගම්වල හදා ගෙන තිබෙනවා, සැන්ට්පෝට් මහත්තයා කියලා. මම දන්නේ නැහැ කොහොම මේක හැදුනාම කියලා. මේ සැන්ට්පෝට් මහත්තයා කිව්වොත් පොලිසියෙන් ආවා වගේ තමයි. අර

[ගරු රොඩ්නි රඩොල්ෆ් ෆ්‍රේසර්]

පොලිස් ඇඳුම ඇඳ ගෙන, කාකි ඇඳුමක් එහෙම දා ගෙන අපි ගියාම භය වීමක් වගේ දෙයක් වෙනවා. දැන් කඩේකට උනත් එහෙමයි. නමුත් දැන් තියෙන තත්ත්වය යටතේ ඒකේ වෙනසක් වෙලා තියෙනවා. බොහෝ දුරට මේකේ T.O.ලාගේ කාර්ය භාරය තමයි ඔවුන් කරන්නේ. මහරගම නගර සභාවෙත් හිටියා. ඒකේ ගත්තොත් එහෙම ප්ලෑන් අඳින එක තමයි කරන්නේ. COC දෙන එකයි. ඕවා තමයි කරන්නේ. ඒගොල්ලෝ පාරට බහින්නේ නැහැ. කාණු පිළිබඳ සොයා බැලීමක් නැහැ. කාණු හොයන්න ගියොත් එහෙම ඒගොල්ලෝ කියනවා, මේක RDA එකට අයිති පාරක්. ඉතින් ඒ නිසා කාණුව අපට අයිති නැහැ. ඉතින් ඒ නිසා මේවා ඔබතුමාගේ නිර්මාණ තුළ, ඔබතුමාගේ බලාපොරොත්තු තුළ යම් යම් දේවල් සිදු වෙනවා කියලා කිව්වත්, මම හිතන්නේ නැහැ ගරු අමාත්‍යතුමනි, ඒ දේ සිද්ධ වෙනවාය කියලා. ඒ නිසා PHI ලාව වෙනමම ගෙනත්ලා කියන්න ඕනෑ, ඔබේ කාර්ය භාරය මේකයි. මේ කාර්ය භාරයෙන් තොරව යම් කිසි තවත් දෙයක් කරන්න බැහැයි කියලා. එහෙම නැත්නම් වෙන්නේ PHI ලා යනවා - හිතන්න කෝ බලන්න. දැන් ඉස්කෝල ළඟ, ඉස්කෝලයක් ඇතුළේ කැන්ටින් ඇතුළට ගියොත් එහෙම. ඒ කැන්ටින්වල නියමයන් තියෙනවා, දරුවන්ට විකුණන්න පුළුවන් මේ මේ ජාතියේ ආහාර ද්‍රව්‍ය කියලා. අද පාසල් කැන්ටින් ගත්තොත් එහෙම කැන්ටින්වල තියෙන්නේ අවුරුදු ගානක් පරණ ඒවා. අද කට්ලට් එක විකිනුවේ නැත්නම්, ඒක බැඳලා නැවත වතාවක් හෙට උදේ ළමයාට දෙනවා. ඒවා PHI ලා ගිහිල්ලා බලන්නේ නැහැ. ඒක ඒ ගොල්ලන්ට අයිති කාර්ය භාරයක්. කිසිම කඩයකට ගිහිල්ලා අඩුම ගණනේ මම දැනුවත්ව නම් නගර සභාවේ හිටපු විදිහට - හිටපු සභාපතිවරු කිහිප දෙනෙක්ම ඉන්නවා මෙතැන. අර මස් එහෙම කොක්කේ එල්ලලා තියන්න බැහැ. ඒවා වෙනම වහලා තියෙන්න ඕනෑ. මැස්සෝ වහනවා. කඩේට ගියාම යම් යම් දෙයක් ලැබෙනවා නම් සාක්කුවේ දා ගත්තා. මීට පස්සේ කරන්න එපායි කියලා යනවා. ගෙදර යන ගමන් වගේ, සාක්කු පුරෝ ගෙන ගෙවල්වලට යන රැකියාවක් බවට ඒවා පත් වෙලා තියෙනවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න.

ඒ වාගේම පරිවාස හා ළමාරක්ෂක කටයුතු පිළිබඳවත් ඔබතුමාට අයිති වෙන්නේ. ළමා නිවාසවල දරුවෝ විශාල ප්‍රමාණයක් ඉන්නවා. සමහර ළමා නිවාසවල ඇත්තටම ළමා ආරක්ෂාව පිළිබඳව සොයා බලනවා ද කියලා හිතා ගන්න බැහැ. ඒවායේ තමයි බොහෝ දුරට අකටයුතුකම් සිදු වෙන්නේ. ලිංගික හිංසනයට ලක් වෙන ස්ථාන ගත්තොත් එහෙම බහුල වශයෙන් ඔය ස්ථාන. ඉතින් ඒ නිසා සමහර ඒවායේ ඉන්න පාලකයන් මේ ළමයින් පිළිබඳව හික්මීම, එහෙම නැත්නම් ළමයාව කොහොමද සකසන්නේ. මේ මුරණ්ඩු ළමයින්ව නැවත වතාවක් සමාජගත කරන්නේ කියලා එහෙම අවබෝධයක් තියෙන පිරිස් නැහැ. නිකන් පොලිස්කාරයෝ වාගේ ඉන්නේ. මහා සද්දන්තයෝ ඉන්නේ. ඒ නිසා රාත්‍රියේදී පාලකයාගේ කකුල් මසාජ් කරන්න ඕනෑ. ඔලුව මසාජ් කරන්න ඕනෑ. එක එක අවශ්‍යතා ඉටු කරන්න ඕනෑ. ඒ නිසා ඇත්තටම රාත්‍රියකදී හරි ගිහිල්ලා මේවා බලන්න ඕනෑ දේවල්. හුඟාක් දෙමාපියෝ නැතුව, එහෙම නැත්නම් පාරේ ඉන්න වීථි දරුවෝ එහෙම ගිහිල්ලා ඒවාට දානවා. සොයා බැලීමක් කරන්නේ නැහැ. අම්මා තාත්තා නැහැ. මම මේ දැනුත් ගියේ තලතා අතුකෝරළ මැතිනියගේ විගමනයෙන් යුක්ත දරුවන්ට තෑගි බෙදා දෙන්න. එතැනදීත් ප්‍රකාශ කළේ, දරුවන් පිළිබඳව මීට වඩා සොයා බලන්න ඕනෑ. ගරු අමාත්‍යතුමනි, ඇත්තටම දැන් ගෙවල්වල දරුවන්ට හිංසනය බොහෝ දුරට සිදු වෙනවා. වැඩකාරකමට ගන්න කොට සමහර නඩුකාරයෝ තමන්ගේ කාන්තා - දැන් කාන්තා අංශයත් ඔබතුමාට නේ අයිති වෙන්නේ. අපි වෙනුවෙන් පෙනී සිටින නඩුකාරවරු, විනිසුරුවරු කාන්තාවන් අපයෝජනය කරනවා. හිතන්න කෝ බලන්න කොහොමද කියලා ඉවර වෙලා. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කිරීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපට වැඩිහිටියන් සඳහා - මම හැමදාමත් කථා කරන එකක් තමයි මේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා අපට අපේ ප්‍රතිපාදනවලින් වැඩිහිටියන්ට කිසිම ද්‍රව්‍යයක් දෙන්න බැහැ. මම දැනුවත්ව නම්. මම නම් දන්නේ නැහැ. ඉස්සර නම්, සිල් රෙදි එහෙම දෙන්න පුළුවන්. නමුත් අපිට එවැනි දෙයක් අපේ ප්‍රතිපාදන ඔස්සේ - ඇත්තටම අසරණ දෙමාපියෝ ඉන්නවා. හොඳ තත්වයේ දරුවෝ ඉන්නවා. දෙමාපියන්ට සල්ලි නැහැ. ඉතින් ඒක නිසා ඔවුන්ට අපි හරහා මොකක් හරි යම් කිසි දෙයක් අඩුම තරමේ ඇඳුමක් හරි, එහෙම නැත්නම් උපැස් යුවළක් මෙවැනි කිසියම් දෙයක් ලබා ගන්න ප්‍රතිපාදන අපිට වෙන් කරන්න පසුබිමක්

නැහැ. ඔබතුමා දැන් අලුතෙන්නම් අපට මේ සැරේ වෙන් කරලා තියෙනවා. මටත් ලක්ෂයක් ලැබුණා. වැඩිහිටියන් සඳහා කණ්නාඩි ලබා දෙන්න. දැන් මැතිවරණ කාලය නිසා ඒක පෙබරවාරි මාසයට කල් ගිහිල්ලා තියෙනවා.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

නැහැ. ඒක දැන් ක්‍රියාත්මක කරන්න පුළුවන්. ගැටළුවක් නැහැ. පරීක්ෂා කරන්න පුළුවන්.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු අමාත්‍යතුමනි, ඇත්තටම ඒ වැඩිහිටියෝ, සමහරු ඉන්නවා හොඳ පවුල්වල. හොඳ වැදගත් පවුල්වල ඉන්නවා. දෙමාපියෝ ඉන්නවා සල්ලි නැති. අම්මලා තාත්තලාට පුතාලා උදව් කරන්නේ නැහැ. ඒ නිසා අපි අර පිං පඩිය උනත් අපේ මීට වඩා වැඩි සංඛ්‍යාවකට දෙන්න පුළුවන් කමක් තියෙනවා නම් මම හිතන්නේ, ඒක ලොකු දෙයක්. ගරු අමාත්‍යතුමනි, අපේ හරහාත්, අපේ මේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදන හරහාත්. අපේ අම්මා තාත්තා වාගේ තමයි. මැරෙනතාක් කල්. මගේ මව මිය ගියේ අවුරුදු 85 ක් ඉඳලා. තාත්තා 96 ක් ඉඳලා. මැරෙනතාක් කල්ම අපි උදව් කළා. ඒ නිසා වැඩිහිටියන් සඳහා යම් කිසි ආකාරයක යම් කටයුත්තක් කරන්න පුළුවන් නම් ඔබතුමාගේ අවධානය යොමු කරන්න. බස් රථවලදීත් කාන්තාවන්ට හිංසනය වැඩියි. ඒ නිසා මම පොඩි ඉල්ලීමක් කරනවා ගරු අමාත්‍යතුමනි, ඉස්සර නම් තිබුණා කාන්තාවන් සඳහා වෙනමම උදේ පාන්දර බස් රථයක්. එක එක බස් රථ ආරම්භ කරන තැන්වලින්. ඒ නිසා අඩුම තරමේ කාන්තාවන්ට උදේ පාන්දර වැඩට එන කොට අර ඇත්තටම කලකිරීමකින් වාගේ එන්නේ. ගෙදරින් ඇඳ ගෙන ලස්සනට වැඩට එන පුද්ගලයා උදේ පාන්දර බස් නැවතුම්පලට ඇවිල්ලා යකෙක් බවට පත් වෙනවා. සංගීත පුටුව වගේ. එහෙට දුවනවා, මෙහෙට දුවනවා බස් එකක් අල්ල ගන්න. ඉතින් අර පිරිමින් අස්සේ කාන්තාවෝ රිංගගෙන එතැන හිංසනය ඇති වෙනවා. ඒ නිසා කාන්තාවන් සඳහා අඩුම තරමින් බස් රථයක් හරි ලබා දෙන්න පුළුවන් නම් හොඳයි කියලා කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.27]

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සතුටු වෙනවා. බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශය ප්‍රධාන දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳව වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න. මම මේ අවස්ථාවේදී දේශපාලනයක් කථා කරනවා නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුමිත් ලාල් මැන්දි මැතිතුමා කියන්නේ, දේශපාලන වශයෙන් දහදුක් විඳලා තමන්ගේ ආදරණීය අයියා විජයපාල මැන්දිස් මැතිතුමාව කුරිරු ත්‍රස්තවාදයට මැදිවෙලා ජීවිතය පූජා කළායින් පස්සේ, තම සහෝදරයාගේ දේශපාලන ක්‍රියාවලිය ඉදිරියට ගෙනැල්ලා ඇපවෙලා කැපවෙලා පළාත් සභාව නියෝජනය කරලා වර්තමාන අපේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ගෞරවයට, ආදරයට, කරුණාවට පාත්‍රවෙලා මේ පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍ය ධුරය ලැබිලා තියෙනවා. ඒ ගැන අපි අපේ පන්තියේ සගයෙක් හැටියට ආඩම්බර වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා කවුරුත් දන්නවා මම මේ අවස්ථාවේදී මේක අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. ලංකාවේ වැඩිම ජනගහනයක් ඉන්න ප්‍රදේශය තමයි බස්නාහිර පළාත. ඉතින් ඒ බස්නාහිර පළාතේ අතිශය බහුතර ජනගහනයකට සෞඛ්‍ය කාරණාවලියේදී සියලු දේම දෙන්න, ඉෂ්ට කරන්න හරිම අමාරුයි. මේකට අනිවාර්යයෙන්ම මධ්‍යම රජය, රේඛීය අමාත්‍යාංශය මැදිහත් වෙන්න ඕනෑ. නමුත් අපි සතුටු වෙන්න ඕනෑ. අපේ සුමිත්ලාල් මෙන්ඩිස් මැතිතුමා සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට එතුමාගේ ප්‍රදේශය නියෝජනය කරන රේඛීය අමාත්‍යාංශයේ ගරු සෞඛ්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න මැතිතුමාත් එක්ක සහ සම්බන්ධයෙන් කටයුතු කරන නිසා එතුමාට විශාල වාසි සැලසිලා තියෙනවා. එතුමා තමාගේ ප්‍රදේශයේ රෝහල්වලට මොනවාද අවශ්‍ය වන්නේ කියලා හිතලා, පළාත් සභාවෙන් ප්‍රතිපාදන මදි නම්, එතුමා තමන්ගේ ඒ ප්‍රදේශය නියෝජනය කරන සෞඛ්‍ය ඇමතිතුමා, රාජිත සේනාරත්න මැතිතුමාත් එක්ක සාකච්ඡා කරලා ඒවා ඒ ප්‍රදේශයට ලබා ගෙන තියෙනවා. ඉතින් මම එතුමා මේ අයවැය විවාදයට සම්පාදනය කරලා තියෙන පොත දිහා බැලුවාම මට පොඩි ඊර්ෂ්‍යාවක් ඇති වුණා.

[ගරු හෙක්ටර් බෙත්මගේ - සභානායකතුමා]

මොකද හුඟාක් දේවල් ලැබිලා තියෙන්නේ කළුතරට. ගම්පහට. කොළඹට ටිකක් අඩුයි. දැන් අපි සාමාන්‍යයෙන් කියනවා නේ, ව්‍යවහරයට කියන්නේ ගමට කැකිරි කොළඹට කිරි කියලා නේ? මේක කොළමට කැකිරි, ගමට කිරි. ඉතින් මම ඔබතුමාගේ මාර්ගයෙන් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ ඒ දේවල් අඩු කරන්න එපා. ඒ දීලා තියෙන දේවල් ඒවා දෙන්න. නමුත් කොළඹටත් දෙන්න කියලා. දැන් මම බැලුවා මේ පොතේ තියෙනවා 2018 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශේෂ වැඩසටහන්. වකුගඩු රෝගීන් සඳහා රුධිර කාන්දුකරණ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම හා සේවා කටයුතු ආරම්භ කිරීම. හැබැයි ඒක කියලා, ඒක ස්ථාපනය කරන ප්‍රදේශ සඳහන් කරලා තියෙනවා. කොළඹට අඩුයි. මම හිතන්නේ කොළඹ මහ රෝහල තියෙන නිසා වෙන්නැති. නමුත් මම ගරු අමාත්‍යතුමාට අවධානයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ කොළඹ මේ මෑත තියෙන - අපි හිතමු කඩුවෙල ආසනය, හෝමාගම ආසනනය, කොට්කාවත්ත මේ ප්‍රදේශයේ විශාල ජනගහන සනත්වයක් වැඩි වෙලා තියෙනවා. ඒ ජනගහන සනත්වයට සරිලන අධි සැපයුමක් දෙන්න අවශ්‍ය වෙනවා. ඒකට කවුරු හරි කියන්න පුළුවන්, ඇයි? කොළඹ තියෙන්නේ කියලා. නමුත් කොළඹට යන්න හුඟාක්ම අපහසුයි. විශේෂයෙන් පාරේ තියෙන රථවාහන තදබදය නිසා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ගරු අමාත්‍යතුමනි, මේ අවස්ථාව අපේ කඩුවෙල ප්‍රදේශයේ තලංගම රෝහලටත් ලබා දෙන්න කියලා. එහෙම නැත්නම් අඩුම ගණනේ අතුරුගිරිය රෝහලටවත්. මොකද මේක ඉතාමත්ම වැදගත්. මොකද මම පෞද්ගලිකව දන්නවා. අපේ ප්‍රදේශයේ විශාල ජනතාවක් වකුගඩු රෝගයට ගොදුරු වෙලා, ඒ රුධිර කාන්දුකරණය කර ගන්න බැරි වෙලා හරිම අපහසු තත්ත්වයකට පත් වෙනවා. ඔවුන් ජීවිතය බේර ගන්න කොළඹට හරි අමාරුවෙන් යනවා. නමුත් විශාල මුදලක් වෙන් කරන්න ඕනෑ. ඒ නිසා තමුන්නාන්සේගෙන් මම ඉල්ලා සිටිනවා මේ පිංකමට සහභාගි වෙන්නය කියලා.

ඊළඟට ගරු අමාත්‍යතුමනි, මම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගේ මාර්ගයෙන් ඉල්ලා සිටිනවා. දැන් මේ තලංගම රෝහල තමයි කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන රෝහල සහ නවගමුව රෝහල, අතුරුගිරිය රෝහල. නමුත් මේ පොත්පත් වල කිසිම තැනක, මම දැක්කේ නැතුවද දන්නේ නැහැ. ඒවායේ තියෙන දියුණුව කෙරෙහි කොහෙවත් සටහනක් නැහැ. වෙනින් වෙනින් රෝහල් තමයි සඳහන් වෙලා තියෙන්නේ. ඉතින් මම හිතනවා අපට අලුත් සෞඛ්‍ය අධ්‍යක්ෂවරයෙක් ඇවිල්ල ඉන්නවා. මම එතුමත් එක්ක දුරකථනයෙන් කථා කළාම, මම මුහුණ දැකලා තිබුණේ නැහැ. නමුත් දුරකථනයෙන් කථා කළාම මට තේරුණා ඇහුම්කන් දෙන, ඒ වාගේම දේශපාලන අධිකාරියත් එක්ක සහසම්බන්ධයෙන් කටයුතු කරන්න පුළුවන් හොඳ පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂවරයෙක් කියලා මට හිතුනා. අද තමයි මම එතුමාව පණ පිටින්, එතුමාගේ ස්වරූපය දැක්කේ. බලපුවාම ඒ නොදැක්කා වගේම, පණ පිටින් දැක්කාමත් හොඳ පුද්ගලයෙක් වාගේ පෙණුනා. ඉතින් මම එතුමාගේ ප්‍රධානත්වයෙන් ඉන්න අනෙකුත් සෞඛ්‍ය වෛද්‍යවරුන්ගෙන් ඉල්ලා සිටින්නේ අපිත් එක්ක හැම වෙලේම කථිකාවක් කරන්න. ඒ පළාතට මොනවාද කෙරෙන්න ඕනෑ කියන කාරණාව.

දැන් කෙනෙකුට කියන්න පුළුවන් දේශපාඥයෝ මොන කෙන්ගෙඩියක්ද දන්නේ. අපි නේ මේවා කරන්නේ කියලා. නමුත් එහෙම නෙමෙයි. දේශපාලඥයාට තමයි මේ පොඩි මිනිහාගේ, සාමාන්‍ය ජනතාවගේ හෘද ස්පන්දනය නැත්නම් හද ගැහෙනා රාවය, රිද්මය දන්නේ. ඒක ශ්‍රී ලංකා වෙන්න පුළුවන්. යූඑන්පී වෙන්න පුළුවන්. ජනතා විමුක්ති පෙරමුණ වෙන්න පුළුවන්. ඔවුන් තමයි දන්නේ. ඒක නිසා අපි එක්ක නිරන්තර සම්බන්ධකම් ඇති කර ගන්න. මොකද, මම එහෙම කිව්වේ, මීට ඉස්සෙල්ලා එහෙම තිබුණාද කියන කාරණාවෙත් අපට පොඩි ප්‍රශ්නයක් තියෙනවා. ඉතින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ පෙරේදා අපට විශාල ප්‍රශ්නයක් ඇති වුණා. ඒ ප්‍රශ්නය තමයි, මේ මැතිවරණයක් ප්‍රකාශයට පත් කරලා තියෙනවායි කියන කාරණාව තුළ අපේ සේවාදායකයාට අපි සැලසූ සේවාවන් එක පාරටම පොල්ලෙන් ගැහුවා වාගේ නවත්තලා තියෙනවා. නිදර්ශනයක් හැටියට කිව්වොත්, අපි ඇස් කණ්ණාඩි පරීක්ෂා කරලා, මෙතුමා දෙන සල්ලි අපේ සල්ලිවලින් අපි ඇස් කණ්ණාඩි දෙන්න ලෑස්ති කරලා තිබුණේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සායන පවත්වලාත් ඉවරයි.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

සෞඛ්‍ය සායන පවත්වපු ඒවා හැර පවත්වන්න තියෙන ඒවා වහාම නවත්තලා තියෙනවා. මම හිතන්නේ ඒක වැරදි වැටහීමක් වෙන්න පුළුවන්. මම ඒකට නිලධාරීන්ට චෝදනා කරන්නේ නැහැ. හැබැයි එවැනි තීන්දුවක් වහාම නවත්වන්නයි කියන තීන්දුව ගන්න ඉස්සර වෙලා ඒ නිලධාරීන් දැන ගන්න ඕනෑ තමාගේ ළඟම ඉහළම නිලධාරියා තමයි ලේකම්වරයා. ලේකම්වරයාගේ ඉඳලා මේ ගැන දැනුවත් කරන්න ඕනෑ. ලේකම්වරයාට තීන්දුවක් ගන්න බැරි නම් අමාත්‍යවරයා දැනුවත් කරන්න ඕනෑ. අමාත්‍යවරයාටත් මේක ඉතාමත්ම බැරෑරුම් සංකීර්ණ ප්‍රශ්නයක් නම්, අමාත්‍ය මණ්ඩලයත් තීරණයක් ගන්න තිබුණා. මේක හදිසියේ නවත්වලා තියෙනවා. නමුත් අද මම සතුටු වෙනවා. අපි කාමරයේ කථා කරලා සභාපතිවරයාත් ඉන්න වෙලාවේ, ඒක නිරාකරණය කර ගත්තා. මේක නිලධාරීන්ට තේරෙන්න ඕනෑ. මේ පොතේ පතේ ලියලා තියෙන නීතිය නොවෙයි. නීති රීති කියලා එකක් තියෙනවා. මේක යහපත් දෙයක්ද? දැන් මේ කාරණාව හාස්‍යයට ලක් කරනවා නොවෙයි. එහෙම නම් කොළඹ මහ ඉස්පිරිතාලේ බෙහෙත් දෙන්නත් බැහැ, මේ දවස්වල. ඇයි? කොළඹ මහ ඉස්පිරිතාලේ බෙහෙත් දෙන්න බැහැ නේ? ඇයි ඇස් පරීක්ෂා කරන්න බැරි නම්, කොළඹ මහ ඉස්පිරිතාලේ බෙහෙත් දෙන්නත් බැහැ. ඒකත් දේශපාලන කාරණාවක් වෙනවා. ඉතින් මම කිව්වේ මෙහෙම දේවල් මීට පස්සේ වෙන්න දෙන්න එපැයි කියන කාරණාවයි.

ඉතින් මම දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙනේන් නැහැ. එක වැදගත් කාරණාවක් තියෙනවා. ගරු අමාත්‍යතුමනි, මේක පැහැර හරින්න එපා, මේකෙන් ලිස්සලා යන්න එපා. පසුගිය කාලේ ආණ්ඩුවට තිබුණ ලොකුම ප්‍රශ්නය තමයි මේ ඩෙංගු. ලංකාවේම ඩෙංගු රෝගීන්ගෙන් 50% ක් කියලා බස්නාහිර පළාතේ මේ පොතේ සඳහන් කරලා තියෙනවා. ඒ වෙලාවේ සියලු දෙනාම අපිව අත්හැරලා යන කොට ආණ්ඩුවට පහර පිට පහර ගහනකොට ඩෙංගු මදුරුවත් මේ ආණ්ඩුවෙන් බෝ කරපු එක්කෙනෙක් කියලා අපේ පිටිපස්සේ ඉඳන් කෑගහන පොඩි කොල්ලෝ ගිහිල්ලා කෑගහනකොට, ඒකට අපේ අමාත්‍යතුමා මුහුණ දුන්නා. එතුමා කල්පනා කළා මේකට වෙනම විශේෂ Task Force එකක්, නැත්නම් ඒකට ඔරොත්තු දෙන හමුදාවක් හදන්න ඕනෑ කියලා. ඒකේදි හැබැයි අපිට ඒ හමුදාව හදා ගන්න බැහැ, අර පරණ විධියට හයයි දෙක ඉල්ලුවා නම්. හයයි දෙක කියන්නේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) වැඩ හයයි, සම්මාන දෙකක් තියෙන්න ඕනෑ. හැබැයි ඒක කළා නම්, එදා කරගන්න බැරි වෙනවා. නමුත් එතුමා වැදගත් තීන්දුවක් ගත්තා. අමාත්‍ය මණ්ඩලයට සංදේශයක් ඉදිරිපත් කරලා මේකේ තියෙන වැදගත්කම ප්‍රකාශ කරලා, හයයි දෙකේ කථාව පැත්තකට දාලා කණිෂ්ඨය සමත් අයවත් මේකට ගන්නය කියලා. දුම් ගහන්න එස්.එස්.සී ලියලා තියෙන්න ඕන නැහැ නේ? අරක කරේ එල්ලන් යන්න තියෙන්නේ? නැත්නම් ගිහිල්ලා මදුරු උපදෙස් දෙන තැනට ගිහිල්ලා සොයලා බලන්න එස්.එස්.සී ඕනෑ නැහැ නේ? නමුත් එතුමා ඒ බුද්ධිමත් තීරණය අර ගෙන අපි ඒ වෙලාවේ ප්‍රධාන අමාත්‍යතුමාටයි, අමාත්‍ය මණ්ඩලයටයි ස්තුතිවන්න වෙනවා. ඒ තීන්දුව දුන්නා. හැබැයි මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. දැන් ඩෙංගු ක්‍රමක්‍රමයෙන් මර්ධනය වෙමින් යනවා. මර්ධනය වෙලා ඉවරයි හුඟාක් වෙලාවට. හැබැයි ඒ කාර්ය භාරය අපි අමතක කරන්න නරකයි. කෘතවේදී මිනිස්සු හැටියට. බැරි වෙලාවේ අපට පිහිට වුණු ඒ සේවකයින්ව ඔවුන්ගේ හයයි දෙක නැති වුණත්, ඔවුන්ගේ සේවා කාලය සලකලා බලලා, අපේ තියෙනවා දින 180 ක් කවුරු හරි සේවය කළා නම්, ඔහුව කම්කරුවෙක් හැටියට, කොන්ත්‍රාත්කරුවෙක් හැටියට අනියම් නිලධාරියෙක් හැටියට අරගෙන, ඊට පස්සේ ස්ථිර කරන්න පුළුවන්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ චක්‍රලේඛය තවම වලංගුද?

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

වලංගුයි, වලංගුයි. ඒකට මේක අනුගත කර ගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ලෝකේ කරන්න බැරි වැඩ තියෙන්නේ කිහිපයයි. සද්භාවයෙන්, යහපත් චේතනාවෙන් කරනවා නම්, ඒවාට ක්‍රමවේද හදන්න පුළුවන්. හැබැයි ක්‍රමවේද හදන්න බැරුව අර පොතේ අර විධියට තියෙනවයි කියලා ගියොත් බැහැ. දැන් ඒකට හොඳම උදාහරණය තමයි අර මම කිව්වේ ඇස් කණ්ණාඩිවල සායන පවත්වන්න බැහැයි කියලා, මැතිවරණ කොමසාරිස් චක්‍රලේඛයක් එව්වයි කිව්වා. ඒක කියෙව්වා.

කියෙව්ව ගමන් දුන්නා ඕඩර්ස්. එහෙම නෙමෙයි ඒක අවබෝධයක් නැත්නම්, අනවබෝධ නම්, ඒවා දැන උගත් අයගෙන් අහලා ඒකට තීන්දුව ගන්න ඕනෑ. මේකේදී මම ඉල්ලා සිටින්නේ, මේ පාප කර්මයට අහුවෙන්න එපා මේ දරුවො ටික, මේ මිනිස්සු ටික එළියට දාලා. ඒක නිසා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනේන් මේකට මම මේ අවස්ථාවේදී ජනාධිපතිතුමාගෙත් අවධානය යොමු කරවනවා. ඒ අමාත්‍ය මණ්ඩලය තීන්දුවක් අර ගෙන, ඔවුන්ගේ සේවය සළකලා, ඔවුන්ව ස්ථිර කරන්න කියන කාරුණික ඉල්ලීම ඉල්ලනවා.

ඊළඟට මූලාසානරූඪ ගරු මන්ත්‍රීතුමා මගින් එතුමාගෙන් ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මගේ මේ ගමේ පොඩි වැඩක් කිව්වාට කමක් නැහැ නේ, මේ වැදගත් වෙලාවේ. මම හිතනේන් අපේ මේ කොළඹ දිසාව භාර වෛද්‍ය නිලධාරිතුමත් ඉන්නවා. අපේ දකුණු තලංගම ප්‍රදේශයේ මාතෘ සායනයක් හැමදාම පවත්වා ගෙන ගියා අනාධිමත් කාලයක් තිස්සේ. ඒක නැවැත්තුවේ මේ ළමා සුභසාධක ශාලාව කියන ශාලාවේ. පසුගිය දවස්වල අපේ ඉල්ලීම මත රුපියල් ලක්ෂ 10 ක් මේකට වෙන් කළා. මේක නවීකරණය කරන්න. ඒක ප්‍රමිති ගත නවීකරණයක් නෙමෙයි. කොහොම වුණාද කියලා මම දන්නේ නැහැ. මම ඊයේ පෙරේදා ගිහිල්ලා බලපුවාම ඒක සම්පූර්ණ, අසාර්ථක ව්‍යාපෘතියක්. ඒක නිසා මම මෙතැනදි අපේ පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂතුමා ප්‍රධාන කොළඹ දිස්ත්‍රික්කය භාර වෛද්‍ය නිලධාරීතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔබ දෙපලගේම විශේෂ අවධානය යොමු කරලා, මේ ළමා සුභසාධක සමිතියේ ගිය දේවල්, පසුගිය දේවල් අපට වැඩක් නැහැ. ඉදිරියට මේ ළමා සුධක සමිතියේ පැවැත්වෙන මාතෘ සායනය මේ ජනවාරි 01 දා ඉඳලා ආයේ ස්ථාපිත කරන්න කාරුණික වෙන්න කියන කාරණාව ඉල්ලා සිටිනවා. මා එතැනින් එහාට කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

මම හිතනවා සාමාන්‍යයෙන් හැම අමාත්‍ය මණ්ඩලයක් ගැනම විවේචන ගොඩාක් තිබුණා. මේ අමාත්‍යාංශයෙත් සමහර විට පසුවට විවේචන ඒවි. හොඳ කියාවි. නරක කියාවි. නමුත් පොදුවේ සාපේක්ෂව ගත්තාම, අපේ අමාත්‍යතුමාගේ ඇපවීම, කැපවීම තුළ අද අපේ බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂතුමාගේ සම්ප්‍රාප්තියත් එක්ක, අනෙකුත් වෛද්‍යවරුත් එක්ක හොඳ ගමනක් යන්න අඩිතාලම දාලා තියෙනවා කියන කාරණාව මම ඉතාමත්ම ප්‍රසංශා මුඛයෙන් ප්‍රකාශ කරනවා. බස්නාහිර පළාතේ ජනතාවට හොඳ සෞඛ්‍ය සේවයක් ලැබිලා, නිරෝගී ජනතාවකට අවකාශ ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම කථාව අවසන් කරනවා.

[අ.භා. 02.41]

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු අමාත්‍යාංශයට අදාළව වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු අමාත්‍යතුමනි, අපි මීට දින කීපයකට උඩදී දිගින් දිගටම අධ්‍යාපන ඇමැතිතුමාගේ අධ්‍යාපන විෂයට අදාළව බොහෝ කථා ප්‍රමාණයක් කළා. අධ්‍යාපනය පිළිබඳව වැඩිපුර මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් කථා කරන්න, මේ සභා ගර්භයේ වැඩිපුර රැඳී සිටියා වගේ තමයි අනිත් ඒවාට සාපේක්ෂව ඒකට වැඩිපුර විවේචන ප්‍රමාණයක් ඉදිරිපත් වුණා. එහෙම ඉදිරිපත් වුණේම ඒ අධ්‍යාපනය අපි කාටත් ඉතාම සංවේදී විෂයක් නිසා. ඒ වගේම තමයි, අධ්‍යාපනය වගේම අපට ඉතාම සංවේදී විෂයක් බවට මේ සෞඛ්‍යයත් පත් වෙලා තියෙනවා.

බස්නාහිර පළාතේ ගත්තොත් එහෙම, අධ්‍යාපනයට වගේම සෞඛ්‍ය පැත්තෙන් ගතේතාත් එහෙම විශාල ජනතාවක් ජීවත්වෙන බස්නාහිර පළාතේ අප කාටත් සංවේදී විෂයන් දෙක අධ්‍යාපනය හා සෞඛ්‍යය යන විෂයයන්. මේකේදී ගරු අමාත්‍යතුමාගේ අවධානයට මා විශේෂයෙන් ලක් කරන්න කැමතියි. අපි විශේෂයෙන්ම නොයෙක් විට යෝජනා අදහස් උපදෙස් කාරක සභාවේදී එතුමාට ඉදිරිපත් කරලා තියෙනවා. නමුත් පහුගිය කාලේ මම හිතන්නේ, මා විශ්වාස කරනවා. අපට උපදේශක කාරක සභා පවත්වන්න යම් අතපසුවීමක් වුණා කියලා. ඒකෙදි අපි යම් යෝජනා අදහස් ගේන්න බලා හිටියත් අපට යම් අවස්ථාවක් උදා වුණේ නැහැ. ඒ නිසා ඒ පිළිබඳවත්, මම හිතන්නේ එන වසරේදිත් දීර්ඝ කාලීනව මම කියන්න කැමතියි අපේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදේශක කාරක

සභාව. අපි දන්නවා හැම මාසෙම අපට උපදේශක කාරක සභාව එනවා කියලා. අදාළ දිනයක් තියෙනවා කියලා. ඒකෙදි අපි අදාළ යෝජනා අදහස් අර ගෙන එනවා.

ඒ වගේම තමයි අපි සෞඛ්‍ය උපදේශක කාරක සභාවේ ඉන්නවා. එහෙදිත් අපට යම් විශ්වාසයක් තියෙනවා අහවල් දවසේ තියෙනවා කියලා. අපත් යම් මැදිහත්වීමක් වෙලා ඒ අදහස් යෝජනා රැගෙන එනවා. ඒ නිසා එතුමාගේ විශේෂ අවධානයට මේ උපදේශක කාරක සභා කැඳවීම් පිළිබඳව අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා. ඒ වගේම තමයි එතුමා අපිට මේ අයවැය විවාදයට අදාළව පොතක් ඉදිරිපත් කරලා තියෙනවා. ඉතින් ඇත්තටම මේ ඉදිරිපත් කරන යෝජනා අදහස් එතුමාගේ අමාත්‍යාංශයට ඉදිරිපත් වන චෝදනා විවේචන මම හිතන්නේ ඇත්තටම හොඳට සවන්දීලා ලියාගත්තොත් එහෙම, මේ සෑම අමාත්‍යාංශයකම පසුවිපරමක්, එහෙම නැත්නම් ආපසු සොයා බැලීමක් කර ගන්න පුළුවන් හොඳම අවස්ථාව තමයි මේ අයවැය විවාදය. ඒක තුළ බොහෝ පිරිසක් කථා කරනවා. වැඩි විවේචන ප්‍රමාණයක් එනවා. වැඩි ප්‍රශංසා ප්‍රමාණයකුත් එනවා. ඒක නිසා මේකේ අපට හොඳම අවස්ථාවක් හැටියට තමයි මේ අයවැය විවාදය තියෙන්නේ. ඉතින් අර එතුමා ඉදිරිපත් කළ පොතේ 10 වෙනි පිටුවේ සඳහන් වෙලා තියෙනවා, එම ඉලක්කය සපුරා ගැනීම සඳහා සිදු කරන ව්‍යාපෘති පිළිබඳව. ඒකෙදී ඇත්තටම මම අර මුලින් කිව්වා වාගේ බස්නාහිර පළාත තමයි වැඩිම ජනගහනයක් ජීවත් වෙන පළාත. මේකේදී මීට වසර දෙකකට උඩදී අපිට මතකයි බස්නාහිර පළාතේ ජීවත්වන ජනගහනයේ ප්‍රමාණය කොපමණ කිව්වොත් ලක්ෂ 57 ක් කියලා දාලා තිබුණා. මම හිතනවා දැන් ඒ ලක්ෂ 57 ලක්ෂ 60 ට ආසන්න ප්‍රමාණයක් වී තියෙනවා කියලා. මේකේදී විශේෂයෙන්ම එතුමා ඒ ඉදිරිපත් කරපු පොතේ සඳහන් වෙලා තියෙනවා බස්නාහිර පළාතේ රෝහල් වල ඇඳන් සංඛ්‍යාව 5725 ක් කියලා. මට ඇත්තටම පුදුම හිතුනා ඒ වාගේම පොඩි කනගාටුවකුත් ඇති වුණා. බස්නාහිර පළාතේ ජීවත්වීම ගත්තොත් එහෙම අපි මේ ලෙඩ ජාතියක්ද? රෝගීන් ජනතාවක්ද ජීවත් වෙන්නේ කියලා. මොකද මෙතරම් රෝගීන් ප්‍රමාණයක් ප්‍රතිකාර අරන් තියෙන, ඒ වගේම සායන වලට සම්බන්ධ වෙලා තියෙන ප්‍රමාණය, නේවාසික ප්‍රතිකාර අරන් තියෙන ප්‍රමාණය ගැන අවධානය යොමු කළොත්, එහි පොතේ සඳහන් වෙනවා, 2016 වර්ෂයේ නේවාසික රෝගීන් සංඛ්‍යාව 1,039,507 ක් කියලා. සායනවලින් බෙහෙත් ගත්ත සංඛ්‍යාව මිලියන 02 ක් කියලා. බාහිර රෝගී අංශයෙන් ප්‍රතිකාර ලබා ගත් සංඛ්‍යාව 4,602,165 ක් කියලා. අපි නේවාසික රෝගීන් සංඛ්‍යාව ගත්තොත් එහෙම අපේ පළාතේ ජීවත්වෙන ලක්ෂ 60 ක් ජනතාවගෙන් බැලුවාට පස්සේ සියලු ජනතාවගෙන් හය දෙනෙකුගෙන් එක් කෙනෙක් නේවාසික ප්‍රතිකාර අරන් තියෙනවා. ඒ වගේම තමයි සායනවලින් බෙහෙත් අරන් තියෙන ප්‍රමාණය ගත්තත්, තුන්දෙනාගෙන් එක්කෙනෙක් ප්‍රතිකාර අරන් තියෙනවා. මේ වගේ සංඛ්‍යා ලේඛන ප්‍රමාණයක් මේ පොතේ සඳහන් වෙනවා. ඒ වගේම තමයි අපි ගත්තොත් එහෙම සෞඛ්‍ය හා දේශීය අමාත්‍යාංශයට අදාළව ඒකෙත් තියෙනවා බෙහෙත් ගත්ත ප්‍රමාණයක් සඳහන් වෙලා තියෙනවා මම දැක්කා. ආයුර්වේද රෝහල් වලින් ප්‍රතිකාර අරන් තියෙන සංඛ්‍යාව ගත්තත්, බාහිර රෝගීන් 319,361 කුත්, අභ්‍යන්තර වශයෙන් 2612 කුත් ප්‍රතිකාර අරන් තියෙනවා කියන සංඛ්‍යා දත්ත තියෙනවා. ඇත්තෙන්ම අපි රට සංවර්ධනය කරා රැගෙන යනවා නම්, රට ඉදිරියට රැගෙන යනවා නම්, ඇත්තටම මේ ලෙඩ මිනිස්සු, නැත්නම් රෝගී ජනතාවක් හිටියොත් අපට මේ දේ කරන්න බැහැ. ඒ නිසා අපට ඕනෑ ඇත්තටම මේ රෝගී ජනතාවක් වෙනුවට නිරෝගී ජනතාවක් ඇති කර ගැනීම තමයි මූලික කටයුත්ත විය යුත්තේ. ඒ සඳහා වැඩ පිළිවෙළක් අනිවාර්යයෙන් කෙටිකාලීන, දීර්ඝ කාලීන හා මධ්‍ය කාලීන වැඩ පිළිවෙළක් අපි සකසා ගත යුතුයි කියලා මා විශ්වාස කරනවා.

ඒ වාගේම තමයි අපේ බෙත්මගේ ගරු සභානායකතුමාත් ඉදිරිපත් කළා අර ඩෙංගු රෝගීන් පිළිබඳව. විශේෂයෙන්ම අවධානය යොමු කරන්න ඕනෑ. දැන් යම් මට්ටමකට ඒ ඩෙංගු රෝගීන් ප්‍රමාණය අඩු වෙලා තියෙනවා. නමුත් පසුගිය කාලයේත් ලොකු විවේචනයක් තිබ්බා. මේ ඩෙංගු රෝගීන් පිළිබඳව. එතුමාගේ අමාත්‍යාංශයටත්, පොදුවේ ආණ්ඩුවටත්. ඒකේදී ඇත්තටම ගත්තොත් එහෙම බස්නාහිර පළාත තමයි වැඩිම ඩෙංගු රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වුණේ. මේ වාර්තා වලත් තියෙනවා. 2015 වසරේ 17875 ක්. 2016 වසරේ 24,230 ක්. 2017 අගෝස්තු මාසය වන විට ඩෙංගු රෝගීන් 59075 ක්. ඉතින් මේක මම හිතන්නේ උපරිම තත්වයකට පසුගිය කාලේ පැමිණියා කියන විශ්වාසයක් මා තුළ තියෙනවා. සම්පූර්ණයෙන්

[ගරු නන්දන පත්මකුමාර]

මේක නැතිවීමක් නොවෙයි. මේක මේ තාවකාලික යටපත්වීමක් තියෙනවා. මේක නැතිවීමේ වැඩ පිළිවෙළක් හැටියට එතුමා මැදිහත් වෙලා දැන් වෙනම Unit එකක් හදලා තියෙනවා. මේ Unit එකේ දෛනික කාර්යයක් බවට මේ ඩෙංගු මර්ධන වැඩසටහන දිගින් දිගටම, දිගින් දිගටම ක්‍රියාත්මක කළොත් අපට මේ ඉදිරියේදී ඩෙංගු රෝගීන් සංඛ්‍යාව, ඩෙංගු මරණ සංඛ්‍යාව අඩු කර ගැනීමේ හැකියාව තියෙනවා. මම හිතන්නේ ඒ පිළිබඳව එතුමාගේ විශේෂ අවධානයක් ඇති කර ගත්තොත් එහෙම - අපට මේ කියුබාවේ ගත්තොත් එහෙම ඩෙංගු රෝගය මර්ධනය කරපු ආකාරය පිළිබඳව යම් සොයා බැලීමක් කළොත් අපිට ලොකු දේවල් ටිකක් එහිදී ලබා ගන්න පුළුවන්.

ඊට පස්සේ ග්‍රාමීය රෝහල් පද්ධතිය ගත්තොත් ඇත්තටම අපි අවට තියෙන රෝහල් වලට අපි ගියාට පස්සේ පානදුර, විශේෂයෙන් අපට අයිති රෝහලක්. හොරණ, නාගොඩ රෝහල්වලට ගියොත් එහෙම, විශාල රෝගීන් සංඛ්‍යාවක් අපි දකිනවා. ඇත්තටම නාගොඩට රෝහලට ගියොත් එහෙම සමහර අවස්ථාවලදී මම දැක්කා ඇඳන් යටත් රෝගීන් ඉන්නවා. ඇඳන් යටත් රෝගීන් ඉන්නවා. ඉතින් ඒ මට්ටමටම ඒ රෝහල්වල ඇඳන් පිරී ගිහිල්ලා තියෙනවා, ලෙඩ්ඩුන්ගෙන්. ඒ වගේම තමයි නැවත අපි ආපසු මොරොන්තුඩු ප්‍රදේශයට ඇවිල්ලා, අපේ බෝම්බුවල රෝහලට ගියාට පස්සේ බොහෝ ඇඳන් සංඛ්‍යාවක් තියෙනවා. රෝගීන් නැහැ. රෝගීන් අඩු වෙන එක හොඳයි. නමුත් අරකේ තියෙන තදබදයට සාපේක්ෂව අර ඇඳන් යටත් නිදා ගන්න රෝගීන් ඒ රෝහල්වල ඉඳිද්දී, මේ රෝහල්වල ඇඳන් නිකන් ඔහේ තියෙනවා. ඇත්තටම මම එතුමාට ගිය වසරෙත් අයවැය විවාදයේදී යෝජනා කළා. ඇත්තටම ඒ ග්‍රාමීය මට්ටමේ රෝහල් ටික දියුණු කළොත් එහෙම හොඳ විශේෂඥ වෛද්‍ය කණ්ඩායමක් ඒකට අනුයුක්ත කළොත් එහෙම, ඒ වාගේම නොයෙක් සායන ඒ රෝහල්වල ග්‍රාමීය මට්ටමින් ඇති කළොත් එහෙම, අපට පුළුවන් අර රෝහල්වල තියෙන තදබදය යම් ප්‍රමාණයකින් අඩු කර ගන්න. ඒක තමයි අපි කළ යුත්තේ. මම හිතන්නේ මේ දිගින් දිගටම එතුමත් අපේ දිස්ත්‍රික්කයේ නිසා බෝම්බුවල රෝහල පිළිබඳව එතුමත් එක්ක මම නිතරමත් කථා කරලා තියෙනවා. එතුමාගේත් විශේෂ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා. ඒ වාගේ තමයි අර ග්‍රාමීය මට්ටමේ තියෙන, ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කැමතියි. මම දැන් මේ ළඟදි පානදුර රෝහලට ගියා රෝගියෙක් බලන්න. ඇත්තටම අපි ජලභීතිකා රෝගය ගැන කථා කරනවා. නමුත් පානදුර රෝහලට ගියාට පස්සේ, රෝහලට ඇතුල්වෙන වාට්ටු සංකීර්ණයට යනකොට මම ගණන් කර ගෙන ගියා සුනඛයන් 6 දෙනෙක් ඉන්නවා තැනින් තැන නිදා ගෙන. මම ෆොටෝ කිහිපයකුත් ගහ ගත්තා එම අවස්ථාවේදී ඔබතුමාට ගෙනැල්ලා පෙන්නන්න කියලා. ඒ කියන්නේ අපි බොහෝ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරනවා, මේ සුනඛයන් නැත්නම් මේ ජලභීතිකා රෝගය මර්ධනය කිරීම සඳහා. එවැනි තත්වයක් තියෙද්දී රෝහලේ එවැනි සුනඛයන් සංඛ්‍යාවක් රෝහල ඉදිරිපිට වාට්ටුවල නිදා ගෙන සිටීම පිළිබඳව ඔබතුමාට ඒකත් මේ අවස්ථාවේ මතක් කරනවා.

ඒ වාගේම තමයි විශේෂයෙන්ම මේ පොතෙත් සඳහන් වෙනවා වාට්ටු සංකීර්ණ ඉදිකිරීම පිළිබඳව. ඔබතුමාගේ ඉදිරි වැඩපිළිවෙළෙත් තියෙනවා. ඇත්තටම වාට්ටු සංකීර්ණ ඉදි කරන්න ඕනෑ. ඒවා නැති රෝහල්වල අඩුපාඩු තැන් බල බලා ඒවා ඉදිකිරීම් කටයුතු කරන්න ඕනෑ. ඒ වගේම තමයි අපි ඒවා ඉදිකිරීම් එකතු කරනවා වගේම මෙහිදී ගත්තොත් රෝගීන් සංඛ්‍යාව අඩු කර ගැනීම තමයි අපේ මූලික ඉලක්කය විය යුත්තේ. මොකද ඇඳන් සංඛ්‍යාව, නැත්නම් වාට්ටු සංඛ්‍යාව වැඩි කරනවා වෙනුවට අපේ පැත්තෙන් ලොකු වැඩ පිළිවෙළක් තිබුණොත් එහෙම රෝගීන් සංඛ්‍යාව අඩු කර ගැනීම, එය තමයි අපි මේ සෞඛ්‍ය අංශය දියුණු කරනවා නම්, එහෙම නැත්නම් වැඩ පිළිවෙළක් සහිතව ඉදිරියට යනවා නම් කළ යුත්තේ. මොකද වාට්ටු කොපමණ වැඩි කළත් වැඩක් නැහැ. රෝගීන් වැඩි වෙනවා නම්. ඒක නිසා රෝගීන් සංඛ්‍යාව අඩු කරනවා නම් මේ ලෙඩ මිනිස්සු ප්‍රමාණය අඩු කර ගන්න පුළුවන් නම්, රෝග නිවාරණ වැඩ සටහනක් දීර්ඝ කාලීන, කෙටි කාලීන හා මධ්‍ය කාලීන සැලසුම් සහගතව වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් මම හිතන්නේ එය තමයි අපට ඉතාම වැදගත් වෙන්නේ.

ඒ වාගේම තමයි එතුමාගේ අමාත්‍යාංශයටම අදාළව විශේෂයෙන්ම ආයුර්වේද රෝහල් ගත්තොත් එහෙම විශේෂයෙන්ම මොල්ලිගොඩ රෝහල ගත්තොත් එහෙම, මොරොන්තුඩුව ආයුර්වේද රෝහලක් තියෙනවා මේ අවට. විශාල රෝහල් ප්‍රමාණයක් අප බස්නාහිර පළාතේ

තියෙනවා. එතුමාගේ විශේෂ අවධානයට මම යොමු කරන්න කැමතියි පසුගිය කාලේ ඔය මොල්ලිගොඩ රෝහලේ වැඩ කරන සේවකයෝ කිහිප අවස්ථාවක් මට දුරකථනයෙන් සම්බන්ධ වෙලා දිගින් දිගටම ඉල්ලීමක් කළා, එම රෝහලට විදේශ රටකින් ඉවත් කරපු භාවිතයට ගත නොහැකි ඇඳන් ප්‍රමාණයක්, පුටු ප්‍රමාණයක්, සෝපා ප්‍රමාණයක් විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරලා ගෙනාවා කියලා. නිසියාකාරව ඒ පිළිබඳව ලොකුම අවබෝධයක් මට නැහැ. මම ඒක අවධානයට යොමු කර ගන්න ඕනෑ.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට වැරදි තොරතුරු දීලා තියෙන්නේ. ඒ විදේශිකයෝ ගෙනැල්ලා තිබුණේ, හොඳම ඇඳන් 35 ක්. නිකන්. අපෙන් වියදම් වෙලා තියෙන්නේ, ලක්ෂ 04 ක් වගේ මුදලක්, මේක නිදහස් කර ගන්න.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්නේ. මොකද ඒ පිළිබඳව මම අපේ කොමසාරිස්තුමියගෙනුත් විමසීමක් කළාම, එතුමියත් යම් උත්තරයක් දීමට අපොහොසත් වුණා කියන හැඟීමක් මට තිබුණේ. ඒ නිසා මට කථා කළ සේවකයෝ කිහිප අවස්ථාවකම මේක හොයන්න මන්ත්‍රීතුමා, මේකට මැදිහත් වෙන්න කියපු නිසා ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කළේ. එතැනදී ගරු ඇමතිතුමා විශේෂයෙන්ම එම ගෙනාපු ඒවා සමහර අවට ඉන්න ජනතාවත් අරන් ගියා කියන මොනවා මොනවා හරි දේවල් ටිකක්, අන්න එහෙම කාරණාවකුත් ඒ කථා කරපු සේවකයන් කිහිප දෙනා මා සමඟ පැවසුවා. ඔබතුමාගේ විශේෂ අවධානයට ඒ පිළිබඳවත් යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. ඒ වගේම තමයි දේශීය වෙදකම පිළිබඳව ගත්තොත් එහෙම ඒකේ ගුණාත්මක තත්ත්වය. මම හිතන්නේ විශේෂ අවධානයක් යොමු කරලා මේ දේශීය වෙදකම පිළිබඳව අපි වැඩ කටයුතු කළොත් ඇත්තටම අර ප්‍රජා සෞඛ්‍ය නිලධාරීන් විශාල පිරිසක් මේ දිස්ත්‍රික්ක තුනේම සේවය කරනවා. ඔවුන්ගේ සේවය මෙයට වැඩිය ගුණාත්මක භාවයෙන් අපට යොදා ගන්න පුළුවන් නම් අපට පුළුවන් විශේෂයෙන්ම බෝ නොවන රෝග පිළිබඳව දැනුවත් කරලා එවැනි වැඩ සටහන් ටිකක් කර ගෙන යන්න. පසුගිය කාලේ අපි වැඩ සටහන් කීපයකට මුදල් ප්‍රතිපාදන වෙන් කළා. ඒ වැඩ සටහන් කළා. ඇත්තටම මම හිතන්නේ ඉතා සාර්ථක වැඩ සටහන්. ඒ නිලධාරීන්ට බොහෝ වැඩ කොටසක් කරන්න පුළුවන් ග්‍රාමීය මට්ටමට ගිහිල්ලා. ඒ වැඩ සටහන් එහෙම ක්‍රියාත්මක කළොත්, අපට පුළුවන් අර රෝගී ජනතාව වෙනුවට නිරෝගී ජනතාවක් බිහි කර ගන්න නිරන්තරයෙන්ම අප පළාතේ මිනිසුන්ගේ ජන ජීවිතය සුරක්ෂිත භාවයට පත් කරන්න.

ඒ වාගේම තමයි ළමාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළව ඔබතුමාගේ විශේෂ අවධානයන යොමු කරන්න ඉල්ලා සිටිනවා. අපි මෙහිදී විශේෂයෙන්ම ගත්තොත්, ග්‍රාමීය මට්ටම ගත්තොත් අපේ කාන්තාවන් විශාල පිරිසක් විදේශ ගත වෙනවා. මේකේදී බොහෝ විදේශ ගත වන කාන්තාවන්ගේ ජීවිත ගත්තොත් එහෙම, නිවස පිළිබඳව ගත්තොත් එහෙම, ඒ දරුවන් විශාල වශයෙන් විනාශ වෙලා යනවා. එක්කෝ අධ්‍යාපනය අතහැර ගිහිල්ලා. නැත්නම් අඩු වයසින් විවාහ දිවියට පත් වෙනවා. එවැනි බොහෝ ගැටළු රාශියක් මේ කාන්තාවන් රැකියා සඳහා විදේශ ගතවීම තුළ, එහෙම ශෝචනීය අවස්ථාව අපි දැකලා තියෙනවා. ඒ නිසා ඒ පිළිබඳව ඔබ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව හරහා ඔබතුමාගේ අමාත්‍යාංශයට අදාළව එවැනි පවුල් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා, ඒ ගැන සොයා බැලීමක් කරලා ඒ ගැන මැදිහත්වීමක් කරන්න කියන ඉල්ලීම කරනවා. ඊට පස්සේ සමාජ සේවා දෙපාර්තමේන්තුවට අදාළව අපි දන්නවා අපේ සමාජය ගත්තොත් එහෙම අද විශාල වැඩිහිටි ප්‍රමාණයක් ඉන්නවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 10 ක් වෙන් වී තිබෙනවා. මම ඒක -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නැහැ, නැහැ. කාලය තියෙනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

විශාල වැඩිහිටි පිරිසක් සමාජයේ ඉන්නවා. ඔවුන් අසරණ භාවයට පත් වෙලා තියෙන අවස්ථා විශේෂයෙන්ම අපි දැකලා තියෙනවා. ඇත්තටම ගත්තොත් එහෙම මම මීට

[ගරු නන්දන පත්මකුමාර]

දින කිහිපයකට උඩදී ගියා අපේ කළුතර තියෙනවා සුජාතා වැඩිහිටි නිවාසයට. එතැනට ගියාට පස්සේ, ඇත්තටම ඒ කරන සත්කාර උපකාර ගත්තොත් එහෙම ඇත්තටම පුදුම හිතෙනවා. ඒ වැඩිහිටි නිවාසවල ඉන්න සේවකයෝ, ඔවුන්ව බලා ගන්න නිලධාරීන් කරන සේවාව පිළිබඳව. මම හිතන්නේ ඇත්තටම අපි මීට වැඩිය දෙයක් එම ආයතන වලට උදව් පදව් කරන්න ඕනෑ. එහෙම කළොත් අපට පුළුවන් යම් හෝ සහනයක් අපේ ඒ වැඩිහිටියන් වෙනුවෙන් සලසා ගන්න. විශේෂයෙන්ම ඒ දෙමාපියන්, වැඩිහිටියන් - අපේ ගම් මට්ටමින් ජ්‍යෝෂ්ඨ පුරවැසි සමිති බොහෝ ප්‍රමාණයක් තියෙනවා. ඒ පිළිබඳවත් විශේෂයෙන් අවධානය යොමු කරලා වැඩ කළොත් අපට පුළුවන් මේ පළාත් සභාව හරහා ඒ ජ්‍යෝෂ්ඨ පුරවැසි සමිතිවලට යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් දීලා, වැඩ සටහන් ප්‍රමාණයක් දීලා, ඒ තුළින් එම පුරවැසියන්ගේ විශේෂයෙන්ම වයසට ගිය පුරවැසියන්ගේ, ජ්‍යෝෂ්ඨ පුරවැසියන්ගේ මානසික තත්වයන් වෙනස් කරලා හොඳ ආකල්ප තත්ත්වයන් වර්ධනය කරලා, ඔවුන්ගෙන් යම් සේවාවක් අපට මේ සමාජයට ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් හදන්න. අපට පුළුවන් ඔවුන්ව ගම් මට්ටමින් ඩෙංගු රෝග මර්ධන වැඩ සටහනක් වගේ වැඩ සටහනකට මේ ජ්‍යෝෂ්ඨ පුරවැසි සමිති යොදා ගෙන, අර අපේ බලකාය, unit එකත් එක්ක සම්බන්ධ කරලා මේ ජ්‍යෝෂ්ඨ පුරවැසියෝ බොහෝ විට කැමතියි ගමට සේවය කරන්න. උදව් පදව් කරන්න. ඔවුන් බොහෝ විට අපි දැකලා තියෙනවා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙනවා. ඒ සඳහා ඔවුන්ව සම්බන්ධ කර ගන්න කියන ඉල්ලීමත් විශේෂයෙන්ම කරනවා.

ඒ වාගේම තමයි විශේෂයෙන්ම ඔබතුමාගේ විශේෂ අවධානය ආපසු මම යොමු කරනවා. ගම් මට්ටමේ තියෙනවා එහෙම උපදේශන සේවාවක්. අපි දන්නවා අපේ රට ගත්තොත් එහෙම ලෝකඩ පදක්කමක් - ජාත්‍යන්තර වශයෙන් අපි ගත්තොත් රන් පදක්කම අපි ජයග්‍රහණයෙන් ලැබෙනවා. රිදී පදක්කම ලෝකඩ පදක්කම ලැබෙන්නේ ජයග්‍රහණය මත. අපි දැන් ඒ ආසන්න මට්ටමේ ඉන්නවා. සිය දිවි නසා ගන්නා රට වලින් ලෝකයේ හතර වන ස්ථානයට ඇවිල්ලා තියෙනවා. ඒ නිසා මේකේදී ගත්තොත් එහෙම - ඇත්තටම අපි දන්නවා බොහෝ විට සිය දිවි නසා ගන්නේ තමන්ගේ ජීවිතය කළකිරීම්, යම් මානසික මට්ටමක් විශේෂයෙන් ගත්තොත් එහෙම බොහෝ අවස්ථාවලදී අපි සම්බන්ධ වෙනවා. එහිදී ණය තුරුස් වෙලා. විශේෂයෙන්ම ණය තුරුස් පිළිබඳව තියෙන ප්‍රශ්න ගැටලු අවස්ථා වලදී තමයි සිය දිවි නසා ගැනීමේ වැඩිවීම් වෙලා තියෙන්නේ. පසුගිය කාලේ අපි දැක්කා පෙබරවාරි, මාර්තු මාස ගත්තොත් එහෙම මට මතකයි මේ වස්කඩුවේ හතර දෙනෙක් සිය දිවි නසා ගත්තා. සියදිවි නසා ගත්තු තුන් දෙනෙක්ම ගත්තොත් එහෙම ණය වෙලා තමයි ඔවුන්ගේ සිය දිවි නසා ගෙන තියෙන්නේ. ඒ නිසා විශේෂ උපදේශන සේවයක්, මේ පහළ ග්‍රාමීය මට්ටමේ උපදේශන සේවයක් අපට ක්‍රියාත්මක කර ගන්න හැකි නම් වඩා හොඳයි. ඔවුන්ගේ ගිහිල්ලා ප්‍රශ්නය ගැටළුව ඉදිරිපත් කරලා ඒකට යම් විසඳුමක් ගන්න, ඒ උපදේශන සේවා හරහා ලබා ගන්න හැකියාව තිබුණොත් අපට පුළුවන් මේ මට්ටම යම් ප්‍රමාණයකින් අඩු කර ගන්න කියන ඉල්ලීමත් කරමින් ඒ වගේම ඔබතුමාගේ මේ ඉදිරි වැඩ පිළිවෙළ ගත්තොත් එහෙම මම නැවත නැවතත් ඉල්ලන්නේ, මේ රෝග නිවාරණ වැඩසටහන් ගත්තොත් එහෙම අර වාට්ට සංකීර්ණ හදනවා වගේම රෝග නිවාරණ වැඩසටහන මීට වඩා ශක්තිමත් කළොත් අපිට පුළුවන් මේ බස්නාහිර පළාතේ ඉන්න මෙවැනි තත්වයන්, මෙවර පොතේ ඉදිරිපත් කරලා තියෙන විශාල දත්තයන් ප්‍රමාණයක්, විශාල ජනතාවක් නේවාසික ප්‍රතිකාර ගත්ත, සායන වලින් බෙහෙත් ගත්ත ප්‍රමාණය අඩු කරලා, රෝගී ජනතාව වෙනුවට නිරෝගී ජනතාවක් බස්නාහිර පළාතේ ඇති කර ගන්න පුළුවන් කියන එක පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 02.57]

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි වේලාව ලබා දීම සම්බන්ධව. සෞඛ්‍ය කියන්නේ අද අපේ රටේ නිදහස් සෞඛ්‍ය ප්‍රතිපත්තියක් ගෙනියන රටවල් වලින් එකක් තමයි අපේ රටේ නිදහස් සෞඛ්‍ය. ඒ වගේම අධ්‍යාපනයයි, සෞඛ්‍යයයි සම්බන්ධව බලන කොට අධ්‍යාපනයෙයි, සෞඛ්‍යයයි තමයි ජනතාව විශාල ප්‍රමාණයෙන් එක් රොක් වන ස්ථානය වන්නේ. එවැනි අමාත්‍යාංශයක් තමයි සෞඛ්‍ය අමාත්‍යාංශය. එම සෞඛ්‍ය අමාත්‍යාංශය අපේ සුමිත් ලාල් ගරු ඇමතිතුමා සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ එතුමාගේ කාර්යය ඉතා හොඳින් හා වැඩදායක අමාත්‍යාංශයක් බවට පත් කළා. එතුමාගේ

ඒ කාලවකවානුව තුළදී විශාල අභියෝගයකට එතුමාට මුහුණ පෑමට සිදුවුණා. ඒ අභියෝගයත් නොතකා ඒ අභියෝගයට මුහුණ දෙමින් අපේ මේ සෞඛ්‍ය ක්ෂේත්‍රය නංවාලීම සඳහා එතුමා විශාල ප්‍රමාණයක් උත්සාහ ගත්තා. ඒකේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි ඩෙංගු. ඩෙංගු රෝගය අද රටේ බැහැර වෙමින් පවතින තත්වයකට උදා කරන්න එතුමා විශාල ප්‍රමාණයේ වැඩකටයුතු සිදු කළා. මධ්‍යම රජයත් එකතු කර ගෙන, එතුමාගේ ඒ දොස්තරවරු, ඒ නිලධාරීන් එකතු කර ගෙන, ඒ කම්කරුවන් එකතු කර ගෙන මහජන නියෝජිතයන් එකතු කර ගෙන පළාතේ සිටින ආරක්ෂක සිවිල් ආරක්ෂාව සහ පොලිසිය හමුදාව සෑම කෙනෙකුම එකතු කර ගෙන වැඩදායක වැඩ පිළිවෙළක් කරලා, ඩෙංගු තුරන් කරලා, මාධ්‍යත් එකතු කර ගෙන තමයි එතුමා ඒ වැඩ කරගෙන ගියේ. ඒ තුළින් ජනතාව දැනුවත් කළා. ඩෙංගු මෙහෙමයි හැදෙන්නේ. ඩෙංගු හැදුනොත්, ඒකට ප්‍රතිකාර කරන්නේ කොහොමද? ගෙදර නිවසේ තියන්ම ඒකට ප්‍රතිකාර කරන්නේ කොහොමද ? මුලදී ඒක හඳුනා ගන්නේ කොහොමද? එවැනි ආකාරයට මාධ්‍යත් එකතු කර ගෙන, වෛද්‍යවරුන් එකතු කර ගෙන ඒ වැඩ පිළිවෙළ හොඳ ආකාරයකට කර ගත්තා. ඒ නිසා තමයි අපට ඒ ඩෙංගු වලට මුහුණ දීලා අපි අද හොඳ තත්ත්වයක සිටින්නේ.

ඒ වාගේම නැවත එම ඩෙංගු ප්‍රමාණය වැඩි වීමට ඉඩ ප්‍රමාණය අපට ඇති වෙන්න පුළුවන්. නැවත මෙම වැඩ පිළිවෙළ අපි ඇති කර ගන්න ඕනෑ මූලාසානරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු ඇමතිතුමනි, මේක බලා ගන්න. මේ සම්බන්ධව නැවත අපි නැගිටින්න ඕනෑ. ඒක අපෙන් බැහැර වුණයි කියලා අත්හැරලා දැම්මාම අපට සිදු වෙන්නේ නැවත එහෙම තමයි. ඉතින් ඒ නිසා නැවත ගෙවල් පරීක්ෂා කරන්න ඕනෑ. ඉඩකඩම් පරීක්ෂා කරන්න ඕනෑ. එවැනි දේකට අපි මුහුණ දුන්නා නම්, ඩෙංගු නැවත මේ රටේ බෝවීම අපට වළක්වා ගන්න පුළුවන්. ඒ වාගේම මූලාසනරූඪ ගරු මන්ත්‍රීතුමා මගින් ගරු ඇමතිතුමාව දැනුවත් කරන්නම්. අපේ මැද කොළඹ රෝහල. මූලාසනරූඪ ගරු මන්ත්‍රීතුමනි අපේ හෙක්ටර් බෙත්මගේ මැතිතුමා කිව්වා වගේ ඇමැතිතුමා හිතන්න පුළුවන් සාමාන්‍යයෙන් කොළඹ රෝහල් වැඩිපුර තියෙනවයි කියලා. කොපමණ රෝහල් ප්‍රමාණයක් වැඩිපුර තිබුණත් ලෙඩ්ඩු වැඩියි. මැද කොළඹ රෝහල කියන්නේ, අපේ දිවංගත හිටපු ජනාධිපති අතිගරු ප්‍රේමදාස මැතිතුමාගේ සංකල්පයක් මත ගොඩනැගු රෝහලයි. අද විශාල අඩුපාඩුවක් සහිත රෝහල් බවට පත් වෙලා තියෙනවා. මැද කොළඹ රෝහල කියන්නේ මාලිගාවත්ත, ග්‍රෑන්ඩ්පාස්, මරදාන, පංචිකාවත්ත එවැනි ප්‍රදේශවලින් එන ලෙඩ්ඩු ටික පරීක්ෂා කරන රෝහලක්. ඒ රෝහලේ තිබුණා ඉස්සර කාන්තාවන්ට වෙනම ස්ථානයක්. ඒ කියන්නේ මව්වරුන්ට ක්ලිනික් එකක්. මව්වරු පරීක්ෂා කිරීමට වෙනම ස්ථානයන් තිබුණා. නමුත් අද ඒ ඔක්කෝම නැති වෙලා තියෙනවා. ඒ මැද කොළඹ රෝහල එවැනි දේවලට යොමු කරලා ජනතාවට ප්‍රතිඵලයක් ලබා ගන්න පුළුවන් විධියට ඒ රෝහල පවත්වා ගෙන යෑම සඳහා අපට උදව් කරන්න කියලා මම ඉල්ලනවා. ඒ වගේම ඒ මැද කොළඹ රෝහල, අපි මධ්‍යම රජයෙන් ඉල්ලා තියෙනවා වකුගඩු රෝහලක් සඳහා. කමක් නැහැ අපි ඒකට විරුද්ධතාවයක් නැහැ. ඒක ලබා දෙන්න ඕනෑ. ඒ වගේම ඒක ලබා දෙන ගමන්, මේ රෝහලත් වැඩි දියුණු කිරීම සඳහා ඔබතුමාගේ සහයෝගය අපි පතනවා. ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා ඒ රෝහල්වලට ආවා. ඒ රෝහල සම්බන්ධව සොයා බැලුවා. හොයලා බැලුවා. අපට ඒ වෛද්‍ය නිලධාරීතුමා කිව්වා වගේ කම්කරුවන් ඒ රෝහලට ලබා දුන්නා. ඒ වගේම ඒ රෝහලට තව සේවිකාවන් ප්‍රමාණයක අවශ්‍යතාවය තියෙනවා ගරු ඇමතිතුමනි. ඒ රෝහලට ලබා දෙන්න. ඒ රෝහලට එන ජනතාවට ප්‍රතිකාර කිරීම සඳහා එම රෝහලේ නැවත ලේ පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය උපකරණ ලබා දෙන්නයි කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ඔබතුමා ගත්ත තීන්දුව අනුව මේ කම්කරු සේවකයන් ඔබතුමාට ගන්න බැරි තත්ත්වයක් තිබියදී ඒ කම්කරුවන් ලබා ගැනීමට ඔබතුමා උත්සාහ කළා. ඒ උත්සාහයේ සාර්ථක ප්‍රතිඵලයක් ඔබතුමා ලබා ගත්තා. ඒ සාර්ථක ප්‍රතිඵලයෙන් තමයි අපේ රෝහල්වලට සේවකයින් ලබා දුන්නේ. ඔබතුමාට නැවත වාරයක් ඒ සම්බන්ධව මම ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම මම ඔබතුමාගෙන් තව දෙයක් ඉල්ලා සිටිනවා. අද මේ රටේ වකුගඩු හා පිළිකා රෝග විශාල ප්‍රමාණයක් තිබෙනවා. මොන දේකට අපි පරීක්ෂණය සඳහා ගියත්, අපේ ඇග පතේ මොනවා හරි ගෙඩියක් ආවා නම්, කෙළින්ම යවනවා පිළිකා රෝහලට. එවැනි වාතාවරණයක් අද රට තුළ උද්ගත වෙලා තියෙනවා. කොපමණ රෝහල් තිබුණත්, කොපමණ දේවල් අපට තිබුණත්, මේ රෝගවලට ආවරණයක් සලසන්න බැරි තත්වයක් උදා වෙලා තියෙනවා. ඒකේ

[ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්]

දැනුවත්කමක් නැහැ. මේ ලෙඩ රෝග කොහොමද හැදෙන්නේ? මේ වකුගඩු රෝගය අපට කොහොමද වැළඳෙන්නේ. මේ පිළිකා රෝගය කොහොමද වැළඳෙන්නේ කියලා තවම ජනතාව දැනුවත් නැහැ. අපි දැනුවත් කිරීමක් කරන්න ඕනෑ. මේ සටනට අපි ඉන්න ඕනෑ. මේ සටහන් සඳහා මුහුණ දෙන්න අපි ලැහැස්ති වෙන්න ඕනෑ. අද වකුගඩු රෝගයයි, පිළිකා රෝගයයි හරියට නිකන් අර ඩෙංගු රෝගය වගේ තමයි කියලා මට කියන්න පුළුවන්. ඕනෑම තැනක ගියා නම් වකුගඩු රෝග. හැම තැනම ගියා නම් පිළිකා රෝග. එවැනි තත්ත්වයක් අද උදා වෙලා තියෙනවා. ඒ වගේම තමයි දියවැඩියා. අද ලංකාවේ ජනතාවගෙන් 80% ක් 90% ක් දියවැඩියා රෝගයෙන් පෙළෙනවා. සෑම ගෙදරකම එක මනුස්සයෙක් ඉන්නවා දියවැඩියා රෝගය තිබෙන. දියවැඩියා රෝගයට බෙහෙත් ගන්න, එක මනුස්සයෙක් හරි අද සෑම ගෙදරකම ඉන්නවා ඇති. මේකට හේතුව මොකක්ද? මේක වැළඳෙන්නේ කොහොමද? මේක හැදෙන්නේ කොහොමද? මෙහෙම ගියාම ඊට පස්සේ එන පරම්පරාව කොහොම ජීවත් වෙයිද? අද පාසල් යන ළමයින්ට පවා දියවැඩියා රෝගය වැළඳෙන තත්ත්වයක් උදා වෙලා තියෙනවා. බඩින් එන ඒ පොඩි ළමයාට පවා දියවැඩියා හැදෙන තත්ත්වයක් උදා වෙලා තියෙනවා. වයස සීමාවක් නැහැ. ගැහැණු, පිරිමි කියලා නැහැ. කිසිම සීමාවක් නැතුව ඒක වැළඳීමේ ප්‍රවණතාවය වැඩි වෙලා තියෙනවා. මේකට අපි කුමක් හෝ ක්‍රමයක් යෙදිය යුතුයි.

අපි ඩෙංගු රෝගයට සටන් කළා වගේ, මේ දියවැඩියා රෝගයටත් අපි සටන් කළ යුතුයි. මූලාසානරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධව ඔබතුමා සාකච්ඡා මේසයක් කැඳවන්න. මේකට ගන්නා වූ ක්‍රියා මාර්ගය මොකක්ද? ජනතාව දැනුවත් කරන්නේ කොහොමද? කෑම බීම රටාව පිළිබඳව ජනතාව දැනුවත් කරන්නේ කොහොමද? ව්‍යායාමවලට ජනතාව යොමු කරන්නේ කොහොමද කියන වැඩ පිළිවෙළකට යා යුතුයි. නැත්නම් අපේ මේ සමාජය මේ රටේ රෝගවලින් පෙළෙන සමාජයක් බවට පත් වෙනවා. අනිවාර්යයෙන් ඒක නිසැකයි. මූලානසාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නැවත වාරයක් ඉල්ලා සිටිනවා, මැද කොළඹ රෝහල සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මැද කොළඹ රෝහල අපට ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාවට විශාල ශක්තියක් ගෙන දෙන රෝහලක්. ඒකට ඔබතුමාගේ අවධානය යොමු කරලා, එම රෝහල වැඩිදියුණු කිරීම සඳහා ඔබතුමාගේ ශක්තිය අපට ලබා දෙන්නයි කියලා නැවත වාරයක් ඉල්ලමින්, මට මේ වෙලාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 03.06]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

මූලාසාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය ඇමතිතුමාගේ අමාත්‍යාංශය වෙනුවෙන් කථා කරන්න ලැබීම සතුටක්. විශේෂයෙන් අපි ආරම්භයේදීම ඇමතිතුමා ගැන කියන්න ඕනෑ. මම ඇත්තටම ගරු කරනවා. ඇමතිතුමා නැහැ, බැහැ වචන නැති, කෙනෙක්. ඕනෑම වෙලාවක ඇමතිතුමා ළඟ උත්තරයක් තිබුණා. අපි මෙහෙම කරලා බලමු කියලා, නිරන්තරයෙන් අපව දිරිගන්වපු ඇමතිවරයෙක්. ඒ වගේම මම නම් ඉල්ලපු හැම දෙයක්ම මට ලැබිලාත් තියෙනවා. රැකියා පැත්ත ඉල්ලුවත් ලැබුණා. ගොඩනැගිල්ලක් ඉල්ලුවත් ලැබුණා. මොනවා ඉල්ලුවත් ලැබුණා. මට මෙවරත් ලක්ෂ 25 – 30 ක් ලැබෙන්න තියෙනවා. ඉඩමේ ප්‍රශ්ණයක් වෙලා ඒක කර ගන්න බැරිවයි මම ලත වෙන්නේ. ඒ නිසා අපි වැඩ කරන ඇමතිතුමෙක් වශයෙනුත්, වැඩ කරන අපට උවමනාව තියෙන ඇමතිවරයෙක් වශයෙනුත් හොඳ සහයෝගයක් හැම පැත්තෙන්ම ලබා දෙනවා.

මම ඊයේ පෙරේරා හදිසියේ ගිහිල්ලා ඇමතිතුමා රබන් ටිකක් බෙදන්න ඕනෑ කිව්වාමත් ටක් ගාලා ලියුම අත්සන් කරලා දුන්නා කර ගන්න පුළුවන් නම් කථා කරලා කර ගන්න කියලා. ඒ නිසා මම ඇමතිතුමාගේ ධනාත්මක සිතුවිලි අගය කරන්නේ. කොයි වෙලාවකවත් බැහැයි කියලා නැහැ. අපි කොහොම හරි කරමු. අපි රැකියා පැත්ත ගැන කථා කරන කොටත් මම මොකක් හරි වැඩ සටහනක් හදන්නම්, ඒ වගේ සිතුවිල්ලක් තියෙනවා නම්, ඒ ලේකම්වරයාත් එක්ක එකතු වෙලා ඒ කාර්ය මණ්ඩලයත් එක්ක එකතු වෙලා, මේ සෞඛ්‍ය පැත්තේ යමක් කරන්න ඇත්තටම පුළුවන් කියන විශ්වාසයයි මට තියෙන්නේ. එම නිසා ඇමතිතුමාට, එතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට, ලේකම්තුමා ප්‍රධාන ඒ සියලුම නිලධාරීන්ට අපේ ගෞරවය පුද කරනවා, එම කාලය තුළ අපට දුන්න සහයෝගයට. අපට නිතර කථා කරලා සහයෝගය

දක්වනවා හැමදේම උනන්දු කරවනවා. මන්ත්‍රීතුමා මේ දේ කරන්න. මෙහෙම කටයුතු කරපු අමාත්‍යාංශයක වැය ශීර්ෂයක් තමයි අපි විවාදයට ලක් කරන්නේ.

මම දවසකට මළ ගෙවල් 10 – 12 කට යන මන්ත්‍රීවරයෙක් මූලාසාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ මළ ගෙවල් වලට ගියාම හරි ඛේදවාචකයක් තිබෙන්නේ. අත්තනගල්ල ආසනයත්, මහර සහ මීරිගම ප්‍රදේශයත් අපට ආවරණය වන නිසා. එහෙම ගියාම සමහර විට ඒ අය අපි ළඟට ගියාම අඩන්නේ අනේ මහත්තයා බලන්න කෝ මේ හොඳට හිටිය කෙනා තමයි මැරුනේ. සමහර විට හෘද රෝගයක්. එක්කෝ වකුගඩු රෝගයක්. එහෙම නැත්නම් පිළිකා තත්ත්වයක්. ඒ වගේ හදිසි මරණ තත්වයන්ට තමයි මුහුණ දෙන්නේ. ඒ නිසා අපි මේවා සම්බන්ධයෙන් ඇමතිතුමාගේ අමාත්‍යාංශයට අපි යොමු වෙලා, බෝ නොවන රෝග සම්බන්ධයෙන් මේ මන්ත්‍රීතුමාලා කවුරුත් වැඩ සටහන් කරනවා. ජනතාවත් දැනුවත් කරනවා. නමුත් මේ රෝග තත්ත්වයෙන් මිදෙන්න පුළුවන් කමක් අද ලැබිලා නැහැ. බෝවන රෝග, තවත් රෝග කාරකයක් හරහා ඇතිවන රෝග, ඩෙංගු මේ සියල්ලම මර්ධනය කරන්න පුළුවන්කමක් තියෙනවා. හැබැයි, මේ මිනිස්සු තුළ ඇති වන මේ රෝග අද නිවාරණය කරන්න පුළුවන් කමක් ඇති වෙලා නැහැ. මේකේ තියෙන ඛේදවාචකය ගරු ඇමතිතුමනි, බොහෝ පුංචි දරුවන්ටත් මේ රෝග හැම එකක්ම තියෙනවා. දියවැඩියාව. රුධිර පීඩනය. වකුගඩු රෝග. ඒ වගේම හමේ රෝග. පිළිකා තත්වයන්. මේ හැම රෝගයක්ම දරුවන්ට තියෙනවා. පාසැල් යන දරුවාගේ ඉඳලා. අපි අනාගතයේ මේ රට බාර දෙන්නේ මේ දරුවන්ට. හැබැයි අවුරුදු 75 – 80 ඉන්න වැඩිහිටියන්ට මේ රෝග එකක්වත් නැහැ. වැඩිහිටියන්ට හොඳට ඇස් පේනවා. කන් ඇහෙනවා. දියවැඩියාව, ප්‍රෙෂර් එක මේ එකක්වත් මේ වැඩිහිටියන්ට නැහැ. අනාගතයේ මේ රට බාර දෙන්නේ මේ දරුවන්ට නම්, මේ දරුවෝ මේ සමාජය බාර ගන්න කොට ලෙඩුන් තමයි, මේ රෝගී දරුවෝ තමයි මේ සමාජයේ වගකීම දරන්නේ.

එතකොට ඔබතුමාගේ අමාත්‍යාංශය ගත්තාම, සමාජය වශයෙන් ගන්න කොට ගැටලුවක් තිබෙනවා. වැඩිහිටි ප්‍රජාවක් ඉන්නවා. වැඩිහිටියෝ නිරෝගි වෙන්න පුළුවන්. නමුත් අවුරුදු 70 – 80 ගත වෙලා හමාරයි. ඒ අය පෝෂණය කරන්න ඕනෑ ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා. ඒ වගේම තමයි රෝගී දරුවෝ, රෝගී පරපුරක් පෝෂණය කරන්න වෙනවා. ඒ නිසා මේක රටක් වශයෙන් ගන්න කොට බරපතළ ඛේදවාචකයක්. මේකට දරුවාගේ උත්පත්තියේ ඉඳලා විසඳුම් හොයන්නට ඕනෑ. ඒක නිසා අපට පැවරෙන කාර්ය භාරය ඉතා ඉහළ එකක්. ඒක නිසා රටක් වශයෙන් ගන්න කොට ජාතියට වැළලෙන්නට දෙන්න පුළුවන් කමක් නැහැ. ඒක නිසා මේක අපි ආරක්ෂා කිරීමේ කටයුත්තක් පළාත් සභා මට්ටමින්, මධ්‍යම රජයේ මට්ටමින් - ඔබතුමා අමාත්‍යාංශයේ ඇමතිතුමාගේ බොහොම ළඟ හිතවතෙක්. ඒ හරහාත්, රජය හරහාත් ඔබට යමක් කරන්න පුළුවන් කියන විශ්වාසයයි අපට තිබෙන්නේ.

ඒ වාගේම තමයි අපි පාසල් යන කාලේ ඉන්න ළමයි 200 යක ගෙන් එක ළමයෙක් හෝ දෙන්නෙක් විතරයි ඇස් කණ්ණාඩියක් පාවිච්චි කළේ. අද සමාජයට බැහැලා බලපුවාම පුංචි දරුවෝ ඇස් කණ්ණාඩි කොපමණ පාවිච්චි කරනවාද? එතකොට මේ තත්ත්වය ඇති වෙලා තියෙන්නේ එක්කෝ අපේ නොදැනුවත්කම, එක්කෝ අපේ ආහාර රටාවේ වෙනස, එක්කෝ මාතෘ තත්ත්වයේදී අම්මාගේ තිබෙන හැසිරීම්, ආහාර වේලේ තියෙන යම් යම් ගැටලු. එතකොට මේවා නිසා සමාජය දිහා බලන කොට නීරෝගී පරපුරක් කියන්න පුළුවන් කමක් නැහැ. අපට අවබෝධය තියෙන්න ඕනෑ. පුංචි කාලේ අපි නිකමට වගේ අපේ අම්මලා අපව නලවන කොට කිව්වේ,

*අතට වෙරලු ඇඹිද ගෙනේ*
*ඉණට පලා නෙලා ගෙනේ*

එහෙමයි අම්මලා අපව නැළෙව්වේ. කවි කියලා දුන්නේ. වෙරලු ගෙඩියක් කොයි විධියටද බෙදා හදා ගෙන කන්නේ? අම්මාගේ සෙනෙහස ආදරය ඒ තුළට ගැබ්වෙලා තිබුණේ කොහොමද? දර මිටියක් හිසේ හෝ ඉනේ තියා ගෙන එන අම්මා දරුවා දුවන් එනකොට වෙරළු ගෙඩිය දුන්නා. ඉණට පලා නෙලා ගෙනේ. අම්මා දන්නවා පලා මිටියක් ගේන කොට පොඩ්ඩක් මැල වෙන්නට ඕනෑ. හේබාන්නට ඕනෑ මේක මලවන්න. අම්මා ඉනට තියලා තදකර ගෙන ගෙනල්ලා මේකට කොල වර්ග 7-8 ක් දාලා පලා මුට්ටියක් මැලෙව්වේ අපේ දරුවන්ගේ ඇස් ටික පේන්න ඕනෑ. විටමින් A ලැබෙන්නට ඕනෑ. දැරුවා ශක්තිමත් වෙන්නට ඕනෑ. දරුවා ලස්සන වෙන්නට ඕනෑ. දරුවාගේ කොණ්ඩේ හැදෙන්නට ඕනෑ කියලයි. එහෙම අධ්‍යාපනයක් නැති

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

අම්මාට අරමුණක් තිබුණා. අම්මා අත්දැකීමෙන් ඒ දේ කළා. අද සමාජය දිහා බලනකොට අපේ දරුවෝ ලෙඩ්ඩු බවට පත් වෙලා ඉන්නේ. අපව නීරෝගීව මේ සමාජයට බිහි කරපු අපේ අම්මලා. හැබැයි, අපෙන් බිහිවන දරුවෝ ලෙඩුන් බවට පත් වීමට තරම් මේ සමාජය කඩා වැටිලා තියෙනවා. ඒක නවීන තාක්ෂණය වෙන්න පුළුවන්. එහෙම නැත්නම් දියුණුව වෙන්න පුළුවන්. හැබැයි දියුණුව කියලා කියන්නේ දියවැඩියාව, ප්‍රෙෂර් එක කොලොස්ටර්රෝල් හැදුන අයට නොවෙයි. දියුණුව කියලා කියනවා නම්, සවි ශක්ති සම්පන්න හොඳ නිරෝගී පරපුරක් රටක ජීවත් වෙන්නට ඕනෑ.

ඒ වාගේම තමයි මූලාසාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාජය දිහා මේ හැම කෙනෙක්ම බලනවා. ගස්ලබු ගෙඩියක් ඉදෙනවා නම් ඉදෙන්නේ, මැදින් පොඩ්ඩට ඉදිලා දෙපැත්තටම ඒක ඉදෙනවා. දවස් ගානක් තුළ. කෙසෙල් කැණක් ඉදෙනවා නම් මුල් ගෙඩිය ඉදිලා දින ගණනකදි තමයි ඒ කෙසෙල් කැණ ඉදෙන්නේ. එහෙම තමයි අපි දන්නේ, ගමක පළතුරක් ඉදෙන විදිය. අද කඩේට ගිහිල්ලා බලන කොට මුළු කෙසෙල් කැණම ඉදිලා තියෙන්නේ. අන්නාසි ගෙඩියම ඉදිලා තියෙන්නේ. නැට්ටත් සමහර විට ඇකිලිලා දින දෙක තුන ගියාට පස්සේ. ගස්ලබු ගෙඩිය ගත්තත්, ගස්ලබු ගෙඩියම ඉදිලා තියෙන්නේ. මේවා මේ ඔක්කෝම වස විෂ යොදලා, කෘතිම දේවල් යොදලා හදපු දේවල්. පුංචි කාලේ අපට මතකයි, මුං ඇට ටිකක් දවස් දෙක තුනක් ගෙනල්ලා තිබුණොත් ගුල්ලෝ ගහලා අම්මා විසි කරනවා. පාන් පිටි ටික හලන්න දෙන්නේ නැහැ. පෙනේරේ දාලා හලන කොට, අම්මා දෙන්නේ නැහැ. මේකේ පණුවෝ ඉන්නවා, මමයි හලන්නට ඕනෑ. හාල් ටික පොලන්න ඕනෑ අම්මා. අද ඒවා එකක්වත් නැහැ. හාල් ටික ගෙනාවා. අර රයිස් කුකර් එක ස්විච් එකට ගැහුවාට පස්සේ - අම්මා වතුර ටික පෙරලා තමයි බත් ටික කන්න දුන්නේ. හාල් ටික ඉදෙන කොට වතුර පෙරලා අයින් කරනවා. අද ඒවා එකක්වත් නැහැ. අද හාල් ටික එහෙමම ලිපේ තියනවා. අපි හොඳට කනවා බොනවා. අද කඩල ඇටයකට ගුල්ලෝ ගහන්නේ නැහැ. මුං ඇට ටිකට ගුල්ලෝ ගහන්නේ නැහැ. හාල්වල පණුකුඩ බදින්නේ නැහැ. පිටිවල පණුකුඩ හැදෙන්නේ නැහැ. එහෙනම් ඔක්කෝටම වස විෂ දාලා තිබෙන්නේ. මේවා තමයි අපි ආහාරයට ගන්නේ. කිරි හට්ටි ටිකක් දානකොට ෆෝමලින් වතුරෙන් හෝදලා ඒ කිරි හට්ටිවලට කිරි පුරවලා, උඩින් ෆෝමලින් එක දියරයක් වශයෙන් ඉස්සාම තමයි කිරි හට්ටිය එන්නේ. අපි කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා ගිහිල්ලා ඔය වැඩ සටහන් වලට සහභාගි වුණා. දින 1 ½ කට වඩා කිරි තියෙන්න පුළුවන් කමක් නැහැ. හැබැයි කිරි හට්ටිවලට ෆෝමලින් ඉස්සාට පස්සේ තමයි දින 10 – 12 ක් ඔය හොඳ කිරි කියලා තියෙන්නේ. ඒ නිසා මේවා තමයි අපි ආහාරයට ගන්නේ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ PHI ලා හරහා අපි කළ යුතු වෙන්නේ මෙන්න මේ වගේ වැරදි සහගත ආහාර සමාජයෙන් ඉවත් කරන එකයි. කෙසෙල් ගෙඩියක් ගත්තොත් කන්න විදියක් නැහැ. හැම කෙසෙල් ගෙඩියේම පණුවෙක් හැදිලා ඉන්නවා. මේකට පැරමෝල් කියලා වර්ගයක් දාලා ඒ පළතුරු මැස්සා එන්නේ නැති විදියට වැඩක් කරන්න පුළුවන්කම තියෙනවා. හැබැයි කවුරුවත් කරන්නේ නැහැ. කෙසෙල් ගෙඩිය දෙකට කඩපුවාම සුදු මහත පණුවෙක් ඉන්නවා. අද ඒ නිසා අද කෙසෙල් ගෙඩියක් කන්න, ගස්ලබු ගෙඩියක් කන්න, එහෙම නැත්නම් දෙහි ගෙඩියක් කන්නවත් විදියක් නැහැ. මේ හැම එකටම පණුවෝ හැදෙන තත්ත්වයක් ඇති වෙලා තියෙනවා. එතකොට මේවා අතීතයේ කෙනෙකුට කිව්වොත් එහෙම මිනිස්සු අහනවා, කවද්ද දෙහි වලට පණුවෝ ගැහුවේ? එහෙම නම් අහනවා, මේ කෙසෙල් වල පණුවෝ හැදුණේ කොයි කාලේද? අපි නම් අහලාවත් නැහැ කියලා. නමුත් අද ඒ තත්ත්වයට මේ පරිසරය විනාශ වෙලා ඒ වස විෂවලින් යුක්ත ආහාර අපට කන්න සිද්ධ වෙලා තියෙනවා.

ගරු ඇමතිතුමනි, PHI ලා හරහා අපට ලොකු වැඩක් කරන්න පුළුවන්. මම ඉන්නේ අත්තනගල්ලේ. නිට්ටඹුව නගරයට එන කොට අපට පුළුවන් නම් බෝඩ් එකක් ගහන්න. මෙන්න මේ අහවලාගේ කඩේ A පන්තියේ කඩයක්. මේ කඩෙන් ඔබ ආහාර ගන්න. මේක B පන්තියේ කඩයක්. මේකෙන් ආහාර ගන්න. මෙහෙම යම්කිසි ක්‍රමවේදයකට හදලා නිර්ණායකයක් දීලා. මෙන්න මේ කඩේ හදනවා නම්, මේ විදියට තියෙන්නට ඕනෑ. පිරිසිදුකම තියෙන්නට ඕනෑ. මේකේ ඉඩ පහසුකම මේ විදියට තියෙන්නට ඕනෑ. මේකේ කුස්සිය මේ විදියට තියෙන්නට ඕනෑ. ආහාර පිළියෙල කරන මිනිස්සු හොඳට ඇඳලා පැළඳලා ඉන්නට ඕනෑ. ඔවුන් විවිධ රෝග තත්ත්වයන්ට බෙහෙත් හේත් අරන් තියෙන්නට ඕනෑ. මේ විදියට උයන පුද්ගලයාගේ ඉඳලා කැෂියර් දක්වා හොඳ ප්‍රමිති කරණයක් කරලා, කඩයටත් හොඳ ප්‍රමිතියක් ලබා

දීලා කටයුතු කළොත් මිනිස්සුන්ට පුළුවන් බයක් හැකක් නැතුව අහවල් කඩෙන් කෑම කන්න. ඒක A පන්තියේ කඩයක් කියලා කියන්න. නමුත් කොපමණ කිව්වත් PHI ලා ඒක කරන්නේ නැහැ. ඒ අනුව අපේ රාළහාමි කියනවා වගේ එතුමාගේ කඩේ ඒ තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා අපි ඉල්ලන්නේ මේ මිනිස්සු වෙනුවෙන්. මේ ලෝකේ ලෙඩ රෝග හැදෙන, මේ අපේ අනාගත පරපුර වෙනුවෙන් අපි මේ කථා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සමාජයට අද මංතීරුවල අවශ්‍යතාවය තියෙනවා. මම ගිහිල්ලා කිව්වා මේ විධියට මංතීරු හදන්නට ඕනෑ. එහෙම කිව්වාම කව්ද කිව්වා දැන් ගල් අල්ලන්නේ නැහැ. වැලිදාලයි මංතීරු හදන්නේ කියලා කියනකොට, එහෙනම් අපේ ජෝන් අමරතුංග ඇමැතිතුමාගේ වෛද්‍යවරයෙක් වෙන්න ඇති ඔය නීතිය ගේන්න ඇත්තේ කියලා විහිළුවට කිව්වා. ඒ කියන්නේ වත්තල මංතීරුව කඩලා දැම්මා නේ? දැන් ගල් අල්ලන්නේ නැහැ. වැලි දාන්නේ ඒක හින්දා කියලා මට සමාජයේ මිනිස්සු කිව්වා. ඒ නිසා අපි මෙන්න මේ තත්ත්වයන් අවබෝධ කරන ගන්නට ඕනෑ. ඒ වගේම තමයි අපට බේදවාචකයක් ඇති වෙමින් තියෙනවා. ළමයින්ගේ සෞඛ්‍ය පිරිහෙලා. දරුවන්ට ඒ තත්ත්වය ඇති වනකොට සෞඛ්‍ය විෂයත් අද පාසල් අධ්‍යාපනයෙන් ගැලවිලා යන තත්ත්වයක් ඇති වෙලා. හෙට අනිද්දා වන විට නව වක්‍රලේඛන අනුව සෞඛ්‍ය විෂය පවතින්නේ නැහැ, අධ්‍යාපන විෂය තුළ. ඒ විෂයයන් තුළින් සෞඛ්‍ය අයින් වෙනවා. ඒක සෞඛ්‍ය විද්‍යාවට හරි මොකක්ට හරි බද්ධ කරයි. දරුවන්ගේ මූලික කටයුතු වෙන්නේ නැහැ.

ඒ වගේම තමයි කාන්තා වැඩසටහන් සම්බන්ධයෙන් අපි කථා කරනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයට කථා කරලා - අපේ ඉන්නවා අනෝමා මහත්මිය එහෙම. අපි ඒ අයට කථා කරලා, අනේ නෝනා අපට එවන් කෝ කාන්තා වැඩ සටහනක්. අපට එහෙම උවමනාවක් තිබෙනවා. එකක් තමයි ජනයා ඒකරාශි කර ගැනීම. මේ වැඩ සටහන හරහා ගමට යන්න තියෙන උවමනාව. ස්වයං රැකියාවක් වශයෙන් ඒ අයට දෙන ඒ පණිවිඩය. කාන්තාවෝ කියන්නේ, වැඩ කරන්න ඉපදුණු අය විතරක් නෙමෙයි. ඒ අයටත් විනෝදයක් තියෙන්නට ඕනෑ. ඒ අයටත් සතුටක් තියෙන්නට ඕනෑ. ඒ නිසා ගරු ඇමැතිතුමනි, කාන්තා වැඩ සටහන් හරහා මේ කාන්තාවෝ ටික ඒකරාශි වෙනවා. මේ කාන්තාවෝ එකිනෙකාගේ මුහුණ දැකපු නැති අය. ඉස්සර නම් එකට එකතු වෙලා මිනිස්සු ඕපාදූප හරි කියනවා. ගම්වල ඕවා තිබුණා. නාන්න ගියාම, ළිඳට ගියාම, ඔයට ගියාම, ගොයම් එකතු කරන්න ගියාම. අද සමාජයේ එහෙම නැහැ. අද ඒවා වෙන්නේ නැහැ. නාන ළිං වැහිලා ගිහිල්ලා. හැබැයි මේ කාන්තා වැඩ සටහන් ටික හින්දා කාන්තාවෝ ටික එකතු වුණාම, විහිළු කර ගන්නවා. තම තමන්ගේ සම්බන්ධතා, සන්නිවේදන ඇති කර ගන්නවා. ඒ අයට විනෝදය තිබෙනවා. කාලය කළමනාකරණය කර ගන්නවා. උදේම නැගිටලා අපේ කාන්තා වැඩ සටහනට, පුහුණු වැඩසටහනට උදේම එනවා. එහෙම නැත්නම් උදේ 7 – 8 වෙනකන් මිදුල අතුගානවා. එක්කෝ කෑම කාලත් නැති කාන්තාව අපට පුළුවන්කම ඇති වෙනවා කාන්තා වැඩ සටහන් හරහා කාලය කළමනාකරණය කරවලා උදේම අපේ වැඩ සටහනට ගෙන්වා ගන්න. ඒ හරහා තමන්ට කුසලතා වර්ධනය කර ගන්න පුළුවන්. ස්වයං රැකියාවක් වගේ ආර්ථික ප්‍රවර්ධනයක් කර ගන්න පුළුවන්. ඒ වගේම ඒ තුළින් ඇයට විනෝදයක් ලබා ගන්නා පුළුවන්. ඒ නිසා ඔබතුමාගේ අමාත්‍යාංශයේ මේ වැඩ සටහන මා නිරන්තරයෙන්ම අගය කරනවා.

ඒ වාගේම තමයි සමාජ සුභසාධනය පැත්තෙන් අපි බලන කොට අපේ වැඩිහිටියෝ වෙනුවෙන් අපට බොහෝ දේ කරන්න තිබුණත්, වැඩිහිටියෝ වෙනුවෙන් යමක් දෙන්න යම් යම් අවහිරතා තිබෙනවා. වැඩිහිටි ක්‍රියාකාරී කණ්ඩායමක් අපෙන් පුටු ඉල්ලනවා. හට් ඉල්ලනවා. විනෝද ගමන් යන්නට ඉල්ලනවා. මේවාට අවහිර තිබුණත් ගරු ඇමතිතුමා, ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා මම මේ වෙන කොට රබන් 60 - 70 ක් බෙදලා තිබෙනවා. ජන සමාජයෙන් වියැකිලා ගිය ගැමි සංස්කෘතිය අවුරුදු කාලෙට එහෙම නැත්නම් ජනවාරි 01 දාට වැඩිහිටියෝ ටික එකතු උනාම මේ රබන් ගහනකොට ඔබ හිතනවාට වඩා අලුත් දෙයක් එතන වෙන්නේ. අවුරුදු 60 – 70 ආච්චිලා ලස්සනට චීත්ත ඇඳලා, බෝරිච්චි අත් දාපු හැට්ටේ ඇඳලා, පබළු මාලේ බැඳලා, අර රබන් ගහන හතර පස් දෙනා වටේ ආච්චි අම්මලා සමහර වෙලාවට 15 - 20 තාලයට නටන කොට ඇත්තටම අපට හිතට සතුටක් දැනෙනවා. මේ අපේ අම්මලා අපි වෙනුවෙන් දර දිය ඇද්ද අපේ වැඩිහිටියෝ නේද කියලා. ඒ නිසා මේ අය වෙනුවෙන් අපි වැඩ සටහන් කරන්න ඕනෑ කියන එකයි මම විශ්වාස කරන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩි වෙලාවක් දෙන්න. ඒ වාගේම තමයි අපේ වේයන්ගොඩ - මම හදිසියේ වගේ ඇවිල්ලා ඔබතුමාගෙන් රු. 50,000 ක මුදලක් ඉල්ලා ගෙනත් ගියා. ඔබතුමාට මතක ඇති. ගරු ඇමැතිතුමනි, අපි වේයන්ගොඩ MOH කාර්යාලයේ ප්‍රදර්ශනයක් කළා. අපි ඒකට සත්තු ගෙනාවා. නයි ගෙනාවා. ඒ වගේම විවිධ රෝග තත්ත්වයන් සම්බන්ධ වැඩ සටහන් කළා. එක තැනක තිබුණා, ගබ්සාව පිළිබඳ වැඩ සටහනක්. හදවතක් තිබුණු හැම මිනිහෙකුටම නෙතට කඳුලක් ආවා. ඉපදෙන්න ඉන්න දරුවෝ මේ ලෝකෙට බිහි කරන්නේ නැතුව කෑලි කෑලිවලට කපලා, මරලා එලියට ගන්නවා තිබුණා. ඒ ශෝකාකුල වෙලාවේ ළමයා අහනවා ඇයි අම්මේ මාව හැදුවා නම් මට ජීවිතය දෙන්නේ නැත්තේ. ඒ නිසා ඒ තත්ත්වයට ඒ ප්‍රදර්ශනය හරහා අපට ලොකු පණිවිඩයක් සමාජයට දෙන්න පුළුවන් කම ලැබුණා. ඔබතුමා ලබන වසරේ මේ වගේ ප්‍රදර්ශන ගමින් ගමට අරන් යන්න. මේ ගබසාව කියන්නේ මිනී මැරුමක්. ඒක මිනී මැරුමක්. එහෙනම් ප්‍රාණඝාතය නොකරන මිනිස්සු, මිනී මරණ විධිය ඒ තුළින් දකින්න පුළුවන්. ඒ නිසා සෞඛ්‍ය වෙනුවෙන් එවන් වැඩ සටහන් අවශ්‍යයි කියන එක මා ඔබට කියනවා. ඔබතුමාගේ අමාත්‍යාංශයට නව අදහසක් දැක්වුවා බටහිර වෙදකමත්, සිංහල වෙදකමත් එකට ගේන්න කියලා. මම ගිය වසරේ ඔබතුමාගේ උපදේශක කාරක සභාවේදී ඉල්ලුවා. අපේ බෙම්මුල්ල ප්‍රදේශයට සිංහල ආයුර්වේදයක් දෙන්න. එතන MOH කාර්යාලයත්, අපේ මධ්‍යම බෙහෙත් ශාලාවක් එතැන තියෙනවා. එතැනට ලබා දෙන්න කියන ඉල්ලීමක් මම ඔබතුමාගෙන් මේ වසරේ ඉල්ලනවා. ඒ වගේම ඩෙංගු වැඩ සටහන වෙනුවෙන් ඔබතුමා දැක්වූ සහයෝගයත් අගය කරන අතර, මගේ කථාව මම දීර්ඝව කරන්නේ නැහැ. තව විනාඩියක් දෙන්න. විශේෂයෙන් මේ දියවැඩියා රෝගයට මස්බැද්ද කියලා කොළ වර්ගයක් පිළිබඳව මේ අපේ ගම් ප්‍රදේශවල තියෙනවා. ඒක කාපු සැනින් සීනි පාලනය වෙනවා. ඒක කාපුවාම සීනිවල රස දැනෙන්නේ නැහැ. එතකොට මේ වගේ දේවල් සමාජයේ තියෙනවා. එතකොට තෙඹු කොළ මිනිස්සු ආහාරයට ගන්නවා. එතකොට මේ සිංහල වෛද්‍ය ක්‍රමය පිළිබඳව අපි වැඩි අවධානයක් යොමු කර ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ගොඩනගන්නට උත්සාහ කරන්නට ඕනැ. ඒ නිසා පාසල් වල ආදී ඉඩම් වල දේශීය ඖෂධ වර්ග වවන්නට කටයුතු කරන්නය කියන එකත් ප්‍රකාශ කරනවා.

අපි මළ ගෙදරකට ගියාම ගෙදර අය අඩන්නේ, අපේ මහත්තයාට අවුරුදු 50 යි අනේ මහත්තයෝ බලන්නකෝ හිටි ගමන් මැරුණා කියලා. මම අහනවා එතකොට එයාගේ අයියාට මොකද වුණේ. අයියාත් අවුරුදු 51 න් මළා. මෙයාගේ තාත්තා, එයත් 49 න් මළා කියලා කියන්නේ. දියුණු තාක්ෂණය තියෙන ලෝකෙක මේ ජාන සම්බන්ධයෙන් එන මරණ. තාත්තාට දදයක් තිබුණා නම් ඒ දදය අපටත් එනවා. තාත්තාගේ කොණ්ඩේ ගියා නම් අපෙත් කොණ්ඩේ යනවා. අම්මාට තිබුණා නම් අපටත් ඒක පරම්පරාවෙන් එනවා. ඒ නිසා මේ ජාන වෛද්‍ය ක්‍රමය පිළිබඳ නවීන ලෝකෙට අපි හඩක් ගෙනිහිල්ලා මේ හදිසි මරණ අවුරුදු 50 න් මැරෙන මිනිස්සුන්ගේ අපි දන්නවා පරම්පරාව ගත්තාම අපි කියනවා ඔය මිනිස්සු අවුරුදු 50 ට වඩා ඉන්නේ නැහැ. පරම්පරාව ගැන අපට කියන්න පුළුවන්. අවුරුදු 60 – 70 ක් ආයුෂ යන මිනිස්සු කියලා කියන්නේ අපේ ජාන තත්ත්වය තුළ. ඒ වෙනුවෙන් මොනවා හරි අලුත් විධියට හිතන්න කියලාත් කියනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

අනේ, මූලානාසරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩියයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

දැන් විනාඩියේ ඒවා ගොඩක් දුන්නා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

විශේෂයෙන් පරිපාලනය සම්බන්ධයෙන් වතුපිටිවල රෝහලේ පරිපාලනය ඉවත් කරලා නවක පරිපාලනයක් ආවත් අර හිටපු පරිපාලකතුමා දැන් OPD එකේ බෙත්

දෙනවා. මේක කරන්න පුළුවන් දෙයක් නෙමෙයි. නායකයෝ දෙන්නෙකු එක තැන සිටියොත් ඒ ආයතනය විනාශ වෙලා යනවා. ඒක නිසා පරිපාලනය එක්කෙනෙකුට බාර දීලා ඒ හිටපු පරිපාලකයා වෙනත් රෝහලකට පත්වීමක් දෙන්න කියලා ගෞරවයෙන් සිහිපත් කරනවා.

සමාජයේ කොල්ලෝ හිතනවා ලස්සන තියෙන කොට, හැඩහුරුකම් තියෙන කොට, සල්ලි තියෙන කොට, ඔක්කෝම තියෙන කොට ලොකු විවාහ මංගල්‍යක් කර ගන්නවා කියලා. උඹලා ඔක්කෝටම වඩා හොඳට මම විවාහ වෙලා ජීවත් වෙනවා කියලා. හැබැයි දින දෙක තුනක් යන කොට විවාහ ජීවිතය කඩා කප්පල් වෙනවා. මේ තරුණ තරුණියෝ දන්නේ නැහැ අලුතින් විවාහ වෙලා ජීවත් වෙන්නවත්. මේකත් එක්තරා සමාජ ඛේදවාචකයක්. උසාවියට ගිහිල්ලා බලන්න කෝ කොපමණ දික්කසාද නඩු තියෙනවා ද කියලා. ඇමතිතුමා මේවාට උපදෙස් දෙන්නට ඕනෑ. කොහොමද තමන්ගේ විවාහ ජීවිතය ගත කරන්නේ කියලා. ඕක නොදන්න මිනිස්සු මේ සමාජයේ ඉන්නවා වීරයෝ වගේ. රටට පේනවාට, සද්ද නැතුව හිටියාට ඛේදවාචකයක් තියෙනවා පවුල තුළ සහ ගෘහය තුළ. ඒ නිසා ඒ වෙනුවෙනුත් සෞඛ්‍ය අමාත්‍යාංශය කටයුතු කරන්න කියලා සිහිපත් කරමින් මට වේලාව ලබා දීම සම්බන්ධයෙන් ස්තූති වන්ත වෙමින් නිහඬ වෙනවා.

[අ.භා. 03.24]

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා. අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේ වචන ටිකක් කථා කරන්න ලැබීම පිළිබඳව. විශේෂයෙන්ම අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය ඇමතිතුමා ඇතුළු එම කාර්ය මණ්ඩලය අපට ඉතාමත්ම හොඳ සේවාවක් කරනවා. හුඟාක් මන්ත්‍රීවරු කිව්වා වාගේ අපි ඕනෑම වෙලාවක කථා කරපුවාම දුරකථනයට එනවා. කථා කරනවා. කියන වැඩෙත් කරලාත් දෙනවා. අපේ වැඩ නෙමෙයි නේ සෞඛ්‍ය ප්‍රශ්න නේ කියන්නේ. අද මගේ මිත්‍රයත් ඉන්න එක මෙතන මම සන්තෝෂ වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මම බැලුවා මොකද සද්දයක් නැත්තේ කියලා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

අද එතුමාගේ සෞඛ්‍ය හොඳ නැති වෙලා වැඩිය කැගහන්නේ නැහැ. මේ ටිකේම මට කථා කරන්න දුන්නේ නැහැ. (බාධා කිරීමක්) ඉංග්‍රීසි තියෙනවා. මම ඊයේ හීනයක් දැක්කා නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ දවස් ටිකේම මෙතුමා මට කරදර කරපු නිසා මෙතුමා ගැන මතක් කරමින් තමයි මම නිදා ගත්තේ. මම හීනයක් දැක්කා. මම හාමුදුරුවන්ගෙන් හීනේ පලාඵල අහන්නම්. මට කියන්න මොකක්ද කියලා. හාමුදුරුවනේ මම ඊයේ රෑ හීනෙන් ගියා ඉන්දියාවේ ජේතවනාරාමයට. ජේතවනාරාමයට ගියාම මම දැක්කා පොහොට්ටුවෝ ටිකක්, පොහොට්ටු අරගෙන පෝලීමේ අඩ අඩා යනවා. මම ඇහුවා කොහේද යන්නේ කියලා. බලන්නකෝ අපේ කට්ටියක්ම එල්ලලා නේ කියලා. ඒ පාර මමත් ඒ අය පස්සෙන් පොහොට්ටුවක් අරගෙන ගියා. ගිහිල්ලා බලපුවාම අනේ මේ පොහොට්ටුවේ කට්ටිය ජේතවනාරාමයේ එල්ලලා. පිටිපස්ස පැත්තේ එල්ලලා. ඉතින් මමත් අනේ කියලා බල බලා ගියා. එකෙක්ගේ කකුල් දෙකෙන් එල්ලලා. මම ළඟට ගිහිල්ලා බැලුවා ඒ කවුද කියලා. මගේ මිත්‍ර ප්‍රසන්න සංජීවව කකුල් දෙකෙන් එල්ලලා. ඒ පාර මම ඇහුවා මේ කට්ටියව මොකද මේ එල්ලලා තියෙන්නේ කියලා. එල්ලලා තියෙන්නේ. මුන් ජේතවනාරාමයට ගල් ගහපු එවුන් කියලා. දැන් මම ඇහුවා අර මන්ත්‍රීතුමාගේ කකුල් දෙකෙන් එල්ලලා තියෙන්නේ ඇයි කියලා. ඌ ජේතවනාරාමේ කැත කරපු එකෙක් කිව්වා. අර කියමනක් තියෙනවා - (බාධා කිරීම්)

මට මහ ඇමැතිතුමා කිව්වා, සිංහලෙන් බනින්න කියලා. දැන් මම සිංහලේ කථා කරන කොට ඉංග්‍රීසියෙන් බණින්න ඕනෑ. අර කියමනක් තියෙනවා Don't sit under beach and wash on the waves කියලා. සිංහලෙන් අපි කියන්නේ, අර සිංදුවක් තියෙන්නේ වැල්ලේ කැත කරලා රැල්ලේ හෝදනවා කියන්නේ. දැන් මෙතුමා අද වැල්ලේ කැත කරලා දෙවැනි එක කරලා නැහැ. හෝදලා නැහැ. ඊට පස්සේ මම ජේතවනාරාමයේදී මොකද දන්නවාද කළේ? අර පොහොට්ටුව පූජා කළේ මෙතුමා ළඟ. පූජා කරලා මම දෙවියන්ට කිව්වා හාමුදුරුවනේ අනේ මෙතුමාව මීට පස්සේ වැල්ල පැත්තේ නම් ඉපදෙන්න අරින්න එපා. ඔය කැත පුරුදු තියෙන්නේ වැල්ලේ ඉපදුණු නිසා කියලා. දොම්පේ පැත්තේ ඉපදෙන්න කියලා අපි ප්‍රාර්ථනා කරනවා. හරි.

[ගරු උපාලි ගුණරත්න]

දැන් කැහගන්න එපා. හැමදාම මට කථා කරන්න ගියොත් කරදරේ. හාමුදුරුවනේ මට පස්සේ ඒ හීනේ පලාඵල කියන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම සෞඛ්‍ය ඇමතිතුමා අපේ ආත්ම ගෞරවය ආරක්ෂා කරලා තිබෙනවා. දැන් අපි යහපාලන රජය වුණාට අපෙත් දොම්පේ පැත්තේ යහපාලන කාරයෝ ඉන්නවා. අපි හදාපු ගොඩනැගිලිත් විවෘත කරන්න එනවා. දැන් බැසිල් මහත්තයා සල්ලි දීලා DMO quarters හැදුවා, දොම්පේ. 100% ක්ම හදලා, අතු ගාලා කොස්සත් අපි දීලා තිබුණේ. බෝඩ් ගහලා, එක පාරට විවෘත කරන්න ලෑස්තියි. මම දන්නෙත් නැහැ. ඇමැතිතුමා දන්නෙත් නැහැ. පස්සේ අපේ ඇමතිතුමා වහාම ඒක තහනම් කළා. අපි ගරු කරනවා ඇමතිතුමාට අපේ පළාත් සභාවේ ගෞරවය ආරක්ෂා කළාට. වහාම තහනම් කරලා පස්සේ ඇමතිතුමා ඇවිල්ලා විවෘත කළා. ඔය හැම මිනිහාටම, කවුරුවත් නැහැ නේ කියන්නවත්. යහපාලනයේ කට්ටිය අනිත් පැත්තේ. ආ .. ඔබතුමා ඉන්නවා නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මම ඉන්නවා නේ? කියන්න.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මූලාසනේ ඉන්නවා. අනෙක් එක්කෙනෙක්වත් නැහැ. එක්කෝ සෞඛ්‍ය නරක් වෙලා. ඉතින් ඇමැතිතුම - ඒක විවෘත කළා. විවෘත කරලා අපේ ගෞරවය ආරක්ෂා කළා. ඒ ගැන අපි ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම ඇත්තටම දොම්පේ රෝහල් කමිටු - දැන් මේ ගැන කථා කරන කොට පසුගිය කාලේ දිගටම රෝහල් කමිටු තිබුණා නේ? මේ රෝහල් කමිටු අපි පත් කළේ මේ බොරුවට දේශපාලනයේ හිටි අය නොවෙයි. රෝහල්වලට වැඩක් කරන්න පුළුවන්, රෝහලට ශක්තියක් දෙන්න පුළුවන් හොඳ වටිනා ව්‍යාපාරිකයෝ, නීතිඥයෝ වගේ අය තමයි අපි දුන්නේ. මේ ඊට පස්සේ දේශපාලඥයන්ගේ නමින් තොරතුරු දෙන්න කිව්වාම වෙනත් හාල්පාරුවන්ව රෝහල් කමිටුවලට පත් කරලා සත පහක වැඩක් නැහැ. අඩු ගාණේ එන්නෙත් නැහැ. දැන් රෝහල් කමිටුවෙන් පොඩි පොඩි දේවල් කිව්වා. ඔය බල්බ් ගහලා ගියාම බල්බ් දෙන්න කියන්න පුළුවන්ද ආණ්ඩුවෙන්. මම රෝහල් කමිටුවේදී කිව්වා, මම බල්බ් 25 ක් අරන් දෙන්නම්. අපේ අනිත් පක්ෂයේ අයට බල්බ් 10 ගණනේවත් අඩු ගණනේ අරන් දෙන්න කියලා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ආයිත් සල්ලි ගත්තා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මම ආයිත් හෙට හීනයක් දකියි. බලාගෙන. ඔය අද හීනේ මම කිව්වේ. මෙතුමා නිසා අද රෑට තව හීනයක් දකියි. බැලුවාම ඉතින් මෙතුමා නැතුව මට ජොලියකුත් නැහැ. රෝහල් කමිටුවට හෝ ගාල වැඩක් නැති අය පත් කරන්නේ නැතුව, ආසන සංවිධායකවරයා ආසනයේ ප්‍රධාන කෙනා පත් කළාම අපි 10 ක් විතර රෝහලේ අඩුපාඩු බලලා, බෙහෙත් නැත්නම් බෙහෙත් අරන් දෙනවා. මට මතකයි එක සැරයක් ඩිස්ප්‍රින් පෙති ලක්ෂයක් අරන් දුන්නා. අපි එහෙම අරන් දුන්නා. ලින්ක් නැචුරල් ඉංජිනියර්ස් එකේ සභාපතිතුමා ජයවර්ධන මහත්තයා අපේ රෝහල් කමිටුවේ හිටියා. ඕන දෙයක් කිව්වාම කරලා දෙනවා. වතුර පොම්පය කැඩුනොත් වතුර පොම්පය හදලා දානවා. ඒ හැම දෙයක්ම කරලා දෙනවා. ඒ රෝහල් කමිටුවලට හොඳ වටිනා පුද්ගලයෝ පත් කරන්න. වැඩක් නැති අය පත් කරන්න එපා. ඒ වගේම අපේ ඇම්බියුලන්ස් එක සම්බන්ධව මම ඔබතුමාට කිහිපසැරයක් කිව්වා. අපේ ඇම්බියුලන්ස් එක කැඩෙනවා. ලෙඩ්ඩු ගෙනියන්න විධියක් නැහැ. වතුපිටිවලින් එකක් එවලා තිබුණා. ඒකත් කැඩුණා. දැන් ඔබතුමා පොරොන්දු වෙලා තියෙනවා. අලුත් ඇම්බියුලන්ස් එකක් අපට දෙනවයි කියලා. ඉතින් මම ඒක බලපොරොත්තු වෙනවා. ඔබතුමාත් අලුත් අවුරුද්දේ අපට ඒක දෙන්න කියලා කියනවා. මම හිතන්නේ ආණ්ඩුවේ ඡන්ද ප්‍රශ්නයක් නැහැ, ඇම්බියුලන්ස් එක දුන්නාට. ඒක දෙන්න. ඒ වාගේම රෝහල්වල හුඟාක් වෙලාවට කම්කරුවන් (බාධා කිරීමක්) ආ ... යහපාලනයේ කවුරුවත් නැහැ. ඔක්කෝටම සෞඛ්‍ය හොඳ නැහැ. අපට කම්කරු අඩුපාඩු තියෙනවා ගරු ඇමතිතුමනි. ඒ කම්කරු අඩුපාඩු ටික ලබා දෙන්න. ඒ වගේම විශේෂයෙන් දෙයක් මට කියන්න තියෙනවා. මේ දොම්පේ රෝහලේ හුඟාක් වෙලාවට මරණ පරීක්ෂණ පවත් වන්නේ නැහැ.

JMO කෙනෙක් නැති හින්දද කොහේද? ඇත්තටම දැන් අපට ගොඩනැගිලි ඕනෑ තරම් තියෙනවා. නමුත් JMO කෙනෙක් නැති හින්ද මරණ පරීක්ෂණ කරන්න ගම්පහ යන්න ඕනෑ. එතකොට ගම්පහ යන්න ගියාම අහිංසක ලෙඩ්ඩුන්ගේ වියදමින් නේ අරන් යන්නේ. ඒගොල්ලෝ ඇම්බියුලන්ස් අර ගෙන ගියාම හරි ලොකු වියදමක් දරන්න වෙනවා. ඒ නිසා කරුණාකරලා මේ පිළිබඳව හොයලා බලන්න, මරණ පරීක්ෂණ පවත්වන්න බැරි ඇයි කියලා. ඒක ලොකු කරදරයක් නේ? ඇත්තටම අහිංසක දුප්පත් මිනිස්සුන්ට රත්තරන් බඩු උකස් කරලා තමයි අන්තිමට ඒ වැඩ කරන්න වෙන්නේ. හුඟාක් වෙලාවට රෝහල්වල ඇත්තටම බෙහෙත් අඩුපාඩුවක් නැහැ. බෙහෙත් ඉවර වෙනකන් කියන්නේ නැහැ. අපි දැන ගත්තාම කවුරු හරි කිව්වාම තමා අපි උසස් නිලධාරීන්ට කිව්වාම, අධ්‍යක්ෂතුමාට කිව්වාම ටක් ගාලා එවනවා. ඒ ගැන මම ස්තුතිවන්ත වෙනවා. ඒ ගැන අඩුපාඩුවක් නැහැ. ඒ වාගේම දොම්පේ මහජන සෞඛ්‍ය සේවා නිලධාරි කාර්යාලය ඉතාම හොඳ සේවාවක් කරනවා. ඩෙංගු වැඩසටහන් හොඳට කරනවා. මහජනතාව සම්බන්ධයෙන් අපහසු ඒවාත් කියන්න ඕනෑ. සාමාන්‍යයෙන් දොම්පේ ඩෙංගු ගොඩාක් ඉහළට ගිහින් තිබුණා. නමුත්, මේ වන කොට සාමාන්‍ය තත්ත්වයකට පාලනය කරලා තිබෙනවා. මහජන සෞඛ්‍ය සේවා නිලධාරි කාර්යාලයේ වෛද්‍ය නිලධාරීන්ට ස්තුතිවන්ත වෙනවා. ඒවාගේම ඔබතුමාගේ දොම්පේ රෝහල ගැන කියන්න ඕනෑ. දොම්පේ රෝහල ඉතාමත් පිරිසිදුව පවත්වාගෙන යන රෝහලක්. දොම්පේ, රදාවන. තමුන්නාන්සේලා ඇවිත් බලන්න. අපේ රෝහල. මම රෑටත් යනවා. දවල්ටත් යනවා. ඉතාමත් පිරිසිදුවට තිබෙනවා. බුලත් කෙළ ගහලා එහෙම නැහැ. රෝහලේ පිටුපස ඌරු කොටුවක් තිබුණා. මම හිතන්නේ මෙතුමාගේ සම්බන්ධයක් තිබුණා. දැන් ඒ ඌරුකොටුව සම්පූර්ණයෙන්ම මම අයින් කරලා දැම්මා. දැන් ඌරන් නැහැ.

ඒ වාගේම කාන්තා වැඩ සටහන්. ගරු සභාපතිතුමනි, දොම්පේ තමයි වැඩිම කාන්තා වැඩසටහන් සහ කාන්තා සමිති තිබුණේ. ඒකට හේතුව දොම්පේ තමයි කාන්තාවන්ට විශ්වාසවන්ත නායකත්වයක් තිබෙන්නේ. (බාධා කිරීමක්) මෙයාලත් එක්ක කාන්තාවටන් ඉන්න පුළුවන්ද? ළඟින් ගියොත් ඇහැක් නැහැ. මෙයාලා නිසා ඒ පැතිවල දිය රෙද්දක්වත් වනන්න බැහැ. කාන්තාවෝ කෙසේ වෙතත්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මෙතුමන්ලා ඉන්න තැන දිය රෙද්දක්වත් වනන්න පුළුවන්ද?ඒත් බැහැ. දොම්පේ ආසනයේ කාන්තා සමිති එකසිය ගණනක් තිබුණා. ගියපාර මාගේ ඡන්දෙට කාන්තාවන් දෙදහස් ගණනක් බැස්සා. උපාලි ගුණරත්නව ජයග්‍රහණය කරන්න. මාව පරද්දන්න හතරදෙනෙක්ව දැම්මා. ඒ කාලයේ ඒ නායකයෝ ටික. උපාලි ගුණරත්නව පරද්දන්න හතර දෙනෙක් දැම්මා. ලංකාවේ කිසිම තැනක, කිසිම ආසනයක සංවිධායක ඉන්න තැනට හතර දෙනෙක් දාලා නැහැ. දෙන්නෙකුට වැඩියෙන්. තරුණ ජවය කියලා ඉල්ලා හතර දෙනෙක්ව දැම්මා. ඔය තරුණ ජවය කියන්නේ වඳුරෝ වාගේ තමයි. මිනිත්තු දෙකකින් ඉවරයි ඔය තරුණ ජවය.

උපාලි ගුණරත්නව පරද්දන්න අපේම පක්ෂයේ අය හතර දෙනෙක් දැම්මා. නමුත් මගේ කාන්තාවන් දෙදහසක් එක දවසේ එළියට බැස්සා. (බාධා කිරීමක්) මගේ කාන්තාවන් තමයි. මේ අයට පුළුවන්ද කාන්තාවෝ දෙදහසක් බස්සන්න. මේ අය එක එකා අරන් යයි. (බාධා කිරීමක්) යහපාලනයේ බබාලා හම්බ වෙනවා. ඕනෑ තරම්, කාන්තාවන්ට බබාලා හම්බවෙන කොට රුපියල් විසිදාහ ගණනේ දෙනවා කිව්වා නේ? දැන් වෙලා තිබෙන්නේ සල්ලි දෙනවා කිව්ව නිසා, යහපාලන ආණ්ඩුවෙන් හෝගාලා බබාලා හම්බ වෙලා. කරදරයක් නැහැ නේ? ඉතින් සල්ලි මදි වුණා. බබාලා වැඩිපුර හම්බ වුණා. නිදහසේ හිටියාම බබාලා හම්බ වෙනවා තමයි. පේනවා නේ. ඒ වාගේම මේ කාන්තා සමිති ගැන කිව්වා නේ. ඇත්තටම මේවාට ටිකක් මුදල් ලබා දෙන්න.

මම අවුරුද්දකට ලක්ෂ විසිපහ ගණනේ වෙන් කළා. මේ වන කොට එක් කෝටි පනස් ලක්ෂයක් පසුගිය අවුරුදු 6 ඇතුළත කාන්තාවන්ට දුන්නා. දොම්පේ ඉන්නේ, අභිමානවත් දිරිය කාන්තාවන්. ඔබතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ආයලා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

දොම්පේ ආයලා දැන් නැහැ. දැන් ඉන්නේ දොම්පේ නෝනලා. ඒ ගෞරවය අපේ ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒවාගේම කණ්නාඩි ටික බෙදන්න (බාධා කිරීම්)

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට බොහොම ස්තුතියි. කතාව අවසන් කරන්න

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

ගරු ඇමතිතුමනි, කණ්නාඩි බෙදන්න තහනම් කර තිබෙනවා නේ? ගරු ඇමතිතුමා, දැන් මේ කණ්ණාඩි නැතුව කතිර ගහන්න හම්බවෙන්නේ නැහැ නේ? අපේ කට්ටිය කණ්ණාඩි නොදා අලියාට ගහයිද? පොහොට්ටුවට ගහයිද? දන්නේ නැහැ නේ? ඒ නිසාහරියට කතිරය ගහන්න කණ්ණාඩි ටික බෙදෙන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පොහොට්ටුවට ගහන්නේ.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මම කිව්වේ, පෙහොට්ටුවට ගහන්නේ කකුල් දෙකෙන් එල්ලලා. පොහොට්ටුකාරයෝ ඔක්කොම ටික ජේතවනාරාමයේ එල්ලනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා කරුණාකර කථාව. අවසන් කරන්න.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

අවසාන වශයෙන් මාගේ මිත්‍ර ප්‍රසන්න සම්පත් බියගම ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිතුමා - මට නැවත කථා කරන්න හම්බ වෙන්නේ නැති නිසා මේ අවස්ථාවේදී එතුමාට සුභ පතන්න ඕනෑ. එතුමා අපේ අල්ලපු ආසනයේ ඉන්නේ. විශේෂ සේවාවක් හිටපු සභාපතිතුමා කළා. එතුමාට නැවත වරක් බියගම ඡන්දය ඉල්ලනවා කිව්වා. එතුමා කියන්නේ හොඳ ඇමතිවරයෙක් ඉන්න ආසනයක්. අපේ රුවන් විජයවර්ධන මැතිතුමා. එතුමාට නැවත වාරයක් ඒ කරපු එම විශේෂ සේවාව කරන්න ශක්තිය ධෛර්ය ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. එතුමා නැති හින්දා මම බලාපොරොත්තු වෙනවා - මම හිතුවා ඉඳියි කියලා. මට ප්‍රසන්න සංජීවමයි කියවෙන්නේ, මල වාතයක්. මට හීනෙනුත් පේන්නේ මේ යක්ෂයාව.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා බොහොම ස්තුතියි.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

ගරු ඇමතිතුමාට බොහොම ස්තුතියි. ඔබතුමා කරන සේවය දිගින් දිගටම කරගෙන යන්න ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 03.36]

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. ඇත්තටම සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ තිබෙන විෂයන් පිළිබඳව අදහස් දක්වන්න මම අද සූදානමක් තිබුණේ නැහැ. නමුත් කථිකයන්ගේ අඩුවක් නිසා මටත් අවස්ථාවක් ලැබුණා, අදහස් දක්වන්න. නැත්නම් මට මෙම අමාත්‍යාංශ විෂයයන් පිළිබඳ මීට වඩා කරුණු කාරණා ටිකක්, තොරතුරු ටිකක්, සංඛ්‍යා ලේඛන සහිතව ඉදිරිපත් කරන්න තිබුණා නම් මට හිතෙනවා, එක ගරු ඇමැතිතුමාටත් වැදගත් වෙයි කියලා. මුලින්ම කියන්න කැමැතියි, ගරු මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.අපේ සුනිල් එදිරිසිංහ මහතාගේ ගීතයක තිබෙනවා.

*"රජකු වුණත් ගිලන් වෙලා එක්තැන් වුණ දා*
*කියනවාට සැකයක් නැහැ*
*නිරෝගී සැප හැර සැපයක්*
*ලොවේ කොහින්දා"*

කියලා. දැන් අපි සැමෝටම මේ ගීතයේ තිබෙන මේ පද පෙළ අපි කුඩා කාලේ වෙනත් වෙනත් ආකාරවලින් අපේ

ජීවිතයට එකතුකරගෙන තිබෙනවා. "නිරෝගී සම්පත උතුම්ම සම්පත වේ" කියලා අපේ ඇමැතිතුමාත් දන්නවා, ඒ කාලේ පාසලේ බාල්කවල රුවන් වැකි කියලා ලියනවා. මෙහෙම ලියලා තියෙන්නේ, අපිට මේවා පොඩි කාලයේ සිටම මොනවා හරි මට්ටමකින් මේක වැදගත් ආකාරයකින් ඔළුවට ඇතුළත් කර ගනියි කියලා, එදා ගුරුවරුන්ගේ විශ්වාසයක් තිබුණ නිසා. අද ඉතින් Facebook හරහා තමයි මේ රුවන් වැකි ටික එන්නේ. නානාප්‍රකාර උපදෙස් දෙනවා. දැන් මේ දවස්වල මම දැක්කා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නන්දිකඩාල් කළපුවේ මහා යුද්ධයෙන් අපේ යුධ නායකයන්, ඒ විරුවන් කොටි ත්‍රස්තවාදයට එරෙහිව යුද්ධ කරන අවස්ථාව ,දැන් මේ දවස්වල ෆේස්බුක් එකෙන් පේනවා. මතු වෙනවා. ඒ කරපු රණවිරුවන්ට වඩා ඒ කියන්නේ, ජෙනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා, ඒවාගේම තවත් තවත් ඔය කියන යුධ නායකත්වයට වඩා, අපේ සාමාන්‍ය සොල්දාදුවෝ දින ගණන් නොකා නොබී නන්දිකඩාල් කළපුවේ ඒ කරපු යුධ මෙහෙයුමට වඩා ඒ යුද්ධය කරපු සිනමා නිළියන්, සිනමා තාරකාවන්, ඒ වාගේම තවත් කලාකරුවන්, මේ සභාවේත් මට හිතන හැටියට එක්කෙනෙක්ගේ වාගේ නමක් තිබෙනවා.

මේකේ වැදගත්කම තිබෙන්නේ මෙන්න මෙතනින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රුපියල් හැට දසක් වාගේ. මේ ගෙවපු ගණන් සමහර අයට මතක නැහැ. ගෙවපු ගණන් මතක නැහැ. රුපියල් හැට දහසකට වඩා ගෙවීම් කරලා තිබෙනවා. හැබැයි අපේ සෞඛ්‍ය - මේ ගෙවපු ගණන් ටික එකතු කරලා බැලුවා නම්, මෙම වර්ෂ ගණන්වලට කොයි තරම් මුදලක් ගෙවලාද කියලා තාමත් අපිට සොයා ගන්න බැහැ. මේක විගණනය කළ යුතු කාරණයක් කියලා මම විශ්වාස කරනවා. අපේ සභාවේ ඒ නම කියන නිසා වැරදි නම් නිවැරදි කර ගැනීමේ කාර්යභාරය ඔහු සතුව තිබෙනවා. නමුත් එම මන්ත්‍රීතුමා තවමත් ඒක නිවැරදි කර ගෙන නැහැ. අන්තර්ජාලය හරහා වේගයෙන් එහේ මෙහේ යනවා. අලුතින් තව වීඩියෝ ක්ලිප් එකතුවෙන ඒවාත් තිබෙනවා. ඉතින් මේ සිනමා තාරකාවන් මේ යුද්ධය කරපු හැටි දැන් අපට පේනවා. ඒකට නායකත්වය දීපු අය මහා ධනස්කන්දයක් වියදම් කරලා. ඒ ධනස් කන්දයෙන් අපි සොච්චම් මුදලක් ඉල්ලුවා, පළාත් සභාවට ටිකක් වැඩි කරලා එවන්න කියලා. අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැදගත් ආයතන ටිකක් තිබෙනවා, පළාත් සභාව සතුව. එතකොට ඒ එවපු මුදල් ටික මධ්‍යම රජයෙන් වැඩි කළා නම්,මෙතුමාටත් ඊට වඩා වැඩියෙන් වැඩ ටිකක් කරන්න තිබුණා.

මම එතුමාගෙන් ඉල්ලා සිටියා ගිය වර්ෂයේ - අපට ඇත්තටම වැය ශීර්ෂයන් යටතේ කථා පවත්වන්න ලැබෙන ප්‍රමාණයන් අඩුයි. අවස්ථාවන් අඩුයි. මම සූදානම් වෙලා සිටියා. එක් අමාත්‍යාංශයක උපදේශක කාරක සභාවල ඉන්න ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂ යටතට විතරයි මට විනාඩි 20 ක් ලැබුණේ. සම්පූර්ණ කාලයක්ම ගත්තායින් පසුව, එක්කෙනෙකුට එක එක අමාත්‍යාංශවලට තමයි අදහස් දක්වන්න අවස්ථාව තිබුණේ. ගිය අවුරුද්දේ විවාදයේදී ඔබතුමාට කියා ගන්න මට අවශ්‍යම කාරණයක් තිබුණා. මීගොඩ මාතෘ හා ළමා සායන සම්බන්ධයෙන්. මම ඒ ටික නන්දන පද්මකුමාර මන්ත්‍රීතුමා හරහා ඔබතුමාට අයවැය විවාදයේදී - මොකද ඒ විවාදය වෙලාවේදී සියලු නිලධාරී මහත්ම මහත්මීන් පැමිණෙන නිසා මට මේක ඒ අවස්ථාවේදී කියන්න ඕනෑකම තිබුණා. ඊට කලින් මම උපදේශක කාරක සභාවේදීත් මේ කාරණය මතු කළා.

මීගොඩ මාතෘ සායන කාරණය නැවත මතක් කළොත්, ඒ අමතක වුණු නිලධාරී මහතුන්ට. අලුත් අධ්‍යක්ෂතුමෙක් ඇවිල්ලා ඉන්නේ. අවුරුදු 40 ක් මීගොඩ මාතෘ හා ළමා සායනයේ අයිතිය කාටද තියෙන්නේ කියලා තහවුරු වෙලා තිබුණේ නැහැ. පසු කාලයක ඒ තොරතුරු ආවාට පසුව මීගොඩ මාතෘ හා ළමා සායනය සම්බන්ධයෙන් මේ අයිතිය සොයාගන්න, සැලකිය යුතු වෙහෙසක් දරලා ඒ අයිතිය තහවුරු කර ගත්තේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රාදේශිය සභාව සතුව තිබෙන පරණ ලියකියවිලි සොයලා ඒ අල්ලපු ඉඩම්වල ඔප්පුවල අංක සොයාගෙන කොහොම හරි දැන් කැඩැස්තර සිතියම සොයාගෙන තිබෙනවා. ඉන්පසුව පහුගිය දවස්වල හෝමාගම සම්බන්ධීකරණ කමිටුවේ මතු කළාම, දැන් මේකේ ගැටලුවක් නැහැ. මේක කරගෙන යන්න පුළුවන්. සෞඛ්‍ය අමාත්‍යාංශයට ඕනෑ නම් පවරලා දෙන්නත් පුළුවන් කියලා සූදානමක් තිබෙනවා. මෙන්න මේ කාරණය හරියාකාරව කරගන්න අපේ බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය මොන තරම් අසමත් ද කියනවා නම්, අවුරුද්දක් ගිහිල්ලා, මම දන්නේ නැහැ. අදටත් ඒ මාතෘ හා ළමා සායනය වෙත ගම් 04 ක ජනතාව එනවා. මම ගරු ඇමතිතුමාට කිහිප වතාවක් කතා කළා. පුළුවන් නම් අපි ගිහිල්ලා පරීක්ෂා කර බලමු කියලා. ඇමතිතුමාට ආසනයේ වැඩ කටයුතු වැඩි නිසා, ඡන්ද ළඟ එන නිසා එතුමාට වෙලාවක් තිබුණේ නැහැ. නමුත් නිලධාරී මහත්වරුන්ව අවස්ථා කිහිපයක් ගිහිල්ලා තිබුණා.

[ගරු සරත් පතිරණ]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගියාට වැඩක් නැහැ, වැඩේ වෙන්නේ නැත්නම්. අවුරුදු 40 ක් ප්‍රතිපාදන වෙන් කිරීමට නොහැකි තත්ත්වයක් තිබුණේ, අයිතිය පිළිබඳව තහවුරු කරගන්න බැරිවුණු නිසා. හැබැයි, අයිතිය තහවුරු කර ගෙන දැන් වසරක් වෙනවා. ඒක තහවුරු වෙලා නැත්නම් තවත් තහවුරු කර ගැනීමේ කාර්ය භාරය තියෙන්නේ මන්ත්‍රීවරයාට නොවෙයි. ඒ නිලධාරීන්ට. ඒ නිලධාරීන් අසමත් වෙලා තිබෙනවා. තවමත් ඒ මීගොඩ මාතෘ හා ළමා සායනය හරහා අවශ්‍ය මව්වරුන්ට - අපි දන්නවා මාතෘ සායනයට ගියාට පස්සේ, බබෙක් හම්බවෙන්න ඉන්න මව්වරු මොනතරම් අසීරුතාවයකින්ද ඈත ගම්වල සිට එන්නේ. ආවාට පස්සේ වාඩිවෙන්න හරියට තැනක් නැහැ, ඔය මම කියන ස්ථානයේ. බොහෝ ඒවා එහෙමයි. පසුගිය කාලේ සමහර ඒවාට ප්‍රතිපාදන වෙන් කරලා වැඩිදියුණු කර ගත්තා. නමුත් බොහෝ සායනවල තවමත් තිබෙන්නේ, අර පරණ තත්ත්වයම තමයි. මෙතැන්ට ආවට පස්සේ මාතෘ සායනය ඉස්සරහින් මහා කුණු කාණුවක් ගලාගෙන යනවා. නගරේ සියලුම කුණු ටික, කැළි කසළ ටික, අපවිත්‍ර ජලය යන්නේ මාතෘ සායනය අසළින් තිබෙන ඒ කාණුව දිගේ. ඒවාගේම ත්‍රිපෝෂ එකතුකර තිබෙන ගබඩාව. හැමදාම රෑට මීයෝ කාලා පැකට් කිහිපයක් විසිකරන්න වෙනවා. මේවා මාධ්‍යවල වාර්තා වුණා. මව්බිම පත්තරේ, ඒ වාගේම දිවයින පුවත්පත ආදී පත්තර ගණනාවක වාර්තා වුණා. මම තමයි පත්තරවලට ඒ තොරතුරු දුන්නෙත්. මාධ්‍යවේදීන් ගෙනල්ලා, මාධ්‍යවේදීන්ට ඒ තොරතුරු ටික දීලා, මාධ්‍ය හරහාත් මේක ප්‍රකාශයට පත් කළා.

නමුත් මම එක කාරණයක් කියන්නේ, මේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ තිබෙන නිදිබර ගතිය, නිද්‍රාශීලී ගතිය කලින් වැය ශීර්ෂයේදී මමත් අපේ බොහෝ මන්ත්‍රීවරු ඒ අමාත්‍යාංශයේ නිලධාරීන් ගැන කවුරුත් ප්‍රසාදයෙන් කථා කළා. ඒ අමාත්‍යාංශයට ගියාම ඒ නිලධාරින් ඒ මන්ත්‍රීවරුන්ට සහ ඒ ජනතාවත් එක්ක දක්වන සුහදශීලීත්වය පිළිබඳව. ඒ අමාත්‍යාංශයට වැඩක් කිව්වාට පසුව වැඩක් කරගන්න පුළුවන් කියලා මන්ත්‍රීවරුන්ට හැඟීමක් තිබෙනවා. ඔබතුමා දන්නවා මීට කලින් පැවැති විවාදයේ මහ මාර්ග අමාත්‍යාංශය, අපේ ලලිත් වනිගරත්න ඇමතිතුමාගේ ඒ අමාත්‍යාංශය පිළිබඳ කවුරුත් ප්‍රසාදයෙන් කථා කළේ, නිලධාරීන් ගැන. හැබැයි මෙහෙම නිද්‍රාශීලීව අවුරුද්දක් යන කල් මේ සායනයට අඩුම තරමින් මැදිහත් වීමක් කරගත්තා නම්, මීට වෙනස් වෙන්න තිබුණා. ඒ එක සායනයක්. ඉතිහාසයේ, මම ප්‍රසන්න රණතුංග ඇමතිතුමා සෞඛ්‍ය ඇමතිවෙලා ඉන්න කාලයේ, මම එතුමාගේ උපදේශක කාරක සභාවේ සාමාජිකයක් හැටියට හිටියා. මම ඒ කාලයේ කිව්වා, සමහර විට එම වාර්තා තවමත් ඇති. ඒ උපදේශක කාරක සභාවට මම ඉදිරිපත් කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඉතාමත් වේගයෙන් අපේ නගරය නාගරික කරණය වෙනවා. අපේ ගම් නාගරිකකරණය වීම නිසා අපේ භූගත ජලය විශාල වශයෙන් දැන් අපවිත්‍ර වී ගෙන යනවා. පර්චස් දහයේ දහයේ කැලිවලට අපේ භූමි-දැන් දහයටත් අඩුවෙන් කඩනවා. දහයට දහයට කැඩුවායින් පසුව -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩි දෙකක් දෙන්න. දැන් මේ භූගත ජලය - මම දන්නවා. මම ඉන්නේ කඩුවෙල ආසනයේ. මෙතුමාත් දන්නවා. ගොඩාක් ළිං ජලය පාවිච්චි කරන්නේ. පාරේ යන නළ ජලය ලබා ගත්තාට මිනිස්සු විශ්වාස කරනවා ළිඳෙන් පාවිච්චි වන ජලය පිරිසිදුයි කියලා. නළ මාර්ගයෙන් එන ජලයට වඩා මේ ජලය පිරිසිදුයි කියලා විශ්වාසය පවතිනවා. නමුත් මේ වර්තමාන අපේ මහ ඇමැතිතුමා යටතේ විශේෂයෙන් කැලණි ගඟේ ජලය පිළිබඳ පරීක්ෂා කරගෙන යද්දි, ඒ පරීක්ෂණ කටයුතු කරපු මහාචාර්යවරු, ඒ ආචාර්යවරු සොයාගෙන තිබෙනවා. දැන් ළිං ජලය බොහෝ සෙයින් අපවිත්‍ර වී තිබෙනවා කියලා. නගර ආශ්‍රිතව. එතකොට මේ ඇළ මාර්ග හරහා ගලාගෙන යන අසූචි, කර්මාන්ත ශාලාවලින් පිට වෙන අපවිත්‍ර ජලය නිසා, කර්මාන්ත ශාලාවලින් භූගත ජලය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා. එතකොට අනාගතයේදී ඉතාමත්ම ස්තුතිවන්ත වෙනවා. සෞඛ්‍ය අමාත්‍යතුමා මැදිහත් වෙලා, හදිසියේ අහම්බෙන් මම වැඩ සටහනකට ඊයෙත් සම්බන්ධ වුණා. වකුගඩු රෝග නිවාරණය සම්බන්ධයෙන් අපේ දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවෙන් කරන වැඩ සටහනක්. ඇත්තටම වැඩසටහන ප්‍රශස්ථ මට්ටමක තිබුණා. වකුගඩු පිළිබඳව දැන් අපේ අවධානය යොමු වෙලා තියෙනවා. ප්‍රමාද වෙලා හරි දැන් වැඩ ආරම්භ කරලා තිබෙනවා. ඒක

සතුටක්. ඇත්තටම අපේ රටේ වකුගඩු රෝහලක් ඉදිකිරීම සම්බන්ධයෙන් අපි කණගාටු වෙන්න ඕනෑ. ඒ කණගාටු වෙනවට කාරණය මේ රතන හාමුදුරුවො, ජාතික හෙළ උරුමයේ ඉන්න ඒ ස්වාමීන් වහන්සේලා මැදිහත්වෙලා ලොකු උත්සහයක් ගත්තා මේ රසායනික ද්‍රව්‍ය අපේ රටට ගෙනල්ලා, මේ කරන විනාශය නතර කරන්න. අපේ රටේ පරිසරවේදීන් මැදිහත් වුණා. නමුත් ඒක කරගන්න බැරි නිසා බෙහෝ දෙනෙක් කළ කිරීමෙන් ඉන්නේ. අන්න ඔය කාරණය නිසාම අපේ රටේ භූගත ජලය සම්පූර්ණයෙන්ම, භූගත ජලය පමණක් නොවෙයි.ජල මූලාශ්‍ර බහුතරයක් දැන් විනාශ වෙලා තිබෙන්නේ. මේකේ ප්‍රතිඵලයක් හැටියට තමයි ඒක එක කාරණයක්, අපේ ජනතාවගේ වකුගඩු විනාශ වෙලා යන්නේ. රෝහලක් හදලා සතුටු වෙන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රෝහලක් හදනවා කියන්නේ, අපිට ඇත්තටම දැනෙන්න ඕනෑ, දැනිය යුත්තේ කනගාටුවක්. නමුත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව මැදිහත් වෙලා ඒ දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළ තවත් වේගවත් කරලා, වැඩිදියුණු කරලා,වැඩි ප්‍රතිපාදන ලබා දීලා, ඔවුන්ව දිරිමත් කරන තැනකට ගේන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අවිස්සාවේල්ල මූලික රෝහලේ ගැටලුවක් තිබෙනවා. මට වේලාව මදි ප්‍රශ්නයක් තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඉක්මණින් කියලා අවසන් කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

අවිස්සාවේල්ල මූලික රෝහලේ ප්‍රශ්නයක්. මම හිතන්නේ, ඔබතුමාට කලිනුත් ඉදිරිපත් කරලා තිබෙනවා. නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමාට කියාගන්න බැරිවුණු එකක් තමයි මට දීලා තිබෙන්නේ. මේකේ සායන 20 ක් තිබෙනවා. වර්ග අඩි 1500 ක වගේ සීමා සහිත ප්‍රමාණයක තමයි විශේෂඥ වෛද්‍යවරුන්ගේ සායන කාමර පවතින්නේ. විශාල තදබදයක් තිබෙනවා. මම හිතන්නේ අවිස්සාවේල්ල රෝහලේ විශාල තදබදයක් ඒ සායන පැවැත්වීමේදී තිබෙනවා. ශල්‍යාගාරය පිහිටා තිබෙන ගොඩනැගිල්ල, වර්ග අඩි 1600 ක ගොඩනැගිල්ලක්. විශේෂඥ වෛද්‍යවරුන්ට වැඩකටයුතු කරගෙන යන්න බැරි දැඩි අපහසුතාවයක් තිබෙනවා. ඒ පිළිබඳව ඇස්තමේන්තුවක් සැකසුවා. නමුත් මේකත් මම අර කිව්ව මාතෘ සායනය වාගේම නිකම් ෆයිල්වලට සීමා වෙලා තිබෙනවා. නමුත් අවිස්සාවේල්ල රෝහලේ තිබෙන වැදගත්කම සලකා බලා අපේ ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඉතාමත් ඉක්මණින් මේ සායනවල තිබෙන පහසුකම් ටික සකසලා ඒ විශේෂඥ වෛද්‍යවරුන්ට අවශ්‍ය පහසුකම් දෙන්න කියලා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.48]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සෞඛ්‍ය ගරු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ අදහස් ස්වල්පයක් දැක්වීමට අවස්ථාව ලැබීම ගැන පළමුවෙන්ම මම සතුටු වෙනවා. අපි බෞද්ධයන් විධියට නිරන්තරයෙන්ම අපේ සිතෙහි සටහන් වෙලා තිබෙන කරුණක් තමයි, "ආරෝග්‍යා පරමාලාභා සන්තුට්ඨී පරමං ධනං" කියන එක. මේ නිරෝගී සැපත තරම් සැපතක් තවත් නැහැ. රජෙක් වුණත් වැඩක් නැහැ, ලෙඩෙක් වුණොත්. අපි මොනතරම් තාන්න මාන්න, තනතුරු, මේ මුළු ලෝකයම අත්පත් කරගත්තත් වැඩක් නැහැ, අවසාන වශයෙන් අපි ලෙඩෙක් බවට පත්වෙලා තිබෙනවා නම්. කායික වශයෙන් සහ මානසික වශයෙන්. ඒ නිසා "ආරෝග්‍යා පරමාලාභා සන්තුට්ඨී පරමං ධනං" කියන එක ගැන අද අපට නැවත නැවතත් කථා කරන්න වෙලා තිබෙන්නේ, අද අපි බොහෝ දෙනෙක් අර්ධ වශයෙන් එක්කෝ කායික රෝගීන්, එහෙම නැත්නම් මානසික රෝගීන් බවට පත්වෙලා තිබෙනවා, මේ ඇතිවෙලා තිබෙන දේශපාලන ආර්ථික ක්‍රමය ඇතුළේ. විශේෂයෙන්ම ඉතාම සංකීර්ණ සමාජ තත්ත්වයක් ගොඩනැගිලා තිබෙන්නේ. අද වන කොට මේ රටේ ඒක පුද්ගල ආදායම ඩොලර් 4000 ඉක්මවලා තිබෙනවා. ඒ කියන්නේ මැදි ආදායම් ලබන රටක්. එන්න එන්න රටේ මැද පංතිය විශාල වශයෙන් ප්‍රසාරණය වෙමින් තිබෙන්නේ. විශේෂයෙන්ම බස්නාහිර පළාත තුළ. ඒ නිසා මේ ප්‍රසාරණය වන මැද පංතිය තුළ තමයි අපි මේ කථා කරන බෝ නොවන රෝග විශාල වශයෙන් ව්‍යාප්ත වී තිබෙන්නේ. දැන් මට කලින් කථා කරපු අපේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා, ඒවාගේම අපේ උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා මේ පිළිබඳව

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

අදහස් දැක්වූවා.  අද මේ රටේ තුන් බියක් තිබෙනවා. එදා තුන් බිය තිබුණේ, විශාලා මහනුවර. එදා බුදුහාමුදුරුවෝ ඒ තුන් බිය පිටු දකින්න තමයි, රතන සූත්‍රය දේශනා කළේ. ඉතින් අපේ රතන හාමුදුරුවෝ ගැනත් අපේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. මේ රටේ තිබෙන එක බියක් තුරන් කරන්න අපේ රතන හාමුදුරුවෝ විශාල වෑයමක් දැරුවා.  නමුත් ඒවා කොතෙක් දුරට ඵල දරලා තිබෙනවාද කියන එක පිළිබඳව - (බාධා කිරීමක්) ඇත්ත වශයෙන්ම අද රජ රට ප්‍රදේශය අරගෙන බැලුවාම මේ වකුගඩු රෝගය විශාල වශයෙන් ව්‍යාප්ත වීම එකම ඛේදවාචකයක්. අපේ ගොවි පියවරු ලක්ෂයකට වැඩි සංඛ්‍යාවක් අද මේ වකුගඩු රෝගයට ගොදුරු වෙලා ඉන්නේ. (බාධා කිරීමක්) වකුගඩු රෝගය පිළිබඳ ප්‍රශ්නය අද ජාතික ආපදාවක්. ඒක අද උතුරු මැද පළාතට පමණක් සීමා වෙලා නැහැ. විශේෂයෙන්ම කියන්න ඕනෑ. අනුරාධපුර, පොළොන්නරුව, පදවි, ශ්‍රී පුර විතරයි මේ සම්බන්ධයෙන් පළමුවෙන් කථා කරන්න සිද්ධ වුණේ. අද වන විට මාතලේට ඒක පැතිරලා ඇවිල්ලා තිබෙනවා. කුරුණෑගලට පැතිරලා ඇවිල්ලා තිබෙනවා. හම්බන්තොට ලුණුගම්වෙහෙර සිට බෙලිඅත්ත, තංගල්ල දක්වා, මේ වන විට කොළඹ දිස්ත්‍රික්කයේත් මේ ප්‍රතිශතය වේගයෙන් ඉහළ යමින් තිබෙනවා. එහෙම නම් අපි බලන්න ඕනෑ, මේකට හේතුපාදක වෙලා තිබෙන කරුණු මොනවාද කියන එක.

ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් මේ පිළිබඳව විවිධ මත අදහස් පළ කරලා තිබෙනවා. ඒ පිළිබඳ වාර්තා ඉදිරිපත් කරලා තිබෙනවා. තවමත් වකුගඩු රෝගය හඳුනා නොගත් - මේ රෝගයට හේතු වන කරුණු තවමත් නිශ්චිතව identify කර ගෙන නැහැ.  කෙසේ නමුත් මේකට ප්‍රධාන වශයෙන් මේ තිබෙන කරුණු කාරණා විශාල ප්‍රමාණයක් බලපාලා තිබෙනවා. මේ රසායනික ගොවිතැන ප්‍රධාන කාරණයක්. ජල මූලාශ්‍ර සම්පූර්ණ රසායනිකරණය වෙලා තිබෙනවා. භූගත ජලය සම්පූර්ණයෙන්ම විෂ වෙලා තිබෙනවා. පොළොව විෂ වෙලා තිබෙනවා. මේ සියල්ලත් එක්ක අපේ වායු ගෝලය දූෂණය වෙලා, ජල ගෝලය දූෂණය වෙලා, අපි ජීවත් වන පරිසරය දූෂණය වෙලා, මේ සියල්ලම එකට බද්ධ වෙලා තමයි අද මේ කියන තත්ත්වයන් නිර්මාණය වෙලා තිබෙන්නේ.  මම කියන්න ගියේ, ඒ කාරණය නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.  අද වේගයෙන් වර්ධනය වන මේ මධ්‍යම පංතිය තුළ විශේෂයෙන්ම තුන් බියක් ඇති වෙලා තිබෙනවා. ඒ තුන් බිය තමයි එකක්, පිළිකාව. දෙක දියවැඩියාව. තුන හෘදයාබාධය. ඊට අමතරව, දැන් අපට දැක ගන්න ලැබෙන එකක් තමයි. දකුණු ආසියාවේ වැඩිම මානසික ආතතිය තිබෙන රට බවට පත්වෙලා තිබෙනවා. ශ්‍රීලංකාව. ඉතින් මම හිතනවා, අපි සියලු දෙනාම මේකේ ගොදුරු බවට පත් වෙලා තිබෙනවා. අපේ මන්ත්‍රීවරු, අපේ රාජ්‍ය නිලධාරීන්, අමාත්‍යාංශවල අය, අපේ දෙමව්පියන්, දරුවෝ මේ සියලු දෙනාම මේකේ ගොදුරු බවට පත් වෙලා තිබෙනවා.

එහෙමනම් සෞඛ්‍ය කියලා කථා කළාම අපි බලන්න ඕනෑ, මේ රෝහල් හදන එකවත්, රෝහල්වල වෛද්‍යවරු වැඩි කරන එකවත්, එහෙම නැත්නම් මේවායේ  තිබෙන උපකරණ වැඩි කරන එකවත් නොවෙයි. අපි බලන්න ඕනෑ සමස්තයක් විධියට කොහොමද අපේ ආර්ථික ප්‍රතිපත්ති, කෘෂිකර්ම ප්‍රතිපත්ති, අපේ ජල ප්‍රතිපත්ති, අපේ පාංශු සංරක්ෂණ ප්‍රතිපත්ති මේ සියල්ලම එකට බැඳිලා තිබෙනවා මේ සෞඛ්‍ය කියන එකත් එක්ක. ඒ නිසා මේවා එකිනෙකට වෙන් කරලා අපිට කතා කරන්න පුළුවන්කමක් නැහැ. එදා කිසාගෝතමී බුදුහාමුදුරුවෝ ළඟට ආවා. තමන්ගේ අම්මා නැති වුණා. තාත්තා නැති වුණා. ස්වාමියා නැති වුණා. දරුවෝ දෙන්නා නැති වුණා. අන්තිමට සිහිවිකල් වෙලා බුදු හාමුදුරුවන් වෙත ආවා. බුදුහාමුදුරුවෝ ගාවට ඇවිල්ලා කොපමණ ධර්මය දේශනා කළත් පළක් වුණේ නැහැ. බුදුහාමුදුරුවෝ කිව්වා, කිසාගෝතමීගේ හිත හදන්න ඕනෑ නිසා, නොමළ ගෙයකින් අබ ඇටයක් හොයාගෙන එන්න කියලා. අද අපිට කියන්න වෙලා තියෙන්නේ, දියවැඩියා රෝගියෙක්, පිළිකා රෝගියෙක්, හෘදයාබාද රෝගියෙක් නොමැති  ගෙදරක් පුළුවන් නම් හොයාගන එන්න කියන එකයි. ඒක තමයි අපිට අද සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ තත්ත්වයට අද අපේ සමාජය පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව අපේ අවධානය අපි විශේෂයෙන්ම යොමු කරන්න ඕනෑ. අපේ ආහාර රටාව, අපේ ජීවන රටාව, අපේ ආහාර සංස්කෘතිය, අපේ ආකල්පවල වෙනසක් වහාම ඇති කර ගන්න ඕනෑ වගේම අපේ කායික හා මානසික සහ ආධ්‍යාත්මික සුවය සඳහා අවශ්‍ය කරන වටපිටාව අපි කඩිනමින් නිර්මාණය කරන්න ඕනෑ.  ඒ සඳහා Jogging Track හදන එක හොඳයි.  සුවතා මංතීරු හදන එක හොඳයි. ආධ්‍යාත්මික සුවය ලබා දෙන මධ්‍යස්ථාන, කලාව, සංස්කෘතිය, සිනමාව මේ සියල්ලම බද්ධ වුණු ක්‍රියාවලියක් කරා හරහා තමයි අපේ ජනතාවගේ කායික, මානසික, සෞඛ්‍ය ඉහළ නංවන්න පුළුවන් වෙන්නේ.  ඒ නිසා

මේ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. අද බොහෝ දෙනා කථා කරනවා, අපේ සෞඛ්‍ය පිරිහිලා කියලා. නමුත් භෞතික වශයෙන් අපේ රටේ අද වන විට සෞඛ්‍ය ක්ෂේත්‍රය විශාල දියුණුවක් අත්පත් කර ගෙන තිබෙනවා. තාක්ෂණික පැත්තෙන්, පර්යේෂණාත්මක පැත්තෙන් ඉතාම දියුණු තත්ත්වයක තිබෙනවා. ඕනෑම ලෙඩක් සම්බන්ධයෙන්, මම හිතන්නේ මේ දකුණු ආසියාවේ නිදහස් සෞඛ්‍ය සේවය තිබෙන රටක් හැටියට අපි ඉතාම දියුණු තත්ත්වයක් අත්පත් කර ගෙන තිබෙනවා. ඒ නිසා අපි ඒක අවමං කරලා කතා කරන්න හොඳ නැහැ. ඒක බාල්දු කරලා, පහත් කරලා කථා කරන්න හොඳ නැහැ. ඒක තව තවත් වැඩි දියුණු කර ගත යුතුව තිබෙනවා. හැබැයි, අපි එක වෛද්‍ය ක්‍රමයක් ගැන විතරක් කතා කරලා වැඩක් නැහැ. බටහිර වෛද්‍ය ක්‍රමය ගැන, ඇලපති වෛද්‍ය ක්‍රමය ගැන විතරයි අපි ඔක්කෝම කතා කරන්නේ. හැබැයි, බටහිරින් බිහිවුණු හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ගැනත් අපි කතා කරන්නේ නැහැ. අපේ දේශීය සිංහල වෙදකම, සිංහල වෙදකම, රාවනා වෙදකම ඒවාගේම අපි කොතෙක් කතා කරන අපේ දේශීය පාරම්පරික වෙදකම් තිබෙනවා. හැබැයි ඒවා පිළිබඳව අපි කවුරුවක්වත් අවධානය යොමු කරන්නේ නැහැ. ඒවා වැඩි දියුණු කරන්න, සංවර්ධනය කරන්න, ඒවාට පිළිගැනීමක්, ගෞරවයක් ලබා දෙන්න කටයුතු කරන්නේ නැහැ. චීන කටු චිකිත්සාව තිබෙනවා.

ඒ වාගේම යුනානි වෛද්‍ය ක්‍රමය තිබෙනවා. ඒ වාගේම අපේ දෙමළ අයගේ වෛද්‍ය ක්‍රම තිබෙනවා. මේ සියල්ල අපි එකට අරගෙන, ඒකාබද්ධ කරලා මේක දියුණු කරන්න ඕනෑ. ඒ හැම එකින්ම අපේ සෞඛ්‍ය නගා සිටවන්නයි මේ සෑම වෛද්‍ය ක්‍රමයක්ම බිහි වෙලා තිබෙන්නේ. ඒ නිසා එක වෛද්‍ය ක්‍රමයක් විතරක් ඔසවා තබන ක්‍රමවේදයෙන් අපි බැහැර වෙන්න ඕනෑ. ඒකටයි ප්‍රධාන අවධානය යොමු වෙලා තිබෙන්නේ. ඒ නිසා අපේ දේශීය වෛද්‍යවරු අද විශාල වශයෙන් මානසික වශයෙන් බිඳ වැටිලා තිබෙනවා. ඔවුන්ට ගෞරවයක් නැහැ. පිළිගැනීමක් නැහැ කියලා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්න කැමැතියි. රාවනා වෙදකම වෙන්න පුළුවන්. ඒවාගේම දේශීය වෙදකම වෙන්න පුළුවන්. සිංහල වෙදකම, හෙළ වෙදකම වෙන්න පුළුවන්.මේ සෑම වෛද්‍ය ක්‍රමයකටම නිසි පිළිගැනීමක් ලබා දෙන්න ගරු සෞඛ්‍ය අමාත්‍යතුමනි, අවධානය යොමු කරන්න. ඔවුන් වර්ෂයකට වතාවක්වත් ඔවුන්ට ගෞරවයක්, සම්මානයක් ලබා දෙන්න. පිළිගැන්වීමක් ලබා දෙන්න. ඒ පාරම්පරික වෙදකම ආරක්ෂා රන ක්‍රමවේදයක්, ඒ වාගේම ඒ වෙද පොත් ආරක්ෂා කරන ක්‍රමවේදයක් අපි ආරම්භ කළ යුතුයි. ඒ පිළිබඳව මම විශේෂයෙන් අවධානය යොමු කරන්න කැමැතියි.

ඊළඟට මේ දේශීය වෙදකමට ඉතාම වැදගත් අත් බෙහෙතක් තමයි කංසා කියලා කියන්නේ. අද කංසා සම්බන්ධයෙන් මොකද්ද තිබෙන ප්‍රතිපත්තිය? අපේ තිබෙන හොඳම කංසා වගාවන් ටික විනාශ කරනවා. ගිනි තියෙනවා. ඇත්ත වශයෙන්ම තණමල්විල, හම්බේගමුව, ඒ වාගේම, උඩවලව කියන ප්‍රදේශවල තමයි මේ කලාපේ තිබෙන හොඳම කංසා වැවෙන කලාපය. හැබැයි අපි ගිහිල්ලා ඒවා සම්පූර්ණයෙන්ම ගිනිබත් කරලා, විනාශ කරලා ඉවර වෙලා, ඉන්පසුව ඉන්දියාවෙන් කේරල ගංජා ගේනවා. KG කියලා කියන්නේ. දැන් KG තමයි මුළු රටේම ගිහිල්ලා තිබෙන්නේ. කවුද මේ KG ගේන්නේ? කවුද මේවා පිටුපස ඉන්නේ? අද අරගෙන බලන්න පොලිස් වාර්තා. මන්නාරම වෙරළ තීරුවේ ඉඳලා මීගමුවේ වෙරළ තීරය දක්වා කොච්චර ප්‍රමාණයක්, මාසිකව ටොන් ගාණක් මේ රට ඇතුළට කේරලා ගංජා ගලාගෙන එනවා. මෙහේ තිබෙන හොඳම ගංජා ටික විනාශ කරලා - මම කියන්නේ නැහැ, මේක නීත්‍යානුකූල කරන්න ඕනෑය කියලා. නමුත් අපේ ආයුර්වේදයට, අපේ සිංහල වෙදකමට, අපේ දේශීය වෙදකමට අවශ්‍ය කරන කංසා ටික ගන්න මොකක් හරි ප්‍රතිපත්තියක් සකස් කරන්න. අවශ්‍ය කරන වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා ඉල්ලා සිටිනවා. මේක මහා හෙන ගහන අපරාධයක් මේ කරන්නේ. අපේ දේශීය වෙදකමේ ඉතාම වැදගත් ඖෂධයක් තමයි මේ කංසා කියලා කියන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු මන්ත්‍රීතුමා, සෞඛ්‍ය ඇමතිතුමාට කියන්න ඕක.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

සෞඛ්‍ය ඇමතිතුමා මේ සම්බන්ධයෙන් දැනටම නියමු ව්‍යාපෘතියක් විදියට ආරම්භ කරන්න යෝජනා කරලා තියෙනවා. කැබිනට් පත්‍රිකාවක් දාලා තිබෙනවා. අක්කර 100 ක වගා කරන්න. අක්කර 100 නොවෙයි. ඇත්ත
[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

වශයෙන්ම මේක ඒ ප්‍රදේශයේ සම්පූර්ණයෙන්ම ජනතාවට වෙනම කලාපයක් විධියටම මේ කටයුත්ත කරගෙන යන්න අවස්ථාව දෙන්න ඕනෑ. ඒකට ලයිසන්ස් එකක් දීලා ඒකට අවශ්‍ය කරන වැඩපිළිවෙළක් සකස් කරන්න ඕනෑ.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඒකට කියන්නේ ත්‍රෛයිලෝක පත්‍ර කියලා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ලෝක තුනකට යන්න පුළුවන්. ඉතින් ඒක නිසා මම හිතන්නේ මේ ගෙන අවධානය යොමු කරන්න කියලා මම කියන්න කැමැතියි. ඒ වාගේම විශේෂයෙන්ම මම මේ කාරණා දෙකත් එක්කම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද බස්නාහිර පළාත තුළ වේගයෙන්, මේ සම්භාහන මධ්‍යස්ථාන හතු පිපෙන්නා වාගේ බිහි වෙනවා. ඉතින් මේවා බිහිවීම පිළිබඳව මාගේ විරුද්ධත්වයක් නැහැ. සම්භාහන මධ්‍යස්ථානවලට - ඇයි සම්භාහන මධ්‍යස්ථාන ඇතිවෙන්නේ? Foot Massage කියයි. Head Massage කියයි. Body Massage කියයි. Spa කියයි. විවිධ නම්වලින් පැය 24 පුරාම කොළඹ නගරය තුළ තිබෙනවා. මේවා ලෝකේ අද ප්‍රධාන නගරවලට ගියාම අපට දැකගන්න ලැබෙන දේවල්. වියට්නාමයට ගියත්, තායිලන්තයට ගියත්, චීනයට ගියත් කොයි රටෙත් අද මේක දැක ගන්නට පුළුවන්. හැබැයි මේවායේ යම් කිසි ප්‍රමිතියක් තියෙන්නට ඕනෑ. මේවා යම් කිසි නියාමනයකට යටත් කරන්න ඕනෑ. මේවායෙන් සේවාවන් සපයන අය යම් කිසි පුහුණුවක් තියෙන අය? එහෙම නැත්නම් මේ අය සදාචාර විරෝධී කටයුතු කරනවාද? ඒක නිසා අපි කියන්නේ, බස්නාහිර පළාත තුළ විශාල වශයෙන් වර්ධනය වන මධ්‍යම පංතියේ තිබෙන මානසික ආතතිය, ඒ වාගේම ඔවුන්ගේ කායික ආතතිය මේවා කිසියම් ප්‍රමාණයකට සමනය කරන්න පුළුවන් ක්‍රමවේදයන් විධියට තමයි මේවා බිහි වෙලා තිබෙන්නේ. ඒක නිසා මේවා පිළිබඳව අපි වැරදි ආකල්පයකින් බලන්නේ නැතුව කිසියම් විධියකට මේවා නියාමනය කරන ක්‍රමවේදයක් සකස් කරන්න අවශ්‍යයි. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. අවශ්‍ය නම්, ඒ සඳහා ප්‍රඥප්ති සකස් කරලා හරි, අලුත් නීති රීති ගෙනල්ලා හරි. ඒ වාගේම, සම්භාහන කටයුතුවල නිරතවන කාන්තාවන් හෝ පිරිමින් ඉන්නවා. මේ අයට පුහුණුවක් ලබා දෙන්නට ඕනෑ. හොඳ පුහුණුවක් ලබා දෙන්න ඕනෑ. ඒ සඳහා පුහුණු පාසලක් ආරම්භ කරන්නට ඕනෑ. ඒකයි අවශ්‍ය කරන්නේ. එහෙම නැත්නම් මේක සම්පූර්ණ ව්‍යාජ බොරු වැඩ පිළිවෙළක් විතරක් නොවෙයි. සම්පූර්ණයෙන්ම මේවා ඇතුළේ අපි කතා කරන සදාචාර විරෝධී දේවල් සිද්ධ වෙන්න පුළුවන්. ඒ නිසා මේකට යම් කිසි ප්‍රමිතියක් ඇති කළ යුතුයි කියන එකත් මම මේ අවස්ථාවේදී අපේ සෞඛ්‍ය අමාත්‍යතුමාගේ මේ වැය ශීර්ෂයේ දී අවධාරණය කරන්නට කැමැතියි.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම කියන්න කැමැතියි. අපි සියලුදෙනාම පිළිගන්න දෙයක් තමයි බෞද්ධයෝ විධියට සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍යයි. අපි සියලු දෙනාම මැරනවා. හැබැයි, අපි කැමැතියි පුළුවන් තරම් දීර්ඝ කාලයක් දීර්ඝායුෂ විඳින්න. ඒ දීර්ඝායුෂ විඳිනවා කියලා කියන්නේ, සතුටින් ජීවත් වෙන්න අපට අවශ්‍යයි. සතුටින් ජීවත්වන්න අවශ්‍ය කරන පරිසරයක් අපි නිර්මාණය කරගන්න ඕනෑ. එහෙමනම් බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශයට, විශේෂ වගකීමක් කාර්ය භාරයක් පැවරෙනවා. පහුගිය කාලය තුළ මේ සභාවේ අදහසක් පළ වුණා. ඇත්ත වශයෙන්ම මම අරගෙන බැලුවා, වාර්තා කොහොමද කියලා. අපට වාර්ෂිකව මිලියන 350 ක් වැය වෙනවා, මේ අයාලේ යන සුනඛයින් හපාකෑම නිසා අපේ ජනතාවට ප්‍රතිකාර කරන්න. ජල භීතිකා රෝගයෙන් පහුගිය කාලයේදී මිය ගිය සංඛ්‍යාව 28 ක්. සම්පූර්ණ හපාකාපු ප්‍රමාණය අරගෙන බැලුවාම, බල්ලෝ හපා කාපු ප්‍රමාණය අසූපන්දහසක් පැනලා තියෙනවා. එහෙම නම් මේ අයාලේ යන බල්ලෝ නිසා අද අපට ජාතික ධනයෙන් මිලියන 350 ක් වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. බලන්න මොනතරම් විශාල මුදලක් කියලා. ජීවිත 28 ක් පහුගිය වසරේ බිලි අරගෙන තිබෙනවා, මේ අයාලේ යන සුනඛයින්. හැබැයි, සත්ව අවිහිංසාවාදී සංවිධාන, සත්ව කරුණාව ගැන කථා කරන, සත්ව අයිතිවාසිකම් ගෙන කථා කරන සංවිධාන මේවා ගැන මොනවාද කියන්නේ? අද මේ අයාලේ යන බල්ලෝ අයින් කරන්න දෙන්නේ නැහැ. අයාලේ යන ගවයෝ අයින් කරන්න දෙන්නේ නැහැ. ඒවාගේම මේ නිසා වන මෝටර් බයිසිකල් අනතුරු, රිය අනතුරු විශාල ප්‍රමාණයක් සිද්ධ වෙනවා. මේවා අවසාන වශයෙන් අපේ සෞඛ්‍ය වැය ශීර්ෂටයි බැර වෙන්නේ. සෞඛ්‍ය පිරිවැයයි මේකට කැප කරන්න වෙලා තිබෙන්නේ.

ඒ නිසා පැහැදිලිවම කියන්නට ඕනෑ. මේ සම්බන්ධයෙන් යම් ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතුව තිබෙනවා. මේවා විවෘතව අද සාකච්ඡා කරන්න ගියාම සමහරු භයයි.

සමහර ආගමික මතවාද, අවිද්‍යාත්මක මතවාද මිත්‍යාමතවාද නිසා අපේ දරුවෝ පවා අද මන්ද පෝෂිත තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ඔවුන්ගේ සෞඛ්‍ය අද දුර්වල වෙලා තිබෙනවා. සමහරු කියනවා මස් කන්න එපා. මාළු කන්න එපා. බිත්තර කන්න එපා. මේ ශරීරයේ වර්ධනයට, මොළයේ වර්ධනයට තිබෙන හොඳම ප්‍රෝටීන් ටික ආහාරයට ගන්න එපා කියලා කියනවා. එහෙම වැඩසටහනක් පසුගිය කාලයේ පාසල් පුරා ක්‍රියාත්මක වුණා. මේ කියන සත්ව අවිහිංසාවාදි සංවිධාන, මහා කරුණාව ගැන කථා කරන සංවිධාන, ඒවාගේම සත්ව අයිතිවාසිකම් සංවිධාන. මට මතකයි එක තැනකදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ නඩුවක් පැවරුවා, ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා. මොකද්ද අධිකරණයට පවරපු නඩුව? එක අවස්ථාවකදී බස්නාහිර පළාතේ පාසල්වල අවසර දුන්නා, මේ සත්ව අවිහිංසාවාදී සංවිධානයකට ගිහිල්ලා මේ දරුවෝ දැනුවත් කරන්න. මේ දරුවන්ට ගිහිල්ලා කිව්වා, මස් කන්න එපා, මාළු කන්න එපා කියලා. ඒ පොඩි දරුවන් ඊළඟට ඇහුවා, ඒ දේශන පවත්වන මහත්මයාගෙන් ඇහුවා, මේ මුහුදේ ඉන්න හාල්මැස්සෝ වුණත් ආහාරයට ගන්න එක සුදුසු ද කියලා. එතකොට කිව්වා, සමහරවිට මේ අය ඔයගොල්ලන්ගේ පෙර ආත්මයේ සහෝදරයා වෙන්න පුළුවන් කියලා. අනේ, මේ දරුවෝ ගෙවල්වල ගිහිල්ලා මේවා කිව්වා. අපි නම් අම්මේ තාත්තේ තවත් නම් මේවා කන්නේ නැහැ. හාල්මැස්සෝ කන්නත් බැහැ. මාළු කන්නත් බැහැ. මස් කන්නත් බැහැ. බිත්තර කන්නත් බැහැ. අන්තිමට මේක මොන තරම් අපේ දරුවන්ගේ සෞඛ්‍යයට බලපානවාද කියලා මේ අය බැලුවේ නැහැ. අවසානයේ මට මතකයි පබා පළිහවඩන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉන්න නිලධාරීතුමිය, එවකට හිටපු ප්‍රධානීන්. එතුමිය ගිහිල්ලා උසාවියෙන් නඩුවක් දාලා සම්පූර්ණ මේ වැඩසටහන නතර කළා. මෙන්න මේ වාගේ මිත්‍යා මත අපේ සමාජය තුළ පතුරවන කණ්ඩායම් ඉන්නවා. අවිද්‍යාත්මක මත පතුරුවන කණ්ඩායම් ඉන්නවා. ඒ නිසා අපේ දරුවන්ගේ සෞඛ්‍ය පිරිහෙනවා. අද ප්‍රෝටීන් ඌණතාවයක් තිබෙනවා. කැල්සියම් ඌණතාවයක් තිබෙනවා. අපේ දරුවන්ට මීටර් 100 ක් දුවා ගන්න බැහැ. කකුල් දෙක පණ නැතුව වැටෙනවා. පපුව පැළිලා මැරෙනවා. ඇයි ? මේ ප්‍රෝටීන් ඌණතාවය - අද ලෝකයේ හැම රටකම, ඒ රටේ ජාතියේ දියුණුව තිබෙන්නේ, මේ Brain එක ශක්තිමත්ව තියෙනවා නම්. අස්ථි පද්ධතිය ශක්තිමත්ව තිබෙනවා නම්. එහෙනම් අපේ දරුවන්ට අද දෙන අවිද්‍යාත්මක මත නිසා අද මොකද වෙලා තිබෙන්නේ? අපේ දරුවෝ මේවා පිටුපස ගිහිල්ලා අද සම්පූර්ණයෙන්ම ඔවුන් ශාරීරික වශයෙන්, මානසික වශයෙන් දුර්වල වෙමින් තිබෙනවා. ඒ නිසා මෙන්න මේවා පිළිබඳ අවධානය යොමු කරන්න. මේ විසි එක්වැනි සිය වස, අවිද්‍යාත්මක මත, ඒවාගේම මිත්‍යා මත, ආගමික මත පතුරවලා සෞඛ්‍ය සහ විද්‍යාව කියන එක බොරු කරන්න ලෑස්ති වෙන්න එපා. ඒක විද්‍යාත්මක පදනමක් මත යන්නේ. ඒ නිසා මාගේ ගෞරවයක් තිබෙනවා, ආගමට. ඒ ආගමට, සංස්කෘතියට ඒවාට තිබෙන වටිනාකම අපි පිළිගන්න ඕනෑ. නමුත්, මේවාගේ බොරු මත අපේ සමාජය තුළ තහවුරු කරන්න අපි ඉඩ දිය යුතු නැහැ කියන එක ප්‍රකාශ කරමින්, අපේ සෞඛ්‍ය අමාත්‍යතුමාගේ කාර්ය භාරය පිළිබඳව මම හිතන්නේ අපේ මන්ත්‍රීවරු කථා කළා. එතුමා මේ සභාවේ ඉන්න පරණ ඇමැතිවරයෙක්. ඒ වාගේම ජ්‍යෝෂ්ට දේශපාලඥයෙක්. එතුමාගේ මේ කටයුතු සර්ව ප්‍රකාරයෙන් සාර්ථක වේවා කියමින්, එතුමාගේ නිලධාරි මණ්ඩලය ඉතා දක්ෂ කාර්යක්ෂම පිරිසක්. ඉදිරි වර්ෂයේ දී විශේෂයෙන්ම බස්නාහිර පළාතේ සෞඛ්‍ය ක්ෂේත්‍රය නගාසිටුවන්න, ජනතාවගේ සෞඛ්‍ය නගාසිටුවන්න, ඒ සියලු දෙනාටම ශක්තිය ධෛර්ය ප්‍රාර්ථනා කරමින් සුබායු දීඝායු කියමින් මාගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 04.06]

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව විනාඩි 10 ක් කථා කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා. බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය පසුගිය වර්ෂ කිහිපයක් තුළ මේ පළාත් සභාවේ ජනතාවට තමන්ගේ අයවැය ලේඛනය හරහා විශාල කාර්ය භාරයක් සිදු කරලා, 2018 වර්ෂයේදීත් අමාත්‍යතුමා බලාපොරොත්තු වූ ආකාරයට මේ පළාතේ හොඳ සෞඛ්‍ය සම්පන්න පිරිසක් බිහිකරන්නට ඔබතුමාගේ උත්සාහය අනුව, මෙවර මුදල් ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්

[ගරු මංජුල ප්‍රසන්න සම්පත්]

කරලා තියෙනවා කියලා, මේක බැලුවහම පේනවා. විශේෂයෙන්ම ගරු අමාත්‍යතුමනි, බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය කියන්නේ - අපේ ඕනෑම කෙනෙකුගේ බලාපොරොත්තුව දවස හොඳින් ගෙවන්නයි. තමන්ගේ ජීවිත කාලය තියෙන තාක් පුරා කිසිඳු රෝග පීඩාවකින් තොරව මේ සමාජයේ හොඳින් ජීවත්වීම තමා මිනිසාගේ අරමුණ, පරමාර්ථය වන්නේ. ඒ පරමාර්ථය අත්පත් කරගැනීමට ඔබතුමාට විශාල කාර්ය භාරයක් තිබෙනවා. මේ රටේ පවතින ප්‍රධානම පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යවරයා වීම සහ තවත් අමාත්‍යාංශ කිහිපයක ප්‍රධාන බලධාරියා වශයෙන් ඔබතුමා පසුගිය වර්ෂ කිහිපයක් තුළදී ගත් උත්සහයට අපි ප්‍රශංසනය ස්තුතිය පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ප්‍රධානම දේ තමයි මළ ගෙවල්වලට ගියාම - අපි සාමාන්‍යයෙන් දවසකට මළගෙවල් පහකට හයකට යනවා. ගියාට පස්සේ ඒ මනුස්සයා මැරිලා තියෙන රෝගය බැලුවාම එක්කෝ හෘදයාබාධය. එක්කෝ පිළිකාව. එක්කෝ වකුගඩු. මේවා කල් තියා හඳුනාගන්න පුළුවන් රෝග. ගරු අමාත්‍යතුමනි. මේවට දීර්ඝ කාලීන විසඳුමක් කථා කරලා, මම හිතන්නේ මේවා කෙටි කාලීන රෝග නොවෙයි. මේවාට ඉතාමත්ම ක්‍රමානුකූලව වැඩ පිළිවෙළක් සකස් කර ගත්තොත්, මේ රටේ තිබෙන ප්‍රධාන රෝග තුන තුළින් සිදු වන අපේ මරණ විශාල වශයෙන් අඩු කරගන්න පුළුවන්. ඒ පිළිබඳව ඔබතුමා විශේෂ අවධානය යොමු කරලා මේවාට දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් සකස් කරගන්න කියලා මම ඉතාමත්ම උවමනාවෙන් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ එක්කම විශේෂයෙන්ම රෝහල් පද්ධතිය, මම නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ රෝහල, බියගම ග්‍රාමීය රෝහල, දොම්පේ ප්‍රාදේශීය රෝහල, උඩුපිල ප්‍රාදේශීය රෝහල මේ රෝහල්වල විශාල අඩුපාඩු තිබුණත්, මේ රෝහල්වලින් ප්‍රදේශයේ ජනතාවට සුවිශාල කාර්ය භාරයක් කරනවා. මේ රෝහල්වල විවිධ සේවකයින්ගේ, මේ රෝහල්වල ගොඩනැගිලිවල, මේ රෝහල්වල අනිකුත් දේවල්වල අඩුපාඩු තිබුණත්, මම හිතනවා, මෙම රෝහල්වලින් විශාල කාර්ය භාරයක් කරනවා අමාත්‍යතුමනි. විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ තමයි මේ රටේ ඉන්න වැඩිම ජනගහනයක් ජීවත් වෙන්නේ. කොළඹ දිස්ත්‍රික්කයටත් වඩා. ඒ ගම්පහ දිස්ත්‍රික්කයේ රෝහල් පද්ධතිය ගත්තාම, ගම්පහ ප්‍රාදේශීය රෝහල තමයි පළාත් සභාවට තිබෙන ලොකුම සම්පත. ඉතින් මේ රෝහලෙන් තිබෙන ගොඩනැගිලිවලින් විශාල කාර්ය භාරයක් වෙනවා කියලා මම හිතන්නේ අපට කියන්නට බැහැ. මේ රෝහලේ විශාල විශයෙන්ම ගොඩනැගිලි පහසුකම් තිබෙනවා. වෛද්‍යවරු පහසුකම් තිබෙනවා. ඉතින් මේ රෝහල විධිමත් කරලා, මේ රෝහලේ ක්‍රමානුකූලව සැලැස්මක් සකස් කරලා ගම්පහ රෝහල විධිමත් තත්ත්වයකට ගේන්නට ඕනෑ. අපි දැක්කා පහුගිය කාලයේ ඒ රෝහල අලුතින් හැදුවට පස්සේ, ගම්පහ මහ රෝහලේ Slab එකෙන් වතුර බේරෙනවා. දැන් නම් ඒක හැදුවා කියලා ආරංචියක් අවා. ගම්පහ මහ රෝහල. ඒ වාගේම සමහර ගොඩනැගිලි ඉදිකිරීමේදී මම හිතන්නේ, ඉංජිනේරු වාර්තා ලබා ගැනීම පිළිබඳව දැඩි අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම ඔබතුමා ළඟදී බියගම රෝහලට ආවා. අපි ස්තුති කරනවා. මම හිතන්නේ බියගම රෝහලෙත් විශාල වශයෙන් අඩුපාඩු රාශියක් තිබ්බත් ඒක ඔබතුමාගේ මැදිහත්වීමෙන් යම් කිසි ප්‍රමාණයකට විසඳුවා. තව තිබෙනවා, මෘත ශරීරාගාරයක් දැන් හදනවා. ඒ රෝහලේ තව අඩුපාඩු තිබෙනවා. Ambulance එකක් නැහැ. පරණ Ambulance එකක් තියෙන්නේ. වෛද්‍යතුමා ඉල්ලීමක් කරලා තිබෙනවා, අලුත් Ambulance එකක් දැන්න කියලා. 2018 වර්ෂයේදී බියගම රෝහලේ තිබෙන අඩුපාඩු ටික ඔබතුමාගේ මාර්ගයෙන් හැකි ඉක්මනින් විසඳලා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ එක්කම දොම්පේ ප්‍රාදේශීය රෝහල, උඩුපිල ප්‍රාදේශීය රෝහල ඒවාගේම අපේ ගම්වල තිබෙන ගමට අයිති ප්‍රාදේශීය රෝහල් ටිකේ අඩුපාඩු ටික විසඳලා, ඒකට අවශ්‍ය කරන උපකරණ ලබා දෙන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු අමාත්‍යතුමනි, එම රෝහලවලට අමතරව ඔබතුමාගේ ප්‍රධාන කටයුත්ත තමයි, කාන්තා කටයුතු. මේ කාන්තාව තමයි නිවසේ ප්‍රධානියා. මේ කාන්තාවන් ගෙදර ප්‍රධානියා වුණාට රාත්‍රි යාමේදී මේ කාන්තාව විශාල වශයෙන් කාර්ය භාරයක් කරනවා. මේ කාන්තාව තමන් නින්දට යන්න කළින් සමහර ගෙවල්වල ගරු අමාත්‍යතුමනි, රූපවාහිනි යන්ත්‍ර තමා තියෙන්නේ. ඒකේ සෑම නාට්‍යයක්ම බලනවා. සමහර නාට්‍යයවල සමාජයේ විෂ බීජ වපුරන, මේ සමාජයේ පවුල් සංස්ථාව දෙදරවන නාට්‍ය ප්‍රදර්ශනය කරනවා. අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමාට පුළුවන් නම්

මධ්‍යම ආණ්ඩුව සමඟ සාකච්ඡා කරලා, අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කරලා, මේ නාට්‍ය බලනකොට කුඩා දරුවන් වාඩිවෙලා ඉන්නවා අම්මා ළඟ. කුඩා දරුවනුත් ඒ වචන පුරුදු වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම ඔබතුමා කාන්තා කටයුතු හා ළමාරක්ෂක අමාත්‍යවරයා වශයෙන් - අපේ රටේ රූපවාහිනී ආවාට පසුව හොඳ දේවල් සහ නරක දේවල් දෙකම සිද්ධ වුණා. මේ රාත්‍රියට යන නාට්‍යවලින් විශාල වශයෙන් මේ සමාජය පිරිහීමක් වෙනවා. අනික බාල වයස් දරුවන්. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. කුඩා දරුවන් සහ දෙමව්පියන් අතර තිබෙන මෙම සම්බන්ධතාවය අපේ රටේ සංස්කෘතියට විශාල ශක්තියක් වුණා. දැන් රූපවාහිනී ආවාට පසුව, සීඩී තැටි ආවාට පසුව මේ සමාජය ඉතාමත්ම ඉක්මණින් පිරිහීමක් වුණා. මම ඕකට එක හේතුවක් දකිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම උසාවි කිහිපයකට ගියා. මගේ එකකට නොවෙයි. ඒ උසාවිවල ගොඩාක් තිබෙන්නේ දික්කසාද නඩු. අවුරුද්දකට විවාහ වන ජෝඩුවලින් 60% කට ආසන්න ප්‍රමාණයක් දික්කසාද සම්බන්ධයෙන් උසාවිවලට යනවා. මේ විවාහය සම්බන්ධයෙන් කිසි අවබෝධයක් නැතුව විවාහ වෙලා, අන්තිමට වෙන්නේ දරුවන් ඉපදිලා සමහරුන් දරුවන්වත් කාණුවට දානවා. ඉතින් ඔබතුමා විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය මෙන්ම කාන්තා කටයුතු භාර අමාත්‍යවරයා වශයෙන් මේ රටේ ඇත්තටම පිරිහීමක් වෙලා තිබෙනවා. මේ පිරිහීමට කාන්තාවන් සම්බන්ධ මොකක්හරි වැඩ පිළිවෙළක්,

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

උපදේශන වැඩසටහනක්.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

උපදේශන වැඩ සටහනක්. අපි දකින්නේ සමහර අවස්ථාවලදී කාන්තාවන්ට මැෂින්ම දෙනවා. මැෂින් දීලා හරියන්නේ නැහැ. අපි ස්වයං රැකියා කේක් පාඨමාලා කරනවා. එක එක පාඨමාලා කරනවා. මේක මම හිතනවා ප්‍රායෝගික නැහැ. අපි මන්ත්‍රීවරයෙක් වශයෙන් පාඨමාලාව සඳහා විසිපන්දහසක් වෙන් කරනවා. ඒක මම හිතනවා එතරම්ම ප්‍රායෝගික නැහැ. නමුත් මේකට කාන්තාවන්ට පැහැදිලි වැඩපිළිවෙළක්, සමහර කාන්තාවන් හැමදාම ඉල්ලන්නේ මැෂින් එක විතරයි. ඒකෙන් ප්‍රයෝජන ගන්නෙත් නැහැ. ඒනිසා ඔබතුමා හරහා ඉල්ලීමක් කරනවා. කාන්තාවන්ට පැහැදිලි විවාහය සම්බන්ධයෙන් යම් කිසි දැනුමක් ලබලා දෙන්න මොකක් හරි ක්‍රමයකින් ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා වැඩ පිළිවෙළක් සකස් කරන්න. නැත්නම් තව අවුරුදු දහයක් පහළොවක් යන කොට විශාල වශයෙන් මේ රටේ සමාජය පිරිහෙනවා. එදා ඉඳන්ම කථා කළා මේ සභාවේ.

අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ සම්භාහන මධ්‍යස්ථාන. මම දැන් බියගම සිට මෙතැන්ට එන කොට බත්තරමුල්ල හන්දියේ සිට සාමාන්‍යයෙන් ගණන් කරගෙන එන්නේ 62 ක් තිබෙනවා. ලස්සනට පිංතූර දාලා, පාර දෙපැත්තේ ලස්සනට පේනවා. මේවායේ ඉන්නේ කිසිදු ආයුර්වේද සහතිකයක් නැති, කිසි ප්‍රමිතියක් නැති අය. මේවා කරන්නේ මේ රටේ මහා පරිමාණ ව්‍යාපාරිකයෝ දෙන්නෙක් තුන්දෙනෙක්. කොළඹ දිස්ත්‍රික්කයේ ඉන්න මහා පරිමාණ ව්‍යාපාරිකයෝ දෙන්නෙක් තුන්දෙනෙක්. මගේ මැතිවරණ කොට්ඨාශයේ එක්කෙනෙක් දාලා තිබෙනවා හතක්. ඒවාට පළාත් පාලන ආයතනයෙන් අවසර දෙනවා. මම කිව්වේ ප්‍රධාන පාරේ. ඊට ඇතුළට වෙන්න තව ගොඩාක් තිබෙනවා. මේවා හින්දා විශාල වශයෙන්ම පවුල් ජීවිත නාස්ති වෙනවා. සමහර අවස්ථාවල මම දැක්කා, විවාහ වෙලා විවාහය කැඩෙනවා. විවාහ කැඩුනට පස්සේ ඒ කාන්තාවට ජීවත් වෙන්න බැහැ. ඒ කාන්තාවන් යනවා සම්බාහන මධ්‍යස්ථානවලට. එතකොට තමන්ගේ දරුවන් සහ මුළු සමාජයත් පිරිහෙනවා. ඔබතුමන්ලා සහ අපි දේශපාලඥයෝ වශයෙන් මේවාට පත් වෙලා ඇවිත් ඉන්නේ ජනතාව වෙනුවෙන් කථා කරන්න. මම ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලීමක් කළා. මෙම පළාත් සභාවේදී සෑම රැස්වීමකදීම කියනවා, මේ සම්බාහන මධ්‍යස්ථානය සම්බන්ධයෙන් මේ සමාජය විශාල වශයෙන් පිරිහීමක් තිබෙනවා. මේකට ඔබතුමා මැදිහත් වෙලා, මේකට ක්‍රමයක්, එක්කෝ අදාළ කරන සහතික තිබෙනවා නම් කමක් නැහැ. අදාළ කරන වෛද්‍යවරු එතැන ඉන්නවා නම් කමක් නැහැ. ඒ සඳහා විශාල වැඩසටහනක් සකස් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඊත් එක්කම පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන. අපේ රජයේ රෝහල් දියුණු කරනවා වාගේම අපි පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානවල දවසින් දවස මේක බිහි වෙනවා. [ගරු මංජුල ප්‍රසන්න සම්පත්]

මම කියන්න යන්නේ නැහැ - විවෘත ආර්ථිකයක් එක්ක මේක තිබෙනවා. නමුත් සමහර තැන්වල සුදුසුකම් නැති වෛද්‍යවරු ඉන්නවා. සමහරු වෛද්‍යවරු සාමාන්‍යයෙන් කාමර කෑල්ලක් ගහගන්නවා බ්ලොක් ගල්වලින්, ෆෑන් එකක් දාගන්නවා, එතැන ගහනවා වෛද්‍යවරයා කියලා. එන මිනිස්සුන්ට වැසිකිළියක්වත් නැහැ. පහසුකමක් නැහැ. මොකුත් නැහැ. උඩ තට්ටුව බැලුවහම ඒකේ මකුලු දැල් බැඳෙනවා. ෆෑන් එක කැරකුවහම මකුලුදැල් ටික කැරකිලා ඔළුව උඩට වැටෙනවා. මම ඕක ප්‍රායෝගිකව අත්වින්දා. ඔබතුමා මාර්ගයෙන් මම ඉල්ලීමක් කරනවා. මේ පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන හරියාකාර නියාමනයක් කරන්න. මේකට අවශ්‍ය කරන නීතිය තදින් ක්‍රියාත්මක කරන්න. සමහර තැන්වල තිබෙනවා, ගබ්සා මධ්‍යස්ථාන. වෛද්‍යවරු ඉන්න තැන්වල. මේවා සම්පූර්ණයෙන්ම නීති විරෝධියි. මම හිතනවා සෞඛ්‍ය අමාත්‍යවරයා වශයෙන් ඔබතුමා මැදිහත් වෙලා මේකට හැකි ඉක්මණින් අවශ්‍ය කරන කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඊත් එක්කම ළමා අපචාර. දවසකට ළමා අපචාර වාර්තා වෙන ඒවා 10 යි. වාර්තා නොවෙන විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ ළමා අපචාර පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ඊත් එක්කම මම ඔබතුමාට චෝදනාවක් නොවෙයි කරන්නේ. මම පහුගිය කාල සීමාව තුළ ඔබතුමාගෙන් ඉල්ලීමක් ඉල්ලුවා. මගේ ආසනයේ තිබෙනවා, විහාර මහාදේවි ළමා නිවාසය. මේ ළමා නිවාසේ කාන්තා දරුවන් 80 දෙනෙක් ඉන්නවා. ඒ කියන්නේ අම්මලා තාත්තලා නැති පොඩි ළමයි ඉඳන් අවුරුදු එකහමාර සිට අවුරුදු 16 දක්වා ළමයි ඉන්නවා. කාන්තාවන් ඉන්නේ. මේ ළමා නිවාසය දීර්ඝ කාලීනව පවත්වාගෙන යන ළමා නිවාසයක්. මේ ළමා නිවාසයේ ඇත්තටම තාප්පයක් ගහලා තිබෙනවා. මේ තාප්පයේ ගරු අමාත්‍යතුමනි, කොටසක් තිබෙනවා තාප්ප ගහලා නැහැ. ඉතින් ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා. දැන් අවුරුදු දෙකක් ආසන්නයි. ඔබතුමා දෙනවා කියලා කිව්වා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ තාප්පය නිසා මෙම ළමා නිවාසය රැට දැඩි ලෙස ලොකු ලොකු තර්ජන තිබෙනවා. ඒ නිසා ඔබතුමා මැදිහත්වෙලා මේ ළමා නිවාසයේ තාප්පය ඔබතුමා හරහා ඉදි කරලා දෙන්න. ඔබතුමා හරහා ඒ තාප්පය ඉදි කරලා දෙනවා නම් ඒක විශාල ශක්තියක්. විශාල ආරක්ෂාවක්. මාකොළ තිබෙනවා, සහතික කළ පාසලක්. මේ පසලට මේ රටේ දරුණුම අපරාධ කරන කුඩා ළමයි එක්කන් එනවා. ඉතින් මේක අක්කර පහකට වඩා විශාල භූමියක්. මම දැක්කා මේකේ ලේඛනයක් තිබෙනවා. පරිගණක පාඨමාලා, වඩු වැඩ පාඨමාලා, හැබැයි, ප්‍රායෝගිකව නම් මේක වෙනවාද කියලා මම දන්නේ නැහැ. ඉතින් මේක මාකොළ තිබෙන පරිවාස මධ්‍යස්ථානය මීට වඩා යම් කිසි, මම හිතන්නේ පළාත්ව සභා මැදිහත් වෙලා යම් කිසි විධියකට පාලනයක් කරලා මේකෙන් වන සේවාව විශාල වශයෙන් ඉටු කරන්න පුළුවන් කටයුත්තක් තිබෙනවා. අක්කර පහක ලොකු ක්‍රීඩා පිටියක් තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව අවධානය යොමු කරලා මාකොළ සහතික කළ පාසලටත් ඒ අවශ්‍ය කරන පහසුකම් දීලා, ඒ ජනතාවට සහ ඒ ප්‍රදේශයට උචිතාකාරයෙන් මේක සකස් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

මේ පළාත් සභාවේ මම හිතන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය කථා කරන කොට ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. පෙරසල්වල අපේ කුඩා දූවා දරුවෝ. මම දැක්කා මේ වාර්තාවේ තිබෙනවා පෙරපාසල්වලට කිරි වීදුරු දුන්නා කියලා. ඔක්කෝම පෙරපාසල්වලට නොවෙයි. ගම්වල යම් කිසි මට්ටමක දුප්පත් පෙරපාසල්වලට ඔබතුමාට ඒක දෙන්න පුළුවන් නම් ඉතාමත්ම හොඳයි කියලා මම ඉල්ලීමක් කරනවා. ඊත් එක්කම ගරු ඇමැතිතුමනි, අපි කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රධාන ජාතික රෝහල, කොළඹ ජාතික රෝහල. අපි මේ වන කොට දැනට ගම්පහ දිස්ත්‍රික්කයේ පවතින ප්‍රධානම රෝහල, කොළඹ ජාතික රෝහලට පස්සේ ලංකාවේ තිබෙන විශාලම රෝහල අපේ බියගම ඉදිකරන්න දැන් මූලික සාකච්ඡා කරලා දැන් ඉඩම් අත්පත් කර ගෙන යනවා. අපි සියඹලාපේ හංදියේ අක්කර 08 ක ඉඩමක් අරගෙන මම හිතන්නේ ඒක තමයි මේ කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන ජාතික රෝහලට පස්සේ ලංකාවේ ඉදිවන දෙවන ලොකුම රෝහල. ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමත්, මාගේ ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය රුවන් විජේවර්ධන මැතිතුමාගේ මූලිකත්වයෙන් සියඹලාපේ හංදියේ අක්කර 08 ක භූමි භාගයක් ඉදි කරලා මේ වන කොට දේශීය සහ විදේශීය කියලා මම හිතන්නේ දෙකකට බෙදලා ජපානයෙන් ආධාර අරගෙන මේ රෝහල ඉදි කරන්න ඉඩම් අත්පත් කරගෙන මේ වන කොට ඒක අග්‍රාමාත්‍ය කාර්යාලය හරහා වෙනම කමිටුවක් පත් කරලා, මේ රෝහල ඉදි කිරීමට මූලික සාකච්ඡාව කරගෙන යනවා. ඒ නිසා අපි පළාත් සභාවේදී ඔබතුමාට මතක් කරනවා. අපේ

අග්‍රාමාත්‍යතුමාටත් කිව්වා, ඔබතුමාගේත් සහයෝගය අරගෙන මේ රෝහල 2018 වර්ෂයේදී අපි මුල් කාලසීමාව තුළදී මුල් ගල් තිබෙනවා. මේ රෝහල ඉදි කරලා ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට ජාතික මට්ටමේ රෝහලක් නැහැ. ඒ සඳහාත් ඔබතුමාට බස්නාහිර පළාත් සභාව හරහා දෙන්න පුළුවන් උපරිම ශක්තිය, සහයෝගය ලබා දෙන්න කියලා මේ අවස්ථාවේදී ගෞරවයෙන් මතක් කරමින්, 2018 බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙනුවෙන් කථා කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුති කරමින්, සෞඛ්‍ය අමාත්‍යාංශයට සුභපතමින් මම නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. Sirikamal Filician de Silva M.P.C] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 04.20]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධනය පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙන්න මුලින්ම කැමැති වෙනවා. ඒවාගේම අපි ඉතාමත්ම සතුටු වෙනවා. අපේ අමාත්‍යතුමා, කළුතර දිස්ත්‍රික්කයේ මම නියෝජනය කරන දිස්ත්‍රික්කයේම ජ්‍යෙෂ්ඨ දේශපාලඥයෙක් හැටියට එතුමා සෞඛ්‍ය අමාත්‍යාංශයේ කටයුතු මෙහෙයවමින්, අප ප්‍රදේශවලට විශාල සේවාවක් කරන්න මේ අවස්ථාව වන කොට කටයුතු කරමින් ඉන්නවා කියන එක, විශේෂයෙන්ම අපිට සතුටට කරුණක් වෙනවායි කියන එක සිහිපත් කරන්නට ඕනෑ. ඒවාගේම මහජන නියෝජිතයන් හැටියට ප්‍රදේශයේ සෞඛ්‍ය ගැටලුවලදී එතුමා අපිට සෑම කටයුත්තකටම සහයෝගය ලබා දෙමින්, අනුග්‍රහය ලබා දෙමින්, එතුමා වාගේම එතුමාගේ කාර්ය මණ්ඩලය, ඒවාගේම අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු ඒ නිලධාරීන් විශේෂයෙන්ම සැලසුම් අංශයේ නිලධාරී මහත්ම මහත්මීන්, ඒ සියලු දෙනාගේ සහයෝගය අපේ කටයුතුවලදී අපට නිරන්තරයෙන් ලැබෙනවා කියන එකත්, මේ අවස්ථාවේ සඳහන් කරන්නට ඕනෑ.

සෞඛ්‍ය විෂයය දිහා ගත්තාම අපි කලින් කථා කළා වගේ අධ්‍යාපන විෂයයට පමණක් දෙවෙනි වනවා කියලා කල්පනා කරන අපට, පළාත තුළ තිබෙන වැදගත්ම සේවාවන් ඉෂ්ට කරන අංශයක් හැටියටයි සෞඛ්‍ය අංශයෙන් අපි බලාපොරොත්තු වෙන්නේ. සෞඛ්‍ය පිළිබඳව පවතින ගැටළු අඩුපාඩුකම් ඒවා දියුණු කරන්නේ කොහොමද කියන කාරණා ගැන දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් වුණු නිසා ඒ පිළිබඳව නැවත නැවත කරුණු ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වුණේ නැතත්, යම් අදහසක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. අද ජනතාව අතරේ තිබෙන මූලිකම ගැටළුවක් බවට පත්වෙලා තිබෙන්නේ බෝ නොවන රෝග නිසා ඇති වන ආබාධයන් තමයි අපට මුහුණ දෙන්න තිබෙන ගැටළුවක් බවට පත් වෙන්නේ. අර බොහෝ ගරු මන්ත්‍රීවරුන් කිව්වා වාගේ අපේ මළ ගෙදරකට ගියොත් එහෙම අඩු වයස කෙනෙක් මිය ගිහින් ඉන්නකොට අපි ඇහුවාම මොකද වුණේ කියලා, හැමෝම කියන්නේ එක්කෝ පිළිකාවක්, එහෙම නැත්නම් පපුවේ අමාරුවක්. එහෙම නැත්නම් වකුගඩු අමාරුවක්. මෙවැනි කාරණා තමයි නිරන්තරයෙන්ම සඳහන් කරන්නේ. ඉතින් අද පවතින සෞඛ්‍යයේ අලුත් දියුණුවත් එක්ක මේ රෝග කලින් හඳුනාගෙන ඒවාට අවශ්‍ය ප්‍රතිකාර, ප්‍රතිකර්ම යොදන්න පුළුවන් කාලයක් හැටියටයි මේ කාලය සලකන්නේ. ඉතින් මේ සඳහා සුදුසු වැඩපිළිවෙළක් කොහොමද ඇති කරගන්නේ කියන කාරණාව මම හිතනවා වැදගත් වෙනවායි කියලා.

අපි බස්නාහිර පළාත් සභාව හැටියට ගත්තාම අපේ ප්‍රදේශයේ මිලියන හය හතක ජනතාවක් ජීවත් වෙනවා.
[ගරු කීර්ති කාරියවසම්]

මේ ප්‍රදේශයේ රජයේ ආයතන අති විශාල සංඛ්‍යාවක් පිහිටලා තිබෙන්නේ, බස්නාහිර පළාත තුළයි. ඒවාගේම විශාල කර්මාන්ත, ඒවාගේම සේවා ස්ථාන, වෙනත් සේවා සපයන ස්ථාන බොහෝමයක් පවතින්නේ බස්නාහිර පළාත තුළයි. අපේ රටේ රාජ්‍ය සේවකයින් පිළිබඳව පවතින ආයතන සංග්‍රහය ගත්තත් එහෙම නැත්නම්, සාප්පු සහ කාර්යාල පනත දිහා ගත්තත් සාප්පු සහ කාර්යාල පනතට යටත්වන සේවකයින් ගැනෙන, එහෙමත් නැත්නම් වෙනත් කම්කරු ශ්‍රේණිවලට ගැනෙන සේවකයින් පරිපාලන සහා නීති රීති යටතේ ඒ අයගේ අයිතිවාසිකම් සහතික වෙනවා. මේ සියලුම අණපනත්වල බොහෝම පැහැදිලිව සඳහන් කරනවා, තමන් වැඩ කරන තැන සේවකයින්ගේ සෞඛ්‍ය පහසුකම් ඒ ආයතනවලින් ආරක්ෂා කරන්න ඕනෑය කියලා.

ඒක නිසා මම යෝජනා කරනවා, ගරු ඇමැතිතුමාට. මේ ආයතනත් එක්ක වැඩ පිළිවෙළක් ඇති කරන්න මේ සියලුම සේවකයන්ව, රජයේ වගේම පෞද්ගලික අංශයේ සේවකයන්ව වාර්ෂිකව හෝ අර්ධ වාර්ෂිකව ඒ අයගෙන් බෝ නොවන රෝග වාගේ දේ පිළිබඳව වෛද්‍ය පරීක්ෂණ කරන්න. දැන් අපි මන්ත්‍රීවරුන්ව මේ ස්ථානයේ පළාත් සභාව මගින් අවුරුද්දකට එක වතාවක් වෛද්‍ය පරීක්ෂණයට යටත් කරනවා. එතකොට අපි දන්නවා, අපේ ලේ ටික බැලුවාම, නැත්නම් අපේ ග්ලූකෝස් ප්‍රමාණය බැලුවාම ඒවා උඩ අපි දන්නවා, අපේ ඇඟේ යම්කිසි රෝගයකට හේතු සාධක වේගෙන එනවාද කියලා. ඉතින් මේ පර්යේෂණ අර රජය සේවකයන්ට වගේම පෞද්ගලික ආයතන සේවකයින්ට කරන්න පුළුවන්. ඒ සඳහා අවශ්‍ය නීතියේ රැකවරණය මේ සියලුම අණ පනත් යටතේ ලැබිලා තිබෙනවා, සේවකයන්ගේ පාලනය කියන එක සම්බන්ධව. ඒ නිසා අමාත්‍යතුමාට යෝජනා කරනවා. ඒ සඳහා ඔබතුමාට පුළුවන් රජයත් එක්ක කථා කරන්න. අනික් පැත්තෙන් වාණිජ මණ්ඩලයත් එක්ක කථා කරන්න පුළුවන්. ව්‍යාපාර සමාගම් එක්ක එහෙම කථා කරලා, වැඩ පිළිවෙළක් ඇති කරන්න පුළුවන් වෙනවා නම්. මේවා පිළිබඳව පරීක්ෂණය කරන්න සියලුම සේවකයින් - ඒවාට යන වියදම ඒ අයගෙන් අයකර ගන්න පුළුවන්. ඒ අය බැඳිලා ඉන්නවා, ඒකට නීතියෙන්. තමන්ගේ සේවකයින්ගේ සෞඛ්‍ය කොහොමද ආරක්ෂා කරන්නේ කියන කාරණාව සම්බන්ධයෙන්. ඉතින් ඒ සඳහා වැඩ පිළිවෙළක් ඇති කරන්න පුළුවන් වෙනවා නම් අපේ ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගෙන් වැඩිම කොටසක් පරීක්ෂණයකට ලක් කරලා, ඒ අයට තිබෙන රෝග පිළිබඳව හඳුනා ගැනීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න පුළුවන් වෙනවා. එතකොට රෝගීන් හැටියට ඉන්නවා නම් ඒ අයට අවශ්‍ය ප්‍රතිකාර ලබා දෙන්න, අවශ්‍ය උපදෙස් ලබා දෙන්න ඒ කටයුත්ත මම හිතනවා අපට කරන්න පුළුවන් වෙනවා. ඒ සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශය මැදිහත්වෙලා, ඔබතුමා මැදිහත්වෙමින් ඒක වඩාත් පුළුල් විධියට කරන්නම් ඔබතුමා සෞඛ්‍ය ඇමැතිතුමාත් එක්ක ඉතා කිට්ටුවෙන් වැඩ කරනවා. මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්ක එක්කහුවෙලා - අපිත් දන්නවා, එතුමා අපේ බොහෝ කටයුතුවලට උදව් කරනවා. රාජිත සේනාරත්න ඇමතිතුමා. එතුමාත් එක්කත් මේ පිළිබඳව කථා කරලා සුදුසු වැඩ පිළිවෙළක් ඇති කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අද පවතින ලොකුම ගැටළුවක් බවට පත්වෙලා තිබෙන්නේ, සමාජයේ මේ රෝගී තත්ත්වයන් වාගේම මිනිසුන්ගේ මානසික තත්ත්වයන් අසහනකාරී තත්ත්වයන් විශාල වශයෙන්ම බරපතළ ගැටළුවක් බවට පත් වෙලා තිබෙනවා. තරුණ ප්‍රජාව දන්නේ නැහැ තමන් කොහොමද අඹුසැමියන් හැටියට එකට ජීවත් වෙන්නේ. ඒ ජීවත් වන කොට ඇති වන කායික ප්‍රශ්න වෙන්න පුළුවන්. මානසික ප්‍රශ්න වෙන්න පුළුවන්. මේවා පිළිබඳව නිසි අවබෝධයක් නැහැ. ඒ නිසා මම මගේ ප්‍රතිපාදනය යොදවලා අගලවත්ත සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථානයේ එවැනි අයට උපදේශන සේවාවක් ආරම්භ කළා. මට දිගින් දිගටම ඒකට ප්‍රතිපාදන ලබා දෙන්න පුළුවන් ඉඩකඩක් ඇත්තේ නැහැ. නමුත් මම හිතනවා ඔබතුමන්ලාට පුළුවන් මේ වැඩ පිළිවෙළ - (බාධා කිරීමක්) ආර්ථික ප්‍රශ්නයත් එක්ක එන්නේ. ඉතින්, ආර්ථික ප්‍රශ්න කියන්නේ ඔබතුමන්ලා - මමත් විශ්වාස කරනවා, සමාජවාදය ආවාම රටේ ප්‍රශ්න විසඳෙනවා කියන තැන. සමාජවාදයට එනකම් හෝ මේ රටේ සියලු ආර්ථික ප්‍රශ්න විසඳෙන තුරු මේ මුකුත් නොකර හිටියොත් මිනිස්සු ඔක්කෝම ලෙඩ්ඩු බවට පත් වෙනවා. නමුත් ඒ අතරතුර -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 02ක කාලයක් ලබා දෙන්න පුළුවන්.

**ගරු කීර්ති කාරියවසම්**

Hon. Keerthi Kariyawasam

ජනතාව තීන්දු කරයි. ඒකට ජනතාව උත්තරයක් දෙයි, ඒ පිළිබඳව ආණ්ඩුව වෙනස් කරන්න ඕනෑ වේලාව වෙන කොට ජනතාවම තීන්දුවක් දේවි. පහුගිය කාලයේ තීන්දුවක් දුන්නා වාගේම ඉදිරියේදීත් මේවට තීන්දු දෙයි කියලා අපි විශ්වාස කරනවා. මිනිස්සු අමාරුවේ වැටිලා තියෙන්නේ මේ ඊයේ පෙරේදා නොවෙයි. මේක දීර්ඝ කාලයක් තිස්සේ රටේ පවතින තත්ත්වයක්. අවුරුද්දකින් දෙකකින් වුණු දෙයක් නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

එවැනි වැඩ පිළිවෙළක් සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථාන මුල් කරගෙන ආරම්භ කරන්න පුළුවන් නම් මම හිතනවා, ලොකු වැඩ පිළිවෙළක් ලොකු සේවාවක් ඒ හරහා කරන්න පුළුවන් වේවි කියලා අපි විශ්වාස කරනවා. ඒවාගේම තව මිනිසුන්ගේ ආර්ථික ප්‍රශ්නය ගැන අපේ මන්ත්‍රීතුමා විශේෂයෙන් සඳහන් කරපු නිසා ඔබතුමාගේ අමාත්‍යාංශයට කාන්තා කටයුතුත් අයිති වෙනවා. අද මිනිස්සු බොහෝ වෙලාවට පවුල්වල ස්වාමියා හම්බ කරන මුදලින් තමයි බොහෝ දෙනා ජීවත් වෙන්න උත්සාහ කරන්නේ. ඉතින් ගෘහනියන් හැටියට ඉන්න කාන්තාවන්ට අතිරේක ආදායමක් උපයාගන්න පුළුවන් වන විධියට අතිරේක ආදායමක් උපයාගන්න පුළුවන් වන විධියට ඒ අයට ස්වයං රැකියා වැනි වැඩ පිළිවෙළක්, පුහුණුවීම් දැන් ඕනෑ තරම් දීලා තිබෙනවා. මිනිස්සු මෙවැනි දේට ඉදිරිපත් වෙන්න කැමැති අය ඕනෑ තරම් පුහුණුවීම් ලබා ගෙන තිබෙනවා. නමුත් පුහුණුවීම් ලබා ගත්තා වුණත් ප්‍රශ්න තිබෙනවා. ඒ අයට එවැනි දෙයක් ආරම්භ කරන්න මූලික ආර්ථික ශක්තියක් නැහැ. දෙවෙනි කාරණාව යමක් නිෂ්පාදනය කළොත් ඒකට වෙළඳපොල කොහොමද සොයාගන්නේ කියන ගැටළු තිබෙනවා. ඒක නිසා ඔබතුමාට පුළුවන් වෙනවා. දැන් ආණ්ඩුවෙන් මේ අයවැය ලේඛනයෙනුත් ඉදිරිපත් කළා ස්වයං රැකියාවලට සුළු ව්‍යවසායකත්වයන් ගොඩ නඟන්න ආණ්ඩුව සහයෝගය දෙන වැඩ පිළිවෙළක්. ඒ වෙනුවෙන් විශාල මුදලක් අයවැය ලේඛයෙනුත් මධ්‍යම ආණ්ඩුව වෙන් කළා. ඒ නිසා ඔබතුමාට පුළුවන් වෙනවා, ඒ මධ්‍යම ආණ්ඩුවත් එක්ක එකතුවෙලා මේ වැඩපිළිවෙළ සාර්ථක කරන්න. කාන්තාවන්ගේ පැත්තෙන් ස්වයං රැකියා පුහුණුව දෙන්න විතරක් නොවෙයි. ඒ අයට ස්වයං රැකියාවක් ආරම්භ කරන්න අවශ්‍ය පදනම හදා දෙන්නත් ඒවාගේම ඔවුන්ගේ අලෙවියන් විකුණා ගැනීමේ මධ්‍යස්ථාන ඇති කරන, වැඩ පිළවෙළකුත් ඇති කරනවා නම් මම හිතනවා ඒ අයට තිබෙන ඒ ආර්ථික අමාරුවට යම් ප්‍රමාණයකින් හරි සහනයක් ඇති කරගන්න ඒක අවස්ථාවක් වෙයි කියලා. නැවත වතාවක් ඔබතුමාට 2018 වර්ෂයේදී ඔබතුමාගේ අමාත්‍යාංශයේ කටයුතු වඩාත් සාර්ථවකව පවත්වාගෙන යන්න ඔබතුමාටත් ඔබතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරී මහත්ම මහත්මීන්ටත් ශක්තිය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 04.32]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංක 105, 113, 114, 115 හා 116 යටතේ වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා. ඇත්තටම සුමිත්ලාල් මැන්දිස් ගරු අමාත්‍යතුමා කියන්නේ, බස්නාහිර පළාත් සභාවේ ජ්‍යෙෂ්ටයෙක්. ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරයෙක්. මධ්‍යම කාරක සභිකයෙක්. ඒ වාගේම මේ රජය බිහි කරන්න ඉතාම ශක්තිමත්ව වැඩ කරපු අමාත්‍යවරයෙක්. කෙළින් වැඩ කරන අමාත්‍යවරයෙක් වශයෙන් මම සතුටු වෙනවා. එතුමා සම්බන්ධව කථා කරන විධියේදී, ඇත්තටම කථා කරන ආකාරය අනුව මහ ආණ්ඩුවේ සෞඛ්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න ඇමතිතුමාගේත් හොඳම හිතවතෙක්. ඒ නිසා මේ දෙදෙනාම ඉතාම සමීපව මේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වැඩ කටයුතු කරනවා. ඇත්ත වශයෙන්ම රාජිත ඇමතිතුමාත් කළුතර දිස්ත්‍රික්කයේ. මෙතුමාත් කළුතර දිස්ත්‍රික්කයේ. විශේෂයෙන්ම ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා ගරු ජනාධිපතිතුමා සමඟත් ඉතාම ළඟින් ආශ්‍රය කරනවා. ඒ වාගේම ජනාධිපතිතුමාගේ දරපු අමාත්‍ය ධූරය තමයි අද රාජිත සේනාරත්න මැතිතුමා දරන්නේ. ඒ සමඟම කළුතර, කළුතර එකතු වීම නිසා ගරු රාජිත අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ අරමුදල්වලිනුත්, මහ ආණ්ඩුවෙනුත් විශාල මුදල් ප්‍රමාණයක් අපේ පළාත් සභාවට ලැබෙන බව මට දැන

[ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක]

ගන්න ලැබුණා. ඇත්තටම ඒ තුළින් ගොඩක් සේවාවක් කරන්න පුළුවන්. එතුමා ඒ උපරිම ශක්තියෙන්, උපරිම දායකත්වයෙන් කටයුතු කරන අමාත්‍යවරයෙකු වශයෙන් අපි දකිනවා. උදාහරණයක් වශයෙන් ඇත්තටම වෙනත් අමාත්‍යවරුන්ගේ වැය ශීර්ෂවලදී මම නම් කරන්නේ නැහැ. යම් යම් අමාත්‍යවරු හයේ හිටියේ, තමන්ගේ වැය ශීර්ෂයන් සම්බන්ධයෙන් කථා කරන කොට. අපි එක අමාත්‍යවරයෙකුගේ වැය ශීර්ෂය දවසේ රෑ වෙනකල් සිරිකොතේ හිටියා. ප්‍රශ්නයක් විසඳාගන්න. මෙතුමාට එහෙම ප්‍රශ්නයක් නැහැ. මෙතුමා මන්ත්‍රීවරු 104 දෙනා සමඟම ඉතාමත් සුහදව, පක්ෂ භේදයකින් තොරව කාටත් රාජකාරි කරන්න, උදව් උපකාර කරනවා. ඒ වාගේම අමාත්‍යාංශයේ දියුණුව තකා සේවකයින්ගේ, වෛද්‍යවරුන්ගේ, සියලුම ක්ෂේත්‍රවල නිලධාරීන් සමඟ හොඳින් වැඩ කටයුතු කරනවා. අපි අගය කරනවා. ඉතාම නිහතමානී අමාත්‍යවරයෙක්. වෙන අමාත්‍යවරු වාගේ ඔලුවට ගන්නේ නැහැ. අපට පෙළක් තැන්වලදී හිතා ගන්නත් බැහැ. මෙතුමා අමාත්‍යවරයෙකු විධියට නොවෙයි ඉන්නේ. සාමාන්‍ය පුද්ගලයෙකු විධියට. නැත්නම් ඒකාබද්ධ විපක්ෂයත් එක්ක කොහොමද වැඩ කරන්නේ කියන එක අපටම පුදුමයි. ඇත්තටම මේ මූලාසනයේ ඉන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමාත් කළුතර දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ විපක්ෂයේ ඉන්න ප්‍රබලයෙක්. කෙසේ වුණත්, මේ කණ්ඩායමත් එක්ක ඉතාම සුහදව, පක්ෂ පාට භේදයක් නැතිව වැඩ කිරීම අපි අගය කරන්න ඕනෑ.

ඒ වාගේම අපි දැක්කා, ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ හිතා ගන්න බැරි වැඩ කටයුතු කරමින් ජනතාවට සමීප දේවල්, ඒ කියන්නේ, බෙහෙත් වර්ග හතළිස් ගණනක, විශාල ප්‍රමාණයක හිතා ගන්න බැරි විධියට මිල අඩු කරලා තිබෙනවා. ඒ වාගේම ශල්‍යකර්ම. විශාල ප්‍රමාණයකට ශක්තිය ලබා දීලා තිබෙනවා. මේ යහපාලන රජයේ අවශ්‍යතාවයක් ඉෂ්ට කරලා තිබෙනවා. ඒ තුළ ඉන්න අපේ බස්නාහිර පළාතේ අමාත්‍යතුමාත් ඒ එකටම කටයුතු කිරීම අපි අගය කරනවා. අපි ඒක දැක්කේ, අපේ කිරිබත්ගොඩ මූලික රෝහලේ වැඩ කටයුතුවලට මෙතුමාත්, රාජිත අමාත්‍යතුමාත් ඉතාමත්ම දායකත්වයෙන් වැඩ කිරීම සම්බන්ධව. කිරිබත්ගොඩ රෝහල කියන්නේ - කැලණියේ ඉන්න එකම පළාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් මම සතුටු වෙනවා. අපි කිරිබත්ගොඩ රෝහල සම්බන්ධව වසර ගණනාවක් කථා කළා. තවමත් මූලික රෝහලක්. මෙතැන නිලධාරීන් ඉන්නවා. මම නම් බලාපොරොත්තු වෙන්නේ, මේක රාගම රෝහල වාගේ මහ රෝහලක්, නැත්නම් ගම්පහ මහ රෝහල වාගේ මහ රෝහලක් බවට පත් වන දවස දකින්න තමයි මගේ සිහිනය තිබෙන්නේ. එයට ශක්තියක් වෙන්න ඊයේ පෙරෙයිදා හදිසි අනතුරු අංශය විවෘත කරන්න අපට හැකියාව ලැබුණා. මේක අවුරුදු ගණනාවක සිට මේ ගොඩනැගිල්ල හදලා යම් යම් අපහසුතා මැද මෙතුමාගේ කාලයේ තමයි මේක ඉවර කරන්න ලැබුණේ. එතුමා ඒ ශක්තිය තුළ ඒ දවසේ විවෘත කිරීමේදී රාජිත අමාත්‍යතුමාත්, අපේ සරත් ෆොන්සේකා අමාත්‍යතුමාත්, මෙතුමාත් පැමිණිලා ඒ ශක්තිය දුන්නා.

ඒ නිසා මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ඉල්ලීමක් කරනවා. ගරු අමාත්‍යතුමා මේ ස්ථානයේ ඉන්නවා. ගරු රාජිත අමාත්‍යතුමා ඒ වෙලාවේ පොරොන්දුවක් වුණා. අපි සියලුම දෙනාගේ ඉල්ලීමක් අනුව එයට ඔපරේෂන් තියටර් එකක්, නැත්නම් ශල්‍යාගාරයක් ලබා දෙනවාය කියලා. ඒ වෙලාවේ එතුමාගේ කථාවේදී කිව්වේ, ඇස්තමේන්තු, සැලැස්ම අපට එවන්න ඇමතිතුමා කියලා. මම කැමැතියි, මේ නිලධාරීන් මෙතැන ඉන්නවා නම්. ඒ දෙය ක්‍රියාත්මක වුණාද? නැත්නම් බොරුවක් ද වුණේ? ඇත්තට එතුමා ඒ වාගේ කථා කරලා ඒ දේ අපට කැලණියට ලැබෙනවා නම්, ඒක ලොකු අවස්ථාවක්. ඒක ක්‍රියාත්මක වුණාද නැද්ද කියලා සභාගත කරන්නය කියලා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙකු වශයෙන් මම ඉල්ලීමක් කරනවා. නැත්නම් ඒක බොරුවට සීමා වෙනවා. නැත්නම් දේශපාලඥයන්ගේ බොරුවට සීමා වෙනවා. නැත්නම් රාජිත අමාත්‍යතුමාට ඕනෑ තරම් වැඩ කරන්න සල්ලි තිබෙනවා. අපට ගන්න තිබෙන වැඩක් නිලධාරීන් එකතු වෙලා කරනවාද නැද්ද කියලා ගරු අමාත්‍යතුමාටත්, විපක්ෂය වශයෙන් අපටත් ඒ සහයෝගය ලබා දෙන්නය කියලා ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ෆොන්සේකා මහත්තයා කිව්වාද ඉල්ලා ගන්න කියලා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක

Hon. U. George Perera - Chief Opposition Whip

ඔව්. සරත් ෆොන්සේකා මැතිතුමාගේ මැදිහත් වීම තුළ තමයි මේ ගමන ගියේ. සරත් ෆොන්සේකා මැතිතුමා තමයි. වෙන කවුරුවත් නොවෙයි. සරත් ෆොන්සේකා මැතිතුමා මාර්ගයෙන් එකතු වෙලා තමයි කළේ. එතුමන්ලා එකතු වෙලා තමයි මේ දින අරගෙන විවෘත කළේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

එහෙම නම් කමක් නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමා බේරුවල. බේරුවලට වෙලා ඉන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

සංවිධායකකමට මොකද වුණේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ වාගේම ඒ රෝහලේ අවශ්‍යතාවයන් ගොඩක් තිබෙනවා. ඇත්තටම ඔපරේෂන් තියටර් එකක් අවශ්‍යයි. ඔපරේෂන් තියටර් වාට්ටු අවශ්‍යයි. VOG වාට්ටු අවශ්‍යයි. ඒ වාගේම කියන්න ඕනෑ. X-ray ගන්න Technician කෙනෙක් මේ දක්වා නැහැ. ගරු අමාත්‍යතුමනි, මාස හයක් වෙනවා. X-ray ගන්න Technician කෙනෙක් නැහැ. එතකොට ඒ මැෂින් එක තිබෙනවා. එහෙම නම් ඒ අවශ්‍යතාවය කිරිබත්ගොඩ වෙන්නේ නැහැ. කිරිබත්ගොඩ කියන්නේ, කොළඹට තිබෙන ආසන්නම ඉස්පිරිතාලේ. ඉතින් මේ රෝහලේ මේ තත්ත්වය නම් තිබෙන්නේ, කාගේද මේකේ වැරැද්ද? Technician ගේ වැරැද්දක් නැත්තේ කොහෙන්ද ආවේ? එහෙම නම් අඩුවක් තිබෙනවා. ඒ Technician ව අපට ලබා දෙන්න. ඒක ලබා දෙන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ඒක මධ්‍යම රජයට කියලා ඉල්ලා ගන්න. ෆොන්සේකා මහත්තයාට කියලා ඉල්ලා ගන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ වාගේම ගරු අමාත්‍යතුමනි, වෛද්‍යවරු අඩුයි. හෙද නිලධාරීන් අඩුයි. සේවකයින් අඩුයි. ඒ මොනවා වුණත්, ඒ රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී ප්‍රගීත් මහත්මයා ඉතා දක්ෂ විධියට මේ රෝහල පාලනය කරනවා. අපි ඒක අගය කරනවා. මේ මෑතකදී ආවේ. එතුමාගේ පැමිණීම නිසා අපේ පළාත් සභාවට ශක්තියක් ඇති වෙලා තිබෙනවා. ජානක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ගේ ළඟ නේද මේ ඉස්පිරිතාලේ තිබෙන්නේ. කථා කරන්න.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මම හොඳ කිව්වා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

හොඳ වාගේම නරකත් කියන්න ඕනෑ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

රාජිත ඇමතිතුමාගෙන් ඉල්ලා ගන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒක බේරුවල බලා ගන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රෝහලේ දියුණුවට වෛද්‍ය ප්‍රගීත් මහතා ඉහළින්ම කටයුතු කරනවා. වෙළඳ ප්‍රජාවේ දායකත්වය ඉහළින්ම ලබා දීලා තිබෙනවා. උදාහරණයක්
[ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක]

වශයෙන් තිලකවර්ධන ටෙක්ස්ටයිල්, ඒ වාගේම ඔසාකා ටෙක්ස්ටයිල් වාගේ වෙළඳ ආයතනවලින්, වෙළඳ ප්‍රජාවගෙන් මිලියන ගණනක මුදලක් බිල්ඩින්වලට, යම් යම් අවස්ථාවලට මේ රෝහලට විනිවිද පෙනෙන ආකාරයට, අමාත්‍යාංශය ගිවිසුම් අත්සන් කරලා, රෝහල වෙනුවෙන් ඒ යම් යම් දේවල් කිරීම පිළිබඳව මම අගය කරනවා. ඒ වාගේම ගරු සරත් ෆොන්සේකා මැතිතුමා මේ ඉස්පිරිතාලේ වටේම කාපට් දාලා ඉතාමත් ශක්තිමත් විධියට මේ පළාත් සභාවට, අපට ශක්තියක් දුන්නා. ගරු අමාත්‍යතුමා ඒක දැක්කා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. ඒ ආසන්නයේම තිබෙනවා, අපේ ආයුර්වේද ආයතනයක්. හිටපු ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා තමයි ඒක කරලා දුන්නේ. ඒක හොඳ දෙයක්. හැබැයි, ඒක දැන් කඩා වැටෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒක ජනතාව දැනුවත් වෙන්නේ නැහැ. ප්‍රචලිත වෙන්නේ නැහැ. ඒ ආයුර්වේද ආයතනය හරිම වටිනවා. ප්‍රසන්න සම්පත් මන්ත්‍රීතුමා කියපු දේට උත්තරයක්. හොඳම තැනක්. මේ රජයේ තැනක්. ඉතින් මේ ස්ථානය ශක්තිමත් කරන්නය කියලා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම ඔබතුමා සාමාන්‍යයෙන් ගරු අමාත්‍යතුමනි, අයවැය කාලයේදී අපට වෛද්‍ය පරීක්ෂණ වාගේ අවස්ථා ලබා දෙනවා. ඒත් මේ අවුරුද්දේ නම් අපි දකින්නේ නැහැ ඒ වාගේ දේවල් ක්‍රියාත්මක වෙනවාද කියලා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

හෙට උදේ තිබෙනවා. වේලාසනින් එන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හෙට දිනයේ ඒ වෛද්‍ය සායනය පෙර පරිදිම පවත්වනවා. ඒ සඳහා සියලු දෙනා සූදානමින් එන්න කියන පණිවුඩය දෙනවා. මම හිතන්නේ, මීට කලින් කියන්න ඇති.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු අමාත්‍යතුමා පරිපූරකයෙන් අපට මුදලක් දුන්නා, අක්ෂි සායන පවත්වන්න. උදාහරණයක් වශයෙන් මේ නව වැනිදා තමයි මගේ දාලා තිබුණේ. ඒක අවලංගු කළා. ජනතාවට කියලා, ෆෝම් බෙදලා, ඔක්කොම කරලා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා මේ සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ගය මොක්කද? දැන් අපට වෙලාව නැහැ.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු මන්ත්‍රීතුමා, ඒක නිරාකරණය කළා. අපේ ලේකම්තුමා ඒකට අවශ්‍ය කටයුතු හෙට අනිද්දාම කරලා දෙයි. ඒක දිගටම කර ගෙන යනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

දැන් කොහොමද? අපි ඔක්කොම ලැහැස්ති කරලා තිබුණේ. ඔබතුමාගේ සමාජ සේවා අංශයෙන් තමයි -

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඔව්. වැරැද්දක් වෙලා තිබෙනවා. ඒ පිළිබඳව සාකච්ඡාවක් කළා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපට කර ගන්න බැරි වුණොත්, ඔබතුමාට බැරිද එම චෙක්පත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දීලා ඡන්දයෙන් පස්සේ අපට මේක කරන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඒකට ලේකම්තුමා විසඳුමක් දෙයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපි දැන් දා ගත්ත එක. නව වැනිදා දා ගත්ත එක අට වැනිදා අවලංගු කළා. කොපමණ අසාධාරණයක්ද මට වුණේ? මම මේ විවෘතව කියන්නේ. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. එම මුදල ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබා දීලා, ඒක ක්‍රියාත්මක කරන්න. ඒ චෙක්පත් ලබා දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 04.42]

**ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි**
Hon. Rev. Thebuwana Piyananda Thero

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ සුමිත් ලාල් මැන්දිස් සෞඛ්‍ය අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිය පුද කරනවා. මම හිතන්නේ, කළුතර දිස්ත්‍රික්කයට සෞඛ්‍යයේ හොඳම වකවානුව, මේ වකවානුවේ එළඹිලා තිබෙන්නේ. මොකද, රේඛීය අමාත්‍යාංශයේ සෞඛ්‍ය ඇමතිවරයාත් කළුතර දිස්ත්‍රික්කයේ. බස්නාහිර පළාතේ සෞඛ්‍ය ඇමතිවරයාත් කළුතර දිස්ත්‍රික්කයේ. ඒ වාසිය දිස්ත්‍රික්කය තුළ තිබෙනවාය කියන එක අපි දන්නවා. දැන් උදාහරණයකට කිව්වොත් මම හිතන්නේ, දැනට ඉදි වෙමින් පවතිනවා නාගොඩ රෝහලටම කිට්ටුව ළමා හා මාතෘ මහා රෝහලක්. මම හිතන්නේ, ඊට පස්සේ කළුතර ජනතාවට ඒ කටයුතු සඳහා රිජ්වේ ආර්යා රෝහලට එන්න උවමනා වෙන්නේ නැහැ. ඒ වාගේම පහසුකම් තිබෙන මහා රෝහලක් දැන් ඉතාම කඩිනමින් ඉදි වෙමින් පවතිනවා. ඒ නිසා සෞඛ්‍ය අංශයෙන් අපට ගැටළු විසඳාගන්න තිබෙන හොඳම වකවානුව මේ වකවානුවයි කියන එකයි කළුතර දිස්ත්‍රික්කයේ අපට විශේෂයෙන්ම මතක් කරන්න තිබෙන්නේ.

විශේෂයෙන්ම ගරු ඇමතිතුමනි, මේ වැය ශීර්ෂය දිහා බැලුවාම මේ විෂය පථය අනුව, විෂයයන් අනුව සෞඛ්‍ය සේවා වෙන් කරලා තිබෙන විධිය බැලුවාම සාමාන්‍ය සෞඛ්‍ය සේවා සඳහා 84% ක ප්‍රතිපාදනයක් වෙන් වෙන කොට දේශීය වෛද්‍ය අංශය සඳහා 4% ක් පමණයි වෙන් වෙලා තිබෙන්නේ. මේක විශාල ගැටළුවක්. මොකද, කළුතර දිස්ත්‍රික්කය වාගේ ගත්තාම හුඟාක් ගම්බද ප්‍රදේශ තිබෙනවා. ඉතින් මේ ප්‍රදේශවල මිනිස්සු බටහිර වෛද්‍ය වෙදකම වාගේම දේශීය වෙදකම පිළිබඳව ලොකු විශ්වාසයක් තිබෙනවා. ලොකු බලාපොරොත්තුවක් තිබෙනවා. වැඩි දෙනෙකු ඒ ක්ෂේත්‍රයට යොමු වෙනවා. ඒ නිසා මම හිතන්නේ, මීට වඩා දේශීය වෛද්‍ය අංශයට මේ ප්‍රතිපාදන වැඩි කර ගන්න පුළුවන් නම් ඉතාමත්ම හොඳයි කියලා මම යෝජනාවක් හැටියට ඉදිරිපත් කරනවා. මීට වඩා මේකට පහසුකම් වැඩි වෙන්නට ඕනෑ.

වෙලාව කොයි වෙලාවේ අවසන් කරයිද කියලා කියන්න බැරි නිසා අත්‍යවශ්‍යම කාරණය මම ඉස්සෙල්ලාම මතක් කරලා ඉන්නම්. ඔබතුමාට මම පෞද්ගලිකව මතක් කරලා තිබෙනවා. දොඩංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය කියන්නේ, මගේ කොට්ඨාශය. මේ කොට්ඨාශයේ තිබෙන එකම ආයුර්වේද රෝහල තමයි නැබඩ ආයුර්වේද රෝහල. නැත්නම් පැරණි වචනයෙන් කියන්නේ, කැන්ද කඩුව ආයුර්වේද රෝහල කියලා. මම හිතන්නේ, මේක කළුතර දිස්ත්‍රික්කයේ තිබෙන පැරණිම ආයුර්වේද රෝහල. ලංකාවේ ගත්තොත් ආයුර්වේද රෝහල් අතරින් ඒත් සෑහෙන පැරණි ආයුර්වේද රෝහලක්. එතැනට ගියාම පේනවා. කෞතුකාගාරයක් වාගේ. බිත්ති බැඳලා තිබෙන්නේ, තනිකර කළු ගලෙන්. අධිරාජ්‍යවාදී සමයේ ඇති කරපු රෝහලක් මේක. ඉතින් ඒ නිසා මේක වටිනා ස්ථානයක්. ඉතාම හොඳට ගොඩනැගිලි පද්ධතිය තිබෙනවා. ඒ වාගේම විශාල ඉඩම් ප්‍රමාණයක් මේ ආයුර්වේද රෝහල සඳහා තිබෙනවා. නමුත් අද වන කොට මේක ඉතාම දුර්වල තත්ත්වයක පවතින රෝහලක්. මම හිතන්නේ, දැනට ලෙඩ්ඩු නේවාසික කර ගන්නෙත් නැහැ කියන තත්ත්වයට වාගේ පත් වෙලා තිබෙනවා. ඇඳන් තිබෙනවා. පහසුකම් තිබෙනවා. ඔක්කොම තිබෙනවා. ඉතින් ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේකට ප්‍රධානම -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

සෞඛ්‍ය ඇමතිතුමා කළුතර. අපේ සෞඛ්‍ය ඇමතිතුමාත් කළුතර.

**ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි**
Hon. Rev. Thebuwana Piyananda Thero

ඔව්. ඒක තමයි. අපි මේ කාරණය නිරාකරණය කර ගන්න එපැයි. එතකොට ඒ රෝහල මේ තත්ත්වයට පත් වීම පිළිබඳව යම් හේතුවක් තිබෙනවා. ඒ හේතුව තමයි, ප්‍රවාහන පහසුකම් නැතිකම. ප්‍රවාහන පහසුකම් නැහැ. ලෙඩ්ඩු කැමැතියි ඇවිල්ලා ඒ රෝහලේ ප්‍රතිකාර ගන්න. නමුත් එන්න ප්‍රවාහන පහසුකම් නැතිකම නිසා තමයි මේ තත්ත්වය උද්ගත වෙලා තිබෙන්නේ. ඒ නිසා මම අපේ සෞඛ්‍ය ඇමතිතුමාට යෝජනා කරනවා. මේකට එතුමාගේ අදහසක් තිබෙන බව පේනවා. යම් විධියකින් අඩු ගණනේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් හරි වාහනයක් අරගෙන අදාළ ප්‍රදේශ,

[ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි]

දොඩංගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය ආවරණය වන විධියට ප්‍රවාහන පහසුකම් මේකට සලස්වන්න පුළුවන් නම් මේ රෝහල ඉතාම හොඳ තත්ත්වයකට පත් කරන්න පුළුවන්. වෙන කිසිම ගැටළුවක් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් පාර හදනවා.

**ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි**
Hon. Rev. Thebuwana Piyananda Thero

පාර හදනවා. පාර හැදුවත් බස් සේවාව හරියට පැවතුනොත් තමයි මේක සාර්ථක වෙන්නේ. ඒ නිසා ඒ ස්ථානය පිළිබඳව, 2018 අවුරුද්දේදී මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් අපේ සෞඛ්‍ය අමාත්‍යතුමාගේ විශේෂ අවධානය යොමු කරලා, මේ ප්‍රවාහන පහසුකම පිළිබඳවත් මේ ගැටළු විසඳීමක් කර ගෙන, මේ රෝහල උසස් තත්ත්වයකට පත් කරන්න. ලෙඩ්ඩුන්ගේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කරලා දෙන්න කටයුතු කරන්න මැදිහත් වෙන්නය කියන කාරණය මතක් කරනවා. පුළුවන්කම තිබෙනවා නම්, අපි ඉදිරි මාසය ඇතුළතදී රෝහලේ සංචාරයක් කරලා, මේ පිළිබඳව සමීක්ෂණයක් කරලා අවශ්‍ය කටයුතු සම්පූර්ණ කරන්න ආරාධනා කරනවා. ඒ වාගේම මේකේ ඉඩම විශාල වශයෙන් තිබෙනවා. ලොකු ඉඩමක් තිබෙනවා. ඒ නිසා මේ ඉඩමේ ඔසු වගාවක් කරන්න හොඳටම ඉඩකඩ තිබෙනවා. ඒ සඳහාත් අවධානය යොමු කරන්න. විශාල ඉඩම් ප්‍රමාණයක් නිස්කාරනේ තිබෙන්නේ. ඒ නිසා හොඳ ඔසු වගාවක් කරන්න, මේ ඉඩම භාවිතා කරලා කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා ඒ ගැන විශේෂ අවධානය යොමු කරන්නය කියන කාරණය පිළිබඳව මම විශේෂයෙන් ඔබතුමාගේ අවධානය මේ වෙලාවේදී යොමු කරනවා.

ඒ වාගේම බෝ නොවන රෝග වළක්වා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම. මන්ත්‍රීවරු හුඟක් දෙනෙක් මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කළා. මම හිතන්නේ, මේකට තිබෙන හොඳම පිළිවෙතක් තමයි අපේ ආහාර රටාවේ වෙනස්කමක් ඇති කිරීම. එතකොට ආහාර රටාවේ වෙනස්කමක් ඇති කරන්න නම්, මිනිස්සු තුළ ආකල්පමය වෙනසක් ඇති විය යුතුව තිබෙනවා. මොකද, දේශීය ආහාර වර්ග හරියට තිබෙනවා. මේකට යම් ප්‍රවණතාවයක් දැන් මිනිස්සුන් තුළ තිබෙනවා. දැන් උදාහරණයක් වශයෙන් අපේ කැන්ටිමට ගියාම මේ දවස්වල හැමදාම ලොකු කොළ කැඳ භාජනයක් තිබුණා. ඉස්සෙල්ලාම ඉවර වෙන්නේ මේක. හැම මන්ත්‍රීවරයෙකුම කොළ කැඳ කෝප්පයක් පානය කරනවා. එතකොට මේකේ වටිනාකම පිළිබඳව පෙරට වඩා මිනිස්සුන්ට අවබෝධයක් දැන් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා බෝ නොවන රෝග වළක්වා ගැනීම සඳහා තිබෙන විශේෂම වැඩ සටහනක් තමයි ආහාර රටාවේ වෙනසක් ඇති කිරීම. දැන් උදාහරණයක් වශයෙන් ගත්තාම ගම්බද හැම ප්‍රදේශයකටම - ගම්බද, නගර බද කතන්දරයක් නැහැ. උදේ පාන්දර පහයි තිහ, හය වෙන කොට වූන් පාන් වෑන් එක එනවා. හැන්දෑවටත් එනවා. මේකේ ඒවා තමයි මිනිස්සු කන්න පුරුදු වෙලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, පුළුවන් නම් ලබන අවුරුද්දේ වැඩ සටහනක් ආරම්භ කරන්න. මේකට විකල්පයක්. දේශීය ආහාර වර්ග, නැත්නම් හාල් පිටි කෑම. ඒ වාගේම අල බතල වාගේ දේවල්. ඒ විධියේ ආහාර වර්ග හදපු, අඩු ගණනේ සාම්පලයක් හැටියට එක වාහනයක් හෝ දෙකක් අපි මේකට පුරුදු කරලා මිනිස්සු අතරට යන්න සැලැස්සුවොත් මම හිතන්නේ, මිනිස්සු මේකට පුරුදු වෙලා අපට ලොකුවටම වෙනසක් ඇති කරන්න පුළුවන්කම තිබෙනවා.

ඒ වාගේම මේ ජ්‍යෙෂ්ට පුරවැසි සංවිධාන පිළිබඳවත් මම විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ. ජ්‍යෙෂ්ට පුරවැසියෝ පිළිබඳව අපි නොයෙක් විධියේ කථා කරනවා. ඒගොල්ලන්ගේ සමිති පවත්වනවා. නැටුම් ගැයුම් පවත්වනවා. පුටු දෙනවා. ඊට වඩා වැදගත් වෙනවා. මේ ජ්‍යෙෂ්ට පුරවැසියෝ කියලා කියන්නේ, මේ රටේ විවිධ ක්ෂේත්‍රවල විශාල දැනුම් සම්භාරයක් තිබෙන පිරිස. විවිධ දැනුම් තිබෙන අය ඉන්නවා. සමහර විට යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් වෙන්න පුළුවන්. දේශීය වෙදකම පිළිබඳව වෙන්න පුළුවන්. කෙම් ක්‍රම පිළිබඳව වෙන්න පුළුවන්. එහෙම නැත්නම් සමහර විට රසකැවිලි වර්ග නිෂ්පාදනය කිරීම වෙන්න පුළුවන්. ඒ වාගේම වෙනත් කලා කුසලතාවයන් වෙන්න පුළුවන්. ජ්‍යෙෂ්ට පුරවැසියන්ගේ මේ දැනුම් සම්භාරය ඊළඟ පරපුරට යන වැඩ සටහනක් මේ ජ්‍යෙෂ්ට පුරවැසි සංවිධානත් එක්ක සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා මම මේ වෙලාවේදී මතක් කරන්නේ. ඒ ජ්‍යෙෂ්ට පුරවැසි සංවිධාන හරහා ඒවායේ ඉන්න විවිධ හැකියාවන්, දක්ෂතාවයන් තිබෙන අයගේ දක්ෂතාවයන්

හඳුනාගෙන ලේඛනයක් සකස් කරලා ඔවුන්ගේ හැකියාවන් ඊළඟ තරුණ පරපුරට ලබා දෙන වැඩ සටහනක් ඇති කරන්න පුළුවන් නම් ඒක මම හිතන්නේ, ඒ ජ්‍යෙෂ්ට පුරවැසියන්ටත් කරන ලොකු ගෞරවයක් වෙනවා. ඒ වාගේම ඔවුන්ගේ දැනුම් සම්භාරය ඊළඟ පරම්පරාවට ගෙන යෑම සඳහා ලොකු ප්‍රයෝජනවත් වැඩ සටහනක් බවට පත් වෙනවාය කියන කාරණය මතක් කරනවා.

කාලය අවසන් නිසා තවත් කථා කරන්න කාරණා තිබුණත්, විශේෂයෙන්ම ගරු ඇමතිතුමා. එතුමාගේ පෞද්ගලික ලේකම්තුමා. අපි ඉතාමත් හිතවත්ව සමීපව කටයුතු කරන අය. බොහොම නිහතමානීව විශාල වැඩ කොටසක් කරනවා. ඒ කටයුතු කරන්න ඔබතුමාටත්, ඔබතුමාගේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් ශක්තිය, ධෛර්යය, වාසනාව ඒකාන්තයෙන්ම ලැබේවා. ඒ වාගේම මම හිතන්නේ අපට මේ පළාත් සභාවේ 2017 වර්ෂයේ කථා කරන්න ලැබෙන අවසාන අවස්ථාව මේක වෙන්න පුළුවන්. ඒ නිසා ගරු සභාපතිතුමාට, ගරු නියෝජ්‍ය සභාපතිතුමාට, මහ ඇමතිතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයටත්, සියලුම මන්ත්‍රීවරුන්ටත්, සියලුම කාර්ය මණ්ඩලවලටත්, හැම දෙනාටම ඉතාමත් වාසනාවන්ත සුභ අලුත් අවුරුද්දක් වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. හැමදෙනාටම තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 04.52]

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ ගරු සභා කටයුතු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයේදී මට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. එතුමා ඇතුළු අපේ ගරු නියෝජ්‍ය සභාපතිතුමාට. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මුලින්ම කථා කරන්න කැමැතියි ආයුර්වේද වෛද්‍ය විද්‍යාව පිළිබඳව. මීට හේතුව අපේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාව පිළිබඳව අපි මෙතැන කථා කරන කොට, ගරු ස්වාමීන් වහන්සේ කථා කරන කොටත් කියවුණා. ගරු ස්වාමීන් වහන්සේත් ප්‍රකාශ කර සිටියා, මේකට වෙන් කරලා තිබෙන මුදල් ප්‍රමාණය මදී. මේකෙන් මීට වැඩිය දෙයක් සමාජයට සිද්ධ වෙනවා. ඒ නිසා ඒකට වැඩිපුර මුදලක් වෙන් කරන්න ඕනෑ කියලා තමයි ස්වාමීන් වහන්සේගේ කථාවේදීත් කිව්වේ. මම උදාහරණයක් වශයෙන් ගරු ඇමතිතුමනි, මේ දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳව කථා කරන කොට අපි හැම තිස්සේම කථා කරන්නේ, අපරදිග වෛද්‍ය විද්‍යාව පිළිබඳවයි. නමුත් දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳව කථා කරන්නේ නැහැ. මම දන්නා, මගේ හිතවත් අසල්වැසියෙක් හිටියා. එයාට අවුරුදු හැට අටයි. ගරු ඇමතිතුමනි, එයාගේ වැල් හයම Block. එයාට තුන් පාරක් හෘදයාබාධ ඇති වුණා. නමුත් එයා ඔපරේෂන් කරන්න භය වුණා. එයා අනුරාධපුරයේ ගිහිල්ලා බෙහෙත් කළා. මාස හයයි බෙහෙත් කළේ. දැන් එතුමාට 100% ක්ම අසනීපය හොඳයි. ඒ නිසා මේ සිංහල වෛද්‍ය විද්‍යාව කියන්නේ, පරම්පරාගත දෙයක්. මේක ආරක්ෂා කර ගෙන, මේක වැඩි දියුණු කරන්නය කියලා තමයි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ.

ඒ වාගේම අනවසර වෛද්‍ය මධ්‍යස්ථාන ගැන කථා කරන කොට මම මේ ළඟදී ගියා මගේ අතේ පොඩි අකරතැබ්බයක් වෙලා බෙහෙත් ගන්න සිංහල වෙදකම් කරන තැනකට. බොහොම සෙනඟ ඉන්න තැනක්. බලන කොට කිසිම සහතිකයක් නැහැ. කාන්තාවෝ පිරිලා ඉන්නවා. පිරිමි පිරිලා ඉන්නවා. එළියේ සියලු දෙනාටම පේන්න පොල් ලෙලි රත් කර කර ඒ කාන්තාවන්ගේ තැල්මවල් වෙලා තිබෙන තැන් තවනවා. ඒ වාගේම පිළිවෙළක් නැතිව ගමේ ගොඩේ ඉන්න තරුණයන්ව එක්කගෙන ඇවිල්ලා, ඒ තරුණයෝ තමයි ඒ අයව මසාජ් කරන්නේ. අත පත ගාන්නේ. මම පසුව කථා කරලා ඇහුවා, ඇයි ඔබතුමා මෙහෙම කරන්නේ කියලා. මෙහෙම කරනවා නම්, කාන්තාවන්ව ඉදිරිපත් කරන්න. කාන්තාවන් ඉදිරිපත් කරලා මේ අයව ආවරණය කරලා, කාටවත් පේන්නේ නැති වෙන්න ඒක කරන්නය කියලා. පසුව මට දීපු උත්තරය තමයි. මට දෙවියෝ කියලා තිබෙන්නේ, ඇතුළට ගෙනියන්න එපා. එළියේ කරන්න කියලා. පෞද්ගලිකව ඇහුවොත් මම තැන කියන්නම්. ඒ නිසා කරුණාකරලා මෙවැනි දේවල් ගැන සැලකිලිමත් වෙන්න ඕනෑ. එහෙම නැතිව ගියොත් ඒක නිකම් වල් වැදුනු වෛද්‍ය විද්‍යාවක් වෙනවා. ඒක දැක්කාම හරිම අශෝභනයි.

අනික් එක ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ගිය සුමානේ අපේ කැන්ටිමේ කෑම කන කොට ඒකේ තිබුණා කුරක්කන් කැඳ එකක්. අපි තුන හතරක් බිව්වා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කුරක්කන් නොවෙයි. කිතුල් කැඳ.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

කිතුල් කැඳ. මම දෙක තුනක් බිව්වා. මම මේක කියන්න ඕනෑ. මේ සභාව ඉවර වෙන්න කිට්ටු වෙන කොට මට බොහොම අමාරු බඩේ අමාරුවක් හැදුනා. මට අනිවාර්යයෙන්ම ගෙදරටම යන්න ඕනෑ මේ මගේ වැඩේ කර ගන්න. මම යන කොට මගදී කැලණිය දිහාවේදී මට යන්නම බැහැ අපහසුයි. මම රියදුරු මහතාට කිව්වා, ඔය රූම්ස් කියලා තිබෙන ගෙස්ට් හවුස් එකකට අල්ලන්නය කියලා. ඇල්ලුවා ගෙස්ට් හවුස් එකකට. මම ඉක්මනට බැහැලා රුපියල් පන්දාහේ කොලයක් දීලා මට වොෂ් එකක් දා ගන්න ඕනෑ කියලා මම රූම් එකකට ගියා. ගරු ඇමතිතුමනි, විශ්වාස කරන්න. ගඳේ බැහැ. රූම් එකට යනවා තියා ඇතුළු වෙන්න බැහැ. Towel ඔතලා ඇඳ උඩ තිබෙන්නේ. Towel එක අඳින්නත් බැහැ. ගඳේ බැහැ. ඊට පස්සේ බෙඩ් ෂීට් එකක් දාලා තිබුණා. පොඩි වුණු එකක් දාලා තිබුණේ. ඒ නිසා මෙවැනි ලැගුම්හල් විශාල ප්‍රමාණයක් තිබෙනවා. මේවා පරීක්ෂා කරන්න කිසිම කෙනෙක් නැහැ. මේ ඇඳේ නිදා ගත්තොත්, මේ තුවායෙන් පිස්සොත් කිසිම කෙනෙකුට ලෙඩක් නොහැදී තිබෙන්නේ නැහැ. ඉතාමත් අපිරිසිදුයි. ඒ විතරක් නොවෙයි. එතැන බෝඩ් එකේ ගහලා තිබෙනවා, මේක සංචාරක මණ්ඩලයේ අනුමැතිය ඇති හෝටල් අතරින් එකකි. අනික් හෝටල්වලට ගිහිල්ලා අමාරුවේ වැටෙන්න එපාය කියලා බෝඩ් එකකුත් ගහලා තිබෙනවා. සංචාරක මණ්ඩලයෙන් අනුමත කරන්නේ මෙවැනි හෝටල්ද? මේ ගැන PHI මහත්වරු, ඒ ඉන්න නිලධාරීන් පරීක්ෂා කරන්නේ නැද්ද? එහෙම නම් මේකේ කැම කොහොම ඇත්ද? ඒ නිසා ගරු ඇමතිතුමනි, මේ ගැන වැඩිපුරම අවධානය යොමු කරන්න ඕනෑ. නැත්නම් හරියන්නේ නැහැ.

ඒ වාගේම තමයි අයාලයේ යන බල්ලන්. අයාලේ යන බල්ලන්ට එන්නත් කරනවා. අයාලේ යන බැල්ලියන්ට වඳ සැත්කම කරනවා, අපේ PHI මහත්වරු. ඒ වාගේම අයාලේ යන කාන්තාවන් ඉන්නවා. ඒ කාන්තාවන් පුනරුත්ථාපනය කරන්න පුළුවන් කියලා කියනවා. මම දැන ගන්න කැමැතියි, පුනරුත්ථාපනය කරන ක්‍රමය මොකක්ද කියලා. අයාලේ යන කාන්තාවන්. ඒ නිසා අයාලේ යන කාන්තාවන්ව පුරුදු පුහුණු කරනවා නම්, රුපියල් ලක්ෂයක්වත් පඩියක් දෙන විධියට ඒගොල්ලෝ පුනරුත්ථාපනය කරන්න ඕනෑ. ඒගොල්ලන්ට රුපියල් දහ පහළොස් දාහක්, විසි දාහක් අරගෙන මදී. ඒගොල්ලෝ ජීවත් වන විධියට. ඒ නිසා අපි බොරුවට මේකට ඇතුළත් කරලා වැඩක් නැහැ. මේවා නීත්‍යානුකූල කරන්න කියලා මම කියන්නේ නැහැ. නමුත් බොහෝ රටවල මේවා නීත්‍යානුකූල කරලා තිබෙනවා. ඒවායේ මාසයකට සැරයක් වෛද්‍ය පරීක්ෂණ පවත්වලා ක්‍රමානුකූලව වැඩේ කර ගෙන යනවා. නැත්නම් මේ වාගේ දේවල්වලින් වෙන්නේ මේවා පොතට සීමා කළාට වැඩක් නැහැ. දස දහස් ගණනක් අද අයාලේ යනවා. කාටවත් නවත්වන්න බැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඒ අයාලේ යන කාන්තාවන් ගැන කථා කළේ.

ඒ වාගේම ඇස් කන්නාඩි සම්බන්ධව. මේ සම්බන්ධව කිහිප දෙනෙකුම කථා කළා. මේ ඇස් කන්නාඩි ව්‍යාපෘතිය තමයි අපේ හොඳම ව්‍යාපෘතිය. අපි ඇස් කන්නාඩි බෙදා දෙන කොට අපට පින් දීලා තමයි ඇස් කන්නාඩි අරගෙන යන්නේ. ඒ නිසා මේ ක්‍රමය තවත් වැඩි කරන්න වැඩිපුර මුදල් වෙන් කරන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම ගරු ඇමතිතුමාටත් -

## රීති අංක 30 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 30

**ගරු සුමිත්ලාල් මැන්දිස් - අමාත්‍යතුමා**
Hon. Sumithlal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "අද දින සභාවේ කාලය විනාඩි පහකින් දීර්ඝ කළ යුතු යැයි" යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම යෝජනා කරනවා. මම දැක්කා ළමා රක්ෂක හා කාන්තා කටයුතු තිබෙනවා. ළමා රක්ෂක කරනවා නම් අපේ ගම්වල ඉන්නවා අනාථ ළමයි. සමහර විට ආච්චිට බලන්නත් බැහැ. අම්මා රට ගිහිල්ලා. ඒ වගේ ළමයි ඉන්නවා. පරිවාස එකෙන් ගිහිල්ලා බලලා,

ඒ ළමයින්ව යම් යම් තැන්වලට යොමු කරන්න ඕනෑ. මම යොමු කරන්න කියන්නේ, ඒ ළමයින්ව ගිහිල්ලා ගාල් කරන්න නොවෙයි. අඩුම තරමේ ප්‍රාදේශීය සභා දෙක තුනකටවත්, ගම් දෙක තුනකටවත් අපට අඩුම තරමේ ආසන දෙක තුනකටවත් එක ළමා රක්ෂක ආයතනයක් ඇති කරන්න ඕනෑ. ඒ ඇති කරලා ඒ තුළට ළමයින්ව යොමු කරලා ඒ ළමයින්ගේ සුරක්ෂිත භාවය අපි සහතික කරන්න ඕනෑ. ඉතින් මෙවැනි ක්‍රම තුළින් විතරයි ඒ ළමයින්ගේ සුරක්ෂිත භාවය ආරක්ෂා කරන්න පුළුවන් වෙන්නේ.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම විශාල ශල්‍යකර්ම කරනවා අපේ අයට. ශල්‍යකර්ම කළාම ඒ අයට මුදල් ලබා ගන්න අපේ පළාත් සභාවේ පුළුවන් උපරිම රු. 50,000 යි. නමුත් සමහර ශල්‍යකර්මවලට ලක්ෂ 12 ක් 15 ක් යනවා. මහ ආණ්ඩුවෙන් හම්බ වෙන්නේ ලක්ෂ 1 ½ යි. මෙහෙන් හම්බ වෙන්නේ රු. 50,000 යි. ඉතිරි ලක්ෂ 10 සොයා ගන්නේ කොහොමද කියන එක අපි කල්පනා කරන්න ඕනෑ. ඒගොල්ලෝ ගෙවල් ගණනේ යනවා. ලවුඩ්ස්පීකර් දාගෙන සල්ලි එකතු කරනවා. ඒ නිසා මම ගරු ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ රු. 50,000 ක මුදල අඩු ගණනේ වැඩි කරලා ඒ අයට දෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රාජිත ඇමතිතුමාට නම් ලක්ෂ 100 ක් දුන්නා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ඔව්. එතුමාටත් දුන්නා. ෆීලික්ස් ඇමතිතුමාටත් කීයක් හරි දුන්නා, ඒ දවස්වල. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇවිදින්න බැරි ළමයින් ඉන්නවා. ඒ ළමයින් ගැන කථා කළාම ළමයින්ට රුපියල් තුන් දාහක දීමනාවක් දෙනවා. මම හිතන්නේ, මහ ආණ්ඩුවෙන් දෙන්නේ. 50 යි නම් 50 ටම තමයි දෙන්නේ. ඒ 50 න් එක්කෙනෙකුට මොනවා හරි වුණොත් තමයි තවත් කෙනෙකුට දෙන්නේ. ආසනවල සිය ගණන් ඉන්නවා අබ්බගාත ළමයි. අම්මලා වඩා ගෙන යනවා. ඉතින් ඒ ළමයින්ට කිසිම ආධාරයක් නැහැ. ඒ නිසා මේවා ගැන ඔබතුමා කථා කරලා, ඒක සමාජ සේවා අමාත්‍යාංශයෙන් ගෙවන්නේ. ඒ වාගේම වැඩිහිටි දීමනාව. වැඩිහිටි දීමනාව දෙන්නේ නැහැ. යම්කිසි ප්‍රමාණයයි දීලා තිබෙන්නේ. ඊට වඩා වැඩි කරන්නේ නැහැ. වෙන ඒවාට කෝටි ගණන් සල්ලි නාස්ති කරනවා. ඒ නිසා කරුණාකර මේ දේවල් ගැන අවධානය යොමු කරන්න. ඒ වාගේම ඔබතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, ඒ වාගේම අපේ පරිවාස කොමසාරිස්තුමිය ඇතුළු සියලුම නිලධාරීන්ට මේ අවුරුද්ද තුළ අපට කරපු සේවයට අපගේ අවංක ස්තුතිය ප්‍රකාශ කරනවා. ඒ වාගේම ලබන්නා වූ නව වසර තමුන්නාන්සේලා සියලු දෙනාටම -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

නත්තල එපාද?

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ශ්‍රී සුභ නත්තලක් සහ සුභ නව වසරක් වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ අනුව ශීර්ෂ අංක 105, 113, 114, 115 හා 116 යන වැය ශීර්ෂයන් පිළිබඳව විවාදය හෙට දින 2017.12.12 වන දිනට කල් තැබීම කරනවා.

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී සභාව පූර්ණ කාරක සභා අවස්ථාවෙන් සභා අවස්ථාවට පත් වෙනවා.

***ඊට අනුකූලව අ.භා. 05.02 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 05.02 p.m. the Provincial Council resolved itself into a committee of the whole Council.*

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය ]**
[Progress of the whole council]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දිනයේ ප්‍රගතිය සභාවට වාර්තා කිරීම. අද දින 2017.12.11 වන දින පූර්ණ කාරක සභාවේදී සාකච්ඡාව අවසන් කරන ලද ශීර්ෂ අංක 107, 121, 122, 123, 124, 125 හා 103 යන වැය ශීර්ෂයන් අද දින පූර්ණ කාරක සභාවේදී මීට පෙර සම්මත වූ බව මෙම සභාවට දැනුම් දෙනවා. අද දින පූර්ණ කාරක සභාවේදී සාකච්ඡාව ආරම්භ කරනු ලැබූ ශීර්ෂ අංක 105, 113, 114, 115 සහ 116 යන වැය ශීර්ෂයන් සම්බන්ධව ඉදිරි වැඩ කටයුතු හෙට දින ඒ කියන්නේ, 2017.12.12 වන දිනට කල් තබනු ලැබූ බවත් මෙම සභාවට දැනුම් දෙනවා.

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 05.04 ට, 2017 දෙසැම්බර් මස 12 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 05.04 p.m till 09.00 a.m, on 12.12.2017*